2018
ස්වර්ණ පුස්තක
සම්මානය දිනූ
විශිෂ්ටතම
නවකතාව

සමන් වික්‍රමාරච්චි

අප්පච්චි ඇවිත්

Name - of - the - Father

[redacted]

අප්පච්චි ඇවිත්

(Name - of - the - Father)

2018 ස්වර්ණ පුස්තක සම්මානය දිනූ වසරේ
විශිෂ්ටතම නවකතාව

තොමීගෙ පොත් ගුල තිලිණයකි

අපේ පුස්තකාලය
telegram group එක
වෙනුවෙනි.
https://t.me/apepusthakalaya.

පියාගේ නාමකරණයේ ඇත්ත කාර්යභාරය (Name - of - the - Father?) කුමක් ද? හරියටම, එමගින් පියා සංකේතිකව මරා දමා, ආත්මයාට තමාගේ පියා සහ (සංවෘත පවුල් චක්‍රය) අතහැර දැමීමට ඉඩ සැලසෙයි. ඉනික්බිතිව ඔහුට ලෝකය තුළ තමාගේම වූ නිදහස් ගමනකට මුලපිරීමට පිළිවන. එහෙම නම් කෆ්කා තම පියාගේ නාමකරණයට නතු වීමට මැලි වීම මගින් පෙන්වා සිටින්නේ ඔහුට තම පියාගෙන් කැඩී යාමට නොහැකි වීම වූ බව පුදුම වීමට තරම් දෙයක් නොවේය. කෆ්කා තම පියාට ලියූ ලිපිය ඔහු සදාකාලිකව තම පියාගේ සෙවණැල්ල තුළ සිටිමින් ලුබ්ධිමය මරඋගුලකට අසුවන සැටි කියවෙන සාක්කියකි. පියාගේ ග්‍රහණයෙන් ගැලවී යාමට ඉඩ නොදී පියාගේ නාමය භාර ගැනීමට කෆ්කා ප්‍රතික්ෂේප කිරීම වූ කලී මෙම සිරගත වීම පිළිබඳ නිසැක සංඥාවකි.

ස්ලැවොජ් ජිජැක්

What is the true function of the Name - of - the - Father? It is precisely, to allow the subject to symbolically kill the father, to be able to abandon his father (and the closed family circle) and freely set out on his, own path in the world. No wonder, then that Kafka's reluctance to assume the - Name - of - the - Father is the very indication of his failure to break away from his father: what the letter to Kafka's father bears witness is a subject who was doomed to remain forever in the paternal shadow, caught up with him in libidinal deadlock. Far from enabling him to elude his father's grasp, Kafka's refiusel to accept the father's name is the surest sign of this imprisonment.

Slavoj Zizek
In Defense of Lost Causes

මරණ පරීක්ෂණයක සාක්කි කීපයක් -

1. අසල්වැසි කතගේ සාක්කිය

මගේ සම්පූර්ණ නම මේස්ත්‍රිගේ හිල්ඩා ගුණවර්ධන. වයස අවුරුදු 48 යි. මම විවාහකයි. විවාහ වෙලා ඉන්නෙ කිත්සිරි ගුණවර්ධන සමඟ. එයා හෙලීස් එකේ වැඩ පරීක්ෂකවරයෙක්.ඔව්. අපට දරුවො දෙන්නෙක් ඉන්නවා. ඒ අය දැන් ලොකුයි. මියගොස් සිටින සුමාලි මගේ මිතුරියක්. නැහැ. එහෙම කුඩා කාලෙ ඉඳලා තියෙන මිතුරුකමක් නොවෙයි. ඒ අය අපේ අසල්වැසියෝ. ඒ අය ඔය ගෙදරට ඇවිත් දැන් අවුරුදු 12ක් විතර ඇති. ඒ කාලෙ ඉඳලාම අපි මිතුරුයි.

සුමාලි වැඩ කළේ බැංකුවෙ. නිස්සංක සේනාධීර කියන්නෙ එයාගෙ ස්වාමි පුරුෂයා තමයි. ඔහු පරිපාලන සේවයේ විධායක නිලධාරියෙක් කියලා දන්නවා. සුමුදු තමයි ඔවුන්ගේ එකම දූව. ඇයට මම හිතන්නේ අවුරුදු 10ක් විතර ඇති. ඇය ඉගෙන ගන්නේ විශාකාවේ. නැහැ. එහෙම ඒ දෙන්න අතර ආරවුල් තිබුණේ නැහැ. සුමාලි කියන්නෙ හරි අහිංසක ළමයෙක්. මම හිතන්නෙ නැහැ

Scanned by CamS

ඇය නිස්සංක ගේ වැරැද්දක් තිබුණත් එල්ලීගෙන යයි කියලා. මම දන්න තරමින් සුමාලි ඒ විදියේ ගෑනියක්.

මම දන්නවා සුමාලියි එයාගෙ දුවයි මරා දැමීම ගැන නිස්සංකව සැක කරනවා කියලා. මට නම් හිතාගන්න බැහැ නිස්සංක එහෙම අපරාධයක් කළාද කියලා. ඔහු නමන්ගෙ පාඩුවෙ ඉන්න හොඳ කෙනෙක්. හැමදාම උදේට ඒ අය කාර් එකෙන් පිටත් වෙලා යනවා. මිදුලට බැස්සම මම මිදුලෙ හිටියොත් දෙන්නම මා එක්ක කතා කරනවමයි. නැහැ මම රස්සාවක් කරන්නෙ නැහැ. දවසම ගෙදරමයි ඉන්නෙ.

නැහැ. නිස්සංකගෙ එහෙම අසාමාන්‍ය හැසිරීමක් මම දැකලා නැහැ. හැබැයි දවසක් මම දැක්ක නිස්සංක ඒ අයගෙ ගෙදර වැරැන්ඩාවෙ ඉඳගෙන කවිද එක්ක කතා කර කර හිටියා. එතන තව කෙනෙක් ඉන්න බවක් මම දැක්කෙ නැහැ. මම ටිකක් ඉස්සි ඉස්සි විපරමින් බලනකොට නිස්සංක මාව දැක්කා. නිස්සංක ඉක්මනට නැගිටලා මං ඉන්න දිහාවට ආවා. ඇයි මිසිස් ගුණවර්ධන? ඕනකමක්ද? කියලා ඇහුවා. මං ගත් කටටම කිව්වෙ, නැහැ මේ සුමාලි ඉන්නව ද කියලා බැලුවා කියලා. නිස්සංක ඊට පස්සෙ කතාවක් නැතුව ගේ ඇතුළට ගියා. ඔය සිද්ධිය ගැන මම අපේ මහත්තයටත් කිව්වා. නැහැ. ඊට පස්සෙ නම් එහෙම දෙයක් දැක්කෙ නැහැ.

ඔව් මම තමයි ඉස්සරවෙලාම අම්මයි දුවයි මරලා දාලා තියෙනවා දැක්කෙ. අනේ අප්පෙ එහෙමත් දුක හිතෙන දර්ශනයක්. සුමාලිව දැක්කම මට ඉහිලුම් නැතුව ගියා. මම සාමාන්‍යයෙන් නිතරම ඒ ගෙදරට යනවා සුමාලි හම්බවෙන්න. නැහැ. සුමාලි එහෙම හැම තිස්සෙම අපේ ගෙදර එන්නෙ

නැහැ. එයා ගෙයින් එළියට බහින්නෙ කලාතුරකින් දවසක. වෙලාවකට මම අහනවා ඔහොම ගේ අස්සටම වෙලා ඉන්න කම්මැලි නැද්ද කියලා. එයා කියන්නෙ එයා ගෙදර ඉන්න කාලෙ වුනත් පුරුදුවෙලා තිබුණේ එහෙමලු.

ඔව්. ඔව් සුමාලි මට දවසක් කිව්වා තමයි නිස්සංකව එයාට හම්බවුණේ කැම්පස් එකේදි කියලා. මුලදි සුමාලිගෙ තාත්තා කැමති වුණේ නැතිලු. පස්සෙ කැමති වෙලා තියෙනවා. ඔය ඉන්න ගේත් හදලා දීලා තියෙන්නේ සුමාලිගෙ තාත්තා තමයි. සුමාලිගෙ තාත්තා නිතරම ආව ගිය කෙනෙක් නෙමෙයි. මම දන්න තරමින් සුමාලිගෙ තාත්තාත් ආණ්ඩුවේ ලොකු රස්සාවක් කරපු කෙනෙක්.

නැහැ මට එදා ඒ ගෙදර දිහාවෙන් කිසිම සද්දයක් ඇහුණේ නැහැ. කව්රුවත් කෑ ගහන සද්දයක් නම් ඇහුණෙම නැහැ. නැහැ. එදා නිවාඩු දවසක් නෙවෙයි. මම සුමාලි හම්බ වෙන්න කියලා ඒ ගෙදරට ගියේ හවස් වරුවෙ. වෙලාව 5.30 ට විතර වෙන්න ඇති. ඉස්සරහ ගේට්ටුව හායි ගාලා ඇරලා දාලා තිබුණා. ගරාජ් එකේ කාර් එක තිබුණෙත් නැහැ. මට යන්තම් මතකයි ඊට පැයකට විතර කලින් කාර් එක එළියට යන සද්දෙ ඇහුණා. මං හිතන්නෙ ඒ හින්දාම තමයි මම සුමාලි හම්බ වෙන්න යන්න හිතන්න ඇත්තෙ. නිස්සංකත් නැති හින්දා හොඳ කයිවාරුවක් ගහන්න පුලුවන්නෙ.

ඔව් ගේ ඉස්සර දොර වහලා තිබුණේ නැහැ. පුරුද්දක් හැටියට ඒ අය ගෙදර හිටියත් ඉස්සරහ දොර වහලා තියෙන්නෙ. ඒ හින්දා සාමාන්‍යයෙන් මම පුරුදුවෙලා හිටියෙ වැරැන්ඩාව දිගේ ගිහින් පැති දොරකින්

සුමාලිට කතා කරලා ඇතුළට යන්න. ගේට්ටුවත් ඇරලා ඉස්සරහ දොරත් ඒ විදියට ඇරිලා තියෙනවා දැක්කම මට එහෙම සැකයක් ඇතිවුණේ නැහැ. හැබැයි ඒකෙ අමුත්තක් තිබුණා. මම වෙනදා වගේ නැතුව ඉස්සරහ දොරෙන්මයි ඇතුල් වුණේ. ගෙදර කිසි හැල හොල්මනක් තිබුණේ නැහැ. මම සුමාලි කියලා කතා කළා. ඒත් කිසි කෙනෙක් උත්තර දුන්නෙ නැහැ. එතකොට තං මගෙ හිතට මොකක්දෝ අමුත්තක් දැනුණා. මම ටිකක් හයියෙන් සුමාලි කියලා කතා කළා. ඒත් සද්දයක් නැහැ.

මම සාලය හරහා ගෙයි පිටු පස දිහාවට ගියා. එතකොටම මම දැක්කා සුමාලිලා ගෙ නිදන කාමරේ දොර ඇරලා තියෙනවා. මම සුමාලි කියාගෙන ඒ කාමරේට එබුනා. එතකොට තමයි මම දැක්කෙ. සුමාලි බිම වැටිලා හිටියා. කාමරේ පුරාම ලේ ගලාගෙන ගිහින් තිබුණා. සුමාලි වැටිලා හිටියෙ උඩුබැලි අතට. එයාගෙ බෙල්ලයි ඔලුවටයි යටිනුයි ලේ කැටි ගැහිලා වගේ තියෙනවා මම දැක්කා. සුමාලි ඒ වෙලාවෙ ඇඳලා හිටියෙ නිල්පාට නයිටියක්. කාමරේ මොකුත් අවුස්සල තිබුණේ නැහැ. හැබැයි මම දැක්කා බිම හැමතැනම සුදු පාට කොල ගොඩක් විසිරිලා තිබුනා. මට ඒ වෙලාවේ කෑ ගැස්සුනා. එක පාරටම මම කළේ ගෙයින් එළියට දුවන එක. එතකොටම මට සුමුදුව මතක් වුණා. මම ගෙයි හැමතැනම සුමුදුව හෙව්වා. සුමුදු එයාගෙ කාමරේ මැද්දෙ වැටිලා හිටියා. එයාගෙත් බෙල්ලෙ තමයි තුවාල තිබුණේ. ඊට පස්සෙ මම ගෙයි මිදුලට බැහැලා කෑ මොර දෙන්න පටන් ගත්තා. අහළ පහළ හැමෝම ආවේ ඊට පස්සෙ. නැහැ. නිස්සංක ඒ වෙලාවෙ ගෙදර හිටියෙ

නැහැ. එහෙම කෑ ගහන සද්දයක්වත් අපට ඇහුණේ නම් නැහැ. මට නම් හිතාගන්නත් බැහැ මොකද වුණේ කියලා.

මට කීමට ඇත්තේ මෙපමණයි.

2. මරණකාරියගේ පියාගේ සාක්කිය

මගේ සම්පූර්ණ නම වන්නක වඩුගේ තිලක් රණවිර. දැන් විශ්‍රාමිකයි. වයස අවුරුදු 65 යි. මිය ගිහින් ඉන්නේ මගේ දුවයි මිතිපිරියයි. සුමාලිගෙ අම්මා මැරුණේ එයා පොඩි කාලෙ. ඔව් මම දෙවෙනි කසාදයක් කරගෙන හිටියා. එයාගෙ නම බියට්‍රිස්. කවදාවත් බියට්‍රිස් සුමාලිට වෙනස් කමක් කළේ නැහැ. අපිට වෙන දරුවො නැහැ. බියට්‍රිස් මැරුණේ දැනට අවුරුදු තුනකට විතර කලින්. මැරෙනකම්ම එයා සුමාලිට ආදරෙන් හිටියා. ඒත් සුමාලි හැම තිස්සෙම පුරුදුවෙලා හිටියෙ එයාගෙ කාමරේට වැදිලා තනියම ඉන්න. අම්මා නැතිවුණේ දුවට හොඳට දැනුම් තේරුම් කාලෙ. මං හිතන්නෙ එහෙම තනිවෙලා ඉන්න එකත් හේතුවක් වෙන්න ඇති.

නැහැ. තිස්සංකගෙයි සුමාලිගෙයි විවාහයට මම ඒ තරම් කැමති වුණේ නැහැ. ඇත්තටම නම් ඒකට මාව කැමති කෙරෙව්වෙ බියට්‍රිස්. අකමැති වෙන්න විශේෂ හේතුවක් තිබුණේ නැහැ. ඒත් තිස්සංකගෙ අප්පච්චිට මගේ කැමැත්තක් තිබුණේ නැහැ. මිනිහා ගෑනු දෙන්නෙක්ම එක්ක ජීවත් වුණ කෙනෙක්. ඒ නිසාමද කොහෙද බිමට ඇබ්බැහි වෙලා කාලකන්නි වෙලා හිටියෙ. මට කවදාවත් හරියට මූණ දීලා කතා කළේ නැහැ. තිස්සංක අපේ

පවුලට සම්බන්ධ වෙන කොට ඒ ගෑනු දෙන්නම මැරිලා. නිස්සංකගෙ අප්පච්චි විතරයි හිටියෙ. මිනිහගෙ පවුල් දෙකේම දරුවන්ගෙන් කව්රුවත් හරියකට ඉගෙනීමක් තිබුණේ නැහැ. නිස්සංක විතරයි ඒ පවුලෙන්ම ඔය වගේ තැනකට ඇවිත් තිබුණේ.

නිස්සංක තමන්ගේ රස්සාව අධ්‍යාපනය වගේ දේවල් ගැන උනන්දුවක් තිබුණ කෙනෙක් බව මම දන්නවා. බියට්‍රිස් වුනත් මට කිව්වෙ ඒකමයි. අන්තිමේ මම දෙන්නාගෙ විවාහයට එකඟ වුනත් නිස්සංක ට මම කැමැත්තෙන් හිටියෙ නැහැ. නිස්සංකගෙ සමහර විකාර ගති මට ඇල්ලුවේ නැහැ. මට හරියටම විස්තර කරලා කියන්න බැහැ ඒ විකාර මොනවාද කියලා. සමහර දවස්වලට මම දුව බලන්න ඒ ගෙදරට ගියාට මාත් එක්ක වචනයක් වත් කතා කරන්නෙ නැහැ. මගෙ ඉස්සරහට එන්නෙත් නැහැ. අන්න ඒ වගේ ඒවා ගැන තමයි මම අකමැත්තෙන් හිටියෙ.

එක පාරක් සුමාලි නිස්සංක එක්ක තරහ වෙලා ගෙදර ආව දුවත් එක්ක. සතියක් විතර හිටියා. ඒ හිටියාට මම දකිනවා හැම තිස්සෙම නිස්සංකට ටෙලිෆෝන් එකෙන් කතා කරනවා. නිස්සංක එක්ක තරහ වෙලා ආපු එක ගැන මම ටිකක් සතුටු වුණා තමයි. හැබැයි නිතරම නිස්සංකට ටෙලිෆෝන් කරන එක ගැන මම දොස් කිව්වා. නිස්සංකව දික්කසාද කරන්න කියලත් මම බල කළා. මම හිතන්නෙ දුව ආපහු ගියේ ඔය දික්කසාද කතාව මම කියපු දවසට පහු වෙනිදා.

මගේ දුව අමුතු ගති පැවතුම් තිබුණ ළමයෙක්. ඔය කැම්පස් ගිහින් නිස්සංක එක්ක යාළු වුණේ

කොහොමද කියලවත් මට හිතා ගන්න බැහැ. ඊට කලින් එයා කිසිම පිරිමි ළමයෙක් එක්ක කතා කරනව වත් මම දැකලා නැහැ. ඔය ගැන බියට්‍රිස් මාත් එක්ක කතා කරලා තියෙනවා. බියට්‍රිස් කිව්වා එයාගෙ ගති ගුණවලයි අදහස්වලයි හැටියට එයාට කවදාහරි කසාදයක් කරලා දෙන එක ලේසි වෙන එකක් නැහැ කියලා.

නිස්සංකයි දුවයි පදිංචි වෙලා හිටියෙ මම හදලා දුන්න ගෙයක තමයි. මගේ දුව වැඩ කළේ බැංකුවෙ. මම විශ්‍රාම ගියෙත් බැංකුවෙ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කෙනෙක් විදියට. නිස්සංකලාගෙ පවුලට අපි පැහෙන්නෙ නැහැ කියලා මම හිතුවේ ඒකයි. නිස්සංකගෙ අප්පච්චි නිකං ක්ලාක් කමක් කරපු මනුස්සයෙක්. ඒකත් හරියට කර ගත්තෙ නැහැ. රස්සාවට ගිහිල්ලත් කරලා තිබුණේ බොන එක. නිස්සංක කැම්පස් යන කොට එයා විශ්‍රාමිකයි. මේ නිසා ඉතාම දුෂ්කර ජීවිතයක් තමයි නිස්සංකලා ගෙවලා තිබුණේ. අප්පච්චිගේ පැන්ෂන් පඩිය මිනිහාගෙ බීමටත් මදි.

ඔව් මම නිස්සංකලාගෙ ගමේ ගිහින් තියෙන්නේ දෙතුන් වතාවක් විතරයි. ඒ ගියත් පැය දෙක තුනක්වත් ඉන්නෙ නැහැ. අන්තිමට ගියේ නිස්සංකගෙ අප්පච්චිගෙ මරණෙට. අවමඟුලෙදි මට කතාවක් කරන්නත් ආරාධනා කළා. මම මොනවා කියන්නද ඔය බේබදු මනුස්සයා ගැන. ඒත් ඉතින් මැරුණාම මිනිස්සුන්ගෙ නරකක් කියන්නෙ නැහැනෙ. මම තැනට ගැළපෙන කතාවක් කළා.

මේ අපරාධය කළේ කවුද කියන්න මම දන්නෙ නැහැ. මට මේක ඉහිලුම් දෙන්නෙ නැහැ. බියට්‍රිස්වත් හිටියා නම් මට මේ තරම් අමාරුවක් නැහැ. නිස්සංක

Scanned by CamS

මේක කරයි කියලා කිව්වට මට නම් හිතාගන්න බැහැ. මගේ දුව වගේ කෙනෙක්ව මරන්න තරම් හිතක් එයාට කොහොම පහළ වුණාද කියලා. මම හොඳටම දන්නවා දුව එහෙම කෙනෙක්ව කේන්ති කරවන ජාතියේ ළමයෙක් නොවේ. මම මේ ගැන වෙන මොකුත් දන්නෙ නැහැ. අනේ මගේ දුවට වෙච්ච දේ.

මට කීමට ඇත්තේ මෙපමණයි.

3. සැකකරුගේ ආයතන ප්‍රධානියාගේ සාක්කිය

මගේ නම නිහාල් දේශප්‍රිය සමරදිවාකර. වයස අවුරුදු 59 මාස 11 1/2 යි. මට අවුරුදු හැට පිරෙන්න තව තියෙන්නේ සති 2යි. එතකොට මම මගේ අධ්‍යක්ෂ තනතුරින් විශ්‍රාම යනවා. නිස්සංක සේනාධීර තමයි මම විශ්‍රාම ගියාම මෙතන අධ්‍යක්ෂ වෙන්න හිටියෙ. ඇත්තටම නම් මම හිටියට ඔහු මෙතන වැඩ කළේ අධ්‍යක්ෂ වගේ තමයි.

මරණකාරිය වන සුමාලි සේනාධීර මම හොඳට අඳුරනවා. ඇය නිස්සංකගේ භාර්යාව. සුමාලි ඉඳහිට අපේ කන්තෝරුවටත් ඇවිත් තියෙනවා. කන්තෝරුවෙ හැමෝමත් සුමාලිව දන්නවා. ඇත්තටම නම් සුමාලිට හැමෝම කැමතියි. මට නම් විශ්වාසයට ගන්නත් බැහැ සුමාලි මේ විදියට මරා දමලා තියෙනවා කිව්වාම. මම දන්න තරමින් සුමාලි එහෙම කාටවත් වරදක් කරන කෙනෙක් නොවෙයි.

නිස්සංක තමයි අපේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ. ඔව්. ඔහු මේ තනතුරට එන්න කලින්

කල්පිටියෙ උප දිසාපති වෙලා හිටියා. ඔහු හරිම කැපවීමක් තිබුණ කෙනෙක්. ඉහළට යාමේ ලොකු ආශාවක් තිබ්බා. අපේ ව්‍යාපෘති පිළිබඳ තියෙන සාකච්ඡා වලදි වැඩිපුරම කතා කළේ නිස්සංක. ඔහු සමහර වෙලාවට හොඳ යෝජනා ගෙනාවා. ඇමතිතුමා වුනත් නිස්සංක ට හරිම කැමැත්තෙන් හිටියෙ.

වෙලාවකට නිස්සංකගෙ අමුතු ගති තියෙනවා තමයි. ඒක මට හරියට තේරුම් ගන්න බැරි දෙයක්. එයාගෙ කාර්යාල කාර්ය සහායක පවා මට ඒ ගැන කියලා තිබුණා. වෙලාවකට නිස්සංක තනියම කතා කරනවා මිනිහා දැකලා තියෙනවා. දවසක් ඔය මාතුපාල - ඒ කියන්නෙ නිස්සංකගෙ කාර්යාල කාර්ය සහායක - නිස්සංක තනියම කතා කරනවා දැකපු බව නිස්සංකට දැනිලා තියෙනවා. නිස්සංක ඒක වහන්න කිව්වලු නැහැ මම මේ මම බලපු නාට්‍යයක දෙබසක් මතක් කළා කියලා. ඒත් මාතුපාල නම් කිව්වෙ නිස්සංක කව්රු හරි තමන් ළග ඉන්න කෙනෙක් එක්ක කතා කරනවා වගේ දැනුණා කියලා.

සාමාන්‍යයෙන් තමන්ගේ වැඩ කටයුතු උනන්දුවෙන් කැපවීමෙන් කරන සමහර අය ළඟ ඔහොම ගති ගුණ තියෙනවා තමයි. බාග විට අර වැඩවලටම කැපවීම නිසා එන පීඩනය හින්දා වෙන එකක් වෙන්න ඇති. නිස්සංකගෙ තිබුණ දුර්වලකම තමයි මිනිහා ඉහළට යන එක නවත්තන්න කුමන්ත්‍රණ කරනවා කියලා හිතන එක. මිනිහා වැඩියෙම සැක කෙරුවෙ මාව. ඒ හින්දයි අධ්‍යක්ෂ ලෙස මම ඉන්දැද්දිත් ඔහුට බලතල වැඩියෙන් දීලා මම පැත්තට වෙලා හිටියෙ.

නැහැ නිස්සංක කවදාවත් තමන්ගෙ සේවකයෙකුටවත් සැර පරුෂ විදිහට හිටපු කෙනෙක් නොවෙයි. කන්තෝරුවෙ කාන්තා පාර්ශවය වුනත් මිනිහට හරි කැමතියි. කොහොමටත් මිනිහා කඩවසම්නෙ.

මට නම් කීයටවත් හිතාගන්න බැහැ මේ අපරාධය නිස්සංක කළා කියලා. ඇත්ත. සුමාලි එක පාරක් සතියක් විතර ගෙදරින් ගිහිල්ලා හිටියා තමයි. මම දන්නෙ නැහැ හේතුව. හැබැයි එහෙම හිටියෙ සතියයි. ඒ සතියක කාලය තුළ නම් නිස්සංක ටිකක් පිස්සුවෙන් වගේ හැසිරුණා. රැවුල කපන්නෙත් නැතුව ඇඳුමක්වත් හරියට මැදලා අඳින්නෙ නැතුව කන්තෝරු ආවා. ඒත් සුමාලි ආපහු ආවම ඒවා ඔක්කොම හරි ගියා.

සුමාලියි එයාගෙ දූවයි මේ විදියට මරලා අලා තියෙන එක ගැන නම් මට හරිම කණගාටුයි. ඒත් ඒක කළේ නිස්සංක කියලා මට නම් හිතාගන්න බැහැ.

මට කීමට ඇත්තේ මෙපමණයි.

Scanned by CamSc

ගෙදර මළ පාලුයි. ඊයේ රෑ පුරාම මම හිටියෙ නිදිවර්ජිතව. මට වැඩියක්ම නින්ද නොගියෙ අප්පච්චිගෙ කාමරෙන් ඇහිච්ච සද්ද හින්දා. අප්පච්චි කහිනවා. හොටු සුරනවා. උගුර පාදනවා. පඩිනවා. අඬනවා. බැරිම තැන මම හයියෙන් කෑ ගහලා කිව්වා. "අප්පච්චි නිදා ගන්නකො. අප්පච්චි ඇහැරලා ඉන්න කොට මට නින්ද යන්නෙ නැහැ."

ඊට පස්සෙ අප්පච්චි වගේ වගක් නැතුව නිශ්ශබ්ද වුණා. අප්පච්චි මම කියන දේ අහලා නිහඬවීම මා තුළ ක්ෂණිකවම ජනිත කළේ සතුටක් වුනත් ක්‍රමයෙන් මගේ හිතට කණගාටුවක් කාන්දු වෙන්න පටන් අරගෙන. අදත් අප්පච්චිගෙ කාමරේට ගිහින් ටිකක් කතා කර කර ඉන්න මම තීරණය කළේ ඊට පස්සෙ.

සුමාලියි සුමුදුයි (සුමුදු කියන්නෙ මගේ දුව. ඇයට දැන් අවුරුදු 10යි) ගෙදරින් ගියේ තමන් ආපු නිසා කියලයි අප්පච්චි හිතන්නෙ. මට ඕන වුණේ ඒක එහෙම නෙමේ කියලා අප්පච්චිට ඒත්තු ගන්වන්න.

මම කාමරයට ඇතුළුවෙන විට ඇඳේ උඩු බැලිව වැතිර සිටි අප්පච්චි හිස හරවලා මගේ දිහා බැලුවා. අප්පච්චිගෙ ඇස් වලින් කඳුළු පීරක් වැහෙනවා.

අප්පච්චි හිතන්නෙ සුමාලියි දූවයි ගෙදරින් ගියේ අප්පච්චි හින්දා කියලා ද? නැහැ. ඒ දෙන්නා මාව දාලා යන්න හැදුවෙ අප්පච්චි එන්නත් කලින් ඇදලා. ඒ ගොල්ලන්ට මගේ විකාර ඇති වෙලාලු හිටියෙ. එදා අප්පච්චි ආව දවසෙ රැම ගිය එක නම් මට වාවන්නෙ නැහැ තමයි.

මම ඇඳ ළඟම තිබුණ පුටුවෙ වාඩිවුණේ ඉකියක් මටත් නොදැනීම මගේ පපුව ඇතුළෙ මෝදු වෙමින් තිබුණ හින්දයි. අප්පච්චි වචනයක්වත් නොකියා මා දෙස බලාගෙන හිටියා.

නැහැ පුතා සුමාලි දූව මට කොච්චර ආදරේද කියලා මම දන්නවා. ඒ අය ගියේ මං ආපු හින්දා නොවෙයි කියලත් මම දන්නවා.

අප්පච්චි එහෙම කටක් ඇරලා කිව්වෙ නැහැ තමයි. හැබැයි අර කඳුළුවල ඒක ලියවිලා තිබුණා. සුදුම සුදුවට පැසුන මවිල් ගැවසුන අප්පච්චිගෙ කෙඬෑරි දකුණු අත පපුව හරහා වැටිලා. මම ඒ අත අල්ල ගන්න මගේ අතක් දිගුකළා. ඒත් එක්කම මා තුළ ඇතිවුණේ පිළිකුලක්. අප්පච්චි වෙතින් මොකක්දෝ කුණුගඳක් හමනවා. මම එක පාරටම අත ආපහු ඇදලා ගත්තා. අප්පච්චි උපහාසය තොලේ දිවේ නොගැවි හිනාවුණා.

උඹට මාව කැත හිතුනා නේද?

අප්පච්චිගෙ උගුරෙන් පිටවෙන්නෙ ගොර ගොර හඬක්.

මගේ අප්පච්චි තවමත් ඉස්සර අප්පච්චිම තමයි. මම මොකක් හරි හිතන පරක්කුවෙන් එයා ඒක දැනගෙන

ඉවරයි. මට ඒක හින්දාම තමයි අප්පච්චිව පේන්න බැරිව ගියේ. කොයි වෙලාවකවත් අප්පච්චි නොවෙයි මට ඔහුව පහු කරගෙන යන්න ඉඩ දුන්නෙ. මම කරපු හැමදේම අසාර්ථක වෙන කොට අප්පච්චි මට බැන්නෙ නැහැ. මගේ ළඟින් යන ගමන් මෙහෙම කියාගෙන යනවා.

මම මුල ඉඳලාම දැනගෙන හිටියා ඕක ඔහොම වෙන බව.

අප්පච්චි!

මගේ පැත්තට නැමී තිබුන මගේ අත මම අප්පච්චි වෙත දිගු කර ඔහුගේ අත් දණ්ඩ තද කර ගත්තා. දැන් අර කුණු ගඳ නැහැ. අප්පච්චි ගාවින් එන්නෙ අර ඉස්සර වගේම අරක්කු ගඳ සමඟ මුසුවුන දහදිය සුවඳමයි.

අප්පච්චි මට සමාවෙන්න. මම අප්පච්චිට කොච්චර වැරදි කරලා තියෙනවද? මතකද? මේක සිද්ධ වුණේ හුඟක් ඉස්සර. අප්පච්චි අර මාව කච්චේරියට එක්ක ගියේ. මම හිතන්නෙ මම එතකොට උසස් පෙළ.

මම හිතින් කියපු දේ අප්පච්චිට ඇහුනා. ඔහු හිස පසෙක ට හරවලා මා දෙස තියුණු බැල්මක් හෙළුවෙ ඒක කියන්න එපා කියනවා වගේ. ඒත් අප්පච්චි ඒක මම කියන්නම ඕනෑ. සුමාලිවත් සුමුදුවත් ගෙදර නැති අතර මේ ඔක්කොම මට ආපහු අප්පච්චි ට කියන්න පිළිවන්. ඒවා රහස් අප්පච්චි. මම ඒක සුමාලිටවත් කියලා නැහැ. කොහොම කියන්නද? මම ගැන ඇත්ත හරියට සුමාලි දන්නවා නම් එයා මාව ආලා යන්නෙ මීට කලින්. සුමාලි කියන්නෙ අප්පච්චි මිනිහෙකුට දාහකින් හොයා ගන්න බැරි ගැහැනියක්. මම මේ කියන්න යන කතාව තවම

සුමාලි නොදන්නවා වුනාට ඒක මගේ වයස ඉක්මවා ගිය හපන්කමක් කියලා කෙනෙකුට හිතෙන්න බැරි නැහැ.

අප්පච්චි ඒ කාලෙ කුරුණෑගල කච්චේරියෙ ලිපිකරුවෙක්. එයාගෙ අරක්කු බීම හැම තැනම ප්‍රසිද්ධයි. දවල්වෙන කොට අප්පච්චි හොයා ගන්න නම් එයාගෙ ආසනේ හොයලා වැඩක් නැහැ. එයා ඒ වෙලාවට නිවැරදිවම ඉන්නෙ පැරමවුන්ට් හෝටලයේ කාමරයක, අරක්කු භාගයක් ඉස්සරහ. උදේට අවදි වුණාම අරක්කු කාලක් බඩට නොවැටුණොත් අප්පච්චිගෙ අතපය වලංගු නැහැ. ටික කාලයක් යද්දි අප්පච්චිගෙ අතපය වෙව්ලීම නවත්තන්න අරක්කු කාලෙත් බැරිවුණා. මේකෙන් වුණේ කච්චේරියෙ අප්පච්චිට පැවරෙන රාජකාරි අතපසු වී යාම.

දවසක් උදේක අප්පච්චි මට කතා කළා. ඒ පාසල් නිවාඩු කාලයක්.

නිස්සංක උඹට බැරිද පුතේ මාත් එක්ක අද කච්චේරියට යන්න එන්න. එතන වැඩ වගයක් තියෙනවා මේ අත වෙව්ලිල්ල හින්දා අතපසු වෙච්ච. ඒවා ලියවාගන්න පියන්ලාගෙ පුකට වැඳලා දැන් මට ඇතිවෙලා. උන් අපට සැලකුවෙ ඉස්සර.

අප්පච්චි සමග කොහොමටත් මගේ වැඩි කතාබහක් නැහැ. ඔහු ගෙදර එන්නෙ හතර ගාතෙන් රෑ මැදියමෙ. මම කවදාවත් අප්පච්චි ගෙදර එන වෙලාවට එළියට එන්නෙ නැහැ. හැබැයි මගෙ මල්ලි නම් අප්පච්චි එනකම් ඇහැරගෙන බලාගෙන ඉන්නවා. මිනිහා තවම නවය පන්තියෙ. නැත්නම් අප්පච්චි මට කන් කෙඳිරි නොගා මල්ලිව එක්ක යනවා කච්චේරියට.

මාව කච්චේරි එක්ක යන යෝජනාව අප්පච්චි පළමුව ඉදිරිපත් කරලා තිබුණේ අම්මාට. අප්පච්චි අද උදේ ඒක කියනකොටත් අම්මා ඒ ගැන මට කතා කරලයි තිබුණේ.

හෙට අප්පච්චි කච්චේරි යන්න කතා කළොත් පුතා යන්න. හැබැයි කව්රුත් එක්ක වැඩිය හජනෙට යන්න එපා. උඹ එතන බේගල් ඇද බාල අප්පච්චිගෙ නමත් කැත කරයි.

බේබද්දෙකුට තවත් කැත වෙන්න නමක් ඉතුරු වෙලා තියෙනවාද? අර බේගල් කතාව මටම ආවේණික දෙයක්. මම කට ඇරියොත් කියන්නෙ බේගලයක් බව හැම තැනම ප්‍රසිද්ධයි. ඒක වෙන්නෙ මෙහෙමයි. මම හුඟාක් වෙලාවට මාවම අලුතින් නිර්මාණය කරනවා. දුර නෑදෑයින් අතර මම කොළඹ ලොකු පාසලකට යන හැමදාම පන්තියෙ පළමුවෙනියා වෙන හැදිච්ච දරුවෙක්. පියා බේබද්දෙක් වුනා ට දරුවා හොඳ හැදිච්ච එකෙක්.

බේබදුකම යට කර ගත්ත හපන්කම් අපේ අප්පච්චිට තිබුණා. ගමේ හැම සමිති සමාගමකම කථිකයා වුණේ අප්පච්චි. පන්සලේ සල්පිලේ මල්වට්ටිය වෙන්දේසි කරන අප්පච්චිගෙ කට අහල ගම් හතක රැව් දුන්නා. ගම් පළාතේ කවි මඩුවල අප්පච්චි ප්‍රසිද්ධ හිටිවන කවියෙක්. බාග විට මම මේ අරගෙන යන්නෙ අප්පච්චිගෙ උරුමය වෙන්න ඇති. ඒත් ඔහු මම වාගෙ බේගල් ඇද බැවෙ නැහැ. අප්පච්චි කියන විදියට මම බැරන් මුන්චවුසෙන්ගෙ පරම්පරාවෙ කෙනෙක්. මගේ පිරිහීමේ සලකුණ තමයි ඒ.

අප්පච්චි මාව කච්චේරියට එක්ක ගිහින් කෙළවරක තිබුණ මේසයක වාඩි කෙරෙව්වා. ඊළඟට රිසිට් පොත් ගොඩකුයි ලේජර් පොතකුයි මගේ ඉස්සරහින් තිබ්බා.

උඹට කරන්න තියෙන්නෙ පොඩි වැඩක්. මේ රිසිට් ඔක්කොම අක්කර බදු අය කරපුවා. මේකෙ තියෙන විස්තර මේ ලේජර් එකට ගන්න එකයි. හරියට ගණන් හිලව් ඒ කොටුවල වැටෙන්න ඕන. මම පැය භාගෙන් එනවා.

අප්පච්චි ඒ පොත් මගේ ළඟට තල්ලු කරලා අතුරුදහන් වුණා. අප්පච්චි ගියේ කොහේ ද කියන්න මම දන්නවා. අර පොත් ටික මගෙ ගාවට ළං කරද්දිත් ඇඟිලි වෙව්លුවා. මම ලෙජරයේ මුල හරිය පෙරලලා බැලුවා. අප්පච්චිගේ රවුම් ලොකු අකුරු තමයි වැඩි හරියක්. මට හිතුනා මේවා ඔක්කොම විසි කරලා දමලා ගෙදර යන්න.

අප්පච්චි එක පාරට ම මගේ අත ගසලා දැම්මා.

උඹ මගේ බීම ගැන මහ ලොකුවට කතා කළාට එදා උඹ කන්තෝරුවෙදි කළේ මොකක්ද? උඹ මොනවද ගිහින් මිනිස්සුත් එක්ක කියලා තිබුණේ.

අප්පච්චි පරලය වෙලා වගේ අහනවා.

ඇත්ත. අප්පච්චි ඒ අය මාව වට කරගෙන විස්තර අහනකොට මම කිව්ව මං ඉන්නෙ විශ්ව විද්‍යාලෙ කියලා. මේ නිවාඩුවට ආපු ගමන්. මේ දවස්වල මම කුරුණෑගල ජන ශ්‍රැති ගැන පර්යේෂණයක් කරනවා කියලත් කිව්වා. උන් කට ඇරගෙන අහගෙන හිටියා. මට හිතුනා තාම මම ඉස්කෝලෙ යනවා කිව්වා නම් උන් මාව පඬෙකට ගනන් ගන්නෙ නැතිවෙයි කියලා.

අප්පච්චිගෙ උගුරෙන් ගොර ගොර හඬක් නිකුත් වුණා.

උඹ හිතනවාද උන් ඒවා විශ්වාස කළා කියලා. පහුවදා මම කන්තෝරුවට අඩිය තියනකොටම එකෙක් ඇහුවා පුතා ආපසු කැම්පස් ගියාද කියලා. මට හොඳටම තේරුණා උන් ඒක ඇහුවෙ ඔලොක්කුවට කියලා. උඹ දන්නවා ද උන් කැන්ටිමේ කතා වෙච්ච දේවල්. අප්පච්චි බේබද්ද. පුතා බේගලය. මට කිව්වෙ කැන්ටිමේ වැඩ කරන හේතුහාමි. මං උන් එක්ක රණ්ඩු වුණා. මම කිව්වා ඔව් යකෝ මගෙ එකා කැම්පස් එකේ තමයි තොපි ඉරිසියාවෙ පැලෙනවා.

මම එක පාරටම අප්පච්චිගෙ අත අතහැරියා. ආයෙමත් අප්පච්චි වෙතින් අර කුණු ගඳ එනවා. මට කාමරේ ඉන්න බැරි තරම්. මම අප්පච්චිගෙ කාමරෙන් එළියට පැන්නෙ දුව ගෙන වාගේ. මගේ කාමරයේ ඇඳ උඩ වැටුනට මට නින්ද යන්නෙ නැති බව පැහැදිලියි. හැබැයි දැන් අප්පච්චිගෙ කිසිම හඬක් නැහැ. මුළු ගේම මළ සොහොන් පිටියක් වගේ නිශ්ශබ්දයි.

අප්පච්චි... අර ඉස්සර වෙලා වගේ කහින්නකො. හොටු සූරන්න. උගුර පාදන්න. අඬන්න. පඩින්න. ඔය මොනවා හරි සද්දයක් කරන්නකො. අප්පච්චි ඔහොම නිශ්ශබ්දව වගේ වගක් නැතුව ඉන්නකොට මට නින්ද යන්නෙ නැහැ. මොනවා හරි සද්දයක් කරන්න අප්පච්චි, මට නින්ද යනකං.

ඉස්තෝප්පුවෙ හැමදාමත් ලගින දික් සඟලා හාන්සි පුටුවට ගුලිවෙලා මම මිදුලෙ එක සාවියට රැස්කන අඟුරු කැටි දිහා ඔහේ බලාගෙන හිටියා. සුමාලියි සුමුදුයි සාලෙ සැටියක වාඩි වෙලා රූපවාහිනිය නරඹනවා. වරින් වර සුමුදු දොර රෙද්ද මෑත් කරලා මං දිහා හොර බැලුම් හෙලලා ආපහු යනවා. මං හිතන්නෙ සුමාලි සුමුදුට කියනවා ඇති මං මොකද කරන්නෙ කියලා බලන්න.

මට ඉවසන්නට බැරි ඒ දෙන්නාගෙ ඔය හෙවිල්ල. නාන කාමරේට ගියත් දෙන්නගෙන් එක් කෙනෙක් ඔත්තු බලනවා. නාන කාමරේ කියන්නෙ මිනිහෙකුගෙ නිදහස උපරිමයට විඳින තැන. ඒකට තව කෙනෙකුට ප්‍රවේශයක් තියෙන්න බැහැ. මම ටිකක් පරක්කු වුනොත් සුමුදු දොරට ගහනවා.

තාත්ති මොකද පරක්කු? ඔයා මොකද ඕක ඇතුළේ කරන්නෙ?

මම යක්ෂාරූඪව වගේ නාන කාමරේ දොර දඩස් ගාලා අරිනවා. මගේ ඇගේ ඇඳුමක්වත් නැහැ. අම්මී. සුමුදු මර හඬ දීගෙන දුවනවා.

අම්මි තාත්තිගෙ පිස්සුව වැඩිවෙලා.

සුමුදු මහ හයියෙන් කතා කරනකොට සුමාලි එයාගෙ කට මිරිකනවා.

කෑ ගහන්න එපා සුමුදු... අහල පහල ගෙවල් තියෙනවා.

අම්මයි දුවයි හිතන්නෙ මට පිස්සු කියලා. සුමුදුගෙ ඔළුවට ඔය අදහස් එන්නත් කරන්නෙ සුමාලිම තමයි. මම දුරකථන ඇමතුමක් ගන්න වෙලාවට ඒ අහල පහල මොනවා හරි වැඩක් සුමාලි හොයා ගන්නවා. මම දන්නවා සුමාලි මම කියන දේවල් අහගෙන ඉන්න බව. අහගෙන හිටියත් කමක් නැහැ මට ඉවසන්නම බැරි ඇමතුම ඉවර වෙන කොටම ඒ ගැන විවේචන එල්ලවෙන එකයි.

කා එක්කද ඔච්චර වෙලා කටු කුටු ගෑවෙ? ඇයි මට ඇහෙයි කියල ද ඔච්චර හිමින් කතා කරන්නෙ?

බැරි වෙලාවත් මම ටිකක් හයියෙන් කතා කරලා තිබුණොත් විවේචනය ඊට වෙනස්.

ඇයි අනේ ඔයාට ෆෝන් එකෙන් කතා කරන වෙලාවට ටිකක් හිමින් කතා කරන්න බැරි. ඔච්චර හයියෙන් කතා කරනවා නං ටෙලිෆෝන් ඕනෙ නැහැ. අනිත් පැත්තෙ ඉන්න කෙනාටත් නිකම්ම ඇහෙන තරම්. අනිත් එක ඔයා ඔය ටෙලිෆෝන් එකෙන් මොනවද කියවන විකාර!

මම මේවා සේරම බාර ගන්නෙ සුමාලි මම ගැන නිතර සෙවිල්ලෙන් සිටින කීකරු බිරිඳකගේ හැසිරීමක් විදියට. ඇත්තට ම සුමාලි මම ගැන සෙවිල්ලෙන් ඉන්නවා තමයි. මගේ නෑම, කෑම, ඇදීම, නිදා ගැනීම මේ හැමදේම සිදුවුණේ සුමාලිට අවශ්‍ය විදියට.

ඒ වුණාට සුමාලි සමඟ ගත කරන ජීවිතය අසම්පූර්ණයි. රෑ මැදියම වෙනකම් පරිගණකයේ චිත්‍රපට බලන්න මම ඇබ්බැහි වුණේ නිරායාසයෙන්.

මේ කල්පනාවල් මැද්දෙ මම දැක්කා ගේට්ටුව ක්‍රමයෙන් ඇතුළට ඇරිලා අඳුර අතරින් කාගේදෝ රුවක් මතු වෙනවා. ගෙයි පැති වැරැන්ඩාවෙ එළිය යාන්තමට මිදුලට වැටිලා. සුදු පාට ඇඳ ගත්ත උස මනුස්සයෙක් ගේ දිහාවට ගාටනවා.

අප්පච්චි!

මම පුටුවෙන් නැගිටලා ටිකක් ඉස්සරහට ගියා.

සුමාලි, අප්පච්චි එනවා.

මම සාලෙට කර පොවා කෑ ගැහුවා. මම හොඳටම දැක්කා අම්මයි දුවයි මූනෙන් මූන බලා ගන්නවා. අප්පච්චි ළඟ ළඟම එනවා.

එන්න අප්පච්චි.

මම අප්පච්චිව පිළි අරගෙන ගේ ඇතුළට එක්කගෙන ගියා. සුමාලියි දුවයි සාලෙන් අතුරුදහන් වෙලා. සුමාලිට ඔය තරම්ම අප්පච්චිව පේන්න බැරුව ගියේ ඇයි? දෙන්නම අප්පච්චිව මග ඇරලා කාමරේට රිංගා ගන්න ඇති. මම අප්පච්චිගෙ අතකින් අල්ලගෙන සාලය මැදින් රැගෙන ගියා. අප්පච්චි අපේ ගෙදර ආවම නිඳා ගන්නෙ පැන්ට්‍රියට යාබදව ම තියෙන කෙළවරේ කාමරේ. මම අප්පච්චිව අතින් අල්ලගෙන කාමරේට එක්ක ගියා.

අප්පච්චි ඇඳුම මාරු කර ගන්නකො. මම සුමාලිට කතා කරන්නම්.

අප්පච්චි අද වැඩි කතා බහක් නැහැ. මම අප්පච්චි කාමරේ සිටියදීම එළියට එනවා. මම දැක්කා සුමාලි රෙදි බෑගයකුත් අරගෙන සාලයේ ඉන්නවා. සුමුදු තව පොඩි රෙදි බෑගයක් අරගෙන එයාගෙ කාමරෙන් එළියට එනවා.

ඇයි දෙන්නා එක්ක කොහේ යන්නද? අප්පච්චි ගෙට අඩිය ගැහුවා විතරයි ඔය දෙන්න රොන්දෙ යන්නද හදන්නෙ?

මම සැරෙන් ඇහුවා. සුමාලිගෙ මුහුණට නැගුණෙ උපහාසය ඉහින් කනින් වැගිරෙන විදියෙ හිනාවක්.

ඔයාගෙ ඔය අප්පච්චි මේ ගෙදරින් යනකං අපි එන්නෙ නැහැ.

මම යක්ෂාරූඪව සුමුදු දෙසට පැන්නා.

කෝ. මෙහෙ දෙනවා ඔය බෑග් එක. එකෙක් හෙලවෙන්නෙ නැහැ ගෙදරින්. යකෝ මේක මළ සමයමක්නෙ. ඇයි තමුසෙලට මගෙ අප්පච්චි ඔය තරම් පිළිකුල්. යකෝ ඒ මනුස්සයා හින්දා තමයි අද මම මේ තත්ත්වයේ ඉන්නෙ.

මම සුමුදු අතේ තිබුණ බෑගය උදුරනවා වෙනුවට ඒ ළඟ තිබුණ පුටුවෙ වාඩි වී ඉකි ගසන්නට පටන් ගත්තා. මගෙ පපුව ඇවිලෙනවා වගේ. මම මුහුණ දෑතෙ ඔබා ගෙන ඔහේ කඳුළු වලට ගලා යන්නට ඉඩ දෙමින් හඬන්නට වුණා.

මම ඔලුව උස්සන කොට අප්පච්චි ආරුක්කු දොරට හේත්තු වෙලා මං දිහා බලාගෙන ඉන්නවා. සුමාලියි සුමුදුයි අතුරුදහන් වෙලා. එතකොට ම ගේට්ටුව දිහාවෙන් ත්‍රී රෝද රියක් සැර ආගෙන පිටත්ව යන ශබ්දය නැගුණා. මම හුන් තැනින් නැගිට්ටා.

යං අප්පච්චි කාමරේට. අපි ඔය තියෙන දෙයක් කාලා නිදා ගනිමු. ගිය උන් ගියා දෙන්. අප්පච්චි ඉන්න හින්දා මට මේ ගෙදර දැන් තනියක් නැහැ.

අන්න ඒ විදියට තමයි අප්පච්චියි මමයි මේ ගෙදර තනිවුණේ. දැන් මේක පිරිමි දෙන්නෙක් විතරක් ඉන්න ගෙදරක්. තවමත් අප්පච්චිට ඉස්සර වගේම හයිය තියෙනවා.

උදේට මම නැගිටලා අප්පච්චිටත් එක්ක උයනවා. අප්පච්චිත් නැගිටලා ඇවිත් හවුල් වෙන වෙලාවල් තියෙනවා. අප්පච්චිට දැන් ඉස්සර වගේ නොවෙයි. ටිකක් එළි වෙනකම් නින්ද යනවා. බාග වෙලාවට මම තේ එකක් හදාගෙන කාමරයට යනකනුත් අප්පච්චි නිදි. මම තේ එක මේසය උඩින් තියලා ආපහු ගිහින් වැඩ ටික ඉවර කරලා (අප්පච්චි තවම නැගිට්ටෙ නැත්නම්) කන්තෝරු යන්න ලෑස්ති වෙලාමයි ආයෙ එන්නෙ. ඒ වෙලාවට අප්පච්චි නැගිටලා එළියට ගිහින් මිදුල අතු ගානවා.

අප්පච්ගෙ කඩිසරකම දිහා මම එක සීරුවට බලාගෙන ඉන්නවා. අප්පච්චි මිදුල අතුගාන හැටි අහළ පහළ අයත් දකිනවා ඇති. දැන් මේ ගෙදර ඉන්නෙ පිරිමි දෙන්නෙක්. සමහර දවස්වල හවසට මම වැඩ ඇරිලා

ගෙදර එන කොට අප්පච්චි මිදුල ශුද්ධ කරනවා. මම ඉක්මනට ඇඳුම් මාරු කරන්නේ අප්පච්චිට උදව් වෙන්න යන්න.

මම ඉතින් අප්පච්චිත් එක්ක හොඳ කයිවාරු කදයක වැටීගෙන මිදුල ශුද්ධ කරන කොට අල්ලපු ගෙදර හිල්ඩ ගෑනි ජනේලෙන් බලාගෙන ඉන්නවා. මට පේන්න බැහැ ඔය ගෑනිව. අප්පච්චි ආ දවස ඉඳලාම කුරුමානම් අල්ලගෙන මොනවාදෝ හොයනවා. මං දැක්කා මම අප්පච්චිට මොනවද කියලා හිනාවෙන කොට කම්මුලේ අත ගහගෙන බලාගෙන ඉන්නවා. ඊට ටිකකට පස්සෙ මම දැක්කා ජනේලෙ එල්ලීගෙන මුළු ගෙදරම අය අපි දිහා බලාගෙන ඉන්න හැටි.

යන් අප්පච්චි ගෙට. මුන් මේ වයසක පිරිමියෙක්ව දැකලා නැද්ද කොහෙද?

මං ටිකක් හයියෙන් කියලා අප්පච්චි එක්ක ගේ ඇතුළට ගියා. සමහර දවස්වලට මම අප්පච්චිත් එක්ක හැන්දෑවට ටිකක් ඇවිදින්න යනවා. පාර දිගේ අපි කතා කර කර යන එක නම් අහල පහල උන්ට කටු අනිනවා වගේ. මං දන්නවා උන් ජනේල අස්සෙන් දොර අස්සෙන් හොර රහසේ බලාගෙන ඉන්න බව. අපි වගේ වගක් නැතුව පාර දිගට යනවා. ආපහු එන්නෙ හොඳටම බිං කරුවල වැටුනම. එතකොට උන් ගෙවල් ඇතුළෙ රූපවාහිනී ඉස්සරහ වහ වැටිලා. අපි ගෙට වැදිලා දොර වහ ගන්නවා.

දවසක් මම අප්පච්චිට මිදුලෙ බැඩ්මින්ටන් ගහන්න කතා කළා. ඉස්සර මං සුමුදු එක්ක හවසට ටිකක් එහෙම

සෙල්ලම් කරනවා. සමහර වෙලාවට සුමුදු පරාද වුනාම මං එක්ක රණ්ඩුවට එනවා. ඒ මම කොලොප්පම් කරන හින්දා.

අප්පච්චි ගත් කටටම කිව්වෙ ඔය නවීන සෙල්ලම් බැහැ කියලා. ඒ දවස්වල වොලිබෝල් ගහද්දි නම් අප්පච්චි ඩෑෂ් පහරවල් ගහන්න කප්පිත්තා කියලා පුරාජේරුවකුත් දෙඩුවා. කොහොම හරි අප්පච්චි බැඩ්මින්ටන් සෙල්ලමට ආවා.

මම අප්පච්චිත් එක්ක එක සීරුවට බැඩ්මින්ටන් ගහද්දි අපේ ගේ හතර වටේ ඉන්න කොලු රැළ තාප්පය දිගට එල්ලීගෙන බලාගෙන හිටියා. මට අල්ලන්නෙ නැත්තෙ උන්ගෙ හූව. අප්පච්චිට අමාරු වෙන කොට මම හුරේ දානවා. එතකොට හූ කියන්නෙ. අහල පහල කොලු රැළ විතරක් නොවෙයි උන්ගෙ මහ උන් ටිකත් අපි දිහා බලාගෙන.

අපි උන් ගැන වගේ වගක් නැතුව බිං කරුවල වැටෙනකම්ම සෙල්ලම් කරලා ගෙට ගියා. පහුවදා උදේම සුමාලි ආවා. උදේම කියන්නෙ පාන්දරම. මහ කලබලේකින් ගෙට ඇතුළු වුණේ.

මොනවද නිසා මේ කරන කෝලං. ඊයේ ඔයා බැඩ්මින්ටන් ගහපු හැටි හිල්ඩ මට ටෙලිෆෝන් කරලා කිව්වා. මොනවද මේ කරන විකාර?

විකාර! අප්පච්චිත් එක්ක මම ඊයේ බැඩ්මින්ටන් ගැහුවා තමයි. ඒක විකාරයක්ද? ඔය හිල්ඩ ගෑනි තමයි රට ගිනි තියන්නෙ. මට තේරෙන්නෙ නැහැ ඔයාල මොනවද මේ කියන්නෙ කියලා.

සුමාලි මුහුණ අත් දෙකෙන් වහගෙන ඉකි බිඳින්න ගත්තා. හිල්ඩ ගෙට ඇතුළු වුණේ එතකොටමයි. ඒ ගෑනි මොන එකකට මෙතනට කඩා පාත් වුණාද?

ඇයි සුමාලි මහත්තයාව ඩොක්ටර් කෙනෙකුට පෙන්නන්නෙ නැත්තෙ?

මේ කතා අහනකොට මාව ඇවෙන්න වගේ ගත්තා. මුන් තමයි මේ සුමාලිට ඕන නැති කතා කියලා නොමඟ යවන්නෙ.

ඩොක්ටර් කෙනෙකුට... බැහැපිය පරට්ටි එළියට. ඩොක්ටර් කෙනෙකුට පෙන්නන්න මට තියෙන ලෙඩේ මොකක්ද? සුමාලි ඇයි ඔයත් ගිය මළ දානෙක ඉන්නෙ නැතුව ආපහු ආවෙ? මම අප්පච්චිත් එක්ක බොහොම සතුටින් ඉන්නෙ. මුන්ට පේන්න බැරි ඒක.

මම ගිනි පිටවෙන ඇසින් හිල්ඩ දිහා බැලුවා. ඇය ඉක්මනට නැගිටලා දුවගෙන වගේ පිටවෙලා ගියා. සුමාලි තව ටිකක් වෙලා අඬ අඬ ඉඳලා පිටවෙලා ගියේ මෙහෙම කියාගෙන.

නිස්සංක ඔයා පරෙස්සමෙන් ඉන්න.

සුමාලි ගිය වහාම මම අප්පච්චිගෙ කාමරේ දිහාවට පිය මැන්නා. කාමරේ හිස්.

අප්පච්චි... අප්පච්චි... කොහෙද ගියේ?

මම බෙරිහන් දුන්නා. සුමාලි කිව්ව දේවල් අප්පච්චි අහගෙන ඉන්න ඇති. සේරටම වැඩිය අර සක්කර වට්ටම හිල්ඩා. ඒ ගෑනිගෙ කට ඇති ඕන මිනිහෙකුට ගිනියම් වෙන්න. අප්පච්චි පස්ස දොරෙන්ම

පිටවෙලා ගියාවත්ද? නැහැ. එහෙම වෙන්න බැහැ. මේ ගෙදරට එන කෙනෙක් පිටවෙලා යන්න ඕන ඉස්සරහ ගේට්ටුවෙන්මයි. අප්පච්චිගෙ හිත රිදෙන්න ඇති. ඒකයි එළියට ගිහින් තියෙන්නෙ.

එතකොට ම අප්පච්චි ඈත කොරිඩෝරයේ කෙළවරින් මතු වුණා. උසට උසේ සුදු ඇඳගෙන. එදා ගෙදරට ආවා වගේම. එහෙනම් අප්පච්චි යන්නද? මේකෙ ඉන්න එකාලගෙ කටවල් වැහෙයි අප්පච්චි ගියාම.

යන්න එපා අප්පච්චි මට පාලුයි. මම හඬා වැටුණා.

අප්පච්චි ගියේ නැහැ. එදා සුමාලි ඇවිත් ගිය දවසෙ අප්පච්චිත් මමත් රෑ එළිවෙනකං කතා කළා. මෙච්චර කාලයක් මට අප්පච්චිගෙන් අහන්න බැරිව හිටපු හුඟාක් දේවල් මම අප්පච්චිගෙන් ඇහුවා මම හිතන්නෙ ඔහු ඒවට නොපැකිලිව උත්තර දුන්නා. සමහර කාරණා ඔහු මට පැහැදිලි කළේ මම ඔහුගේ පුතා බව නොතකමින්. අප්පච්චි කොහොමටත් ටිකක් ලිබරල් මනුස්සයා.

අප්පච්චි පවුල් දෙකක් නඩත්තු කරපු කෙනෙක්. සල්ලාලකම කියන දේ ඒ අයගෙ පවුල්වල අනන්‍ය ලක්ෂණයක්. අප්පච්චිගෙත් අප්පච්චි එක ගෙදරම ගෑනු දෙන්නෙක් තියාගෙන ඉඳලා තියෙනවා. අක්කයි නංගියි. අක්කට පළමු ළමයා ලැබෙන්න යද්දී ගෙදරට උදව්වට ආව නංගිවත් සහේට අරගෙන.

අපේ අප්පච්චිගෙ දෙවන පවුල හිටියෙ අපට ඒ තරම් ඈතක නෙවෙයි. ඒ පවුලෙ දරුවො තුන් දෙනයි. පිරිමි දෙන්නෙක් සහ දැරියක්. ඒ අය නිතර අපේ ගෙදර එනවා. ඔවුන් අපේ අම්මාට අම්මා කියලා කතා කරද්දි අපටවත් අම්මාටවත් අමුත්තක් දැනුණේ නැහැ. ඇත්තටම අම්මා ඒ දරුවන් තමන්ගෙ දරුවන් හැටියට බාර ගත්තා. ඔවුන් අපේ අම්මාට අම්මා කිව්වට අපි ඒ අයගේ අම්මාට

කිව්වෙ පුංචි අම්මා කියලයි. ඇත්තටම නම් පුංචි අම්මා අපේ අම්මා විතර ලස්සනත් නැහැ.

අප්පච්චිට කොහොමද පුංචි අම්මා හම්බ වුණේ?

අප්පච්චිගේ මුහුණ හඳ පායලා වගේ එළිය වුණා. කසට දත් පෙන්නලා හිනාවුණ අප්පච්චි අතකුත් දික් කරලා මගේ අතක් අල්ල ගත්තා.

ඇත්තම කියනවා නම් ඒ ගැනි උඹේ අම්මාට වැඩියෙන් මට කරුණාවෙන් හිටියා.

මම ඇහුවෙ අප්පච්චිට පුංචි අම්මා හම්බවුණේ කොහොමද කියලා.

අප්පච්චි එක පාරටම ඇඳෙන් බිමට පැන්නා. ඔහුගේ මිට මෙල වූ දකුණු අත වම් ඉන ළඟ රැදිලා තිබුණේ හරියට කඩුපතක මිටක් අල්ලගෙන වගේ. අප්පච්චි කාමරේ වටයක් කැරකුනා.

ඒ කාලෙ මම නාට්‍යකාරයා. මීගමුව ජයමාන්න නාට්‍ය ජනප්‍රිය වෙච්ච කාලෙනෙ. උඹට මතකනෙ අර ඩැනී වේලර් බාස් උන්නැහේ. එතකොට ආබ ගුරුන්නාන්සේ. (ආබා කියන්නෙ මස් පරුවතයක්) උන් තමයි අපේ නළුවො. හැබැයි උන් හැබෑ නළුවො. මම තමයි නාට්‍ය ලිව්වෙ. අපේ නාට්‍ය ජනප්‍රිය වුණා. අපි රට පුරාම ගියා නාට්‍ය පෙන්නගෙන. අපට හිටියෙ නැත්තෙ නිළියො තමයි. නිළියො ගත්තෙ පිට පළාත්වලින්. උඹලගෙ ඔය පුංචි අම්මත් එහෙම නිළියක් තමයි.

ඉතින් පුංචි අම්ම නිළියක් වගේ ලස්සනයැ!

Scanned by CamS

මට කියවුනා. අප්පච්චි දිග කල්පනාවකට වැටුණා. මගේ වචන වලින් හිත රිදෙන්න ඇති.

ඒ වුණාට ඒකිගෙ හිත ලස්සනයි.

අප්පච්චිගෙ මුහුණ ආයෙමත් එළිය වුණා.

ඒ කාලෙ අපේ නාට්‍ය කණ්ඩායම වාරයක් ගියා තුඩැල්ලෙ නාට්‍යයක් පෙන්නන්න. තුඩැල්ල කියන්නෙ එපා කරපු ගමක්. උන් නාට්‍ය බලන්න එන්නෙ අඩියක් විතර දිග උණ බම්බු කෑලිත් අරගෙන. ඒ බම්බු වලට කට තියලා උන් පටන් ගන්න හූව නවතින එකක් නොවේ. තුඩැල්ලෙ නාට්‍යයක් පෙන්නනවා කියන්නෙ මරු කටින් එගොඩ වෙනවා වගේ වැඩක්.

මට මතක හැටියට මම ලියලා තිබුණේ ලක්ෂ හතරෙ මංකොල්ලෙ කතාව. ඒකෙ ජෝන් සිල්වාගෙ චරිතෙ රඟපෑවෙත් මම මයි. උඹලාගෙ ඔය පුංචි අම්මාත් ඔය නාට්‍යයේ සුළු කොටසක් රඟ පෑවා. එදා අපි තුඩැල්ලට ගියේ හැන්දෑවටත් කලින්. ස්ටේජ් එක හදලා තිබුණේ විශාල පිට්ටනියක කෙළවර. ජෙනරේටරයකින් නිපදවුන විදුලියෙන් පළාතම එළිය වුණා. රෑ වෙනකොට පිට්ටනිය උතුරන තරම් සෙනඟ.

නාට්‍ය සංදර්ශනය ආරම්භ කරන්න දැන් වෙලාව හරි. ඒත් පිට්ටනියෙ හතර අතින් හූව ඇරඹුනා. එක පාරක් තිරය ඇරියත් එක්ක. හූව වැඩිවුණා. ඉක්මනට තිරේ වැහුවා. තව ටිකකින් ගල් මුල් එන්න කලින් කරන දෙයක් කරන්න ඕන. මම නාට්‍යයට ඇඳගෙන හිටපු ඇඳුම්වලට උඩින් ලොකු කබායක් දාගෙන තිරය මෑත් කරලා වේදිකාව ඉදිරිපසට ගියා. හූව දිගටම තීව්‍රව

නැගුනා. කිසි දෙයක් නොකියා මම සෙනඟ දෙස ඔහේ බලාගෙන හිටියා. කල්පයක් ගතවුණා. එක පාරට ම එකෙක් මහ හයියෙන් කෑ ගහලා මෙහෙම කිව්වා.

නවත්තපියව් බලන්න ඕක ටිකකට. මේකා මොකක්ද කියන්න යන්නෙ බලන්න.

හූව නතර වුණා හැම තැනම හරියට බෝවෙන රෝගයක් වගේ නිශ්ශබ්දතාව පැතිරුනා. කව්රුවත් කතාවක් නැහැ. මම මිනිස්සු දිහා ටික වෙලාවක් බලා හිටියා. උඹ හිතපන් මම කරන්න ඇත්තෙ මොකක් කියලාද? ඒ කාලෙ මම කොහොමටත් කතාවට දස්සය. ඒත් මං කතා කරන්න ගියේ නැහැ.

මම කළේ පපුව පිරෙන්න ලොකු හුස්මක් ඉහළට ගත්ත එක. ඊළඟට තමයි මම හැකි තරම් උච්ච ස්වරයෙන් දිග හූවක් කියන්න පටන් ගත්තෙ. මං හිතන්නෙ මගෙ හූව තුඩැල්ල ජා ඇල ගම් පසාරු කරගෙන ගිහින් මීගමුවටත් ඇහෙන්න ඇති. හැමෝම ගල් ගැහිලා බලාගෙන ඉන්නවා. මම හූව නැවැත්තුවා.උන්ට දැන් හූ කියන්න අමතක වෙලා. අන්න එතනින් තමයි මම කතාව පටන් ගත්තෙ.

අප්පච්චි දැන් අතපය දික් කරමින් කතාව පවත්වනවා.

නෝනාවරුනි මහත්වරුනි, ඒ තමයි ඔබතුමන්ලාගේ මනරම් හූවට අපේ ප්‍රතිචාරය. මට ඕනවුණේ තමුසෙලට වැඩිය අපිට හූ කියන්නත් පුලුවන් කියලා පෙන්නන්න. යකෝ හූ කියපියව් නාට්‍ය ඉවරවුනාම ඒක හොඳ නැත්නම්. එතකං මෙතන

ඉන්න එක නරියෙක් ආයෙ හූ කිව්වොත් මම නාට්‍ය නිෂ්පාදක බෝධිපාල කියන්න එපා.

උඹ විශ්වාස කරපං. එකෙක් නෙමේ ඊට පස්සෙ මීක් ගෑවෙ. අපි නාට්‍ය පෙන්නන්න පටන් ගත්තා.

මම රඟපෑවෙ ජෝන් සිල්වටනෙ. ජෝන් සිල්වාව මරන්නෙ කැලේට අරගෙන ගිහින් ගෑස් මුහුණක් දාලා. දැන් මාව ගහක බැඳලා ගෑස් මුහුණ දැම්මා. මට ටික ටික දැනෙනවා මගෙ මුහුණ ඉඳි කටු ඇනෙනවා වගේ මොක්කුද කනවා. කූඹි රොත්තක් මගෙ මුහුණ වහගෙන. ගෑස් මුහුණ ස්ටේජ් එක පිටි පස්සෙ තණකොළ බිස්සේ අනිත් බඩුත් එක්ක දාලා තියෙද්දි කූඹි රොත්තක් ඒකට රිංගගෙන. මට කරන්න කිසි දෙයක් නැහැ. එක්කෝ මම වෙස් මුහුණ ගලවලා දමලා දුවන්න ඕන, නැත්නම් දත් කාගෙන ඒ ජවනිකාව ඉවර වෙනකම් එහෙමම ඉන්න ඕන. ඒ ජවනිකාව ඉවර වෙන්න කල්පයක් ගියා. කූඹි මුහුණ කන එක ඉවසගන්න බැරිව දඟලන කොට ප්‍රේක්ෂකයො විතරක් නෙවෙයි අපේ උනුත් ඒක බාර ගත්තෙ නළුවාගේ ස්වභාවික රඟපෑමක් විදියට. තිරේ වැහෙන කොටම මම වෙස් මුහුණ ගැලෙව්වා. හැමෝටම පෙනුණෙ මම තව වෙස් මුහුණක් දාගෙන වගේ. එතන හිටපු එකියක් මගේ කොරහක් වගේ ඉදිමුන මුහුණ දැකලා හිනාවුණා. කව්ද කෙනෙක් හැලි අරක්කු වීදුරුවක් මට දික් කළා. ඒක තමයි අවුසදය. මම ස්ටේජ් එක පිටිපස්සෙ පැදුරක වැටිගෙන කෑ ගහද්දී ඔය කෙල්ල තමයි එතන දණ ඔබාගෙන මට සාත්තු කළේ. උඹ කිව්වානෙ ඒකි ලස්සන නැහැ කියලා. ඒක ඇත්ත වෙන්නැති. ඉස්සරහ දත් අතර මහ හිඩැසකුත් එක්ක. ඒ වුනාට ඒකි ඇඟට අත තියෙන කොට කරන්ට්

එක වදිනවා වගේ. මට මේවා උඹට ලුණු ඇඹුල් ඇතිව විස්තර කරන්න බැහැ. උඹ මගේ පුතා හින්දා.

අප්පච්චි කතාව නවත්තලා හති දමන්න පටන් ගත්තා. ඊළඟට ඇඳට නැගලා ආයෙමත් ඇලවුණා. අප්පච්චිට දිගට කතා කරලා අමාරුයි. අප්පච්චි අමාරු නං දැන් නිදා ගනිමු. මම ආදරයෙන් කිව්වා.

මට මොන අමාරුවක්ද? මම එළි වෙනකං උනත් කියන්නම්. අපි ජීවිතේ හොඳට විඳලා තියෙනවා. අපි කරපුවයින් එක අරික්කාලක් උඹ කරලා තියෙනවාද? ඒ කාලෙ ඇති පදම් ලස්සන ගෑණු මගේ පස්සෙන් වැටුණා. මගේ කොන්ඩේ ඔය උඹේ කොණ්ඩේ වගේම බොකුටුයි. මම ඉතින් අපේ නාට්‍ය කණ්ඩායමේ හිටිය කඩවසම්ම එකා. උසයි, රතුයි. ඒ වෙන කොට මම වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලෙ ඉගෙන ගෙන ගෙදර ඇවිත් රස්සාවක් නැතුව හිටියෙ. ඔය නාට්‍ය කණ්ඩායම හැදුවෙ ඒ කාලෙනෙ. හැබැයි පුතෝ කොච්චර ගෑණු මගේ පස්සෙන් ආවත් මම නෙමේ ඒ එකෙක් දිහා ඇහැක් ඇරලා බැලුවෙ. ඔය ලක්ෂ්මී (අප්පච්චි ඔය කියන්නෙ පුංචි අම්මා ගැන) විතරයි මගෙ හිතට ඇල්លුවෙ.

මෙහෙම කතා කරගෙන යද්දී මට අප්පච්චි වෙතින් අර පුරුදු කුණු ගඳ දැනෙන්න පටන් ගත්තා. අප්පච්චි මේ නොකියා කියන්නේ මොකක්ද? එයාට තිබුණයි කියන ජවය එයාම වමාරමින් කනවා. එයා ඔය කියන්නෙ එයාගෙ හෙවණැල්ල තුළ හැදුණ වැඩුණ අපට එයාට වගේ සවිබල චරිතයක් ලැබුණේ නැහැ කියන එක. අප තවමත් බෙලහීනයි කියන එක. අප්පච්චිට ඕන කුදයක් ගහ ගන්න කියලා නැගිටලා මගේ කාමරේට යන්න මට හිතුනා.

අප්පච්චි ඔලුව කරකවලා තියුණු ලෙස මා දිහා බැලුවා.

උඹට එහෙම යන්න බැහැ. උඹ ඉන්න ඕන මම ළඟ. මගේ හෙවණැල්ලෙන් මිදෙන්න උඹට බැහැ.

මට පෙන්නන්නම බැරි අප්පච්චි මේ විදියට මගේ හිත කියවන එක. එයා ඉස්සරත් ඔහොමයි. තමන්ගෙ කඩවසමයි, ජවයයි ගැන පුරාජේරු දෙඩුවට දෙවෙනි සහේට ගත්තෙ නාට්‍ය කණ්ඩායමේ හිටපු අවලස්සනම ගැහැනිය. මට මේ ටික අප්පච්චි ට කටක් ඇරලා කියන්න බැහැ.

උඹ හිතනවා ලක්ෂ්මී කැතයි කියලා. ඒකිගෙ පොත්ත රතු නැති බව ඇත්ත. හැබැයි... මට ඒ හරිය උඹට කියන්න බැහැ උඹ මගේ පුතා හින්දා.

කණ්ඩායමේ හිටපු පොත්ත රතු අනිත් ගෑනු පස්සෙන් වැටුනයි කිව්වට උන් එකෙක් අප්පච්චි දිහා ඇහැක් ඇරලා බලන්න නැතුව ඇති.

මොකක්ද යකෝ උඹ හිතුවෙ? උන් විතරක් නොවෙයි පරයො අහලා ගං හතක හිටපු ගෑනුත් මගේ පස්සෙන් ආවා. උඹේ ඔය පොත්ත රතු අම්මත් එහෙම ආපු ගැහැනියක් තමයි. හැබැයි ලක්ෂ්මී මට හම්බ වෙනකොට උඹ බඩේ. නැත්නම් ඒ කැත ගෑනි තමයි උඹේ අම්මා වෙන්නෙ.

අප්පච්චි කතා කරන්නෙ හරියට පරලය වෙලා වගේ. මම අත දික් කරලා අප්පච්චිගේ අතක් ස්පර්ශ කළා. දැන් අර කුණු ගඳ ටිකක් තුනී වෙලා. අප්පච්චි අත

ඈතට ගත්තා. මම අප්පච්චි දිහාවට නැමිලා ඒ අත තද කරලා අල්ල ගත්තා.

අප්පච්චි මට රහසක් තියෙනවා අප්පච්චි එක්ක කියන්න.

රහසක්?

ඔව් රහසක්. ඒක කිසි කෙනෙක් දන්නෙ නැති රහසක්. අප්පච්චිට හැර ඒක කියන්න වෙන කෙනෙක් නැහැ මට.

හෙට කියපන්. හෙටත් මේ වෙලාවට ම මගේ කාමරේට වරෙන්. උඹ ඕක ඇත්තට ම මා එක්ක කියනවද කියලා කල්පනා කරන්න හෙට වෙනකං වෙලාව තියෙනවා. රහස් කියන ඒවා එහෙම එක පාරටම වමාරන්න හොඳ නැහැ මිනිහො.

මම තෝන්තු වුණා. අප්පච්චි කියන කතාව ඇත්ත. හැම තිස්සෙම මම අප්පච්චිට පරාදයි. අප්පච්චි දෙන අවවාදයකට, උපදෙසකට මගේ සිතිවිලි යට වෙනවා. හැබැයි කොච්චර කල්පනා කළත් මේ රහස කා සමඟ හෝ මම කියන්න ඕන. අර උමංදාවෙ කාවින්දය එයාගෙ රහස් කිව්වෙ පුත්‍රයාට. මගේ රහස් මම කියන්නෙ අප්පච්චිට.

පහුවදා අප්පච්චි මා එක්කම කන්තෝරු ගියා. මම උදේ නැගිට්ට ගමන් අප්පච්චි ට කිව්වා අද මාත් එක්ක කන්තෝරු යන්න සූදානම් වෙන්න කියලා. අප්පච්චි ට තනියම ගෙදර ඉන්න එක දැන් ඇතිවෙලා ඇති. ඒ කාලෙ අප්පච්චි එයාගෙ වැඩ කරව ගන්න මාව කන්තෝරු එක්ක ගියා වගේ මම අප්පච්චිව මගේ කන්තෝරුවට ගෙන යනවා. අප්පච්චි ඒ කාලෙ සාමාන්‍ය ලිපිකරුවෙක්. කොමසාරිස් ට උප කොමසාරිස් ට සෑර් බෑර් ගාමින් ඔලුව කසන නිකම්ම නිකං ලියන්නෙක්. මම දැකලා තියෙනවනෙ උන් එකෙක් කොරිඩෝරය දිගේ යන කොටත් අප්පච්චි නැගිටිනවා.

මම එහෙමද? මම එතන දෙවෙනියා. නියෝජ්‍ය අධ්‍යක්ෂ. මට ඕන වුණේ මට එතන තියෙන තැන අප්පච්චිට පෙන්නන්න. මම කන්තෝරුවට ඇතුල්වෙන කොට උන් නැගිටලා යටහත් පහත්ව පසෙක ට වෙන හැටි දැක්කාම අප්පච්චි මං ගැන ආඩම්බර වෙයි. අප්පච්චිගෙ කාලෙ වගේ නොවෙයි. අපි වැඩ කරන්නෙ පරිගණකයෙන්. අපි ඉන්නෙ කොටු වෙච්ච අඳුරු කාමරවල නොවෙයි. කියුබිකල්වල.

උදේ නැගිටලා මම අප්පච්චිගෙ කාමරේට එබිලා මාත් එක්ක කන්තෝරු යන්න ලැස්ති වෙන්න කිව්වාම අප්පච්චි හිනාවුනා. ඒ හිනාවෙ එක පාරටම මම දැක්කෙ උපහාසයක් තැවරි තියෙනවා වගේ. ඒත් අප්පච්චි කඩිමුඩියෙම ඇඳෙන් බහින කොට මට හිතුනා අප්පච්චි එන්නෙ හරි කැමැත්තෙන් කියලා.

මම ගරාජයෙන් කාරය එළියට ගෙන ගේට්ටුවට මුහුණ ලා නැවැත්තුවා.

අප්පච්චි අපි යං.

මම කාරයට නගින ගමන් කෑ ගැහුවෙ තවම අප්පච්චි එළියට ඇවිත් හිටියෙ නැති හින්දා. අල්ලපු ගෙදර හිල්ඩා ගෑනි අදත් ජනේලෙන් එබීගෙන ඔත්තු බලනවා. අප්පච්චි එළියට එන කොටම වම් පැත්තෙ දොර ඇරියෙ අප්පච්චිට නගින්න. ඒ වෙලාවෙ හිල්ඩ ගෑනි දිහා නොබලා ඉන්න මට බැරි වුණා. ඒ මුහුණෙ තිබුණ මූසලකම. ඒක උපහාසයක් එක්ක කලවම් වුණාම බලන්න අජූව දසුනක්.

අප්පච්චි කාරයට නැගලා හරි බරි ගැහී වාඩි වුණා.

අප්පච්චි බෙල්ට් එක දා ගන්න. නැත්නම් හදිසියේ බ්‍රේක් ගැහුවොත් එහෙම හොම්බ කට සමතලාවෙයි.

මම අප්පච්චිට ආරක්ෂක පටි පැළඳගන්න උදව් වුණා. ඊළඟට රථය පාරට අරගෙන බැහැලා ඇවිත් ගේට්ටුව වහන්න වුණේ මටමයි. වෙනදාට සුමාලි. අපි අපේ පටුමග දිගේ මහ පාරට යනකං හැල්මෙ ගියා. නගර අභ්‍යන්තරයට පිවිසිලා මහ වීදියේ මෝදු වන රථවාහන

තදබදයට මැදිවෙන විටම මම දුටුවා සුමාලි එයා වැඩ කරන බැංකුව ඉස්සරහ හිටගෙන ඉන්නවා. ඇය දන්නවා මේ වෙලාවට මම මෙතන පහුකරගෙන යන බව. මම ඇය දුටුවෙ නැති ගානට අප්පච්චිත් එක්ක කතාවට වැටෙන්න හිතුවා.

එක අතෙකින් අර මගේ රහස් කතාව මේ යන එන ගමනුත් අප්පච්චිට කියන්න පිළිවන්. මම අප්පච්චි දිහා හැරිලා බැලුවා. අප්පච්චි දැන් ඒක කියන්නද? ප්‍රශ්නය වචන බවට පරිවර්තනය වෙන්න කලින් අප්පච්චි කතා කළා.

එපා! රහස් කියන ඒවා යන එන ගමන් කියන්න හොඳ නැහැ. ඒවා සාමාන්‍යයෙන් කියන්න ඕන දොර අගුලු දාපු කුටියක් ඇතුළෙ. උඹට ඔය රහස මා එක්ක කියන්නම ඕනනම් අද රෑට කියපන්.

දැන් මට සුමාලිව පසු වෙනවා. මම කතාවක් නැතුව ඉස්සරහ බලා ගත්තා. මට ඉවසන්න බැරි වෙලාවකට මේ අප්පච්චි ගාවින් එන කුණු ගඳ. ඒ ගඳ එන්නෙ එක වෙලාවකට. අප්පච්චි ගැන කිසියම් නුරුස්නා හැඟීමක් ඇතිවෙන කොට තමයි ඒක මට දැනෙන්නෙ. කෙනෙකුගේ හිතේ ඇතිවෙන හැඟීම් අවට පරිසරයට විතරක් නොවේ තමන් ළඟ ඉන්න පුද්ගලයින්ටත් බලපානවා ඇති. මම පණ්ඩිතමානි විදියට කල්පනා කළා.

රථය විවෘත ගරාජය තුළ “නියෝජ්‍ය අධ්‍යක්ෂට වෙන් කර ඇත” යන පුවරුව යට ගාල්කර මම අප්පච්චිත් සමඟ කන්තෝරු ගොඩනැගිල්ලට ඇතුළු වුණා. ආරක්ෂක නිලධාරියා සීරුවෙන් නැගිටලා මට ආචාරයක්

කළා. මුන් දන්නවා වැඩි දවසක් යන්න ඉස්සර මම මෙතන අධ්‍යක්ෂ වන බව. කොටින්ම දැන් ඉන්න අධ්‍යක්ෂට වැඩිය මෙතන ඉන්න අය මට ගරු සරු කරනවා. මම අප්පච්චි දිහා ආඩම්බරේ ට හැරිලා බැලුවා.

මම විදුලි සෝපානය පහළට එනතුරු බලාගෙන සිටියදී නිර්මලා එතැනට ආවා.

නිර්මලා මේ මගේ අප්පච්චි.

මම අප්පච්චිව නිර්මලාට හඳුන්වලා දුන්නා. පර බැල්ලි. ඒකි නොවේ අප්පච්චි දිහා හැරිලාවත් බැලුවෙ. නිර්මලා වෙලාවකට ඉතාම හොඳයි. වැඩට දක්ෂයි. කියන දේ තේරෙනවා. ඒත් සමහර වෙලාවට එහෙම අමුතු හැසිරීම් තියෙනවා. ඒ මදිවට ඇය මම හුන් තැනින් ටිකක් එහාට ගියා.

විදුලි සෝපානයට ඇතුළු වුණාම ඒකෙ හිටියෙ අපි තුන්දෙනා විතරයි. නිර්මලා අප්පච්චිගෙ ඇගේ ගෑවෙයි කියලා ඈත් වෙලා හිටියෙ. බාග විට අර අප්පච්චි ගාවින් එන කුණු ගඳ නිර්මලාට දැනෙනවා ඇති. අද ගියාම අප්පච්චිව මම ම නාවන්න ඕන. වයසට යන කොට අපි වුනත් ඔහොම ගඳ ගහන්න පිළිවන්.

මම වැඩ කරන්නෙ පස්වෙනි මහලේ. පස්වෙනි මහලට සෝපානයේ දොර ඇරුනාම නිර්මලා වේගවත් ගමනින් (දුවගෙන වගේ) කොරිඩෝරය දිගේ ගිහින් දොරකින් ඇතුළු වී නොපෙනී ගියා. නිර්මලා ඇතුල් වුණ දොරින් ම මාතුපාල එළියට ඇවිත් මා දිහාවට දුවගෙන එනවා. ඔහු වහාම මගේ අතේ තිබුණ කාර්යාල බෑගය අරගෙන පස්සෙන් වැටුණා.

අප්පච්චි කතාවක් නැතුව මාත් එක්කම ඉස්සරහින් ගාටනවා. මම අප්පච්චිව මාතුපාලට හඳුන්වා දෙන්න ගියේ නැහැ. මාතුපාල කව්ද මගේ අප්පච්චි කව්ද? දොරෙන් ඇතුළු වී කාර්යාලය හරහා යන විට හැමෝම වගේ ඉඳගෙන සිටි අසුන් වලින් නැගී අප දෙස බලා සිටියා. මේ හැමෝම දැන් ඔය අධ්‍යක්ෂ කතාව දන්නවා. අධ්‍යක්ෂ වුණාම නම් අපට ඔතනින් එන්න ඕනෙ නැහැ. එතකොට මට වෙනම සෝපානයක් තියෙනවා. මගේ කුටිය තියෙන්නෙ වෙනම. මම අප්පච්චි දිහාට හැරිලා කිව්වා.

බාග විට මේ අය නැගිටගෙන බලාගෙන ඉන්නෙ අප්පච්චි දිහා වෙන්න ඇති. අප්පච්චි ටිකක් කෙට්ටුවෙලා වුනත් තවමත් කඩවසම්. ඒ ගහක් වගේ උසයිනෙ. මම මගේ කියුබිකල් එකට ඇතුල්වුණේ තේ දෙකක් ගෙන එන ලෙස මාතුපාල අණවමින්.

සර්!

මාතුපාල මා දිහා සැකමුසුව බලාගෙන ඉන්නවා.

ඇයි?

තේ දෙකක්?

ඔව්. අප්පච්චිටත් එක්ක. අප්පච්චි වාඩි වෙන්න. මම මගේ ඉදිරිපස පුටු දෙකෙන් එකක් පසු පසට ඇද අප්පච්චිට වාඩි වෙන්න සැලැස්සුවා. මාතුපාල එතනින් පිටවුණේ ඉගිලීගෙන වගේ. මම බොහොම ආඩම්බර තාලෙන් අප්පච්චිට පේන්නම මගේ පුටුවෙ වාඩි වුණා. මගේ මේසය මත තිබෙන නිස්සංක සේනාධීර නියෝජ්‍ය

අධ්‍යක්ෂ පුවරුව අතින් ටිකක් ඉදිරියට තල්ලු කළා. ඊළඟට පරිගණකය පණ ගැන්වුවා.

මාතුපාල ආවා. හැබැයි ඔහු ගෙනවිත් තිබුණේ තේ එකයි. ඒ තේ එක ඔහු මගෙ ඉස්සරහ තියලා කිසිදෙයක් නොවුන ගානට එළියට ගියා. මම ඇඟ වෙව්ලන තරම් යක්ෂාරූඪව හිටියෙ.

මාතුපාල!

මම බෙරිහන් දෙනකොට මාතුපාල දුවගෙන ආවා.

කෝ යකෝ අනිත් තේ එක?

මාතුපාල අහිංසක විදියට මා දිහා බලාගෙන ඉන්නවා.

මං බොට කිව්වා නේද අප්පච්චිටත් එක්ක තේ දෙකක් ගේන්න කියලා. කෝ යකෝ අනිත් තේ එක.

අප්පච්චි නැගිටින්න හදනවා.

අප්පච්චි ඔහොම ඉන්න මම ඒක මූත් එක්ක බලා ගන්නම්. මුන්ටත් අප්පච්චිලා ඇතිනෙ.

මාතුපාල මම කිව්ව දේ මායිං නොකර එළියට යන්න ආපහු හැරුණා.

මගේ අතට අහුවුණේ මාතුපාලගේ කමිස කොලරයේ පිටුපස කෑල්ල. මාතුපාල මා දිහාවට ඇදිලා ආවා. එතකොටම කව්දෝ මගේ අතට ගැහුවා. මගෙන් මිදුණ මාතුපාල විසි වෙලා ගිහින් එතන බිම සිටුවා තිබුණ විදුලි පංකාව උඩ වැටුණා. මම අප්පච්චි දිහා හැරිලා බැලුවා. අප්පච්චිගේ මුහුණේ උපහාසය උතුරනවා.

උඹ මෙහෙම ද කන්තෝරුවල වැඩ කරන්නෙ? පහත් සේවකයින්ට සලකන්නෙ මෙහෙමද?

ඊළඟට මම දැක්කෙ මිස්ටර් සමරදිවාකර (ඔහු මගේ අධ්‍යක්ෂ) වේගවත් ගමනින් එන සැටි. ඔහු කෙළින්ම ඇතුල්වෙලා මං ඉස්සරහා හිට ගත්තා.

මිස්ටර් සේනාධීර මොනවද මේ කරන විකාර?

මම බැලුවෙ අප්පච්චි දිහා. අප්පච්චි එකපාරටම මහ හයියෙන් හිනාවෙන්න පටන් ගත්තා. මහ බොල් හිනාවක්! ඊළඟට හුන් තැනින් නැගිට කාර්යාලය හරහා ඊ ගහක් වගේ දොර දිහාවට වේගයෙන් ඇවිදගෙන ගියා. අප්පච්චි අතුරුදහන් වුනා.

සමරසේකර මහතා සමඟ තව පිරිසක් එතන එකතු වෙලා. සමරෙ ආපහු හැරිලා අනෙක් අය දිහා බැලුවා.

හරි හරි තමුසෙලා දැන් යනවලාකො. මිස්ටර් සේනාධීර තව ටිකකින් ඇවිත් මාව හමුවෙන්න.

එහෙම කියාගෙන සමරදිවාකර එතනින් පිටත් වුණා. අනෙක් හැමෝමත් විසිරිලා ගියාම තත්ත්වය සන්සුන් වුණා. මාතුපාල ආගිය අතක් නැහැ.

මම මගේ පුටුවෙ ඉඳගෙන පරිගණකයෙන් අන්තර් ජාලය සමඟ එකතු වුණා. ඊළඟට නිල් චිත්‍රපට එකින් එක මම පරිගණකය තුළ දිග හරින්න පටන් ගත්තා. පරිගණකයෙන් නැගෙන රමණ දෝංකාරය මුළු කාර්යාලය පුරාම පැතිරෙනවා. අප්පච්චි ගිය එකත් හොඳයි. මම පරිගණකයෙන් නැගෙන හඬ උපරිමයට වැඩි කළා. මම දැක්කා ගෑනු ටික කන්වල ඇඟිලි ගහ ගන්නවා. පච්

නිර්මලා. එයා සාරියත් ඔලුව වටේ ඔතාගෙන. හැමෝම උන් හිටි තැන්වල නැඟිටගෙන.

ඒ එක්කම විදුලිය විසන්ධි වෙලා පරිගණකය අන්තර්ජාලය සමඟ සබඳතා අත හැරියා.

There is no Internet Connection

Try:

- Checking the netwoek cables, Modem and router.
- re connecting to Wi - Fi.
- Running Windows Network Diagnosis.

Err Internet Disconnected.

මම මගේ කාමරේ ඇඳ උඩ වැටීගෙන උඩුබැලිව සිටියා. ඇඟපත හරිම කෙඩෙත්තුයි. අදත් සුමාලි ඇවිත් මට බැනලා ගියා. මම කන්තෝරුවෙ නටපු නාඩගම් එයාට ආරංචි වුනාලු. ඒකෙ ලජ්ජාව එයාට. මම හිතන්නෙ දික්කසාදයක් ගැනත් සුමාලි මොනවා හරි දෙඩුවා. සුමාලි ඔයා මාව දික්කසාද කරන්නෙ මීට හුඟාක් ඉස්සර. ඔයා තවම මගේ රහස දන්නෙ නැහැ. මම ඒක අද රෑට අප්පච්චි ට කියනවා. මම හිතින් කිව්වා.

මම අප්පච්චිගෙ කාමරේට ඇතුල්වුණා. අප්පච්චි බිත්තිය දෙසට මුහුණ ලා ගෙන නිදි.

අප්පච්චි!

මම කතා කළාම අප්පච්චි අලස ලෙස හැරිලා මා දෙස බැලුවා.

ඇයි අප්පච්චි? අසනීපයක්ද?

අප්පච්චි ඇඳ උඩ හරිබරි ගැහිලා ඉඳ ගත්තා.

උඹ ඔහොමද මිනිහො කන්තෝරුවක් පාලනය කරන්නෙ? අපේ කාලෙ කොහොමද කොමසාරිස් තුමාල එනකොට කන්තෝරුවම රත් වෙනවා. මිනිහෙකුගෙන් වැඩක් ගන්න ක්ලාක් කෙනෙකුට වුනත් ඔහොම කැ

Scanned by C

කොස්සන් ගහන්න ඕනෙ නැහැ කියන පරක්කුව විතරයි. උඹලාගෙ තියෙන්නෙ ඔය කොම්පියුටර් විතරයි.

සමකාලීන කන්තෝරු සමාජය ගැන අප්පච්චිගෙ විවරණය තුළ තියෙන්නෙ අතීත වේදනාවක් කියලා මම කිව්වා. මේ කාලයේ සමාජය වෙනස්. අප්පච්චිලාගෙ කාලෙ වගේ නොවෙයි තමයි.

හරි දැන් උඹ ආවෙ අර උඹේ රහස වමාරන්නද?

අප්පච්චි අද කතා කරන්නෙ වෙනදා වගේ නෙවෙයි. වෙනදාට අප්පච්චි ඉස්සර වෙන්නෙ එයාගෙ කතාව කියන්න. ඒ කතා බහ ඇතුළේ තිබුන අර අහිංසක බයාදුකම තුනී වෙලා. අප්පච්චිව අද කන්තෝරුවට එක්ක ගෙන ගිය එක වැරදියි.

ඔව් අප්පච්චි - නැහැ අප්පච්චි.

අප්පච්චිට කේන්ති ගියා. අප්පච්චි කේන්ති ගත්තම දත් මිටි කනවා. මට ඇහුනා දත් මිටි කන සද්දෙ.

මොකක්ද මනුස්සයෝ ඔය ඔව් නෑ දෙකම එකට කියන එකේ තේරුම?

නැහැ අප්පච්චි ඊට කලින් අප්පච්චිට කියන්න තව දේවල් මට තියෙනවා.

අප්පච්චි ඇඳ උඩ හරිබරි ගැහුනෙ ඒ අනිත් දේවල් අහන්න සූදානම් බව අඟවමින්. මම බයාදු විදියට කතාව පටන් ගත්තා.

අප්පච්චි මම මේ කියන කතාව මගේ රහසට කොච්චර සම්බන්ධ ද කියලා මට තේරුම් කරන්න අමාරුයි. හැබැයි

ඒක ගැන පසුතැවෙන හැම මොහොතකම මට මේ කතාව මතක් වෙනවා. ඒ කතාවයි මේ කතාවයි අතර සම්බන්ධයක් ඇත්තටම නැහැ.

අප්පච්චි ට මතකනෙ මම මුලින් ගියේ ගමේ ඉස්කෝලෙට. මගේ ජීවිතේට පළමු රහස එකතුවන්නෙ එහෙදි. මම හිතන්නෙ එතකොට මම හිටියෙ එක්කෝ පහල බාලාංශයේ නැත්නම් ඉහල බාලාංශයේ.

ඒ දවස්වල මම හුඟාක් කැමති වුණේ තනියම ඉන්න. මම සමහර දවස්වලට ඉස්කෝලෙ පුරාම ඔහේ ඇවිදිනවා. ගොඩනැගිල්ලක කොරිඩෝරයක් දිගේ ඔහේ ඇවිදගෙන යන ගමන් ඒකෙ කනු දොරවල් අතින් ස්පර්ශ කර ගෙන යන්න මම පුරුදු වෙලා හිටියා. බැරි වෙලාවත් මට කනුවක් හරි දොරක් හරි මග ඇරුනොත් මම ආපහු ඇවිත් ඒක අතගාලා යනවා. මේ ඉබාගාතේ ඉස්කෝලෙ පුරා ඇවිදින සිරිත හින්දා හුඟාක් වෙලාවට මම පන්තියෙ නැහැ. ඉතින් පහල බාලාංශෙ (නැහැ මට හොඳටම මතක හැටියට ඉහළ බාලාංශෙ) බාර ගුරුතුමියට සිද්ධ වෙනවා මාව ඉස්කෝලෙ පුරාම හොයන්න.

මම එදා ඇවිදගෙන ගියේ පාසැල් බිමේ කෙළවරම තිබුණ ගොඩනැගිල්ලෙ වැටයි බිත්තියයි අතර තිබුණ තීරුව දිගේ. ඒ ගොඩනැගිල්ල කෙළවර කඳු ගැටය මත තියෙන විසල් බෝ රුකත් පැදකුණු කර ගෙනම මම එහි අනෙක් පස බිත්තිය තරණය කරන්න හැරුනා. එහි කෙලවරේම තියෙන්නෙ කාමරයක්. එහි දොර ඇරලා තියෙනවා මම කවදාවත් දැකලා තිබුණේ නැහැ. ඒ දොරට තට්ටුවක් දාගෙන යන්න අමතක වෙලා මම ටිකක් දුර ගියා. ආපහු හැරිලා දොර වෙත පැමිණි විට මම දුටුවෙ දොර හරියට

Scanned by CamS

වසා නැති බවයි. බාගෙට ඇරුණ දොර තද කර වහනවාද නැත්නම් ඇරලා බලනවාද කියලා හිතාගන්න බැරුව මම දොර ඉස්සරහ තෝන්තුව බලා හිටියා.

මම නිකමට දොර අතින් තල්ලු කළ විට එය හායි ගාලා ඇතුළට විවෘත වුණා. ඊළඟට එහි පැත්තක ගොඩ ගසා තිබුණ ඩෙස්ක්, පුටු තොගයක් පහු කරගෙන ගිය මගේ බැල්ම නතරවුණේ මට පිටුපා ජනේලය වෙත හැරී සිටින ස්ත්‍රියකගේ රූපයක් මත. ඇගේ සාරිපොට පිටුපසට වැටී බිම ඇතිල්ලෙනවා. දොර ඇරුණ හඬට ඇය තිගැස්සෙමින් හැරී බැලුවා.

අප අතර පරතරය අඩි දහයකට පහළොවකට වඩා නැහැ. මම පළමුව දුටුවේ හැට්ටය දෙපසට විවරව, නිරාවරණය වුණ ඇගේ විසල් පියයුරු. ඇගේ අතක් පියවුරක රැඳී තිබුණා. ඉන් ගලා ගිය කිරෙන් හැට්ටයත් තෙත්ව තිබෙන සැටි මගේ නෙත් වලට ගොදුරු වුණා. ඇය හැරුණේ තිගැස්සෙමින් වුනත් මගේ රුව දුටු සැනින් ඇගේ මුහුණ පහන් හැඟීමකින් එළිය වුණා. හරියට මේ වෙලාවට මම මෙතනට එයි කියලා ඇය බලාගෙන හිටිය වගේ. මගේ කුඩා කම එහි සිදුවන්නේ කුමක්ද යන්න මට හරියට තේරුම් කර නොදුන්නත් කිසියම් තෘෂ්ණාවකින් මගේ සිතත් ගතත් වෙලා ගත්තා. ඈ වෙත එන මෙන් ඇය හිසින් මට සන් කළා. මම කාමරයට ඇතුල් වී ඇය වෙත යද්දි ඇය සිහින් හඬින් මා ඇමතුවා.

පුතේ දොර වහගෙන එන්න.

මම ආපසු හැරී දොර වසා ඇය වෙත ගියා. දැන් මම ඇගේ කිරිබරින් පිරුණ මා වෙත නිරාවරණය වූ දෙපියයුරු ඉදිරිපස. කළ යුත්තේ කුමක්දැයි තිනච්චක් නැති වුනත් මට මතක් වුණේ අම්මාගෙන් කිරි උරා බොන මල්ලීව.

බොන්න!

ඇය කෙඳිරුවා. මම හිටිවනම සිටිමින් ඇගේ දෙපියයුරු වල එල්ලීගෙන පිරුන තන පුඩු මුවින් ගෙන කිරි ඉරුවා. ඇය සිහින් ඉකියක් නගන හඬ ඇහෙන විට මට දැනුණේ මගේ හිස ඇගේ කඳුළින් තෙත් වන බවයි. ඇය ඇඩි සෙනෙහසින් මා කිටි කිටියේ තුරුළු කර ගත්තා. මටත් නොදැනීම මගේ දෙඅත් ඇගේ බඳ වටා එතිලා. ඇගේ පියයුරු බර හැල්ලු වුණාම ඇය මා මුදා හැරියේ මෙහෙම කියාගෙන.

හෙටත් එන්න!

හැමදාම ඒ වෙලාවට එම කාමරයට යන එක මගේ සිරිතක් වුණා.

මම කතාව නවත්තලා අප්පච්චි දිහා බැලුවා. අප්පච්චිගෙ ඇස් අග කඳුළක් මෝදු වෙනවා. කපොලක් නලියනවා. අප්පච්චිට මතක ඇති ඒ කාලෙ ගෙදර කතා වෙන දේවල්වලින් මම තේරුම් අරගෙන හිටි දෙයක් තමයි මම ඉපදිලා හැරිලා බලන ඇසිල්ලෙන් නංගිව අම්මාගෙ බඩට ආව කියන එක. මට අම්මාගෙ තනය අහිමි වෙන්න දෙමාසයක් ගියේ නැහැ. මට මතකයි මම

අපේ පුංචි අම්මාගෙ කිරි නැති තනෙත් උරලා තියෙනවා. මම ඔය කියන සිදුවීම වෙන කාලෙ මල්ලි ඉපදිලා මාස ගානක් ඇති. අම්මා මල්ලිව තුරුළු කරගෙන කිරි දෙන හැටි මම අනන්තවත් බලාගෙන ඉඳලා තියෙනවා.

අප්පච්චිගෙ මුහුණෙ තිබුන ශෝකී පෙනුම ක්‍රමයෙන් මැකී යන සැටි මගේ බැල්මට අසුවුණා. අප්පච්චිගෙ මුහුණට එකතු වෙන්නෙ මගේ කතාව ඒ හැටියට ම බාර ගන්න සූදානම් නැහැ කියනවා වගේ පෙනුමක්. අප්පච්චි මගේ කතාව බැහැර කරන්න කලින් මම ආයෙත් මගේ කට ඇරියා.

අප්පච්චි එයා ඒ ඉස්කෝලෙම උගන්වපු ගුරුවරියක්. එයා ඉගැන්නුවෙ මට ඉහළ පන්තියකට. ඊට මාස තුනකට විතර පස්සෙ එයා මාරුවෙලා ගියා. එයා මාරු වෙලා යන දවසෙ අනිත් ළමයි එක්ක වඳිද්දී එතන හිටපු තව ගුරුවරියක් කිව්වා ඔන්න ඔයාගෙ පුතා කියලා. එතකොට ඇය මාව තුරුළු කර ගත්තා. මම ඔය කතාව ගෙදර කිව්වෙ නැතිවුණාට සමහර ගුරුවරු ඒක දැනගෙන ඉන්න ඇති. ශිෂ්‍යත්වෙ සමත් වෙලා නගරයේ පාසලට යන තෙක්ම සමහර ගුරුවරියන්ට මාව අපූර්ව දර්ශනයක් වෙලා තිබුණා. සමහර ගුරුවරියක් මාව දුටුවම නවත්තගෙන පපුවට තුරුළු කර ගන්නවා.

නවත්තගනින් උඹේ පව ගැහිල්ල. මම දන්නෙ නැද්ද උඹේ හැටි. අතේ පැලවෙන බොරු ගොතලා කියන්න උඹ ඒ කාලෙ ඉඳලාම හපනා නෙ.

අප්පච්චි දත් මිටි කන ශබ්දය මට ඇහෙනවා.

අනිත් එක ඔය කියන හරුපෙ මට තේරෙන්නෙ නැහැ කියලද උඹ හිතන්නෙ? යකෝ උඹට කියන්න තියෙන දේ කෙලින්ම කියපන්. උපහැරණ නැතුව.

මට තේරුණේ නැහැ අප්පච්චි. මම කිව්වෙ ඇත්ත. එහෙම එකක් වුණා.

නැහැ. උඹ ඔය කියන්නෙ අවුරුද්දට එකා ගානෙ ළමයි හම්බවෙන්න මම අර ගෑනිත් එක්ක හැමතුනා කියන එකනෙ. උඹේ ප්‍රශ්නෙ මගේ බේබදු කමනෙ. මම බීලා කනමදය වගේ ඇවිත් අර ගෑනිට ඉන්න දුන්නෙ නැහැ කියන එකනෙ. ඇයි උඹට ඒක කෙලින් කියන්න හයියක් නැත්තෙ?

එහෙනම් එහෙමයි අප්පච්චි ඒ ගැන හිතන්නෙ. ඇත්තට ම ඒක මම නිර්මාණය කරපු කතාවක්ද? එහෙම දෙයක් මට කවදාවත් අත් දකින්න වෙලා නැද්ද? එලෙස මවක් මෙන් මට කිරි දුන් ගුරුවරියක් පිළිබඳ කතාව සිහිනයක් ද? මට ක්‍රමයෙන් කල්පනා වෙන්නට ගත්තෙ ඇත්තටම මම ඒක නිර්මාණය කරපු එකක් වෙන්න ඇති කියලයි. ඒ කාලෙ අප්පච්චිගේ කල් ක්‍රියාව මම දෘෂ්ටාන්තයකට ගෙතුව වෙන්න ඇති. අපේ ජීවිත කියන්නෙ කතන්දර මල්ලක්.

මම ගල් ගැහී අප්පච්චි දෙස බලාගෙන හිටියා. අප්පච්චි මාව අභිබවා යන එක මට ඉවසන්න බැහැ. අප්පච්චි ඉදිරියේ මම බෙලහීන චරිතයක්.

බලන්න කියපං බලන්න උඹේ අර අනිත් කතාව. ඒකත් ඔය වගේම කෙප්පයක් වෙන්න ඇති. ඒත් කමක්

නැහැ. ඒකත් කියපන්කො. ඔය උඹේ කතා හැම එකක් ඇතුළෙම ඉන්නෙ මම නෙ. කියපන් ඉතින්.

නැහැ අප්පච්චි. මට ඒක කියා ගන්න බැහැ දැන්. මම හෙට කියන්නම්.

උඹත් හරියට අර අරාබි නිසොල්ලාසයේ අර්ෂසාදි වගේ කතාන්දර මල්ලක්.

අප්පච්චිගෙ අන්තිම වචන දෙක මට ඇහෙන කොට මම කාමරයෙන් එළියෙ. මම කළුවරේම ගිහින් ඇඳේ වැතිරුණා.

පහුවදා නිවාඩු දවසක්. උදේම වගේ සුමාලි ආවා. තනිවම නොවෙයි, සුමාලිගෙ තාත්තත් ආවා. ඒ අය එන කොට මමයි අප්පච්චියි හිටියෙ වැරැන්ඩාවේ පඩිය මත වාඩි වෙලා කයිවාරු කදයක.

කාලෙකින් අප්පච්චිත් එක්ක ටිකක් වෙනස් විදියක කතා බහකට අවස්ථාවක් ලැබුණා. අප්පච්චි ළඟ තියෙන්නෙ හරිම ගතානුගතික අදහස්. අප්පච්චිලාගෙ කාලෙ නාට්‍ය වල තිබුනලු කිසියම් රසයක්. අප්පච්චිගේ මතය අනුව විශ්ව විද්‍යාල වලින් පිට වෙන්නෙ දැනුමක් තියෙන අය නොවේ. කවි නම් ඉතින් අල්විස් පෙරේරාගෙ මීමන ගෙ කපිල ගෙ කවි තමයි කවි. ඊළඟට අප්පච්චි තොරතෝංචියක් නැතුව විශ්ව විද්‍යාල අධ්‍යාපනයටයි නිසඳැස් කවියටයි පහරපිට පහර දෙන්න පටන් ගත්තා. ඒ වෙන කොට මට අප්පච්චිත් එක්ක කතාව ඇතිවෙලයි තිබුණේ.

එතකොට ම තමයි මම දැක්කෙ සුමාලිගෙ තාත්තාගේ පැජරෝ එක ගේට්ටුව ළඟ නවත්තනවා. මුලින්ම පැජරෝවෙන් එළියට පැන්නේ විශාල බඩක්. ඊළඟට තමයි එහි අයිතිකාරයා වූ සුමාලිගේ තාත්තා බිමට බැස්සෙ. කහපාට අත්කොට ටී ෂර්ටයක් ඇදලා,

කල ගෙඩියක් බඳු බඩ කැපිලා පේනවා. ඔහු දෙඅත් දෙපසට ඇත්ව තබාගෙන විකාරකාරි ලෙස වනමින් මගේ දෙසට එනවා. සුමාලිත් ඒ පිටු පස්සෙන්. මම දැක්ක පැජරෝව පිටි පස්සෙ ලොරියක් නවත්තලා තියෙනවා. පිරිමි හතර පස් දෙනෙකුත් එතන නතර වෙනවා. මේ අය සූදානම් වෙන්නෙ ලොකු නාඩගමක් නටන්න.

අප්පච්චි මේ වෙලාවේ මෙතන ඉන්න එක හරි මදි. සුමාලිගෙ තාත්තා කොහොමටත් මගේ අප්පච්චිට කැමති නැහැ. ඔහුට අනුව බෝධිපාල කියන්නෙ කලිසම් අඳින ගොඩයෙක්. අප්පච්චි බුලත් විට කනවා. සිගරට් බොනවා. අරක්කු බොනවා. අප්පච්චී ගේ නහය යට පොල් මුඩු රැවුලක්. සුමාලිගෙ තාත්තගෙ මුහුණෙ නම් එක රැවුල් ගහක් ඉතිරි නොවෙන්න මුඩු කරලා. අප්පච්චි තල් ගහක් වගේ උසයි. කෙට්ටුයි තමයි. ඒත් කඩවසම්. සුමාලිගෙ මිටි තාත්තාගේ පෙනුමට තියෙන්නෙ ලොකු බඩ විතරයි. මම අප්පච්චි දිහා බැලුවෙ ඔහුට මෙතනින් යන්න කියන්න.

කෝ අප්පච්චි? ඔහු අතුරුදහන් වෙලා. අප්පච්චි මම කියන්නත් කලින් හෙමින් සීරුවෙම කාමරේට පල්ලම් බහින්න ඇති. අප්පච්චිට පෙන්න බැරි සුමාලිගෙ තාත්තා ඉංග්‍රීසියෙන් කතා කරන එක. ඔහු මොන ඉංග්‍රීසි කතා කළත් අප්පච්චි උත්තර දෙන්නෙ සිංහලෙන්. අප්පච්චි මඟ ඇරලා ගිය එක හොඳයි.

මම දැක්කා හිල්ඩා ගැනිත් හෙමින් සීරුවෙ වැට පනිනවා. අප්පච්චිගෙයි මගෙයි නෙයියාඩම් අර දෙන්නාගේ කනේ තියලා ඇයට අපූරු විනෝදයක්

විඳින්න පිළිවන්. සුමාලිගෙ තාත්තා කෙළින්ම ගෙට ආවේ මා දිහා රවාගෙන.

තමුසෙ මගෙ කෙල්ල කෑවා ඕයි. මම මේක ලේසියෙන් අත අරින්නෙ නැහැ. තමුසෙ අර නැට්ටිච්චියක් එක්ක නටපු නෙයියාඩම් මම නොදන්නවා කියලද? ඔව් ඉතින් ගහේ කටු උල් කරන්න ඕන නැහැනෙ. තමුසෙගෙ අප්පච්චිත් පවුල් දෙකක් නඩත්තු කරපු මිනිහෙක්නෙ.

සුමාලිගෙ තාත්තා හති දමනවා. අනේ තාත්ති. සුමාලි ඇවිත් ඔහුගේ ඇඟේ එල්ලුනාම ඔහු අත ගසා දමපු පාරට ඇය විසි වෙලා යනවා.

අයිෂෙ මම මේ කෙල්ල තමුසෙ එක්ක එනවට කැමති වුණේ එකිගෙ අඬා වැඩියාව හින්දා. නැත්නම් තමුසෙගෙ ඔය දිසාපතිකම් මම මායිම් කරන්නෙ නැහැ. මම තමුසෙ ගැන විස්තර හොයා ගෙන තියෙන්නෙ. අර සක්කරවට්ටමත් එක්ක ලැගපු ගුබ්බෑයම් වල විස්තරත් මම දන්නවා. තමුසෙට තියෙන්නෙ සිතාසි එනකං බලාගෙන ඉන්න විතරයි. මේ කෙල්ල මට වැඩි නැහැ.

අප්පච්චි මෙතන නොසිට කාමරේට ගිය එක ලොකු දෙයක්. අප්පච්චි හිටියා නම් හිතයි මම එයාට කියන්න ගිය රහස තමයි සුමාලිගෙ තාත්තාගෙ කටින් මේ එළියට පනින්නෙ කියලා. ඒක නොවෙයි අප්පච්චි රහස. ඒක වෙන එකක්. සුමාලිගෙ තාත්තා දන්න ඉටි ගෙඩියක් නැහැ. අද රෑට අපි ඒ කතාව කියමු.

මම දැක්කා අර ලොරිය ගේට්ටුවෙ තෙරපීගෙන මිදුලට එනවා. මම ඒ දිහා බලාගෙන ඉන්නකොට සුමාලිගෙ තාත්තා කතා කරන්න පටන් ගත්තා.

තමුසෙට පුදුම ඇති ඇයි මේ ලොරියක් කියලා. මේ ගෙදර තියෙන්නෙ මගෙ දුවට මම අරන් දීපු බඩු. ඒවා ඔක්කොම මම ගෙනියනවා. මේ ගේ ලොරියක පටවන්න බැහැනෙ. ඒක හින්දා ඒක විතරක් තව ටික දවසක් තියේවි. ඊට පස්සෙ ගේ කොහේවත් යන එකක් නැහැ. හැබැයි තමුසෙට යන්න වෙයි.

ඊළඟට ඔවුන් ගෙයි බඩු ලොරියට පැටවීම ආරම්භ කළා. අප්පච්චි මෙතන ඉන්නයි තිබුණේ. අඩු තරමින් මගේ පැත්තට කව්රු හරි ඉන්න ඕන. ඇත්තටම අප්පච්චි එතැනට ආවා. මම දැක්කා සාලයේ කෙළවර පැන්ට්‍රියට ඇතුල්වෙන දොර ළඟ උලුවස්සට හේත්තු වෙලා අප්පච්චි මේ සිදුවන දේවල් දිහා උකටලීව බලාගෙන ඉන්නවා.

උන් ගෙදර තිබුණ උන්ට අයිතියි කියලා හිතුන ඔක්කොම බඩු ලොරියට පටව ගත්තා. මම නිදාගන්න ඇඳයි ඒකෙ තිබුන අල්මාරියයි මේසෙකුයි විතරක් ඉතුරු කරලා තිබුණා. අප්පච්චිගෙ කාමරේ ඇඳ ඉතුරු කළේ සුමාලිගෙ ඉල්ලීමට. කව්දෝ ඒක එළියට ගන්න හදනකොට සුමාලිමයි කිව්වෙ නැහැ ඒක එහෙම තිබුණාවේ කියලා. ඒක අප්පච්චි නිදා ගන්න ඇඳ කියනවා වගේ තේරුමක් තමයි එහි තිබුණේ.

උන් මගේ පොත් රාක්ක වලට ඇඟිලි ගහන්න ආවෙ නැති එක ලොකු දෙයක්. මේ කාලය පුරාවට ම සුමාලි මා දිහා ඇහැක් ඇරලා බැලුවෙ නැහැ. ඇය හිල්ඩා ගැනිත් එක්ක මොනවාදෝ තොර තෝංචියක් නැතුව දෙඩෙව්වා. හිල්ඩා මා දිහා බල බල කියන්න ඇත්තෙ අප්පච්චි ගැන වෙන්න ඇති.

අන්තිමේදි උන් ඔක්කොම අප්පච්චියි මමයි ඒ පාලු හිස් ගෙදර තනි කරලා පිටත් වෙලා ගියා.

අප්පච්චි මම ඒ කතාව මුල ඉඳලාම කියන්නම්. මම අප්පච්චිගෙම පුතා. අප්පච්චිගෙ කපාපු පලුව. මම අප්පච්චි වගේම උසයි. හීන්දෑරියි. කොන්ඩෙ බොකුටුයි. අප්පච්චිගෙ වගේ රැවුලක් නැති වුණාට මුහුණ දිගටියි. කෙටියෙක් කිවහොත් කෙල්ලෙක් මට ඇපනෙ වැටෙන්න වැඩි වෙලාවක් යන්නෙ නැහැ. හැබැයි සුමාලි මට හමුවීම වෙනම කතාවක්. බාග විට මම ඉස්සරහට ඒක කියයි. සුමාලි වුනත් මට වහ වැටුණේ මගේ උගත්කමටවත් රස්සාවටවත් නොවෙයි. මගේ කඩවසමට.

අප්පච්චි ඔලොක්කු හිනාවක් තමන්ගෙ මුහුණේ ඔහේ ඇදෙන්න දීලා බලාගෙන ඉන්නවා.

මට විතරයි අප්පච්චිගෙ රූපකාය තනිකරම ලැබුණේ. අනිත් ළමයි ගැන රටේ මිනිස්සුන්ට ප්‍රශ්න තිබුණා. මිනිහා රෝන්දෙ යනකොට වෙන ගෑනු තියාගෙන පවුල් කනකොට මොන ගෑනිද ඒවා ඉවසගෙන එක් හිත්ව ඉන්නෙ? අම්මගෙ පතිවත අප්පච්චිට ප්‍රශ්නයක් නොවුනට ගමේ උන්ට ප්‍රශ්න තිබුණා.

උඹෙ ඔය වැල් වටාරම් දෙඩවිල්ල පැත්තක තියලා කතාව කියපං.

අප්පච්චි එක පාරටම පරලය වුණා.

නැහැ අප්පච්චි මට ඕන වුණේ මේක මුල ඉඳලාම කියන්න.

මට ඕන මම නොදන්න දේ උඹෙන් දැන ගන්න මිසක් මම දන්න දේම ආපහු උඹ ලවා වමාරවන්න නෙමේ. උඹේ අම්මා තවත් මිනිස්සු එක්ක නිදා ගත්ත කියන එක මම නොදන්න කාරණයක් නොවෙයිනෙ. ගෑනියකුගෙ පතිවත හොයන්න දරුවන්ගේ මුහුණ බලන සිරිත යල් පැන ගිය එකක්. අනිත් එක මගෙ ගෑනිගෙ පතිවත මට ප්‍රශ්නයක් නෙවෙයි නම් උඹට තියෙන රුදාව මොකක්ද?

අප්පච්චි ඒ මගේ අම්මා.

වේසාවියක් ගේ දරුවෙකුට වුනත් ඒ වේසාවි අම්මා තමයි. උඹ මට ඕක කියලා දෙන්න යන්න ඕන නැහැ. දැන් කියපන් කෙලින් ම උඹේ රහස. උඹ ඒක උඹට කලින් මම ලව්වම කියවා ගන්න කලින් කියපන්.

අප්පච්චි!

මම අප්පච්චි දිහා පුදුමයෙන් බැලුවා. මගේ රහස අප්පච්චි දන්නෙ කොහොමද? අප්පච්චි ඒක දැනගෙනම වෙන්න ඇති බාග විට මෙහෙම ඇවිත් මාත් එක්කම ඉන්නෙ. අප්පච්චි ඒක දැන ගත්තයි කියන එකේ පුදුම වෙන්න දේකුත් නැහැ. ඒක අප්පච්චි නොදැන හිටියා නම් තමයි පුදුම වෙන්න ඕන. අප්පච්චිට එහෙම ඉර්දි බල තියෙනවා.

උඹ ඔහොම මහ ලොකුවට මං ගැන කලබල වෙන්න ඕනෙ නැහැ. මම ඕක මේ ගෙදරට පය ගහපු

දවසෙ ඉඳලාම දැනගෙන හිටියා. මොකක්වත් නෙමේ උඹේ ඔය නල්ලමලේ රහස. උඹ ඔය හෙම්ජ්ජ වගේ ඉන්නෙ ගෑනියෙක්ව මරලා.

අප්පච්චි!

හැම එකට ම හප්පච්චි හප්පච්චි ගාන්නෙ නැතුව ඉඳින්. මම දන්න ඉටි ගෙඩියක් නැහැ. හැබැයි පසුගිය දවස්වල උඹ හැසිරුණේ ගෑනියෙක් ව මැරුව නරුමයෙක් වගේ තමයි. කාවද මැරුවේ, කොහේදිද මැරුවේ, මොකටද මැරුවෙ. ඔය එකක්වත් මම දන්නෙ නැහැ. දැන් කියපං උඹ ගෑනියෙක් ව මැරුවා නේද?

මම කතාවක් බහක් නැතුව දිගින් දිගටම අප්පච්චි දිහා බලාගෙන හිටියා. දිගට ම බලාගෙන හිටියා. අප්පච්චි ට මාව ඇති වෙනකම්ම බලාගෙන හිටියා. අන්තිමේදී අප්පච්චිම කතා කළා.

හරි උඹ මොකුත් කියන්න ඕනෙ නැහැ. මම කියන්නම්. උඹ ගැන නෙමේ මම ගැන. පිරිමි ගැහැනු ඇසුරුකිරීමේ පිළිවෙල ගැන. ගෑනියකුට දැපෙන වැටෙන මිනිහෙකුට විය හැකි දේ ගැන.

අප්පච්චි ටික වෙලාවක් හති ඇම්මා.

ඒක කතාවක්. කෙනෙකුට අහන්න හිත් දෙවන කතාවක්. බාග විට මේ කතාව අහල උඹේ ඔය මනස්ගාතය අකුල ගනීවි. උඹ ඔය කතාවක් කියලා මට කියන්නෙ ඒක සිදු වෙච්ච විදිය කියලා උඹ හිතන දේ මිසක් ඒක සිදුවුන විදියම නෙවේ කියලා මම දන්නවා. බාග විට මම මේ කියන්න යන කතාවත් එහෙම වෙන්න ඇති.

මම වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලයෙන් පිටවෙලා ආවට මට රස්සාවක් තිබුණේ නැහැ. මෙන්න මේ රස්සාවක් නැතුව රස්තියාදුවෙන් ගෙවපු කාලයේ තමයි මම නාට්‍ය කණ්ඩායම හැදුවෙ. උඹට මම කිව්වනෙ අපේ නාට්‍ය කණ්ඩායම මේ රටේ නොගිය පළාතක් නැති තරම්.

උඹ නොදන්නවට මට රස්සාවක් ලැබුණෙත් මගේ හිතුවක්කාර මුරණ්ඩු පිළිවෙත හින්දාම තමයි. අපි ඒ කාලෙ සම සමාජකාරයෝ. මම තමයි හන්දියෙ විශාල රතු බැනරයක් දැම්මෙ. හැබැයි මම ආර්.ජී.ට විරුද්ධව පිලිප් ගෙ මහජන එක්සත් පෙරමුණෙන් දඹදෙනියට ඉල්ලපු අල්විස් පෙරේරාට වැඩ කළා. අපේ ගේ ඉස්සරහ පොල් ගහක රතු පාටින් සරසපු විශාල කරත්ත රෝදයක් එල්ලගෙන ගෙයි මිදුලෙ අල්විස් පෙරේරා ට මම වේදිකාවක් හැදුවා. හන්දියෙ කඩේ මුදලාලි ආර්.ජී. ට තමයි වැඩ කළේ. මට තවම මතකයි අල්විස් පෙරේරා අර වේදිකාවෙ ඉඳගෙන කිව්ව කවි. ඔහුට ගොදුරු වුණේ අර මුදලාලිගේ කඩේ මුදුනෙම එසවිලා තිබුණ ඇවැන්ත නිල්කොඩිය.

හන්දිය කඩේ මුදලාලිගෙ බඩ ගෙඩිය
පිරවෙන විදිය දන්නව අර නිල් කොඩිය

අප්පච්චි තාලයකට ඇදලා පැදලා කියද්දී මට හිතුණේ අප්පච්චි කියන විදියට ඇත්තටම කවි කිව්වෙ අල්විස් පෙරේරා ද කියලා. බාග විට ඒව අප්පච්චිගෙ ම කවි වෙන්න ඇති. හිටිවන කවි වල දොරේ ගලන්නෙ මුඛරිකම. ඒ කව්වල එන ග්‍රාම්‍ය බවට හේතුව ඒකයි කියලා මම අප්පච්චිත් එක්ක වාද කළා.

මාත් එක්ක එකඟ නොවුනත් අප්පච්චි කිව්වෙ කවි කම කියන්නෙ මුබරිකම නම් ඒකත් එක විදියක හපන්කමක් තමයි කියලා.

මට මතකයි ඔය රැස්වීම වෙලාවෙ ආර්.ජී. හන්දියෙ මුදලාලිගෙ කඩේට ඇවිත් තිබුණා. අල්විස් පෙරේරාගෙ රැස්වීම සංවිධානය කරන්නෙ කව්ද කියලා ආර්.ජී. මුදලාලිගෙන් අහන කොට අපේ නාට්‍ය කණ්ඩායමේ ආවතේව කාරයා වුන ඇල්බට් ඉඳලා තියෙන්නෙ එතනමයි. ඒ කතා බහ මිනිත්තු ගණනකින් අපේ රැස්වීම් භූමියට පියාඹලා ආවා.

කව්දෝ නොන්ඩියෙක් පාරේ දඟලනවා
මේ රැස්විමේ අග මුල ගැන විමසනවා

අල්විස් පෙරේරා යකඩ කටෙන් ඇති පදම් හයියෙන් කියලා දැම්මා. ආර්.ජී. ගෙ එක කකුලක් කොරයි. මොහොතක්වත් නොරැඳී කොර කකුලත් අද්ද අද්ද උන්නැහේ කැඩිලැක් එකට නැග්ගලු.

අප්පච්චි හඬ නඟා හිනාවෙනවා. ඒ හිනාව වියැකෙන්න වැඩි වේලාවක් ගියේ නැහැ.

ආර්.ජී. ගෙ රැස්විම ඒ හන්දියෙ තියන්න නියමිතව තිබුණේ ඊට පස්සෙ. ඒ රැස්වීමට දවස් ගානක් තියෙද්දී තමයි මම රතු බැනරයක් පාර හරහා දැම්මෙ. එදා රෑ කන මදය වගේ බී ගෙන එතන හන්දියෙ පාර මැද වැටීගෙන ආර්.ජී. ව පතුරු හරිමින් ඉන්න කොට තමයි උන් මාව පැහැර ගෙන ගියේ. මාව පටව ගත්තෙ ලොරියකට. ඒ ලොරිය කෙලින්ම ගියේ දූල්ලෑව වත්තට.

ආර්.ජී. මට මුහුණට මුහුණ හම්බ වුණේ ඊට දවස් දෙකකට පස්සෙ. උන් මට හොඳට කන්න බොන්න දීලා සැලකුවා. දවස් දෙකකට පස්සෙ මාව ආර්.ජී. ඉස්සරහට අරගෙන ගියා.

ආ - මෙයාද මිනිහා?

ආර්.ජී. ඇහුවා. ඊළඟට කිව්වෙ මෙච්චරයි.

තමුසෙ ඉගෙන ගත්ත මිනිහෙක්නෙ මේ ගමේ. මම තමුසෙට ආණ්ඩුවේ රස්සාවක් දෙන්නම්. මගේ වැඩවලට ඇඟිලි ගහන්න එපා.

කිව්ව වගේ ම ආර්.ජී. මට රස්සාවක් දුන්නා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් කමක්. හැබැයි මගේ පළමු පත්වීම කලාවැව ට ලැබුණ නිසා ආර්.ජී. ට සැනසිල්ලක් ලැබෙන්න ඇති.

මගේ කතාව ඒක නොවෙයි. රස්සාවක් නැතුව නාට්‍ය කණ්ඩායමක් හදාගෙන රට වටේ යන කාලෙ වරක් අපි ගියා වාරියපොල. මලගනේ රජයේ පාසල කිට්ටුව තමයි අපි කඳවුරු බැඳ ගත්තෙ. මම ඉගෙන ගත්ත කෘෂිකර්ම විද්‍යාලය තිබුණෙත් මලගනේට යන පාරෙමයි. අපි මාස ගානක් තිස්සේ නාට්‍ය සංදර්ශන පැවැත්වුවා. කෘෂිකර්මෙ ඉන්න කාලෙ ඒ ප්‍රදේශයේ මිනිස්සු මම ළඟින් ඇසුරු කරලා තිබුණා.

අපේ නාට්‍ය කඳවුර පිහිටලා තිබුණේ පාසල අසලම විශාල පොල්වත්තක. ගමේ මිනිස්සු අපට හරියට සැලකුවා. මිනිස්සු මාව ඇමතුවෙ නාට්‍ය මහත්තයා කියලා. අපි එතන ඉඳගෙන වාරියපොල පුරාම තැනින්

තැන නාට්‍ය සංදර්ශන පැවැත්වුවා. වැල්ලැගල විහාරෙ පිංකම් අදාල කරගෙන සති දෙකක් පුරාම පවත්වපු නාට්‍ය සංදර්ශනේ ගැන අදටත් මිනිස්සු කතා කරනවා. මලගනේ ඉස්කෝලෙ ප්‍රධානාචාර්ය තුමා කලා ලැදි මනුස්සය. අපට එයාගේ කරුණාවයි සහයෝගයයි නොඅඩුව තිබුණා. මම හිතන්නෙ ඔය කාලය තුළ මම අලුතින් නාට්‍ය දහයක් පහළොවක් ලියලා පුහුණු කළා.

ඒ අව් අස්සෙ අපේ පිරිමි අහළ පහළ ගැහැනු සමඟ අමුතු සම්බන්ධකම් ඇති කරගෙන. අපි එහෙම විනයක් තිබුණ පිරිසක් නොවෙයි. පුදුමෙ කියන්නෙ මේ පළාතේ ගැහැනුත් මිනිහෙක් එක්ක නිදිවදින්න ලෑස්ති වෙච්ච ගමන් ඉන්නෙ. ගෑනියෙක්ව ඔය කොහේ හරි පඳුරකට දක්කන එක අපේ උන්ට ඒ හැටි කජ්ජක් නෙමේ. ඒත් මම මටම පනව ගත්ත නීතිරීති ටිකකින් සංවර කමක් ආරූඪ කරගෙන හිටියෙ. මේ නිසාම ගෑනු වැඩියෙන් ආකර්ෂණය වුණේ මට. මලගනේ ඉස්කෝලෙ ගුරුවරියකුත් මා එක්ක පැටලෙන්න ලෑස්ති පිටම හිටියා. මම ඒ එකියක්වත් ගණන් ගත්තෙ නැහැ. උඹ දන්නවනෙ මං ගැන. ගෑනු ගැන ආසාවක් නැතුව නෙමේ. ඒත් මං එහෙම පෙන්නුවා. මේ හින්දා නාට්‍ය මහත්තයා ආඩම්බරකාරයෙක් හැටියට තමයි ගෑනුන්ගෙ සංගම්වල කතා වුණේ.

ඒ දවස්වල මගේ සිරිත තමයි අහල ගං වල ඇවිදින එක. ඒ ඇවිදින ගමන් මම මගේ නාට්‍ය වල දෙබස් හිතින් නිර්මාණය කළා. ඒ වෙනකොට රජ කතා, චෝරකතා, දේවකතා, වනකතා ඔක්කොම ඉවරවෙලා තිබුණේ. මා

ආලය කළ තරුණිය, කැලෑ හඳ වගේ නවකතා මම නාට්‍ය බවට පරිවර්තනය කළා.

දවසක් මම ගමේ වැලි පාරක් දිගේ ඔහේ ඇවිදගෙන ගියා. ඒක ඉරණම් ගමනක්. වෙල්යායක මායිමේ කුඩා බෝක්කුවක් ළඟින් තව පටු පාරක් පටන් ගන්නවා. මගේ දෙපා ඉබේම ඒ පාරට ගොඩ වුණා. ඒක ඉබාගාතේ ගිය ගමනක්. මම වැඩි දුරක් ගියේ නැහැ. කුඩා ගෙපැලක් ඉස්සරහ මිදුලක කව්දෝ තරුණ ස්ත්‍රියක් වැඩක යෙදිලා ඉන්න හැටි මගේ ඇස්වලට ගොදුරු වුණා. මම හිතන්නේ ඇය බිම එලපු මාගලක එලා තිබුණ මොනවා හරි අතින් තුනී කරමින් හිටියෙ.

මම ගල් ගැහිලා ඇය දිහා බලාගෙන හිටියා. මේ ගමේ ඒ තරම් පොත්ත රතු එකියක් මම ඊට කලින් දැකලා හිටියෙ නැහැ. ඇගේ දිගු කෙස් වැටියත් කඩා හැලීගෙන ඇයත් එක්ක හරි හරියට මාගලේ වී අතුරනවා. ඇය නැමිලා හිටපු සාරසුබාව කාගෙ වුණත් හිත කළඹන සුළුයි. උකුලට ඔහේ මගේ බැල්ම එක්ක හුරතල් වෙන්න ඉඩ දීලා ඇය තමන්ගෙ වැඩේ කරගෙන ගියා.

මම වැට ඉස්සරහ ඇය දිහා කොයි තරම් වෙලාවක් බලාගෙන හිටියාද කියලා මට මතක නැහැ. මෙහෙම මේ විදියට තරුණ ස්ත්‍රියක දෙස බලා සිටීම අශීලාචාර නොහොබිනා දෙයක් ලෙස මට දැනුනේ නැහැ. ඇය එක්වරම හැරිලා මා දෙස බලන තෙක්ම මම හුන් තැනම ගල් ගැසී හිටගෙන සිටියා. මාව දුටු ගමන්ම ඇය දූන්නක් වගේ කෙලින් වී සිට ගත්තා. මාව හඳුනාගත් බවක් ඇගේ මුහුණින් පළ වුණා. ඒ වෙනකොට ඒ පළාතේ නාට්‍ය මහත්තයාව නාඳුනන කෙනෙක් හිටියෙ නැහැ.

ඇගේ මුහුණේ මන්දස්මිතයක් ඇඳිලා වහාම මැකී ගියේ තැති ගත් බවක් පළ කරමින්. ඊළඟට ඇය නොඉවසිල්ලෙන් ගේ දිහා බැලුවා. ඇය ගවුමකට උඩින් මල් වැටුන චීත්ත රෙද්දක් ඇඳගෙන හිටියෙ. වහාම එතැනින් පියමන් වෙන්න යයි ඇය මට අතින් සන් කළා. එහෙත් මම තවදුරටත් නොසෙල්ව එතනම සිටගෙන සිටියදී ඇය වෙලෙව්ව ගේ දිහාවට පිය මැන්නා. ඉස්තෝප්පුවට ගොඩ වී ගෙට ඇතුළු වීමට මොහොතකට පෙර ඇය ආපසු හැරී මා දෙස බැලුවා. තැති ගැන්ම සමඟ මුසුවුන ඇගේ මුහුණේ සුන්දරකම මාව මුසපත් කළා.

ඉන් පස්සෙ දවස් ගණනක්ම මම ඒ පාරේ ගියත් මට ඇයව දකින්න ලැබුණේ නැහැ. ඒ වෙනුවට දවසක් මම දැක්කෙ මිදුලෙ හිටගෙන හිටපු ඌරු වැද්දෙක් වගේ මරුමුස් පෙනුමක් තියෙන මිනිහෙක්. ඔහු සරම මවිල් වලින් ගැවසුන කලවා පෙනෙන විදියට කෙටි කර වලාපට ගහගෙන හිටියෙ. ඉනේ දිග පිහියක්. මම ගේ ඉදිරිපිට දි ගමන බාල කර බලද්දි ඔහුගේ මරු මුස් බැල්ම ඉස්සර වුණා.

ඊට පස්සෙ මම ඇයව දැක්කෙ අපේ නාට්‍ය දර්ශනයක් නැරඹීමට පැමිණි සෙනඟ අතර සිටි නරඹන්නියක් විදියට. අප එවර නාට්‍ය පෙන්නුවේ පාසලේ මිදුලේ තනවපු වේදිකාවක. පැති තිරයක් අතරින් ප්‍රේක්ෂක ජනකාය ඉදිරියෙන් ම ඇය සිටගෙන සිටිනු මම දුටුවා. එදා එතන වේදිකා ගත වුණේ මම අලුතින් ම ලියපු කැලෑහඳ. මමයි ඒකෙ ජෝන් ජයපාල.

වේදිකාව ආසන්නවම සිටගෙන සිටින සුරූපිනිය දුටුවම මට ඉහිලුම් නැතිව ගියා. මම ඇල්බට්ව ළඟට කැඳවලා ඇයව පෙන්නුවා.

එකක ගෙන වරෙන් කොහොම හරි ස්ටේජ් එක පිටි පස්සට.

ඇල්බට් ටිකක් අදි මදි කළා. ඊළඟ දර්ශනයට ජෝන් ජයපාල වේදිකාවට පැමිණීමට නියමිත බව ඇල්බට් මතක් කරා.

හරි හරි ඒකට තව වෙලා තියෙනවා.

ඊළඟට මම දුටුවේ ඇල්බට් සෙනඟ අතර තෙරපෙමින් ඇය ළඟට සමීප වන ආකාරයයි. ඔහු ඇයගේ කනට ලංවී මොනවාදෝ කියනවා. ඇය එක්වරම හැරී ඇල්බට් දෙස බලා අනතුරුව වේදිකාව දෙස බැලුවා. පැති තිරයට මුවාව සිටින මාව ඇයට පේන්නේ නැහැ.

මේ වෙලාවේම ආබා මගේ කනට කරලා මොනවාදෝ කියනවා. මම ඔහු කියන දේ අහන්න ඔහු සමඟ අයිනකට වුණා. ආබා කියන දේ මට හරියකට තේරුණේ නැහැ. මම හිතන්නේ ඔහු කළේ පෙළ මතක් කර දෙන විල්සන් ගැන පැමිණිල්ලක්.

හරි හරි ආබා මං ඒක ගැන බලා ගන්නම්.

ඊළඟට මම පැති තිරය අතරින් සෙනඟ දිහා බැලුවා. ඇය එතනින් අතුරුදහන් වෙලා.

බෝධි මහත්තයා අන්න අරකි ආවා.

ඇල්බට් වේදිකාව පිටුපසින් ඇවිත් කොඳුරනවා. මම වේදිකාවෙන් බිමට පැන පිටුපස කළුවර අතරට දියවුණා.

හැබැයි ඊළඟට ජෝන් ජයපාල තමයි එන්න තියෙන්නෙ.

හරි හරි යකෝ මම ඇඳගෙන ඉන්නෙ. වෙලාවට එන්නම්. මට කතා කරපන්කො.

එතකොට ඇය ළඟටම ඇවිත්. මම ඇගේ අතකින් අල්ලලා ළඟට ඇදලා ගත්තා.

මම මහත්තයාව දැක්කා.

ඇය තොල් මතුරනවා.

ඇයි ඉතින් කතා නොකළේ මොකක්ද ඔයාගෙ නම?

රත්නාවතී. මම ඇගේ නමට ආලවන්තකම තැවරුවා.

රත්නා!

මම ඇයව තුරුළු කරගෙන ඇගේ මුහුණෙ තොල් පිහිටා තිබුණ තැන සොයා ගත්තා.

මගේ මනුස්සයා මාව මරයි.

ඇගේ පපුව ගැහෙනවා.

අර ඌරු වැද්දා ද ඔයාගෙ මනුස්සයා.

ඊළඟට මම කළේ ඇය ළඟම තිබුණ පාසල් ගොඩනැගිල්ල දිහාවට ඇදගෙන යන එක. මට එක පාරටම මැවිලා පෙනුනෙ ඌරු වැද්දාගෙ දැවැන්තකමට මේකිව තැලෙන පොඩිවෙන සැටි.

බෝධි මහත්තයා දැන් සීන් එක.

ඇල්බට් ඇත ඉඳගෙන කොඳුරනවා. මට ඇය අත හරින්න හිතෙන්නෙ නැහැ.

පස්සෙ එන්නම් මහත්තයා.

ඇය මගෙන් ඈත් වෙන්න හදනවා. මම ඇයව තදින් තුරුළු කර ගත්තා.

එපා මහත්තයා... මගේ මිනිහාත් ඇවිත් ඉන්නවා. මහත්තයාගෙ කොටස කරන්න යන්න. නැත්නම් මිනිස්සු කලබල වෙයි.

ඇත්තටම මිනිස්සු කලබල වුණා. පාසල් භූමිය දෙවනත් කරගෙන හුවක් නැඟුනා. මම රත්නව අතහැරලා වේදිකාව දිහාවට දිව්වා.

කෝ යකෝ නාට්‍ය මහත්තයා.

උන් වේදිකාවත් ආක්‍රමණය කරලා. ආබා කරකියා ගත හැකි දෙයක් නොමැතිව බලාගෙන ඉන්නවා.

කෝ යකෝ තේගිසාගෙ ගෑනි.

අර නාට්‍ය මහත්තයාත් එක්ක ඉස්කෝලෙ ඇතුළට රිංගුවෙ.

කෝ යකෝ මගෙ ගෑනි?

ඌරු වැද්දාගෙ අතේ දිග මන්නයක්. ඒක ඉහළට එසවුණේ මගේ හිස් මුදුන ඉලක්ක කරගෙන. ඊට කලින් ආබාගේ පොලු පහර ඉස්සර වුණා. ඌරු වැද්දා (උගේ නම තේගිස්) වේදිකාව හරහා ඇදගෙන වැටුනා. දැන්

එතන එකම කාලගෝට්ටියයි. පොලිසියත් එතනට කඩාගෙන වැදුනා. තේගිස් රෝහලට ගෙන ගියේ ඊට පස්සෙ. අපට පහුවදාම ඒ පළාත අතහැරලා එන්න සිදුවුණා. වහාම පළාතෙන් පිටවී යන ලෙස පොලිසිය අපට දැනුම් දුන්නා. ඒ අනුව අපි ගම රට බලා ආවා. තේගිස් රෝහලේ ලගින අල්ල පනල්ලෙ රත්නා මාත් එක්ක ආවා.

අප්පච්චි කතාව නවත්තලා මා දිහා බලාගෙන ඉන්නවා. අප්පච්චිගෙ තියුණු බැල්ම මට දරාගන්න බැරි තරම්.

ඇයි අප්පච්චි?

බැරිම තැන මම ඇහුවා.

මම මේ කල්පනා කළේ එදා ඒ මා එක්ක ආවේ උඹේ අම්මා කියලා උඹට කියනවද නැද්ද කියලා.

අප්පච්චි!

පහුවදා උදේම මම තේ එකකුත් හදාගෙන අප්පච්චිගේ කාමරේට ගියේ අප්පච්චිට මුහුණ දෙන්නෙ කොහොමද කියලා සිතමින්. නැහැ ඔය කියන රත්නා මගේ අම්මා නම් අප්පච්චි කොහොම ද මට මුහුණ දෙන්නෙ? අප්පච්චි ඊයේ රාත්‍රියේ එළිදරව් කළේ එච්චර කාලයක් සැඟවී තිබුණ රහසක්.

මට මතකයි ඒ දවස්වල අප්පච්චි රාවණා ට පක්ෂ ව වාද කරනවා. මේ වාදය ඇවිලෙන්නේ අපේ ගෙදර සාලයේ. ඥානසේකර ලොකු ඉස්කෝලෙ මහත්තයා තමයි අනෙක් පාර්ශවය. අප්පච්චි නගන තර්කය තමයි අපේ ජාතිය ආරම්භ වුණේ විජයගෙන් නොව රාවණාගෙන් බව.

අප්පච්චි ට අනුව විජය යනු මං පහරන්නෙක්, හොරෙක්. එහෙම කෙනෙක් අපේ ජාතියේ පියා වෙන්නෙ කොහොමද? ඥානසේකර ඉස්කෝලෙ මහත්තයාත් එහෙම ලේසියෙන් අතහරින කෙනෙක් නොවෙයි. රාවණා කියන්නෙ ගෑනු හොරෙක්. ඔහු අනුන්ගේ ගෑනියෙක් ව හොරකම් කරගෙන ආපු තිවටයෙක්.

මේ තිවටයෙක් කියන යෙදුමට තමයි අප්පච්චි පරලය වෙන්නෙ. ඔහු ඇඟිලි දෙක පිලිස්සෙන්න ඔන්න

මෙන්න කියලා ඇවිලී තිබුණ සිගරැට්ටුවේ අන්තිම නිකොටින් ටිකත් පපුවට උරාගෙන හුන් තැනින් නැගිට්ටා.

ඒක කොහොමද ඥාන සේකර මහත්තයො නිවටකමක් වෙන්නෙ? ගෑනියෙක්ව බලහත්කාරයෙන් අරගෙන එන එකත් හපන්කමක් තමයි.

ගෑනියෙක්ව එයාගෙ කැමැත්තට විරුද්ධව බලෙන් අරගෙන එන එකද වීරකම?

සීතා රාවණ එක්ක ආවෙ කැමැත්තෙන්. ඒක සීතාගේ හිතේ තිබුණ ආලවන්තකමක්.

මට හොඳටම මතකයි උලුවස්සට හේත්තු වී ගෙන මේ කතා බහ අහගෙන සිටි අම්මා මුළු තැන් ගේ දිහාවට ගිය බව. ඇයි අම්මා එහෙම පැනලා ගියේ? අප්පච්චිගෙ උදව්වට ඔහුට පක්ෂව හිතින් තර්ක ගොඩ නගමින් සිටියා මිසෙක මට ඒ ගැන තිනච්චක් නැහැ.

මම කාමරයට ඇතුල්වුණා. අප්පච්චි ඇඳේ නැහැ. මෙච්චර උදෙන් නම් එයා ඇහැරෙන්නෙ නැහැ. මම ගේ හැම තැනම අප්පච්චිව හෙව්වා. ගෙයින් එළියට බැහැලත් අප්පච්චි අප්පච්චි කියමින් කෑ ගසා අප්පච්චිව කැඳෙව්වා. එතකොටම තමයි අල්ලපු ගෙදර හිල්ඩා ගෑනි ජනේලයකින් මා දිහා බලාගෙන ඉන්න බව දුටුවේ. අප්පච්චි යනවා හිල්ඩා දකින්න ඇති.

හැතිරියක් වුනත් අප්පච්චි යනවා දැක්කාද කියලා අහන්න මම ටිකක් වැට අයිනට සමීප වුණා.

මිසිස් ගුණවර්ධන අපේ අප්පච්චි එහෙම උදේම යනවා දැක්කාද?

මම එහෙම අහනකොට හිල්ඩා ගෙ මූහුණ සුදුමැලි වුණා. මම තව ටිකක් ඇර තිබුණ ජනේලය දිහාවට ගියා. අප්පච්චි උදේම යනවා හිල්ඩා දකින්න ඇති. මට ඕන වුණේ අප්පච්චිගෙ හිතුවක්කාර ගති ගැන හිල්ඩාත් එක්ක කයිවාරු කදයක වැටෙන්න. ඒත් මම අප්පච්චි ඊයේ රෑ කියපු කතාව නම් කීයටවත් කියන්නෙ නැහැ. මොන පූතකුටද පුළුවන් තමන්ගෙ අප්පච්චිගෙ කතාව මේකයි කියලා පිටස්තර කෙනෙකුට කියන්න. අප්පච්චි ගැන රට්ටු මොනවා නොහිතයිද?

ඒත් එක පාරටම සිදුවුණේ මම නොහිතපු දෙයක්. මම හිල්ඩාත් එක්ක කතාවට වැටෙන්න ගියේ බොහොම සුහද විදියට. පසමිතුරු බවක ලකුණක් එහි තිබුණේම නැහැ. ඒත් මේ ගෑනි එක පාරට ම ජනේලය දඩස් ගාලා මගෙ මුහුණට වහලා දැම්මා.

මගේ ඇඟ දැවෙන්න පටන් ගත්තා. අප්පච්චි මේ ගෙදර ඉන්න එක ගැන මේ අවට කිසි කෙනෙක් කැමති නැහැ. මේ හැමෝම එකතු වෙලා කුමන්ත්‍රණයක් කරල අප්පච්චිව එලවා ගත්තා. විශේෂයෙන් ම හිල්ඩා. ඇය තමයි අප්පච්චි මේ ගෙදර නිදහසේ ඉන්න එක ඇහේ කටු ඇනිල්ලක් කර ගෙන තිබුණේ.

තොපි ඔක්කොම එකතු වෙලා. කුමන්ත්‍රණය කරලා අප්පච්චිව එලවා ගත්තා. මම දහ අතේ කෑ මොර දුන්නා.

යකෝ ඒ වයසක මනුස්සයා මොනවා කළාටද උඹලා ඒ මනුස්සයා එලවා ගත්තෙ. අනිත් එක උඹලා

කව්රුවත් නොදන්නවාට ඒ මනුස්සයා ජීවිතේ විඳපු කෙනෙක් මිසක් විඳවපු කෙනෙක් නොවෙයි.

කෑ මොර දීමේ පලක් නැති බව ඒ එක්කම මට කල්පනා වුණා. අප්පච්චි ඔය ගියාට ඉක්මනටම ආපහු ඒවි. ඒත් අප්පච්චි නැති මේ ගෙයි මම කොහොමද තනියම ඉන්නෙ.

මට වැඩියක් ම වේදනාවක් වුණේ මගේ රහස් කතාව එළිදරව් කරන්නත් කලින් අප්පච්චි ගිය එක. අප්පච්චිගෙ ජීවිත කතාවට එරෙහිව පිහිටුවන්නට නියමිතව තිබුණ ඒ කතාව මා තුළම ගිලී ගිහින්.

මම කතාව නවත්තලා ගෙතුළට වැදුනා. කිසිම ගෘහ භාණ්ඩයක් අලංකාර සැරසිල්ලක් නැති හිස්ම හිස් සාලය මැද මම තනිවී බලාගෙන හිටියා. වුණේ මොකක්ද කියලා මට තවමත් සිහි එලවා ගන්න බැහැ. සංකේතික පාරිභෝගික වස්තුන් ගෙන් හිස් වුණ සාලය මැද සිටගෙන හිටියා. ඊළඟට මගේ කාමරය තුළට ගොස් ඇඳේ වැතිරුණේ අප්පච්චි ඇවිත් මට කතා කරාවි යන බලාපොරොත්තුවට ඔහේ වැඩෙන්න ඉඩ දෙමින්.

මට දැඩි කුස ගින්නක් දැනුණා. ක්‍රමයෙන් කුසගින්න ඇවිල්ලක් බවට පෙරළිලා උගුර දිහාවට ගලන්න පටන් ගෙන. අද සෙනසුරාදාවක් නිසා කන්තෝරු යන්න වෙන්නෙ නැති එක ලොකු දෙයක්. නිවාඩු දවසට අපි උයන්නෙ නැහැ. අප්පච්චියි මායි දෙන්නම ගිහින් පාන් අරගෙන එනවා.

මම දඩි බිඩියෙම කලිසමක් දාගෙන එළියට බැස්සා. වෙනදාට ඒ යන අතරමගදිත් අප්පච්චි මාත් එක්ක

කොයි තරම් දේවල් කතා කරනවාද? බාග වෙලාවට කඩේ ඉස්සරහට ගිහින් බඩු ගැනිල්ල පැත්තක තියෙද්දි අප්පච්චියි මමයි කයිවාරු කදයක වැටෙනවා.

මිනිස්සු පුදුමයෙන් අපි දිහා බලාගෙන ඉන්නවා. උන් හැසිරෙන්නෙ හරියට මම විතරක් තනියම කතා කරන සැටි බලාගෙන ඉන්නවා වගේ. මට පේන්නම බැරි කොල්ලො කුරුට්ටො මගේ පිටිපස්සෙ රොක් වෙන එකට. ඉන්න අප්පච්චි මම මූන් ටික එලවලා දාන්න. දුවපියව්! මම කෑ ගහනකොට උන් දුවනවා. ආයෙත් ටිකකින් මගේ පිටි පස්සෙ රොක් වෙනවා. බැරිම තැන අපි දෙන්නා ගෙදර එනවා.

අද මම ඉන්නෙ තනියම. මට කතා කරන්න අප්පච්චි ළඟ නැහැ. මම කෙලින්ම ගිහින් කඩේ මුදලාලිගෙන් පාන් ගෙඩියක් ඉල්ලුවා. මුදලාලි ටිකක් විස්මයෙන් වගේ මා දිහා බැලුවා.

අ... අද කෝ අප්පච්චි?

මුදලාලිගෙ කතාවේ වික්කලයක් තියෙනවා. ප්‍රශ්නය ඒක නොවෙයි. ඒක අහපු විදිය විරූප වුණේ වික්කලය හින්දාම නොවෙයි. ප්‍රශ්නය තුළ තිබුණේ ඔලොක්කුවක්. ඒත් එක පාරටම ඒක වෙනස් කරලා ඔහු හිනාවුණේ බොරුවට බව ඕන කෙනෙකුට තේරෙනවා.

අප්පච්චිට ටිකක් සනීප මදි... මම එනකොටත් තාම නිදි.

අප්පච්චි ගෙදරින් ගිහිල්ලා කියලා කියන්න මගේ හිත ඉඩ දුන්නෙ නැහැ. කඩය ඇතුළේ ඉඳගෙන හිටපු

පිරිමියෙක් කම්මුලේ අත ගහ ගත්තා. අප්පච්චි ට සනීප නැහැයි කියපු එක මිනිහා විශ්වාස කරන්නෙ නැහැ වගේ.

ඇත්තමයි. අප්පච්චිට සනීප නැහැ. මගේ හිතටත් හරි මදි.

මම කෙලින්ම අර මිනිහා දිහා බලාගෙන කතා කළේ. මිනිහාගේ මුහුණේ ඒ ගමන මහ කල්ල කඩත්ත හිනාවක් ඇඳුනා. අද අප්පච්චි නැති එක ගැන හැමෝටම කුතුහලය. මට තව එක මොහොතක් එතන ඉන්න හිත දුන්නෙ නැහැ. මම පාන් ගෙඩිය අරගෙන පාරට බැස්සා.

ගෙට ඇතුළු වෙනකොටම අප්පච්චි කහින සද්දෙ ඇහුනා. එහෙනම් අප්පච්චි ඇවිදින්. මම කෙලින්ම ගියේ අප්පච්චිගේ කාමරේට. අප්පච්චි ඇඳ උඩ ඉඳගෙන කෙලින්ම මා දිහා බලාගෙන ඉන්නවා. අප්පච්චි බලාගෙන ඉන්නෙ මම කොහේවත් ගියේ නැහැ කියනවා වගේ. මම ඒ ගැන මොකුත් අහන්නෙම නැතුව කාමරේ මේසෙ උඩින් පාන් ගෙඩිය තිබ්බා.

Scanned by CamS

අප්පච්චි දවසක මේ ගෙදරින් සදහටම යන බව මම දන්නවා. ඊට කලින් මම මේ කතාව අප්පච්චිට කියන්න ඕන. අද මම එලිවෙනකම් හරි ඒ කතාව කියනවා. ඒත් අප්පච්චි මම කොහෙන්ද පටන් ගන්නෙ?

කොතනින් පටන් ගත්තත් උඹ මට කියන්නෙ උඹම හදාගත්ත කතාවක් තමයි. ඒකෙ වෙනසක් නැහැ. ඉතින් කියපන් තෙපර බාන්නෙ නැතුව.

අප්පච්චිගෙ ගොරෝසු කට හඬට මම තෝන්තු වුණා.

මේ කතාව මම පටන් ගන්නෙ සුමාලි හම්බ වුණ තැනින්. ඇත්ත. සුමාලි මට මුණ ගැහුණේ විශ්ව විද්‍යාලෙදී තමයි. සාමාන්‍යයෙන් විශ්ව විද්‍යාලයේදී ගැහැණු ළමයකු සමඟ ප්‍රේම සම්බන්ධකම් ගොඩ නගා ගන්න නොයෙක් ක්‍රම තිබෙනවා. විශ්ව විද්‍යාලයේ මගේ අවසන් වසර වෙනකම්ම ඒ එක ක්‍රමයක්වත් හරි ගියේ නැහැ.

විශේෂයෙන් අලුත් ශිෂ්‍ය කණ්ඩායමක් ආපුවම නවක වධය කාලය තමයි ගැහැනු ළමයකු සමඟ සම්බන්ධකමක් ගොඩ නගා ගන්න තියෙන හොඳම අවස්ථාව. අප්පච්චි මට ඒ අවස්ථාවත් ගිලිහුණේ මගේම

වරදින්. සාමාන්‍යයෙන් එහෙම දෙයක් සිදුවන්නෙ එක්කෝ අලුතින් ආපු ශිෂ්‍යාවක් නවක වධයෙන් ගලවා ගැනීමෙන්. නැත්නම් නවක වධය දීමෙන්මයි.

අපේ දෙවන වසරේදී මම කෙල්ලෙකුට ඇහැ ගහ ගෙන හිටියා. ඒ කෙල්ලව තනියම කොටු කර ගන්න මාන බලමිනුයි මම හිටියෙ. දවසක් මම ඇයව දේශන ශාලාවකට ඇතුළු වීමට පොදිකන පොරකන පිරිසගෙන් වෙන් කර ගත්තා.

ඒත් මම කරන්න ඕන මොකක් ද කියලා මට නිනව්වක් නැහැ. ඒ අතරෙ තව දෙතුන් දෙනෙකුත් එතෙන්ට වට වුණා. දීපන් ඕකිට හොඳ රැගක්. එකෙක් කිව්වා. මට ඕන වුණේ ඒකිව මේ හැමෝගෙන්ම බේර ගෙන කොහේ හරි තැනකට අරගෙන ගිහින් මගේ ආදරය ප්‍රකාශ කරන්න. ඒත් මම එතනදි කළේ මම සිතූ දේ වත් කළ යුතුව තිබූ දේ වත් නොවෙයි.

ගනිං හාෆ් ෂීට් එකක්.

ඇය මගේ අණින් කිසි කතාවක් නැතුව තමන්ගෙ පොත් මිටිය අවුස්සලා සුදු කඩදාසියක් ගත්තා. ඇගේ මුහුණ කිසිදු බියපත් බවක් පළ කළේ නැහැ. මගේ කෝපය ඉහ වහා ගියේ එකෙනුයි.

බැල්ලි... මං කියන ඒවා ලියපන් ඔය කොළේ. හරියට ලියලා නොතිබුණොත් උඹට වෙන දේ උඹ දන්නෙත් නැහැ.

එතන හිටි හැමෝම තුෂ්නිම්භූතව බලාගෙන ඉන්නවා. ඒත් නවක ශිෂ්‍යාවගේ මුහුණින් පළවුණේ උකටලී විලාශයක්. සියුම් උපහාසයක් ඇගේ බැල්මෙන් ප්‍රකාශමාන වන බවයි මට පෙනුණේ.

Scanned by CamS

ලියපිය... පුරුෂ ලිංගය කියන කුණු හරුපෙට කියන ශිෂ්ට සිංහල වචනය.

මම බෙරිහන් දුන්නා. ඇය මා දෙස බැලුවේ ඔච්චර බෙරිහන් දෙන්නෙ ඇයි? කියන විදියෙ බැල්මකින්. ඇය උරහිස් හකුලා ගත්තා.

ඊළගට ඇය අර හිස්කොලයේ උඩින්ම'ප' ලියන විට අපි හැමෝ ම ගල් ගැහුණා. ඇයට වගේ වගක් නැහැ. ඇත්තටම එතැන රැග් වුණේ ඇය නොවෙයි මම මයි. ඇය අතහැරලා දමලා එතනින් යද්දි එකෙක් කිව්වෙ යකඩ කෙල්ලක් කියලයි.

ඉන් පස්සෙ මේ යකඩ කෙල්ල මට හමුවෙන්නෙ පුස්තකාලය ළඟදී. ඇය මාව දැකලා බොහොම සුහදව හිනාවුණා.

යමුද මොනවා හරි බොන්න.

මගේ යෝජනාවට ඇය එකඟයි. අපි කැන්ටිමට ඇතුළු වුණා. මම ඇයට මගේ ඇති කැමැත්ත ප්‍රකාශ කරන්න වචන හොයා ගත්තෙ මේසයක වාඩි වෙන්නත් කලින්. ඇය පුදුමයෙන් වගේ මා දිහා බැලුවා. ඒ පුදුමය සෝපාහාසයක් බවට රූපාන්තරණය වීමට වැඩි වෙලාවක් ගත වුණේ නැහැ. ඊළඟට ඇය හිනාවෙන්න පටන් ගත්තා. ඇය වියරුවෙන් වගේ ඇස්වලින් කඳුළු පනිනකම්ම හිනාවුණා. අවට සිටි අයත් අපි දිහා බලන්න පටන් අරගෙන.

ඇය ක්‍රමයෙන් හිනාව පාලනය කර ගත්තා. එය ඇයවත් නොදන්න ඉසව්වකින් පැන නැගුන හිනාවක්. ඊළඟට ඇය කතා කරන්න පටන් ගත්තා.

ඔයාට මතකනෙ එදා රැග් එක.

මට සමාවෙන්න !

නැහැ. ඒක සමාව කියන වචනයත් එක්ක සම්බන්ධයක් නැහැ. ඒ රැග් එක ඔයා ගැන හොඳ හැඳින්වීමක්. ඉතින් ඔයා මට කියන්නෙ ඔයා වගේ පර්වර්ට් කෙනෙකුට කැමති වෙන්නද? මම හොයන්නෙ ඔයා වගේ කෙනෙක් නොවේ. මම හොයන්නෙ කලාත්මක හදවතක්.

ඇය හුන් තැනින් නැගිට මේසය උඩ විසිරී තිබුණ පොත් ටික එකතු කර ගෙන පිටවී ගියා. හිස් බැල්මෙන් ඇය දෙස බලා සිටිනවා හැර මට කරන්න වෙන දෙයක් තිබුණේ නැහැ.

අප්පච්චි මහ හයියෙන් වියරුවෙන් වගේ හිනාවෙන්න පටන් ගත්තා. හිනාව කෙළවර අප්පච්චි මන්තරයක් වගේ මොනවාදෝ මුමුණනවා.

කලාත්මක හදවතක්... කලාත්මක හදවතක්...

අප්පච්චිගේ මිමිනීම අතරින් එළියට පනින්නෙ ඒ වචන.

නිස්සංක උඹ එතනදි නම් ගැලවුණා. ඔය කලාත්මක හදවත කියන වචනය පිටි පස්සෙ තිබුණ මර උගුල උඹ හරියට දැක්කෙ නැතත් දෛවයකින් වගේ උඹ ගැලවුණා.

අප්පච්චි ආයෙමත් හිනාවෙන්න පටන් ගත්තා. මම ගැස්සුණේ ඒ හිනාවට නෙවෙයි. අප්පච්චිගේ නවීන සිතිවිලිවලට.

නැහැ අප්පච්චි ඊට පස්සෙවත් මට ගැහැණු ළමයෙක් එක්ක සම්බන්ධයක් හදාගන්න බැරිවුණා. සුමාලි හම්බ වෙන කම්ම විශ්ව විද්‍යාලය තුළ මට ගෙවන්න සිදුවුණේ හුදෙකලා ජීවිතයක්.

එතකොට උඹට සුමාලිව හම්බ වුණේ කොහොමද?

ඇත්තටම අප්පච්චි එහෙම ඇහුවාද කියලා නම් මට මතක නැහැ. මම කියාගෙන ගියා.

ඒ මම විශ්වවිද්‍යාලයේ ගෙවපු අවසන් අවුරුද්ද. දවසක් නව කලාගාරයේ චිත්‍රපට දර්ශනයක් තිබුණා. ඒක සංවිධානය කළේ අපිමයි. සත්‍යජිත් රායිගේ සිනමාව. මට මතක හැටියට එදා පෙන්නුවේ චාරුලතා. මම චිත්‍රපටය බලන්න ඉඳ ගත්තෙ කළුවරේම ශාලාවට ඇතුළු වෙලා. ඒ වෙන කොට ඔක්කොම වගේ ආසන පිරිලා. මම අඳුරේම ඉඩ තිබුණ තැනකින් වාඩි වුණා.

මම කළුවරේම වාඩි ව තිබුණේ ගැහැනු ළමයකුට යාබදව. කළුවර අතරින් හිස හරවා බැලූ මට දක්නට ලැබුණේ ඒ ආසන පේළියම ගැහැණු ළමයින්ගෙන් පිරී තිබුණ බවයි. මේ අතරතුර පුටු අත මත තබාගෙන තිබූ යාබද තරුණියගේ වමත මගේ සුරතෙහි ස්පර්ශ වුණා. ඇය අත ඉවතට නොගත් නිසා එම අතෙහි පහසට ලොල්ව ඇය දෙසට නැඹුරු වුණා. එම ස්පර්ශ කතාබහ දුරදිග ගියාම මම මගේ දකුණත උකුල දෙසට බර කර ඇගේ ඇතැඟිලි මගේ ඇඟිලි අතර සිර කර ගත්තා.

තරුණිය ඇගේ ඇඟිලි මගෙන් මුදා ගනිමින් යාබද යෙහෙළියගේ කනට කර යමක් පැවසුවා. ඉන් මොහොතකට පසු නැඟී සිටි ඇය යෙහෙළිය සමඟ

තමන් සිටි අසුන හුවමාරු කර ගත්තා. මට මුලින්ම හිතුණේ එතැනින් නැගිටලා යන්න. ඇය එතනින් නැඟී ගිය පුවත දැනටමත් මේ ගැනු පේලියේ කෙළවරට ගිහින් ඇති. චිත්‍රපටය අහවරව ශාලාව එළිය වන්නට පෙර එළියට පැන ගන්න මම හිත හදා ගත්තා.

මම අලුත් තරුණිය දෙස නිකමටවත් හැරි බැලුවේ නැහැ. එහෙත් මම තිරය දෙස බලාගෙනම ඇගෙන් මෙහෙම ඇහුවේ මගේ වරදකාරී බව වසන් කර ගැනීමට.

ඇයි අර ගර්ල් සීට් මාරු කර ගත්තෙ?

මට ඕන වුණේ ඇය මා ගැන කී දේ හරියටම දැන ගන්න.

සුමාලිද? ඇයි එයා මෙතන ඉන්නවට කැමතිද? මේ ඉස්සරහා ඉන්න කෙනාගෙ ඔලුව හින්දා එයාට පේන්නේ නැතිලු. සුමාලි එච්චර උස නැහැනෙ.

මා ඇය දෙස බැලුවේවත් ඇය මා දෙස බැලුවේවත් නැති බව ඇත්ත. එහෙත් මේ අලුත් තරුණියගේ කටහඬ මා තුළ ජනිත කළේ අපූර්ව ප්‍රබෝධයක්. එහෙනම් සුමාලි ඇයට මොකුත් කියලා නැහැ. තරුණිය චිත්‍රපටය සමඟ බැඳිලා. පුටු අත මත තිබුණ ඇගේ වමත මගේ දකුණත සමඟ ස්පර්ශ වන විටම මම අත වහා අහකට ගත්තෙ සර්පයකු ස්පර්ශ වූ ආකාරයෙන්. ඇය චිත්‍රපටය සමඟ සිනාසෙනවා මට දැනුණා. ඊළඟ වතාවේදි එම ස්පර්ශයට මම ඉඩ දුන්නා. ටිකකින් මට දැනුණේ ඇයම මගේ අත තරව මිරිකා ගත් බවයි.

ඉතාම සුළු වෙලාවකදි මම ස්ත්‍රී ශරීරයක් සමඟ නිදහසේ දොඩමලු වන්නට පටන් අරගෙන. ඇගේ වමත

මා දෙසට දික්වී මගේ ශරීරය ගවේෂණය කරනවා. ඇය සිහින් කෙඳිරියක් නගන හඬ මට ඇසුණා. දෙනෝ දහක් මැද අප රමණ කෙළියක යෙදෙනවා වගේ මට දැනුණේ. ඇය නොවෙයි සුමාලි වේගයෙන් හුස්ම හෙළන හඬ මට ඒ මොහොතේ ඇසුණා.

සිනමා පටය නිම වී අක්ෂර මාලාව තිරය මත සිරස්ව ගලා යද්දී මම ඇගෙන් මිදුනා. සාලාව එළිය වූ විට මම ඇය දෙස හැරී බැලුවා. දෙවියනේ! මම තිගැස්සුණා. එතන හිටියෙ මම දකින්න බලාපොරොත්තු වුණ විදියේ තරුණියක් නොවෙයි. ඇගේ මුහුණ හරිම අවලස්සනයි. යටිතොල ඇඟුලක් පමණ පළලයි. ඇගේ මුහුණේ අවලස්සන කම තීව්‍ර වුණේ ඉදිරියට නෙරූ දත් අතර තිබූ හිදැසින්.

මම සුමාලි දෙස බැලුවා. ටිකක් තලෙලු වුනත් ඇය සමඟ සසඳන විට සුමාලි දෙවඟනක්. මට ඕන වුණේ හැකි තරම් ඉක්මනින් එතනින් පැන ගන්න. සුමාලිගේ මුහුණේ තැවරී තිබුණේ සෝපාහාසාත්මක හිනාවක්.

අප්පච්චි මහ හඬින් හිනාවෙන්න පටන් ගෙන.

ඔච්චර අලකලංචියක් වෙලත් සුමාලි උඹ එක්ක යාළු වුණාද?

ඒක තමයි අප්පච්චි මට අදටත් හිතාගන්න බැරි. අර ගෑනු ළමයා නම් මම ඈත තියාම දකින කොට මඟ හරිනවා. පුදුමෙ කියන්නෙ එයත් කිසිම ඕනකමක් පෙන්නුවේ නැහැ මාත් එක්ක කතා කරන්න.

සුමාලි දවසක් අහම්බෙන් පුස්තකාලය ළඟදී හමුවුණා. එක් නිමේෂයකට දුටු මුහුණක් වුණත් ඇය

Scanned by CamS

මට මතක තිබුණා. අපි එකිනෙකාට අභිමුඛව සිටගෙන සිටියදී මම දැක්කෙ ඇගේ ළය වේගයෙන් උස් පහත් වන සැටි. වැඩිකල් නොගොස් ඇගේ ශරීරය පිරිමියෙකුගේ ඇඟිලිතුඩු වලින් සුසර වුන සංගීත මෙවලමක් බවට පත් වුණා.

අප්පච්චිගෙ කසට දත් දෙපළ අතරින් කෙල බිංදුවක් සමඟ එළියට පැන්නෙ එකම වචනයයි.

විකාර!

පහුවදා උදේ අප්පච්චි කාමරේ හිටියෙ නැහැ. උදේම නැගිටලා අප්පච්චි කොහේද ගිහින්. සුමාලි මට මුණ ගැසුණ සැටි ගැන කියූ කතාව දරා ගන්න බැරිව අප්පච්චි මාව දාලා ගියාවත්ද? දවස් දෙකක්ම ඔහු ආවේ නැහැ. මම දන්නවා අප්පච්චි කොයි මොහොතක හරි එනවා. එයාට මම නැතුව ඉන්න බැහැ. අනෙක අප්පච්චි මම ළඟ ඉන්නෙ නැතුව කොහේ කියලා යන්නද?

හිතුව වගේම අප්පච්චි ආවා. අප්පච්චි ආවෙ හැන්දෑවක. මම නිකමට වගේ කාමරයට යන විට අප්පච්චි බිත්තිය දිහාවට හැරිලා නිදි. ඔහු සාමාන්‍යයෙන් නිදාගන්නෙ උඩුබැලිව. කකුලක් මත කකුලක් තබා තොරතෝංචියක් නැතුව හොලවන පුරුද්දක් අප්පච්චිට තිබුණා. ඔහු එහෙම කරන්නෙ කල්පනාවේ ගැලී ඉන්න කොට. අප්පච්චි මුහුණ බිත්තිය පැත්තට හරවාගෙන නිදා ඉන්නෙ මා එක්ක අමනාපෙන්ද?

අප්පච්චි!

මම කතා කළා ට ඔහු හැරිලා බැලුවේ නැහැ. මම අප්පච්චි ළඟට කිට්ටු වුණා. අප්පච්චිගෙ ඇඟ සීතලම සීතලයි. එක පාරට ම මා තුළ ජනිත වූයේ බියක්.

අප්පච්චි!

මම ටිකක් සද්දෙට කතා කළා. ඒ හඬේ බියත් කුතුහලයත් සමෝ සමේ තියෙන්න ඇති. ඒත් අප්පච්චි තවමත් නිසොල්මන්. ඒ ගමන මම අප්පච්චිව හොලවන්න පටන් ගත්තා.

අප්පච්චි නැගිටින්නකො.

මම අප්පච්චිව උඩුබැලි අතට පෙරලන්න උරහිසින් ඇද්දා. ඔහු එක්වරම මගේ අතක් ගසලා දමලා නැගිටලා ඇස් හැර මා දිහා බැලුවේ තරහින්.

මොකද උඹට වෙලා තියෙන්නෙ? හිතුවාද මම මැරිලා කියලා.

අප්පච්චි උඩු බැලිව කකුලක් පිට කකුලක් තියලා හොලවන්න පටන් ගත්තා.

අප්පච්චි කොහෙද මේ ටිකේ ගියේ? කොයි වෙලාවෙද ආවෙ?

ඒ ප්‍රශ්න එකක්වත් මායිම් නොකර ඔහු ඇඳමත හිඳගත්තා.

මට ඕන වුණේ මේ අවස්ථාව මඟ හැර යන්න. අප්පච්චි කතා කරන්න කලින් මේ වටපිටාව වෙනස් කරන්න ඕන. අප්පච්චිගෙ හිත හැදෙන්න කියන්න දෙයක් මම කල්පනා කළා. සුමාලි ගැන කතාව මම අප්පච්චි ට නොකියා ඉන්නයි තිබුණේ.

අප්පච්චි අද අපි ගමනක් යමු. අපි යමු බස් එකේ.

මම හිතන්නෙ බස් එකේ ගමනින් අප්පච්චිගෙ හිත තවත් ඔද්දල් වුණා. අපි නැගපු බස් එකේ සෙනග පිරි සිටි නිසා හිටගෙන යන්නයි සිදුවුණේ. අප්පච්චි මම ළඟින්ම හිටගෙන බස් පොල්ලෙ එල්ලීගෙන. සෙනග තෙරපෙන හින්දා මම අප්පච්චිට හේත්තු වී ගෙන හිටියෙ. අප්පච්චිගෙ සුවඳ ළඟින්ම මට දැනෙනවා.

මට ඕන වුණේ අප්පච්චිත් එක්ක කතාවට වැටෙන්න. ඒත් මම අහන ප්‍රශ්න වලට පිළිතුරු දෙනවා වෙනුවට ඔහු බසයෙන් පිටත බලාගෙන සිටියේ කුතුහලයෙන්. අපි පසු කරමින් සිටියේ ඇස්වාට්ටුව. Bread Talk එක දැකලා ඔහු ටිකක් සද්දෙට හිනාවුණා. දැන් අප්පච්චිලාගෙ කාලේ වගේ නෙවි. අපේ වෙළෙඳ පුවරුවක් කියන්නෙත් කවියක්.

මගේ ළඟ හිටපු මනුස්සයා කුතුහලයෙන් බලලා මගෙන් ඈත් වුණා. බාග විට අප්පච්චි තෙරපෙන එක ගැන අනුකම්පාවෙන් වෙන්න ඇති. එතකොටම එතන තිබුණ අසුනේ සිටි දෙන්නම බහින්න සූදානම් වුණ නිසා ඒක හිස් වුණා. ඒ දෙන්නා තෙරපීගෙන බහිද්දි මම අප්පච්චිව අසුනේ කෙළවරට තල්ලු කරලා වාඩි කෙරෙව්වා. ඊළඟට මම වාඩි වුණාම අර අප්පච්චි ගැන අනුකම්පාවෙන් ඈත්වුණ මනුස්සයා ළං වුණා.

මිස්ටර් ටිකක් එහාට වෙනවාද?

මිනිහට ඕන මාව අප්පච්චිගෙ උකුලට ඇදලා දමලා හරි මෙතන වාඩි වෙන්න. මට යකා නැග්ගා.

පේන්නෙ නැද්ද මෙතන මයෙ අප්පච්චි ඉඳගෙන ඉන්නවා කියලා. තමුසෙ කියන්නෙ මට අප්පච්චිගෙ උකුල උඩ වාඩි වෙන්නද?

Scanned by CamS

මගෙ කතාවට අහල පහළ සිටි හැමෝම මහ හයියෙන් හිනාවුණා. අර මිනිහාගෙ කට විරූප වෙන තරමට ඇද වෙලා.

මේ හලෝ තමුසෙට පිස්සු වුණාට අපිට පිස්සු නැහැ. තමුසෙගෙ ඔය නල්ලමලේ අප්පච්චි ජනේලෙන් එළියට ඇදලා දමලා ටිකක් එහාට වෙනවා වාඩි වෙන්න.

මට ඉහිලුම් නැතිව ගියා.

මොකක්ද යකෝ කිව්වෙ?

මම නැගිට්ටෙ අතක් මිනිහා දිහාවට දික් කරගෙන. මට දැනුණා අප්පච්චි නැගිටිනවා. මම හැරිලා ඔහු දිහා බැලුවා. අප්පච්චි මාවත් තල්ලු කරගෙන මගීන් අතර තෙරපෙමින් ඉස්සරහට යනවා. මම නිහඬව බලා හිටියා. ඒ අතරවාරෙ අර මිනිහයි තව මිනිහෙකුයි අපේ අසුන අයිති කරගෙන. සෙනඟ අතර තෙරපෙන අප්පච්චි හැරිලා මා දිහා බැලුවා.

බැහැපන් බස් එකෙන්.

අප්පච්චි කෑ ගහලා කිව්වාම මම අප්පච්චි දිහාවට වෙලෙව්ව ගියා. මිනිස්සු හැමෝම ඇත් මෑත් වෙලා මට ඉඩ දෙනවා.

අපි බිමට බැහැලා බලාගෙන ඉන්න අතරවාරේ බස්රිය අප පහු කරගෙන ගියා. බසයේ සිටි අය කවුළුවලින් හිස් එළියට දමාගෙන හිනා වගුරුවමින් අප දිහා බලාගෙන. මහ පාරේ ඉවක් බවක් නැතුව යන අයත් අප දිහා විමසිල්ලෙන් බලනවා.

යං අප්පච්චි අපි පයින්ම.

මම හොඳටම දන්නවා මේ සිදුවුණ දේට අප්පච්චි දොස් පවරන්නෙ මට. ඒකයි ඔහු ඔය කතාවක් බහක් නැතුවම ගාටන්නෙ. අප්පච්චිගෙ හැටි එහෙම තමයි. මම පරණ කතාවක් ඇදලා ගන්න හිතුවා.

අප්පච්චිට මතකද මම ගෙදරදී කෙසෙල් ගෙඩියක් හොරෙන් කෑවා කියලා අප්පච්චි මට ඉදිච්ච කෙසෙල් කැනක් ම කවන්න හැදුවා. මාව කෝටු මස් කරලා ඉවර වෙලා තමයි ඒකත් කළේ. මට මතක හැටියට කඳුළු පෙරමින් මම අමාරුවෙන් කෙසෙල් ඇවරි දෙකක් ම කෑවා. අම්මා තමයි ඇවිත් මාව බේර ගත්තෙ.

මේ කතාව අස්සෙ මට දැනුණා මම අප්පච්චිව පහු කරගෙන ඉස්සරහට ගිහින් බව. අප්පච්චිට වයස හින්දා මගේ වේගෙට යන්න බැහැ. මම පිටු පසින් ගාටන අප්පච්චි දිහා හැරිලා බැලුවා. ඒත් අප්පච්චි නැහැ. කෝ මේ අප්පච්චි? අප්පච්චි ආයෙම අතුරුදහන් වෙලා. ඔහු ගිය අතක් ගැන මට හිතාගන්නවත් බැහැ. මම අප්පච්චීඊඊ කියලා ටිකක් හයියෙන් කතා කළා. මග යන එන මිනිස්සු මං දිහා බලනවා. අප්පච්චි ආයෙම මට මග හැරිලා. මම බස් නැවතුමක නතර කළ බසයක එල්ලුනේ ගෙදර යන්න.

ගෙදර. මම ඈත තියාම ගේ ඉස්සරහ ගේට්ටුව ළඟ පැජරෝ ජීප් රියක් නවත්තලා තියෙනවා. මම හිතුවේ සුමාලිගෙ තාත්තා කියලා. මම හිත දැඩි කර ගත්තා. අද නම් මට අනම් මනම් කියන්න ගියොත් මමත් කියනවා දෙකක් මිනිහාගේ කනේ ඇඟිලි ගහ ගන්න. මටත් තියෙනවා කියන්න දේවල් ඕන තරම්.

ඒත් පැජරෝවෙ දොර ඇරුණාම ඉන් බිමට බැස්සෙ සමරදිවාකර. එතකොටයි මට කල්පනා වුණේ මම අද වැඩට නොගිය බව. මම කිසිම දැනුම්දීමක්වත් කරලා නැහැ. මට තිබුණා උදේම ටෙලිෆෝන් කරලාවත් නොඑන බව කියන්න. කන්තෝරුවෙ වෙන සේවකයෙක් නොදන්වා වැඩට නොපැමිණ සිටියහොත් මම උන් ගෙන්නලා පලු යන්න බනිනවා. මට උඩින් ඉන්නෙ සමරදිවාකර. දැන් මිනිහා මාව හොයාගෙනම ඇවිත්.

සමරදිවාකර රථයෙන් බැහැලා මං දිහාවට ඇවිදගෙන එනවා. මම ඉස්සර වුණා.

අනේ මිස්ට සමරදිවාකර. මට අද ඔෆිස් එන්න බැරිවුණා. මම මේ ෆෝන් එකෙන්වත් කියන්න හිටියෙ. මං හිතන්නෙ අද අපි විශේෂ වැඩක් ආගෙන තිබුණේ නැහැ.

සමරදිවාකර ඔලොක්කුවෙන් වගේ මා දෙස බලාගෙන හිටියා.

අද? අද විතරක් නෙමෙයි තමුසෙ දැන් දවස් තුනකින් ඔෆිස් ඇවිත් නැහැ.

මම?

නැතුව මමද? නිස්සංක අපි දන්නවා ඔයාට ප්‍රශ්නයක් තියෙන බව. ඒ වුණාත් නොදන්වා වැඩට නොඒම බරපතල ප්‍රශ්නයක් තමයි.

මේකයි සමරෙ. අප්පච්චි ඇවිත් හිටියානෙ. පහුගිය දවස් දෙක තුනක්ම අප්පච්චි ආගිය අතක් නැතුව හිටියා. පස්සෙ ගෙදර ආවා. අද මම අප්පච්චිව බස්

එකේ එක්කගෙන ගියා. අප්පච්චි මාවත් දාලා ආයෙම අතුරුදහන් වෙලා.

සමරදිවාකර අනුකම්පාවෙන් වගේ මා දිහා බලාගෙන හිටියා. මම හොඳටම දැක්කා කල්ල කඩත්ත පෙනුමක් මිනිහාගේ මුහුණෙ ඇඳෙනවා. ඔහු මගේ අතක් අල්ල ගත්තා.

නිස්සංක මට කණගාටුයි තමුසෙ ගැන. නගිනවකො මගේ වාහනේට අපට තියෙනවා පොඩි ගමනක් යන්න.

සමරදිවාකර පැජරෝවෙ වම්දොර ඇරලා මාව ඇතුළට තල්ලු කළා. ඊළඟට වහාම රියදුරු අසුනට පැනලා මෝටර් රථය පණ ගැන්වූවා. දැන් එය හැල්මේ පාර දිගේ යනවා. මම නිකමට රථයේ පිටුපස බැලුවා. මම දුටුවේ අදහාගත නොහැකි දසුනක්.

සුමාලි ඔයා කොහොමද මේක ඇතුළට ආවෙ? ඇගේ ඇස්වලින් කඳුළු බේරෙනවා. සුමාලිගෙ තාත්තායි තව කීප දෙනෙකුයි එතන සිටින බව මට පේනවා. එතකොටයි මම දැක්කෙ පිටිපස්සෙම අසුනෙ කෙළවරක අප්පච්චි ඉඳගෙන සිටින බව. එහෙනම් මේක බොහොම සැලසුම් සහගතව වෙන දෙයක්. උන් අප්පච්චිවත් අල්ලගෙන. මගේ අසරණ අප්පච්චි මම කරපු වැරදිවලට පළි නැහැනෙ.

මේ අය මාවයි අප්පච්චිවයි ගෙන යන්නේ කොහේද? මුන්ගෙ මේ සැලසුම පරාජය කරන්න පිළිවන් වෙන්නෙ මම මෙතනින් පැන ගත්තොත් විතරයි. මම වේගයෙන් යන රථයෙන් එළියට පැන ගන්න විදියක්

කල්පනා කළා. මම හෙමින් සීරුවෙ වම් අත සීරුමාරුවට දොරේ අගුල වෙත දිගු කළා.

අපි මේ නිස්සංකගෙ හිත හදන්න උත්සාහ කරන්නෙ. අප්පච්චි ගැන මතකය නිස්සංක අත හරින්න ඕන.

සමරදිවාකර කියෝනවා. මම ටකස් ගාලා අගුල ඇද්දා. දැන් කරන්න තියෙන්නෙ දොර එළියට තල්ලු කරන ගමන්ම එළියට පනින එකයි. මේක එක විදියකින් දිවි නසා ගැනිමක් තමයි. ඒත් මුන්ගෙන් ගැලවෙන වෙන මඟක් නැහැ.

මගේ සැලසුම අවුල් වුණා. උන් මට වඩා සූක්ෂ මයි. දොර ඇරගත් මම එළියට පනින්න කලින් කව්දෝ එකෙක්ගේ අතක් මගෙ බෙල්ල ඉදිරියෙන් දමලා තද කර අල්ලා ගත්තා. මාව දඬු අඬුවකට හිර වුණා වගේ. රථය නතර වුණා. දොරත් නැවත වැහුණා. ඊළඟට මගේ දකුණත් බාහුවේ කඩියෙක් කනවා වගේ රිදුමක් දැනුණා. මට මතක එච්චරයි.

ඊළඟට මට සිහිය එන විට මම හිටියෙ විශාල කන්දක් පාමුල. එක් වරම දුර්ගන්ධයක් මගේ නාස් පුඩු අතර තෙරපුණා. ඒක කුණු කන්දක්. මම ඉන්නෙ කුණු කන්ද පාමුල. එතන පිරිලා තිබුණ අබලි ද්‍රව්‍ය ඉදිරිපස මාව කනුවක ගැට ගසා තිබෙන බව මට දැනුණා. එතකොටම තමයි මම දුටුවේ එතන ඉන්නේ මා විතරක්ම නොවන බව. සුමාලි සහ දුව එතන හිටියා. අප්පච්චිත් ඉන්නවා. ඔවුන් හැමෝම මහත් කණගාටුවෙන් මා දෙස බලාගෙන.

සමරදිවාකරගෙ පැජරෝව එතනම නවත්තලා තිබුණා. වැඩි වේලාවක් නොගිහින් සමරදිවාකර වාහනයේ දොර ඇරගෙන එළියට බැස්සා. ඔහු උජාරු ගමනින් මා දෙසට එනවා. අතෙහි මිට මෙලව ගත් පිස්තෝලය මගේ ඇස ගැටුණේ එතකොටමයි. එහෙනම් සමරදිවාකරගේ කල්පනාව මේක මේ විදියට බේරුමක් කර ගන්නයි.

ඔහු මා ඉදිරියේ සිට ගත්තා. ඔහු මේ නාඩගම නටන්න තෝරා ගෙන තිබුණේ කුණු කන්දක් පාමුල වීම මට අදහගන්න බැරි දෙයක්. ගඳ ගහන කුණු කන්දක් පාමුල මා මරා දැමීමෙන් ඔහු මගේ මරණය හැකිතාක් අවමානයට පත් කිරීමට අර අඳින බව කාට වුනත් තේරෙනවා. ඔහු මට දරා ගත නොහැකි තරම් අධිකාරි විලාශයකින් මා ඉදිරියේ හිට ගෙන ඉන්නවා.

මම සුමාලි සහ දුව දෙස බැලුවා. සුමුදු ඉකි ගසමින් හඬනවා. අප්පච්චිගේ ඇස්වල විතරයි කඳුළු නැත්තෙ. මේ වගේ වෙලාවක හිස කෙලින් තබාගෙන සිටිය යුතු බව අප්පච්චිගේ විලාශය මට සිහිපත් කරනවා. සමරදිවාකර පිස්තෝලය මා දෙසට එල්ල කර ගෙන ම වියරුවෙන් වගේ හිනාවෙනවා.

තමුසෙ හිතන්නෙ මම තමුසෙ වෙනුවෙන් උණ්ඩයක් වියදම් කරයි කියලාද? නැහැ තමුසෙට එහෙම පහසු මරණයක් ලබා දෙන්න මට ඕන කමක් නැහැ. අපි හැමෝම දැන් මෙතනින් යනවා. තමුසෙ විතරක් මේ කුණු කන්ද කන සියලු ප්‍රාණීන් සමඟ තනි වෙනවා.

ඔහු පිස්තෝලය අප්පච්චි ඇතුළු පිරිස සිටි දිහාවට දික් කළා.

ඇන් කරුණාකරලා ඔය නෝනල මහත්තුරු වාහනේට නගින්න.

පුදුමෙ කියන්නෙ හැමෝම සමරදිවාකරගෙ බහට අවනතව පැජරෝවට ගොඩ වුණා. සුමාලි නැග්ගේ ඉදිරිපස අසුනට. සුමුදුයි අප්පච්චියි පිටුපසට ගොඩ වුණා. සමරදිවාකර උජාරුවෙන් රියදුරු අසුනට නැගලා සුමාලි ළඟින් වාඩි වුණා. ඔවුන් මා කුණු කන්ද සමඟ තනිකර දමා ඈතට ඇදී යන හැටි මම ඔහේ බලාගෙන හිටියා.

අප්පච්චි මම යි අතර සම්මුතියක් ඇති වුණා. ඇඳ උඩ එරමිණිය ගොතාගෙන නිසොල්මනේ සිටින අප්පච්චි දැක්කම මට ඉහිලුම් නැතුව ගියා.

අප්පච්චි මට රෑට නින්ද හොරයි.

මට ඕන වුණේ ඇයි අප්පච්චි මටත් නොකියා බස් එකෙන් බැහැලා ආවෙ කියලා අහන්න. ඒත් මගේ වචන වලින් අප්පච්චි කලබල වුණේ නැහැ.

අප්පච්චි මට නින්ද යන්නෙ නැත්තෙ හීන පේන හින්දා. ඇස් පියවී ගෙන එන කොටම මට පේනවා හීනයක්. ඒක හැමදාම දකින හීනයක්. මම දකින්නෙ කල්‍යාණියි මමයි තැනකදි මුණ ගැහෙන හැටි.

කව්ද කල්‍යාණි කියන්නෙ?

ඇයි අප්පච්චි මම කිව්වෙ නැද්ද? මගෙ අතින් මැරුනෙ කල්‍යාණිනෙ.

අප්පච්චි කොක් හඬලා සිනාසුණා. මම අප්පච්චිගෙ සමච්චලය මායිම් නොකරම හීනෙ ගැන කියාගෙන ගියා.

මගේ අතින් කල්‍යාණි මැරුණේ කොහොමද කොහේදිද කියලා පස්සෙ විස්තර ඇතුව කියන්නම්.

හැමදාම කළ්‍යාණි මගේ මේ හීනෙට ඇතුල් වෙනවා. අපි කොහේදි හරි තැනකදි හමුවෙමු කියලා කතා වෙලා ඉන්නෙ. හැබැයි කාටවත් අඳුනගන්න බැරි විදියට වෙස් මුහුණක් දාගෙන එමු කියලා යෝජනා කළේ මම.

ඉතින්!

අපි ගිවිස ගත්ත විදිහට මුණ ගැහුණා. අපි හමු වුණේ පාලු ගොඩනැගිල්ලකදි. ඒක වහලක් නැති ගරා වැටුණ ගෙයක්. අහළ පහළ කොහේවත් ගෙයක් නැහැ. ඒත් පුදුමෙ කියන්නෙ අප්පච්චි අපි ඒ ගරා වැටුන ගේ ළඟට එනකොට එතන තිබුණ පරිසරය එහෙම පිටින්ම වෙනස් වුණා. එතන ඉස්සරහින් මිනිස්සු නිතරම යන එන පාරක්. ටිකෙන් ටික සන්දර්ශනයක් නරඹන්න එනවා වගේ මිනිස්සු ගේ වටේ ම රොක් වෙනවා. අපි දෙන්නම වෙස් මුහුණු පැළඳගෙන හිටියෙ. ඒ හින්දා කිසි කෙනෙකුට හඳුනාගන්න බැහැ. දැන් එතන ගරා වැටුණ ගෙයක් නොවේ. අපි මුණ ගැහුණ තැන හෝටල් කාමරයක්. මම ඒ කාමරයට ඇතුළු වෙනකොට කළ්‍යාණි හිටියෙ ඇඳ උඩ වාඩි වෙලා. එයා දාගෙන හිටියෙ රකුසු වෙස් මුහුණක්. මගේ වෙස් මුහුණ ගිරා හොටක් තියෙන කුරුල්ලෙක්.

දැන් අපිව කාටවත් හඳුනගන්න බැහැ කළ්‍යාණි.

මම කළ්‍යාණිට සමීප වෙමින් කිව්වා.

ඒත් ඇයි අපි මේ වෙස් මුහුණු දමාගෙන. මේ කාමරේ වෙන කව්රුත් නැහැනෙ.

මම ආපහු හැරිලා දොර අගුලු දැම්මා. අපි කතා වුණේ දෙදෙනා එක්වරම වෙස් මුහුණු ගලවන්න.

කළ්‍යාණි වෙස් මුහුණ ගලපුවාම මම සුදුමැලි වුණා. එතන හිටියෙ කළ්‍යාණි නොවෙයි. සුමාලි. එයා වෙස් මුහුණක් දාගෙන ඇවිත්.

ඒත් සුමාලිගෙ මුහුණත් සුදුමැලි වෙන හැටි මං දුටුවා. ඇගේ මුව ටිකක් විවර වුණේ විරූප පෙනුමක් ආරූඪ කර ගනිමින්.

අප්පච්චි!

ඇය මාව අමතනවා. මම දාගෙන හිටපු වෙස් මුහුණ යට හිටියෙ අප්පච්චි. ඔව්. ඒ හිටියෙ මම නෙවෙයි අප්පච්චි. ඒත් එක්කම මට ඇහැරුණා. ඇස් දෙක පියවෙන ඇසිල්ලෙන් ඔය හීනෙ මගේ නින්දට කඩා වදිනවා. අර අප්පච්චි නොහිටපු දවස් දෙකේ මට ඔය හීනෙන් ගැලවීමක් තිබුණේම නැහැ.

මේ වගේ විකාර කතාවක් කිව්වම වෙන වෙලාවට නම් අප්පච්චි වියරුවෙන් වගේ හිනාවෙනවා. ඒත් මේ වෙලාවේ හිනා වුණේ නැහැ.

නිස්සංක මට පේනවා පුතේ මම හින්දා උඹ ලොකු කරදරේක වැටිලා ඉන්නෙ. අපි මේක විසඳා ගනිමු. මින් පස්සෙ උඹ මා එක්ක එළියට යන්න ඕනේ නැහැ. එදා උඹ මාව උඹේ කන්තෝරුවට එක්කගෙන ගිය එකත් වැරදියි. අපි ඔය එළි පහළියට වෙලා කතා කරන එක වැඩ කරන එක සෙල්ලම් කරන එක නවත්තමු. කොටින්ම උඹ එළි පහළියේදි හැසිරෙන්න ඕන මම මේ ගෙදර නැති ගානට. හැබැයි මම ඉන්නවා. මම කොහේවත් යන්නෙ නැහැ.

මේ කාමර්ට ම වෙලා ඉන්නම්. අපි ටිකක් ඒ විදියට කරලා බලමු.

අප්පච්චි හැම තිස්සෙම තීරණ ගන්නෙ තීක්ෂණව කරල්පනා කරලා. එක අතෙකින් මේ කරදරවලට මුල අප්පච්චිත් එක්ක එළි පහළියෙ ගැවසීම තමයි. අපි ටිකක් පිටත සමාජයෙන් වහන් වෙලා ඉන්න එක හොඳයි.

බලපන් උඹේ හැටි. උඹ දවස් ගානකින් රැවුල කපලා නැහැ. මුහුණ හෝදලා නැහැ. ඔය විදියට ගඳ ගහන එකත් මිනිසුන්ට අපුලක්. පිරිසිදුව ඉඳපන්. හැමදාම කන්තෝරු පලයං. නිවාඩු කියන්නෙ වර ප්‍රසාදයක් මිසක් අයිතියක් නොවේ. මට මතකයි ඒ කාලෙ අපේ කොමසාරිස්තුමා කියන්නෙ ස්ටේෂන් එකේ තියෙන පොදු වැසිකිළියට යන්නෙ ඕනකමකට විතරයි. පොදු වැසිකිලියක් තිබුණ පලියට ඒකට නොවරදවාම ගිහින් එන්න ඕන කියලා එකක් නැහැනෙ. ඒ වගේ තමයි නිවාඩුත්. හෙට වහාම වැඩට පලයන්. දැන් ගිහින් හොඳට නා ගනින්.

මම අඩියට දෙකට කාමරෙන් එළියට පැන්න. මේ ටිකේ මම ගෙවලා තිබුණේ ඉබා ගාතේ යන ජීවිතයක්. අප්පච්චි එක්ක කාලය ගෙවනකොට මට ඒක දැනුණේ නැහැ. දැන් අප්පච්චිම ඒක මතක් කරලා දෙනවා. මම හදන්නෙ ජීවිතේ අලුත් පිටුවක් පෙරලන්න. බාග විට එතකොට සුමාලි ආපහු එන්නත් බැරි නැහැ. ඒත් කළ්‍යාණි. කළ්‍යාණි මැරිලා හිටපු හැටි තමයි මට අමතක කරන්න බැරි.

මම නාන කාමරයට වැදිලා දොර වසා ගත්තා. වතුර කරාමය ඇරලා මගේ ගිනියම් වුණ හිස සීතල

වතුරෙ ඔබා ගත්තා. වතුර මගේ ඇඳුම් තෙමාගෙන සීතල සිරුර තුළට කාන්දු වෙනවා. මට දැනුණෙ වෙන කවදාවත් නොදැනුණ විදියෙ සැහැල්ලුවක්.

රැවුල කපන්න කැඩපතට එබුනාම මම තිගැස්සුණා. හුඟ දවසකින් මම මාව කැඩපතකින් දැකලා තිබුණේ නැහැ. මුහුණ පුරා සබන් තවරලා රේසරය මුහුණට ළං කරන විට මම තිගැස්සුණා. ආයෙමත් කළ්‍යාණී මගේ ඔලුවට කඩා වැදිලා. ඒත් රේසරය සබන් සූරගෙන මුහුණ පුරා කරක් ගහන කොට අමුතු හැඟීමක් මා පෙළන්නට වුණා. රැවුල කපලා එළි පෙහෙළි වෙන එක මට දැනුණේ මහ විශාල කැලයක් කපලා එළිපෙහෙළි කරනවා වගේ. කැලයක් නේන්නම්. කටු කැළේ. මං එළි පෙහෙළි කරන්නේ කටු කැලයක්.

මට දැනුණෙ මම කන්තෝරුවේ පිළිවෙලකට නැති දේවල් පිළිවෙල කරමින් ඉන්නවා වගේ. මේසෙ උඩ තැනින් තැන විසිරිලා තියෙන ලිපිගොනු පොත්පත් මම එහි කෙළවරකට එකතු කළා. රේසරය සබන් පෙන ගොඩක් සමඟ මුහුණෙ පහලට එනවා. ඒ වෙලාවෙ මට දැනුණේ කන්තෝරුව එකම එක කැලයක් වගේ. ඒක ශුද්ධ කරලා මිනිස් වාසයට සුදුසු තැනක් බවට පත් කිරීම තමයි මට පැවරිලා තියෙන රාජකාරිය. කටු කැලේ. කන්තෝරුව කියන කටු කැලේ මගේ අතින් ශුද්ධ වෙලා ධන ධාන්‍ය වපුරන හේනක් බවට පත් වෙනවා. ඒත් මෙතන ගොවිතැන් කරන්න කෝ වතුර. ඒකට අපි ජල කළමනාකරණය කරන ව්‍යාපෘතියක් වහාම ආරම්භ කරන්න ඕන. මම රේසරය පැත්තකින් තියලා වහ වහා මුහුණට වතුර ඉස සබන් පෙන සෝදලා දැම්මා.

එදා රාත්‍රියේ මම අප්පච්චිගෙ කාමරයට ගියේ නැහැ. අප්පච්චි මට කතා කළෙත් නැහැ. ඒ කාමරයේ නිසොල්මන මාව තෝන්තු කරනවා. ඒ මදිවට අර හීනෙ කඩා වැදිලා නින්ද පැහැරගෙන. මම උදේම නැගිටලා නාන කාමරයට වැදුනා.

මම ටයි පටිය අතින් සකස් කරමින් මිදුලට බැහැලා ගරාජය දිහාවට ගියා. හිල්ඩා ඒ ගෙදර පෝටිකෝව යට ඉඳගෙන කොට තාප්පයට උඩින් මා දිහා බලාගෙන. මගේ මුහුණෙ තිබුණ වෙනස මම හිතන්නෙ ගෑනිවත් වෙනස් කළා වගේ. ඇය ටිකක් හිනාවෙන්න වගේ හැදුවා.

ගුඩ් මෝනින් මිසිස් ගුණවර්ධන.

මම කටපුරා හිනාවීගෙන කියනකොට ඇය ටිකක් පැකිලුණා. ඊළඟට මෝනිං කියලා කට හැදුවෙ වෙන මොකක් හරි මගෙන් අහනවා වගේ. මම ගරාජය තුළට ගිහින් මෝටර් රථය එළියට අරගෙන ගේට්ටුව ඉස්සරහ නවත්තලා බොහොම සීරුමාරුවට බිමට බැස්සා. හිල්ඩාගෙ මහත්තයත් ඒ ගමන පෝටිකෝව යටට ඇවිත්.

නිස්සංක ඔෆීස් යන්නද?

නැහැ මම මේ මාළු අල්ලන්න යන්න හදන්නෙ කියලා කියන්න මගෙ කට පොපියනවා. පසුගිය ටිකේ මුන් නටපු නාඩගම. අපේ අප්පච්චි නම් හරිම කල්පනාකාරයා. මම කිසිවක් නොකියාම මුහුණේ සිනාවක් ඇඳගෙන ගේට්ටුව ඇරලා රථය එළියට ගත්තා. ඊළඟට බොහොම සාර සුබාවට රථයෙන් බැහැලා ඇවිත් ගේට්ටුව වැහුවා.

කන්තෝරුවට ගියාම එතනත් සැබෑ වෙනසක්. හැමෝම වගේ ආවා මාව හමුවෙන්න. ඒ අය බොහොම සුහදව මාත් එක්ක කතා බහ කළා. මාතුපාල වෙනදා වගේ බොහොම යටහත් පහත්ව සර් තේ එකක්? කියලා ඇහුවා.

ගේනවකො කියලා මම කිව්වෙ බොහොම දයාවන්ත විදියට. කන්තෝරුවෙ හැසිරෙන්න ඕන විදිහ මම ඉගෙන ගත්තෙ අප්පච්චිගෙන්. සමර දිවාකර මාව මිනිහාගෙ කාමරයට නොකැඳවා මාව බැහැ දකින්න මගේ ළඟටම ආවා. පසුගිය ටිකේ මගෙන් අතපසු වුණ වැඩ වගයක් ගැන කතා කරන අතරවාරෙ මෙහෙමත් ඇහුවා.

දැන් නිස්සංක ට සනීපයි වගේ නේද?

මම අහිංසක විදියට හිනා වුණා. මට කිසිම අසනීපයක් තිබුණේ නැහැ. ඒත් ඒ ගැන කතාවට යන්නෙ මොනවටද? සාමකාමීව ජීවත් වෙන්න මම අදිටන් කරගෙන ඉන්නෙ. වෙන වෙලාවක නම් මම සමරදිවාකර ට කනේ ඇඟිල්ල ගහ ගන්න දෙකක් කියනවා. ඒත් අප්පච්චි මට කට කැඩෙනකම් කිව්වෙ මිනිස්සුත් එක්ක ප්‍රශ්න හදා ගන්නෙ නැතුව ජීවත් වෙන්න කියලා.

එතකොටම දුරකථනය නාද වුණා. ඒකෙ කෙළවර හිටියෙ සුමාලි. මම දුරකථනයට පිළිතුරු දෙන දිහාව සමරදිවාකරත් බලාගෙන.

හිල්ඩා අද උදේම මට ටෙලිෆෝන් කරලා කිව්ව ඔයා අද ඔෆීස් ආවා කියලා. ඔයා දවස් තුනකින් ඔෆීස් ආවෙ නැළු නේද? දැන් ඔයාට හොඳයි නිස්සංක. මම ලබන සතියෙ දුවත් එක්ක එන්නම් ගෙදර.

මට ඕන වුණේ එපා කියන්න. තාම අප්පච්චි ගෙදර ඉන්නවා. දැන්ම ආවොත් ආයෙත් එයා අප්පච්චි එක්ක ප්‍රශ්න හදා ගනී. ඒත් සමරදිවාකර මං දිහා බලාගෙන. අප්පච්චි තවම ගෙදර ඉන්න බව කිව්වොත් මිනිහාත් ආයේ කලබල වෙයි. මේ වෙලාවෙ කල්පනාකාරිව වැඩ කරන්න ඕන. අමතක නොකළ යුතු දේ තමයි මම ගෑනියෙක් මරපු මිනිහෙක්.

හදිසි වෙන්න එපා සුමාලි!

මම කෙඳිරුවා. ඒ උත්තරේට සමරදිවාකරගෙ මුහුණෙ හරි අපූරු හිනාවක් ඇඳෙනවා මම දුටුවා. සමරදිවාකර මේසෙන් නැගිට්ටෙ පස්සෙ හම්බ වෙමු කියනවා වගේඅතින් සංඥාවක් කරගෙන.

සුමාලි මාව ඇදගෙන වගේ ගිහින් කාමරයකට තල්ලු කළා. ඒක ශාලාවක් තරම් විශාල කාමරයක්. එහි කොනක විශාල මේසයක් තිබුණා. බිත්තියට පිටුපා කව්දෝ කෙනෙක් එම මේසයට වාඩි වී සිටියා. ඔහු මනාව හැඳ පැළඳගෙන සිටි මහත්තයෙක්. ලා නිල් පාට ටයි පටියක් ඇඳගෙන හිටියේ. ඇස් මත විශාල දුඹුරු පැහැති උපැස් යුවළක්.

සුමාලි මාව ඉදිරියට තල්ලු කළා. එතකොට තමයි මම දුටුවෙ මේසය මත තිබුණ ඔහුගේ නාම පුවරුව. ඔහු ජී.සී.ආර්. ෆර්නැන්ඩු. මොකක්ද ජී.සී.ආර්. කියන්නෙ? ගාමිණී චන්ද්‍ර රත්නායක වෙන්න ඇති. ඒක ෆර්නැන්ඩු කියන නමත් එක්ක ගැලපෙන්නෙ නැහැ. බාග විට ගාවින් චම්ලි රේමන් ෆර්නැන්ඩු වෙන්න ඇති. ඔහු මනෝ වෛද්‍යවරයෙකු බවත් එම පුවරුවේ සඳහන්ව තිබෙනු මම දුටුවේ එවිටයි. මට කාරණය වැටහුණා. සුමාලි මගේ ඔලුව පරීක්ෂා කර බලන්න සයිකියාට්‍රිස්ට් කෙනෙකු ළඟට අරගෙන ඇවිත්.

මනෝ වෛද්‍යවරයා මා සමඟ ඉතාම සුහද විදිහට හිනාවුණා. මම ඔහුට හිත යටින් හිනාවුණා. ඔහු දැන් මගෙන් ඇසීමට නියමිත ප්‍රශ්න මොනවාදැයි මා දන්නවා.

ඔහු අසන ඒවාට ඔහු වික්ෂිප්ත කරන විදියේ උත්තර දී ඔහුව මැඩවීමේ ආසාවකින් මම ආතුරව සිටියෙ. ඒත් එය කළ යුත්තේ කොයි විදියටදැයි මම ක්ෂණිකව කල්පනා කළා. මම දකින බොරු මනෝ භ්‍රාන්තීන් ගැන බේගල් ගොඩක් ඇද බැවොත් ඔහු ලොකු අමාරුවක වැටෙයි. එහෙත් ඊට වඩා හොඳම සහ ආරක්ෂාකාරි දේ තමයි ඔහුට කිසිම හෝඩුවාවක් නොදී මගේ මානසික සෞඛ්‍යය ඉතා යහපත් බව ඔහුට ඒත්තු ගන්වන එක.

මම ඔහු සමීපයට යන විට ඔහු අතින් ඉදිරිපස පුටුවක් පෙන්නුවා.

මිස්ටර් නිස්සංක සේනාධීර. කරුණාකර වාඩිවෙන්න. එහෙනම් මිනිහා මගේ නමත් දන්නවා.

සුමාලි කලින් ඇවිත් මේ හමුවීම නියම කර ගන්න ඇති. මම ගැන ඇය ඔහුට මොනවා කියලා තියෙනවාද දන්නෙ නැහැ.

මෙහෙමයි... මම ඔයාට නිස්සංක කියලා කතා කරන්නම්. එතකොට අපි දූරස්ථයි කියලා හිතන්න එපා. හිතේ මොනවා හරි කරදරයක් තියෙනවා නම් හංගන්නෙ නැතුව මට කියන්න. ප්‍රශ්නයක් තියෙනවා නම් නිස්සංක පිළිතුරකුත් තියෙන බව මම ඔයාට අමුතුවෙන් කියලා දෙන්න ඕනෙ නැහැනෙ. ඔයා බොහොම ඇන උගත්කම් තියෙන කීර්තිමත් පරිපාලන නිලධාරියෙක් නෙ.

මාව කතා කරවන්නෙ නැතුව මනෝ වෛද්‍යවරයාම කතා කරන එකෙන් මට ඔහුගේ රෝග ලක්ෂණ පැහැදිලිව පෙනෙනවා. මම ඔහු ඉදිරිපස වාඩි

වුණා. සුමාලි එතන වාඩි වෙන්න හදනකොට ඔහු මෙහෙම කිව්වා.

සුමාලි ඔයා ටිකක් එළියෙන් ඉන්නවා නම් හොඳයි. එතකොට මට නිදහසේ නිස්සංක එක්ක කතා කරන්න පිළිවන්. මේවා මේ අපේ පිරිමි කතානෙ.

ඔහු මහ කල්ල කඩත්ත විදියට හිස ඇල කරලා ඇහැක් ගැහුවා. සුමාලි කතාවක් බහක් නැතුව එළියට ගියා. මිනිහා සුමාලි යන දිහා බලාගෙන. මිනිහාගේ ඇස් දෙක ඇලවිලා තියෙන්නෙ සුමාලිගෙ පටු නිතඹ මත බව හොඳටම පෙනෙනවා. මම ඔහුගේ උකුසු බැල්ම නිරීක්ෂණය කරන බව දැනිලා ඔහු තිගැස්සුණා. ඔහු කලබලයෙන් වගේ මං දිහා බැලුවා.

මට නිස්සංක ගැන සුමාලි හුඟක් දේවල් කියලා තියෙනවා. ගෙදර නිස්සංකයි සුමාලියි දුවයි ඇරුනාම වෙන කව්රු හරි ඉන්නවාද?

මම හිත යටින් හිනාවුණා. ඔහු මේ අහන්නෙ අප්පච්චි ගැන බව පැහැදිලියි.

නැහැ ඩොක්ටර්... අපි තුන්දෙනා විතරයි. ඉස්සර නම් සර්වන්ට් කෙනෙක් හිටියා. ඒ ගෑනිත් යන්න ගියා. සුමාලිට බැහැනෙ සර්වන්ට්ස්ලාත් එක්ක වැඩිදවසක් ඉන්න.

මගේ පිළිතුරේ තිබුණ සරලකමයි ඍජු කමයි ඉස්සරහා මිනිහා හැකිලුනා. බලාපොරොත්තු කඩවුණ බැල්මකින් ඔහුගේ මුහුණ විරූප වෙලා.

හොඳයි මම මෙහෙම අහන්නම්කො. ගෙදර තව කව්රුහරි ඉන්නවා කියලා නිස්සංකට දැනිලා එහෙම තියෙනවාද? මොකද මටත් ගෙදර ඉන්න කොට එහෙම දැනිලා තියෙනවා.

මට හිතුනෙ පැනපු ගමන් මේ මිනිහාගේ බෙල්ල මිරිකගෙන ඉන්න. මිනිහා මාව අන්දන්න හදන විදිහ හරිම බාලයි. එක පාරටම මට හිතුනෙ අප්පච්චි මේ දැනුත් ගෙදර කාමරේක ඉන්නවා කියලා කිව්වොත් ඔහුට මොනවා වේවිද කියලා. හරියට ඉහේ මලක් පිපුණා වගේ තියෙයි.

ඒ විදිහට හිතන්නෙ හරි දැනෙන්නෙ හරි පිස්සන්ට නෙ ඩොක්ටර්. මට නම් කවදාවත් එහෙම දැනිලා නැහැ.

දැන් මිනිහාගෙ මුහුණ කළු වෙලා. දැන් ඔහුට තියෙන්නෙ මේ හමුවීම මෙතෙනින් අවසන් කරලා කිසිම මානසික රෝගයක් නැත කියලා සහතිකයක් දෙන එකයි. ඒ ටික නොකර තෙපර බාන්නෙ ඇයි කියලා අහන්න මා තුළ ඇතිවුණ පෙළඹීම මම මැඩ ගත්තෙ හරිම අමාරුවෙන්.

ඔහු අලුත් ප්‍රශ්න වටයකට සූදානම් වන බව මම දුටුවා. ඔහු පුටුව මත ඇඹරුණා.

මෙහෙමයි. නිස්සංක දන්නවනෙ මම මනෝ වෛද්‍යවරයෙක් බව. සුමාලි ඔයාව මම ඉස්සරහට කැඳවාගෙන එන්නෙ ඔයාගෙ මානසික ගැටළුවක් ගැන මාත් එක්ක සාකච්ඡා කරන්න. මට නම් තවම නිස්සංකගෙ එහෙම අවුලක් පෙනෙන්නෙ නැහැ.

මනෝ වෛද්‍යවරයා අසරණකමේ පත්ලටම ඇදවැටිලා.

හරි - නිස්සංකට ඔයාගෙ අප්පච්චි මතකද?

ඔව් ඇයි මතක නැත්තෙ?

අප්පච්චි ඔයාට ආදරෙන් හිටියාද?

මේ ප්‍රශ්නයට දිය යුතු පිළිතුර මම හිතින් කිරලා මැනලා බැලුවා. අප්පච්චි ආදරෙන් හිටියා කිව්වොත් ඒ ආදරය නිසා අප්පච්චි ආයෙම මාව හොයාගෙන ඇවිත් කියලා මිනිහා හිතාවි. ඒක නිසා මම පිළිතුර විදියට නැහැ කිව්වා. හැබැයි ඒ උත්තරෙන් මිනිහා දුර්මුඛ වුණේ නැති නිසා මට සැකයක් ඇතිවුණා. බාග විට මිනිහාට පොටක් පැදුනා කියලා හිතනවා ඇති.

අප්පච්චි අපි කාටත් එක විදියට තමයි සැලකුවෙ. සාමාන්‍යයෙන් අප්පච්චි කාටත් සැරයි. අම්මට වුණත් එහෙමයි. මට තේරුම් ගන්න බැරි ඩොක්ටර් ඇයි මේ ප්‍රශ්න මගෙන් අහන්නෙ කියලා.

මගේ ඒ ප්‍රශ්නෙන් නම් මිනිහා කලබල වුණා.

නැහැ - නැහැ නිස්සංක මොකුත් හිතන්න එපා. සුමාලි කිව්වා නිස්සංක එක්ක ටිකක් කතා කරන්න කියලා. නිස්සංක කන්තෝරුවේදි හුඟාක් මහන්සි වෙනවාලු. රස්සාව ඕනවාට වඩා හිතට අරගෙන කරන්න යනවලු. ඒ නිසා ටිකක් පීඩනයකින් ඉන්නෙ කියලත් සුමාලි කිව්වා.

මට එහෙම කිසිම පීඩනයක් නැහැ ඩොක්ටර්.

ඇත් මිනිහාට සිද්ධ වෙනවා මේ ප්‍රශ්න කිරීම වෙන මාවතකට හරවන්න. මම මේ බලාගෙන ඉන්නෙ කොයි විදියේ ප්‍රශ්න ඇහිල්ලකට ඔහු මාරු වෙයි ද කියලා.

හොඳයි... අපි නිකම් කතාකරමු. අපිට කතා කරන්න දේවල් නැතුව නොවෙයිනෙ.

ඔහු මේසය උඩ තිබුණ සීනුව නාද කළා. එවිට සුදු ඇඳගත් තරුණ හෙදියක් දුවගෙන ආවා.

හේමමාලි අපට තේ දෙකක් ගේන්නකො. අර මිසිස් සේනාධීරටත් තේ එකක් යවන්න.

ඔහු එහෙම කියලා යටැසින් මා දෙස බැලුවා. ඇත් මිනිහා හිතනවා ඇත්තෙ මම සම්පූර්ණයෙන්ම මිනිහාට නතු වෙලා ඉවරයි කියලා වෙන්න ඇති. දැන් ඉතින් අහන ඕනම ප්‍රශ්නයකට උත්තර දෙයි කියලා හිතනවා ඇති. අහපන්කො ප්‍රශ්න. මම දෙන්නම් හොඳ උත්තර.

තිස්සංක කොහෙද ඉස්කෝලෙ ගියේ?

මම ගියේ කුරුණෑගල මලියදේවෙට.

හා - කැම්පස් ගියෙත් ඒ ඉස්කෝලෙන්මද?

ඔව්.

මලියදේවෙ කියන්නෙ ඒ කාලෙ හරි හොඳ ඉස්කෝලයක්. මගේ බැච් එකේ යාළුවෙක් හිටිය මලියදේවෙ ඉගෙන ගත්ත. වික්ටර් කියලා. තිස්සංකට මතකද එහෙම කෙනෙක්ව.

නැහැ මට මතක නැහැ.

දැන් නිස්සංකට වයස කීයද?

42 යි.

අපොයි මට බාලයිනෙ. මං හිතන්නෙ නිස්සංක අපට ජුනියර්. කොහෙද කැම්පස්?

කොළඹ.

දැන් මට පේනවා මිනිහා ප්‍රශ්න අහලා හෙම්බත් වෙලා. දැන් ප්‍රශ්න හොයමින් එහෙ මෙහෙ අතපත ගානවා.

නිස්සංකලාගෙ පවුල් ජීවිතේ කොහොමද? දෙන්නා හොඳට ආදරෙන් ඉන්නවාද?

ඔහු එක පාරටම ටිකක් ලොකු ගල් ගෙඩියක් බඳු ප්‍රශ්නයක් මගේ ඉස්සරහ අත හැරියා.

මම දන්නෙ නැහැ සුමාලි ඩොක්ටර්ට මොනවා කියලා තියෙනවාද කියලා. හැබැයි ඔයා මගෙන් ප්‍රශ්න අහන්නෙ මට ඔලුවෙ අමාරුවක් තියෙනවා වගේ හිතාගෙන. අපේ පවුල් ජීවිතේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි හොඳින් ඉන්නවා.

මොනවා වුනත් සුමාලි දුවත් සමඟ ගෙදරින් පිටව ගිය කතාව කියලා නැහැ වගේ. මම ඔහුට නොදැනෙන්න මගේ කෝපය පාලනය කර ගත්තා. අර උත්තරයත් එක්ක ඔහු මේ ප්‍රශ්න ඇසීම නතර කරන්න සිතුවා වගේ. එවිට ම හේමමාලි හෙදිය තේ දෙකක් ගෙනවිත් අප ඉදිරියේ තැබුවා.

නිස්සංක හීන දකිනවාද?

වෛද්‍යවරයා එක්වරම අහනවා. හීනයක් හිතින් නිර්මාණය කර ගන්න ඒ අතරවාරයේ මම කල්පනා කළා. මිනිහා අලි අමාරුවක වැටෙන හීනයක්. මම ඇත්තට ම දකින හීනයක් ඒයේ අප්පච්චිට කිව්වා. ඒ හීනෙ ගැන මෙයා එක්ක කියන්නෙ නැහැ.

ඔව් ඩොක්ටර් මම නිතර දකින හීනයක් තියෙනවා.

මම උත්තර බැන්දාම මිනිහාගෙ ඇස් දිලිසෙන්න පටන් ගත්තා.

මොකක්ද? මොකක්ද?

ඔහු අහනවා.

නැහැ. ඒක එච්චර වැදගත් ද කියන්න මම දන්නෙ නැහැ. මම හැමදාම දකිනවා ලොකු දිග බස් එකක් මම පදවගෙන යනවා. මම යන්නෙ පටු වේල්ලක් දිගේ. පාරෙ පළල තියෙන්නෙ බස් එකේ පලලට විතරයි. ඔන්න එතකොට ම තමයි මට දැනෙන්නේ මේ වේල්ල දෙපස තියෙන්නෙ විශාල ජලාශයක් කියලා. මට හරිම බයක් දැනෙනවා. මම දැන් බොහොම සීරුමාරුවට බස්රිය පදවගෙන යනවා. මට හිතෙන්නෙ ටිකක් එහෙ මෙහෙ වුණොත් බස්රිය වතුරට වැටෙයි කියලා. ඒක කෝච්චියක් තරම් දිගයි. ඒ වගේම උසයි කියලා මට දැනෙන්න පටන් ගන්නවා. ටිකකින් මම ගමනාන්තයට ඇවිත්. මට දැනෙන්නේ දැන් මම පදවන්නෙ කාර් එකක් කියලා... මම... එතකොට මට දැනෙනවා මේ කාර් එක පුංචිම පුංචි එකක් බවට පරිවර්තනය වෙනවා කියලා. දැන් කාර් රථය අර පුංචි දරුවකුගෙ සෙල්ලම් කාරයක්

තරම් පුංචියි. පුදුමෙ කියන්නෙ මමත් ඒ ගානට ම කුඩා වෙලා. එතකොටම මට ඇහැරෙනවා.

මම කිව්වෙ හීනයක් ගැන වුණාට මගේ නිර්මාණ ශක්තිය ගැන මට ම පුදුම හිතුණා. ඒ මම කිව්වෙ ඇත්තටම මම දුටු හීනයක්ද කියලා දැන් මටම නිනච්චක් නැහැ. මනෝ වෛද්‍යවරයා අලි අමාරුවක වැටිලා. දැන් මිනිහා මේ හීනෙ තියෙන සංඥාර්ථ හිතින් තක්සේරු කරනවා. සුපින කේතයන් විකේතනය කරමින් මාව කියවනවා.

නිස්සංක ඔය වගේ තව හීන දකිනවාද?

අමාරුවේ වැටී සිටින මේ මිනිසාව තව තවත් අගාධයට ඇද දැමීමේ කුරිරු ආසාවකින් මම ආතුර වෙනවා.

අපොයි ඔව්. වෙලාවකට මහ විකාර හීන මට පේනවා. සමහර වෙලාවට මට හිතෙනවා මේ හීන බැලිල්ල හින්දා මම නිදා ගන්නෙම නැහැ කියලා.

නැහැ. නිස්සංක හීන කියන්නෙ ඔයාගෙ නින්දට එන බාධාවන් ට විරුද්ධව තියෙන දෙයක්. ඒක නිසා හීන දකිනවා කියන්නෙ ඔයා නිදා ගන්නවා කියන එක. හරි - තව ඔයා දකින හීන මොනවාද කියලා මට කියන්න.

ඒවා කතාන්දර වගේ හීන. කොහොමටත් මම දකින්නෙ දිග හීන කතාන්දර. පුදුමෙ කියන්නෙ ඩොක්ටර් ඔය හුඟාක් හීන මට කාලයක් යන කම් ම මතක තියෙන එකනෙ. ඔන්න මම දවසක් දැක්කා මම මහා කැලෑවක ඇවිදගෙන යනවා. මහා රූස්ස වනාන්තරයක්. කොයි

Scanned by CamS

තරම් ගස්වැල්ද කියනවා නම් කැලය ඇතුළේ තිබුණේ මහා අන්ධකාරයක්. ඉර එළිය පොදක් බිමට වැටෙන්නෙ නැති තරම්. ඒක හින්දා පොළොව හරි හීතලයි. මෙහෙම මම ගස්වැල් දෙබෑ කරගෙන ඉස්සරහට යනවා. මට දැනෙනවා ගස්වැල් මගේ අතින්ම දෙපැත්තට කරන්න ඕන නැති බව. මම කිට්ටු වෙනකොට ගස්වැල් ඉබේම දෙපැත්තට වෙනවා. මෙහෙම යද්දි මට ඇහුනා මහා භයානක සද්දයක්. මකරෙක්. කටින් ගිනි දැල් විහිදගෙන මං දිහාට එන ඇවැන්ත මකරෙක්. මට පුදුම බියක් දැනුණා. දැන් මකර මම දිහාවට එනවා. උගේ කටින් පිටවෙන ගිනිදැල් වලින් රස්නයක් මට දැනෙනවා. එතකොට මට දැනුණ කව්රු හරි කෙනෙක් මාව අල්ලගන්නවා. අල්ලගෙන මාව බදාගන්නවා වගේ. මාව බදා ගන්න කෙනාට ඕන මාව බේරාගන්න කියලා මට දැනෙනවා.

නිස්සංක... නිස්සංක කියලා එයා කතා කරනවා. ගෑණු කට හඬක්. මට හිතුනේ මේ කැලේ වෘක්ෂයකට අරක්ගත් දේවතාවියක් කියලා. එතකොටම මට ඇහැරෙනවා. සුමාලි මාව හොලවනවා. ඔයා හීනයක් දකිනවා නිස්සංක. ඇය කියනවා. මම හීනෙන් හැබෑ ලෝකෙට අවදි වෙනවා. ඕවා තමයි ඉතින් මම දකින විකාර හීන.

නිස්සංක කිව්වත් වගේ දකින්නෙ කතාන්දර වගේ හීනනෙ.

ඔව්. මට වෙලාවකට හිතිලා තියෙනවා දකින හීන පොතක ලියලා එකතු කරලා හීන පොතක් හදන්න. ඕන නම් මගේ හීන පොත කියලා ඒක පබ්ලිෂ් කරන්නත් පිළිවන්.

දැන් ඔන්න මගේ වෛද්‍යවරයා කෙකර ගගා හිනා වෙනවා. මිනිහා තව තවත් මඩවන්න මා තුළ ආශාවක් ඇතිවෙනවා.

තව ඔය වගේ මං දකින හීන තියෙනවා. ඩොක්ටර්ට වැදගත් කියලා හිතෙනවා නම් කියන්නම්. ඇයි ඉතින් ඩුමාලි කියලා ඇතිනෙ මගෙ ඔලුව ඇතුළට රිංගලා ඒකෙ පිරිලා තියෙන කුණු කන්දල් අවුස්සලා බලන්න කියලා.

මගේ වෛද්‍යවරයා දැන් හරිම අසරණයි. කුරිරුකම මාව වෙලාගෙන. ගැනුන්ගෙ කීම් බස්වලට මේ වගේ දේවල් කරනවාට විඳවපන් කියලා මම හිතුවා.

තව මම දකින හීනයක් තියෙනවා. ඒක නම් හුඟාක් වැදගත් වේවි. මොකද මගෙන් අප්පච්චි ගැන අහපු හින්දා. ඔන්න දවසක් මම අප්පච්චිත් එක්ක තරහාවෙලා රණ්ඩු කරලා ගෙදරින් පැනලා යනවා. මේ හීනෙත් තියෙන්නෙ කැලෑවක්. හැබැයි අර ඉස්සරවෙලා හීනෙ වගේ රූස්ස වනාන්තරයක් නොවේ. සමහර තැන් වල නිකම් ස්ටෙප්ස් තණ බිම වගේ තැනි තලාව. හරි අපූරු පරිසරය. හීනෙත් වුනත් මම අපූරු සෞන්දර්ය රසයක් විඳිනවා. ඉතින් මම හැඟීම්බරව ඔහේ ගාටනවා. මට දැන් අප්පච්චි ගැනවත් අම්මා ගැනවත් ගෙදර වෙන කෙනෙක් ගැනවත් කල්පනා වෙන්නෙ නැහැ. මම හරිම නිදහසක් විඳිමින් සිටිනවා කියලා තමයි මට හිතුණේ. ඒ දවස්වල අපි රෑට අප්පච්චිගෙ කකුල් මිරිකන්න ඕන. මට එක කකුලක්. අනිත් කකුල නංගිට හරි මල්ලිට හරි. අප්පච්චි බීලා කෙඳිරි ගගා නිදි. මිරිකිල්ල නැවතුනොත් අප්පච්චි අවදිවෙලා දත් මිටි කනවා. මෙහෙම නිදහසේ යන කොට දැන් ඒ කරදරෙත් නැහැ කියලා මට හිතුනා. මෙන්න එතකොටම මම මහ

විශාල අගාධයකට ඇදගෙන වැටෙනවා. ඒක මහ ගැඹුරු වලක්. මම ඒ ගැඹුරු වල ඇතුළට ඇදිලා යන්නේ අර ඇලිස් ඉන් වන්ඩර්ලන්ඩ් කතාවේ ඇලිස් ගියා වගේ. දැන් ඔන්න මම ඒ වල ඇතුළෙ. හැම තැනම කළුවරයි. කිසිම දෙයක් පෙනෙන්නෙ නැහැ. මට හරිම බයක් දැනෙනවා. කවදාවත් මේ අගාධයෙන් ගැලවෙන්න මට ලැබෙන එකක් නැහැ කියලා මට හිතෙනවා. දැන් මට දැනෙනවා මගේ පයට සීතලට යමක් පෑගෙනවා. ඒ පෑගෙන දේ මගේ දෙපතුළ යටින් ඇදිලා යනවා වගේ. මම ඉන්නෙ සර්ප විමානෙක. දැන් ඩොක්ටර්ම හිතන්න ඒ වගේ වෙලාවක කෙනෙකු තුළ මොන විදියෙ බියක් ඇතිවෙයිද? බය හින්දාම දැන් මාව හිරි වැටිලා වගේ. මම දැන් ඉහළ ආකාසෙ දිහා බලනවා. එතකොට මට පෙනෙනවා ඉර මුදුන් වෙලා වගේ. ඉර එලිය කැරැල්ලක් අගාධය තුළට ගලාගෙන එනවා. දැන් වලේ තිබුණ අර අඳුරු ගතිය තුනී වෙලා. මම ඉහල ආකාශය දිහා ඇසිපිය නොහෙලා බලාගෙන හිටියා. එතකොටම මම දැක්කා කව්ද පිරිසක් වල ඇතුළට එබීගෙන ඉන්නවා. අප්පච්චිත් එතන හිටියා. හැමෝම එකතුවෙලා මාව ඒ අගාධයෙන් ගොඩට ගත්තා. අප්පච්චි මට සමාව දුන්නා. අපි හැමෝම සතුටින් ගෙදර ගියා. ලස්සන කතාව නේද ඩොක්ටර්?

මට දැන් මිනිහා අර බළලෙකුට බාගෙට මරාගත් මීයෙක් ගානයි. මම මී කූනත් එක්ක එහාට පැන පැන මෙහාට පැන පැන සෙල්ලම් කරනවා.

නිස්සංක හරි කතා කාරයෙක්නෙ. හීන කියන ඒවා ඔහොම කතාවල් වගේ පිළිවෙලකට මතක හිටින්නෙ නැහැ. අපි දකින්නෙ හීන කෑලි. අපි කරන්නෙ අමතක ටික අතින් දාලා පුරවලා කතාවල් හදන එක. ඒ අතින්

ගත්තාම නිස්සංක හොඳ නිර්මාණකරුවෙක්. හැබැයි අර මකරගෙ හීනෙයි වලකට වැටුන කතාවයි අපට ටිකක් අදාළයි. කෙනෙකුට හිතෙන්න පුළුවන් ඒ හීනවලින් කියවෙන්නෙ නිස්සංකගෙ අප්පච්චි ගැන කියලා. නිස්සංක අතින් දාලා හැදුවත් ඔයා ඔය කියන්නෙ අප්පච්චි ගැන තමයි. නමුත් එකම දේ ඒවා සාමාන්‍යයි.

දැන් මිනිහා මට හොඳටම හීලෑ වෙලා.

මම කියන්නද නිස්සංකගෙ මේ කතා කීමේ හැකියාවෙන් ප්‍රයෝජනයක් ගන්න. නවකතාවක් වගේ දෙයක් ලියන්න. තමුන්ගෙ ජීවිත කතාව වගේ එකක්. ඒක තමන්ගෙ මනසටත් හොඳයි. හිතත් නිදහස් වෙනවා.

දැන් ඔහු වෙනම පාරක් තෝරගෙන.

මම එහෙම බාගෙට ලියපු නවකතා අඩල් තුන හතරක්ම තියෙනවා. මට තියෙන ප්‍රශ්නෙ කිසි දෙයක් මට එක දිගට කරගෙන යන්න බැරිකම.

මගෙන් පිටවුණ ඒ අවසන් වැකියට මම ම ගැස්සුණා. මිනිහාට හෝඩුවාවල් සපයන්න හොඳ නැහැ. ඒ වාක්‍ය හොඳටම ඇති මාව තක්සේරු කර ගන්න.

නැහැ මම කිව්වෙ...

මම ඒක නිවැරදි කරන්න හැදුවාට ඔහු ඊට ඉඩ නොදී කතා කළා.

එහෙම ප්‍රශ්න කාටත් තියෙනවා. මට වුණත් එහෙමයි.

ඩොක්ටර් මම කවදාහරි ලියනවා මගේ ම කතාව. ඒ තමයි මම ලියන්න හිතාගෙන ඉන්න නවකතාව.

ඒක හරි - අපි හැමෝගෙම කතාව නවකතාවක් තමයි.

මේ අවසාන වාක්‍යයත් සමඟ ඔහු සීනුවට ඇඟිල්ලෙන් තට්ටු කළා. හේමමාලි නැවත අප ඉදිරියේ පෙනී සිටියා.

හේමමාලි අර මිසිස් සේනාධීර ට එන්න කියන්න.

සුමාලි ඈත දුර ගමනක් ගිහින් එනවා වගේ සෙමෙන් අප වෙත එනවා. ඇය මා දෙසත් වෛද්‍යවරයා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා.

මිසිස් සේනාධීර වාඩි වෙන්න.

දැන් ඔහුගේ කතාබහ කිසියම් නිල ස්වරයකට මාරු වෙලා. සුමාලි කීකරුව වාඩිවුණා.

ඔයාගෙ හස්බන්ඩ් ට කිසිම ප්‍රශ්නයක් නෑ. එයා හොඳ නිර්මාණශීලි කෙනෙක් විදියටයි මම දකින්නෙ. හැබැයි එයාගෙ හිත ටිකක් කලබලයි. ඒක අසාමාන්‍ය නැහැ. හොඳට නිදා ගත්තම ඇරිලා යයි. මම පොඩි බෙහෙතක් ලියලා දෙන්නම්. ඒක ගත්තම හොඳට නින්ද යයි.

අසරණයා. මම හිතින් හිනා වුණා.

එහෙනං ඩොක්ටර් මාව දැන් නිදහස් කරන්න පුළුවන්නෙ.

මම ඔලොක්කුවට ඇහුවා.

අපොයි ඔව්.

ඔහු අසරණ ලෙස නැගිටලා මට අත දික් කළා.

අප්පච්චිගෙ ප්‍රශ්නය හරි අපූරුවට විසඳුනා. දැන් සියල්ල සාමාන්‍යයයි. මනෝ වෛද්‍යවරයකු හමුවුණ බව සුමාලි හැම තැනම පතුරුවලා. දැන් මම පුරුදු විදියට කන්තෝරු එනවා. හැමෝම හිනාවෙනවා. කතා කරනවා. හිත යටින් දත් මිටි කනවා. හැබැයි දැන් මම ඉස්සර වගේ උන්ගෙ මුහුණු කියවන්න යන්නෙ නැහැ.

මම උදේම කන්තෝරුවට ඇවිත් මගේ මේසයේ ඉඳගෙන මාතුපාලට කතා කළා. මාතුපාල ඇඹෙරෙමින් මා ළඟට එනවා.

ගේනවකො මාතුපාල තේ දෙකක්.

මාතුපාල ගැස්සුනා. ඇස් දෙක දොඹ ගෙඩි දෙක්ක වගේ එළියට පනින කං ලොකු කර ගෙන ඔහු මා දිහා බලාගෙන ඉන්නවා.

සර්?

මාතුපාල ගොත ගහනවා. මිනිහා කියුබිකල් එකට උඩින් කාටදෝ ඉඟි මරනවා. මම හයියෙන් කොක් හඬලා සිනාසුණා.

අන්න බලනවා මාතුපාල තමුසෙ හිතන්නෙ මට තාමත් පිස්සුයි කියලනෙ. මම මේ තමුසෙව පොඩ්ඩක්

ටෙස්ට් කළා. තේ දෙකක් මොකටද ඕයි මේ තනි මට. ගේනවා තේ එකකුයි සිගරට් පැකට් එකකුයි.

මම සල්ලි දික්කලාම මාතුපාල සැහැල්ලුවෙන් ඉගිලුණා.

මාතුපාල යනවත් එක්කම නිර්මලා ලැසි ගමනින් මගේ කියුබිකල් එකට ඇතුල් වෙනවා.

මතුපාල!

මගේ කෑ ගෑමට මාතුපාල තිරිංග තදකළා.

දැන් නම් තමුසෙට තේ දෙකක් ම ගේන්න වෙයි. මේ නිර්මලා මිසිත් ඇවිල්ලානෙ මාව බලන්න.

නිර්මලා අහිංසක විදියට හිනාවී ගෙන මගේ ඉදිරිපස පුටුවේ වාඩි වුණා.

මට නම් හරිම සතුටුයි සර් ඔහොම හිනාවෙලා ඉන්න එකට. දැන් සර්ට සනීපයිනෙ.

නිර්මලා කියනවා.

ඇයි නිර්මලා එහෙම කියන්නෙ මට මොකක්ද තිබුණ අසනීපෙ. මට කවදාවත් ඉහෙන් බහින ලෙඩක් තිබුණේ නැහැ.

නිර්මලා නිහඬවම බලාගෙන හිටියා. බාග විට මගේ අසනීප ගැන සඳහන් කිරීම නුසුදුසු දෙයක් කියලා ඇයට හිතෙන්න ඇති.

නැහැ ඉතින් සර් ඒ දවස්වල එක එක විකාර කළානෙ. අප්පච්චි කියලා කෙනෙක්ව හිතෙන් මවාගෙන.

නිර්මලා ගැන මා තුළ ඇතිවුණේ කණගාටුවක්. අප්පච්චි මේ දැනුත් ගෙදර කාමරේ ඇති. නිර්මලා අහිංසකයි. අප්පච්චිගෙයි මගෙයි උප්පරවැට්ටිය ඇය කොහොමද දන්නෙ? අප්පච්චිගෙ රහස නිර්මලාට විතරක් කියන්න මට හිතුනා. නිර්මලා හොඳ කෙල්ල. ඇය ඒ වගේ රහසක් දැන ගත්තට කමක් නැහැ. ඒ අවි අස්සෙ මම හිතින් තර්ක කළා. නිර්මලා වුණත් අප්පච්චිගෙ විස්තර දැන ගන්නෙ කුමකටද? අනිත් එක අප්පච්චි මේ විදියට සැඟවී සිටීම අප දෙදෙනාගේම සම්මුතියක්. එහෙම රහසක වුනත් තියෙනවා කිසියම් ආස්වාදයක්.

නැහැ නිර්මලා. ඒ දවස්වල මම ටිකක් මානසිකව වැටිලා හිටියෙ. සුමාලි දුවත් එක්ක ගෙදරින් ගියා. තනියම ඉන්න කොට විකාර දේවල් හිතෙනවානෙ.

මේවා කියවෙන කොට මට මම ගැනම පුදුමයි. ඉතාම තර්කානුකුල විදියට අප්පච්චි රහසක්ව තියා ගැනීම ඇත්තටම ආස්වාදයක් තමයි.

මම නිර්මලාගෙ මුහුණ කෙළින් ම බැලුවෙ එතකොටමයි. ඇගේ මුහුණට වෙන කවදාවත් නැති සටකපට පෙනුමක් එකතු වෙලා. මේ උදේ පාන්දරම නිර්මලා මාව හමුවෙන්න ආවෙ ඇයි? දිගින් දිගට බලාගෙන ඉන්න කොට නිර්මලාගේ මුහුණ පැත්තකට ඇලවෙනවා වගේ මට පෙනුනා.

දැන් ඉතින් සර්ට තියෙන්නෙ සුමාලිව ආපහු ගෙන්න ගන්න.

මුන් හැමෝම එකයි. සමාජය කියන්නෙ කුමන්ත්‍රණ වලින් පිරුණ තැනක්. සුමාලි කියන්න ඇති නිර්මලාට

මාව හමුවෙන්න. නැහැ. නිර්මලාගේ මේ ආගමනයේ ඊට වඩා සැඟවුණ අරුතක් තියෙනවා. බාග විට ඇය මෙතෙන්ට එවන්න ඇත්තෙ සමරදිවාකර වෙන්න ඇති.

කළ්‍යාණි ගැන ටිකක් හරි දන්න කෙනෙකුට ඉන්නෙ අප්පච්චි විතරයි. මම එහෙම හිතුවාට කළ්‍යාණි ගැන මේ අයට ඉව වැටිලා වෙන්න බැරිද? සුමාලි ආපහු ගෙන්න ගන්න කියන නිර්මලාගේ වචන මම එකින් එක ගෙන විශ්ලේෂණය කළා. ඒ වචනවල තියෙන්නෙ වෙනත් අර්ථයක්. ඇය සුමාලි ගෙන්න ගන්න කිව්වා මිසෙක දුව ගැන වචනයක් කිව්වෙ නැහැ. සුමාලි කියන තැනට කළ්‍යාණි ආදේශ කළොත් ඇය කියන දේවලට වෙනම අර්ථයක් එනවා. එතකොට ඇය කළ්‍යාණිව ආපහු ගෙන්න ගන්න කියන්නෙ කළ්‍යාණිව මතක් කර ගන්න කියන එක වෙන්න බැරිද?

මගේ පිට කොන්ද දිගට සීතලක් දිව ගියා. ගෙදර ගිය ගමන් මට අප්පච්චි එක්ක මේ ගැන කතා කරගන්න වෙනවා. මම කළ අපරාධය ගැන මේ හැමෝම දන්නවා. හැබැයි උන් හැසිරෙන්නෙ නොදන්නවා වගේ. එදා සුමාලිගෙ තාත්තාත් ඔය වගේ කතාවක් කිව්වා.

තමුසෙ ඒකිත් එක්ක ලැගපු ගුබ්බෑයම් වල විස්තර සේරම මම හොයාගෙන තියෙන්නෙ. තමුසෙට තියෙන්නෙ උසාවියෙන් සිතාසි එනකං බලාගෙන ඉන්න විතරයි.

සුමාලිගෙ තාත්තාගේ කට හඬ මගේ කන් සිදුරු අතර තෙරපෙනවා.

මාතුපාල තේ දෙකත් අරගෙන ඇතුල්වුණේ එතකොටම. ඔහු නිර්මලා ඉදිරියේ තේ එකක් තියලා ගරු සරු ඇතිව මගේ තේ එක මා අසලින් තිබ්බා. මම මාතුපාලගේ අතින් ඩැහැගත් සිගරැට් පැකට්ටුවෙන් සිගරැට්ටුවක් තොල්වල අලවගෙන දල්වා ගත්තා.

නිර්මලා තේ එක තොල ගාමින් සුළු වෙලාවක් රැඳුණා. මම ඇය සමඟ කතා කළේ හරිම ප්‍රවේශමෙන්. මම බොහොම සීරුමාරුවට වචන තෝරා බේරා පාවිච්චි කළා. මම මාතුපාල දෙස වුනත් බැලුවේ සැකයෙන්.

මාතුපාල සේවය කරන්නෙ මට නොවෙයි. ඔහු වෙන කෙනෙකුගේ ඒජන්තයෙක් වෙන්න බැරිද? ඔහු මෙතන මං ගැන ඔත්තු බලන්න පත් කළ සමරදිවාකරගෙ හෙංචයියෙක්.

මම ඉතාම තියුණු විදිහට මේ දේවල් ගැන දිගින් දිගටම හිතුවා. ඉතාම කල්පනාවෙන් වැඩ කළ යුතු කාලයක් මේ. මම දන්නවා කියන එක හැඟවීම සුදුසුම නැහැ. ඒත් මට තේරෙනවා තැනින් තැන කුමන්ත්‍රණ දියත් වන බව. මම උදේ සෝපානය ළඟ ඉන්න කොට කීප දෙනෙකු මං දිහා බලමින් කොඳුරනවා මම දැක්කා. මම කළේ නහයට කෙලින් උන් දිහා බලන එක. හැමෝම මගේ බැල්ම ඉදිරියෙ පරාජිතව බිම බලා ගත්තා.

මාතුපාල හිමින් සීරුවෙ එළියට ලිස්සලා ගිහින්. අතපසු වෙච්ච වැඩ ටික ඉවරයක් කරන්න මම කල්පනා කළා. මගේ වැඩවලට අදාළ ලිපි ගොනු මාතුපාල දැනටමත් මගේ මේසය මතට වඩම්මලා.

මම ලිපි ගොනුවක් දිග හැරගෙන ලියන්න සූදානම් වුණා. මේක ලිවිය යුතුම දෙයක්. ඒත් එක වචනයක්වත් ඔලුවට එන්නෙ නැති හැටි. මම හිසකෙස් ඇඟිලිවලින් පටලවගෙන රිදෙනකම්ම ඇදගෙන හිටියා. එතකොට මට දැනුණා අප්පච්චි මම ළඟින් වාඩිවෙනවා වගේ. ලියන්න ඕන දේ ඔන්න දැන් දිය ඇල්ලක් වගේ ගලාගෙන එනවා.

මම හිතන්නෙ මම පැය තුනකටත් වැඩි කාලයක් තිස්සේ ලිපි ගොනු එක්ක හැප්පුනා. අතරමග නැවතිලා තිබුණ කටුකැලේ ව්‍යාපෘතියෙන් අපි අපේක්ෂා කළේ ස්වභාවික වනාන්තරයක් රැක ගන්න ගමන් මහ කැලයක ඉහත්තාවෙ කන්දෙන් ඇද හැලුන ජල ධාරාව රැක ගැනීම. මිනිස්සු මේ කැලයට හානි කළේ මේ දිය ඇල්ලෙන් වතුර ගෙන යන්න යන එන ගමන්. ප්‍රශ්නය වුණේ මිනිස්සු කැලේ විනාශ කරන එක නවත්තන්නෙ කොහොමද කියන එකයි.

ඇමතිවරයා මේ ගැන සාකච්ඡා කරන්න කැඳවපු රැස්වීමේදි වැඩිපුරම අදහස් දැක්වූයේ මම.

කැලේ රැක ගන්න ඕන නම් මිනිස්සු වතුර ගන්න දිය ඇල්ලට යන එක නවත්තන්න ඕන.

මම යෝජනා කළාම හැමෝම සිනාසුණා. මම එතන මෝඩ කතාවක් කළා වගේ ඇමතිවරයත් හීනිවට හිනා වෙනවා. සමරදිවාකර කිනිසි තුඩු වගේ වචනවලින් මට අනින්න පටන් ගත්තා.

නිස්සංක... ඒක අපි හැමෝම දන්නවා. ප්‍රශ්නෙ තියෙන්නෙ ඒක කරන්නෙ කොහොමද කියන එක.

කැලේ වට කරලා හමුදා කඳවුරක් ඉදිකරන්න කියලාද ඔබතුමා යෝජනා කරන්නෙ?

සමරදිවාකර ඇමතිවරයා ඉදිරියෙ මාව ලජ්ජාවට පත් කරලා මිනිහාගේ මල්ලට ලකුණු එකතු කර ගන්නයි හදන්නෙ.

කරන්න තියෙන්නෙ මුලින්ම ජල ව්‍යාපෘතියකින් මිනිසුන්ගෙ අවශ්‍යතා සඳහා ජලය සපයන එක. දෙවෙනි එක තමයි මිනිස්සුන්ව විකල්ප වගාවක් සඳහා යොමු කිරීම.

ඇමතිවරයා බැරෑරුම් ලෙස මා දිහා බැලුවෙ එතකොට.

මිස්ටර් සේනාධීර ඒක හොඳ යෝජනාවක් තමයි. නමුත් ඔය තරම් ලොකු ප්‍රොජෙක්ට් එකකට කෝ අපට සල්ලි?

මම සමරදිවාකරට ඔලොක්කුවටත් එක්ක හිනාවුණා.

අපි කරන්න යන්නෙ ඵලදායි වැඩක් කියලා අපට ඒත්තු ගන්නවා ගන්න පුළුවන් නම් නෝවිජියන් ආධාර අපට ලැබෙන බවට දැනටමත් ඉඟියක් තියෙනවා සර්.

ඒ ගමන කතාව ඒ පැත්තට මාරු වුණා. නෝර්වේ තානාපති ඇතුළු පිරිස හමුවෙලා මේ කාරණය ඔවුන්ට ඒත්තු ගන්වන්නෙ කොහොමද? කියන ප්‍රශ්නය සමඟ තමයි අපි ගැටුනෙ.

අපි සර් ඒක මිස්ටර් නිස්සංක සේනාධීර ට පවරමු.

සමරදිවාකරගෙ යටි අදහස මට පැහැදිලියි. නෝර්වේ තානාපති ඉස්සරහ මම ඇන ගන්න හැටි මිනිහා හිතෙන් නරඹනවා. ගමක ඉස්කෝලෙකින් ආපු හින්දා මිනිහා හිතන්නෙ මට හරියට ඉංග්‍රීසි කතා කර ගන්නත් බැහැ කියලා. මම වැඩේ බාර ගත්තා.

හරි... මිස්ටර් සේනාධීර මේ වැඩේ හරියට කළොත් ඔබතුමාව මම අධ්‍යක්ෂ තනතුරට නිර්දේශ කරනවා. දැන් මිස්ටර් සමරදිවාකර හෙට අනිද්දා විශ්‍රාම ගියහම ඒ පුටුවට පත්වෙන්නෙ එතකොට තමුන්නාන්සේ.

සමරදිවාකර ඒක බාර ගත්තෙ ඇමතිවරයා මට කරපු සමච්චලයක් විදිහට. ඔහු අනෙක් අයත් එක්ක කටු කුටු ගාමින් හිනාවුණා. ඒත් සමරදිවාකරගෙ ඇහේ කටු ඇනෙන්න පටන් ගත්තෙ නෝර්වේ තානාපති සමඟ මා කළ සාකච්ඡාව සාර්ථක වුණාට පස්සෙ. මගේ යෝජනා වල සාධනීය බව තානාපතිගෙ සිත් ගත්තා. නෝර්වේ රජය රුපියල් ලක්ෂ එකසිය පනහක් ව්‍යාපෘතියේ මුල් අදියර සඳහා ලබා දෙන්න එකඟ වුණා. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව මාස තුනක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඔවුන් මට නියම කළා. අප්පච්චි අපේ ගෙදර ඇවිත් නතර වුණේ අන්න ඒ ජයග්‍රහණයට සතියක්වත් යන්න කලින්.

පැය තුනක් තිස්සේ ලියාගෙන ලියාගෙන ගිහින් මම ඔලුව උස්සලා බැලුවා. කන්තෝරුව හැම තැනම නිශ්ශබ්දයි. කිසි කෙනෙකුගේ හා හූවක් නැහැ. මාතුපාල මගේ කියුබිකල් එක ඉස්සරහ කුඩා මේසය ළඟ පුටුවෙ වාඩිවෙලා නිදිකිරනවා. මෙච්චර වෙලා මම ළඟ හිටියා වගේ දැනුණ අප්පච්චිත් නැහැ. ලියන අකුරක් පාසා

මම අප්ප්චචි අප්පච්චි කියලා තොල මැතිරුවා. මේක මේ විදියට ලියලා ඉවර කරන්න ධෛර්යය ලැබුණේ අප්පච්චිගෙන්.

මාතුපාල!

මාතුපාල ගැස්සිලා වගේ නැගිට්ටෙ. ඔහු යටහත් පහත්ව මා දෙසට එනවා.

මොකද මේ කන්තෝරුව මේ තරම් නිශ්ශබ්ද? මම ඇහුවා.

සර් දැන් වෙලාව හතරහමාරත් පහුවෙලා. හැමෝම ගිහින්. සර්ට මං කතා කළාට සර්ට ඇහුණේ නැහැ. සර් දිගටම ලිව්වා.

මම මගේ ඉස්සරහ ගොඩ ගැහිලා තියෙන කඩදාසි කන්දරාව දෙස බැලුවා. මම හිතන්නෙ මම පිටු එකසිය පනහක් විතර ලියලා. මේ ව්‍යාපෘති වාර්තාව දුටුවාම සමරදිවාකරගෙ ඇස් උඩ යයි. මේ වැඩේ ඉවර වුණ එක ලොකු දෙයක්. ගෙදර ගිහින් මේ ගැන අප්පච්චි එක්ක කතා කරනකම් මට ඉවසුමක් නැහැ.

එතකොට ස්ටෙනෝස්ලා ටයිපිස්ට්ලා කව්රුත් නැද්ද? මට මේ වාර්තාව වහාම ටයිප් කරගන්න ඕන.

කව්රුත් නැහැ සර්. හැමෝම ගිහින්. මම හිටියේ සර් හින්දා. සර් දැන් යනවාද?

මම හුන් අසුනින් නැගිට්ටා.

එහෙනම් මාතුපාල අපි යමු. මම හෙට එනකොට ටිකක් දවල් වුණොත් මේ වාර්තාව දෙනවා සමුද්‍රා මිස්ට

ටයිප් කරන්න. එයා මගේ අකුරු හොඳට අඳුනනවා. මම මේ ලාච්චුවට දානවා මේක. වෙන කිසි කෙනෙකුට දෙන්න එපා සමුද්‍රා මිස්ට හැර. තේරුණාද?

මාතුපාල මම කියන දේ තේරුම් ගත්තා. හැබැයි කලබල වුණා.

සර් හෙට සෙනසුරාදා. සඳුදාට තමයි දෙන්න වෙන්නෙ.

ඒකෙත් හැටි. මේ වැඩේ හෙටම ඉවරයක් කරගන්න ලැබෙන්නෙ නැහැ.

කමක් නැහැ මාතුපාල අපි යං.

මාතුපාල මගේ කාර්යාල බෑගය අරගෙන ඉස්සර වුණා. මගේ ව්‍යාපෘති වාර්තාව ගැන අප්පච්චිට එකින් එක විස්තර කරන හැටි හිතෙන් කල්පනා කරමින් මම විදුලි සෝපානය දෙසට ගාටමින් ගියා.

මට එකපාරටම කල්පනා වුණේ මේ වාර්තාව දැන්ම සමුද්‍රා අතට පත් කර ගන්න පුළුවන් නම් කොච්චර හොඳද කියලා. එතකොට සමුද්‍රා කාර්යාලයට ඇවිත් මේක ටයිප් කරන්න ගත වෙන කාලය ඉතුරු වෙනවා. අනෙක සමුද්‍රා ළඟ එයාගෙම ඔඩොක්කු පරිගණකයක් තියෙනවා. ඉතින් එයාට පිළිවන් ගෙදරදිම මේක ටයිප් කර ගෙන එන්න.

මාතුපාල!

මම බෙරිහන් දෙනවිට මාතුපාල ඉද්ද ගැහුවා වගේ නැවතිලා හැරී බැලුවා.

මාතුපාල - සමුද්‍රා ඉන්නෙ මේ ළඟ නේද?

ඔව් සර් මේ ඔෆිස් එක ළඟින්ම වැටෙන සමුද්‍රාරාම පාරෙනෙ. ඒකට සමුද්‍රාරාම පාර කියන්නෙ සමුද්‍රා මිස් ඒ පාරෙ ගෙදරක ඉන්න හින්දනෙ.

මට හිනාගියා.

තමුසෙලත් හරි විහිලුකාරයො තමයි. කව්ද ඔය නම ඔය පාරට දැම්මෙ.

සමරදිවාකර සර්නෙ.

මාතුපාල එහෙම කියන කොට මගේ මුහුණ දුර්වර්ණ වෙන්න ඇති. මාතුපාල වචන ගිල ගත්තා.

හරි හරි ගිහින් අර ෆයිල් එක ගේනවකො. අපි යන ගමන් දීගෙන යමු. මම තමුසෙව බස් ස්ටෑන්ඩ් එකෙන් බස්සන්නම්.

හරි සර්.

මාතුපාල ආපහු දිව්වා.

ඒත් ඒකෙන් වැඩක් වුණේ නැහැ. අපි යන විටත් සමුද්‍රා ගමේ ගිහින්. වාර්තාව ගෙදර ගියේ එහෙම. එක අතකින් ඒක හොඳයි. අප්පච්චිට පෙන්නන්න පිළිවන්. තව ටිකක් මට කියවලා බලන්න පිළිවන්.

මම අප්පච්චිගෙ කාමරයට ඇතුල්වුණේ හිස් අතින්. ව්‍යාපෘති වාර්තාව අප්පච්චිට පෙන්වීමට මට හිතුණේම නැහැ. අප්පච්චි ඒක දැක්ක ගමන් විවේචනය කරන බව මම සහ සුද්දෙන් ම දන්නවා. ව්‍යාපෘති වාර්තාව ලියලා ඉවර කළ බව මම අප්පච්චිට කියන්නෙවත් නැහැ.

අප්පච්චිගෙ ක්‍රමය සාර්ථකයි අප්පච්චි.

මම කාමරයට ඇතුළුවුණේ එහෙම කියාගෙන.

මොකක්ද මගේ ක්‍රමය.

අප්පච්චි අහනවා.

නැහැ අප්පච්චි. අප්පච්චි මේ ගෙදර නැහැ වගේ ඉන්න එක. අප්පච්චි එළියට පහළියට යන්නෙ නැති එක. මාත් එක්ක එහෙ මෙහෙ නොයන එක. දැන් උන් හිතාගෙන ඉන්නෙ අප්පච්චි නැහැ කියලා. සුමාලිත් කතා කළා අද. එයා ගෙදර එනවා කිව්වා.

අප්පච්චි කිසිවක් ම නොකියා නිහඬව බලාගෙන හිටියා. මට හිතුණේ සුමාලි ආවොත් අප්පච්චි ගෙදරින් යයි කියලා. මට ඕන වුණේ මේ කතාව වෙන පැත්තකට හරවන්න. මම කිසි සම්බන්ධයක් නැති පරණ සිදුවීමක් විස්තර කරන්න පටන් ගත්තා.

මම විශ්ව විද්‍යාලෙ තුන්වෙනි අවුරුද්දෙදි දේශපාලන පක්ෂයකට සම්බන්ධ වෙලා වැඩ කළා. ඒ පක්ෂයේ නායකයා නිතරම කැම්පස් එකට ආවා ගියා. සාකච්ඡා බොහොමයක් පැවතුණේ අපේ ශිෂ්‍ය සංගම් කාර්යාලය ඇතුළේ. පක්ෂ නායකයාට මම ඒ දවස්වල වහ වැටිලා වගේ හිටියෙ. එයා හරි උසයි. රතුම රතුයි. මූණ පොඩි ළමයකුගෙ වගේ. කම්මුල් පිම්බිලා. ඒ ගොල්ල පැය ගණන් කතා කළා. වාද කළා. මම එතන හිටියා අප්පච්චි.

මම කතාව ටිකක් නවත්තලා හුස්මක් ගත්තා.

හරි උඹ මොනවාද ඔය පක්ෂෙ කළේ. උඹට මම කියලා තියෙනවානෙ අපි දේශපාලනේ කළ හැටි.

මගේ විරාමය තුළ අප්පච්චිගෙ හිතේ ප්‍රශ්නයක් මෝදු වෙලා.

එහෙමට දෙයක් නැහැ අප්පච්චි. මට තමයි දවල්ට බුලර්ස් පාරට ගිහින් හැමෝටම කෑම ගේන්න වුණේ. ඒ දවස්වල හරි අමාරු ජීවිතයක් මම ගෙව්වේ අප්පච්චි. අම්මාට තනියම මගේ වියදම ගැන හිතන්න කොහොමවත් බැහැ. කැම්පස් ලෝන් එකෙන් කොටසක් ගෙදරට යවනවා කියලා හැමදාම හිතුවත් ඒක කර ගන්න ලැබුණේම නැහැ.

එක දවසක් පක්ෂ නායකයා මං දිහා බලලා අමුතු විදියට හිනාවුණා.

මට නිස්සංක එක්ක පුද්ගලිකව යමක් කතා කරන්න තියෙනවා. තමුසෙට පුළුවන්ද අද හවසට ඇවිත් මාව හමුවෙන්න.

ඔහු තිඹිරිගස්යායෙ පයිප්ප පාරෙ ලිපිනයක් සඳහන් කළා.

එදා හවස පහට විතර මම ඒ ලිපිනයේ සඳහන් නිවස සොයාගත්තා. ඒක විශාල ගෙයක්. ලොකු බරාඳයක් සහිත කාමර හත අටක් තියෙන ගෙයක්. නැහැ අප්පච්චි ඒක තට්ටු දෙකේ ගෙයක් නොවුණාට හුඟාක් ඉඩ කඩ තියෙන විශාල නිවසක්. ඔව් ඒක පාර අයිනටම වෙන්න තමයි තිබුණේ. හැබැයි ඉස්සරහා විශාල සාවියක තණ කොල පිට්ටනියක්. මල් වවලා. සුන්දරයි.

මම යනකොට පක්ෂ නායකයා (පුදුමෙ කියන්නෙ අප්පච්චි මට එයාගෙ නම අමතකයි) බරාඳයේ ලොකු හාන්සි පුටුවක වාඩි වෙලා පොතක් කියවනවා. මාව දැක්ක ගමන් ඔහු නැගිටලා ඉදිරියට ආවා.

නිස්සංක එන්න. ඒත් මං මේ බල බලා හිටියෙ මොකද පරක්කු කියලා.

ඔහු මාව කෙලින්ම ගේ ඇතුළටම කැඳවාගෙන ගියා. විශාල සාලයේ තුන් තැනක සැප සෝපා තුනක් තිබුණා. ඒත් එතන කිසි පිළිවෙලක් තිබුණේ නැහැ. ඈත කෙළවරක අඩ නිරුවත් ස්ත්‍රී රූපයක් සහිත පින්තූරයක් බිම බිත්තියට හේත්තුවෙලා තිබුණා. මම සාලයේ වාඩි වීමට තැනක් සෙව්වෙ වාඩි නොවුනොත් බිම ඇඳගෙන වැටේවි කියලා බයෙන්. නායකයා (මට ආයෙමත් කියන්න වෙනවා මට ඒ මනුස්සයාගෙ නම අමතක බව) මගේ හිත කියෙව්වා.

නිස්සංක වාඩි වෙන්න කලින් මට තමුසෙට යමක් පෙන්නන්න තියෙනවා. ඔහු ඉස්සර වුණා. ඔහු

දැල කාමර පේලියක් වැටුණ අඳුරු කොරිඩෝවක් දිගේ ගමන් කළා. ඔහු එක තැනක නැවතිලා ඉන් එක් විශාල කාමරයක් ඇර මට පෙන්නුවා.

තමුසෙට මේ කාමරවලින් ඕන එකක නවතින්න පිළිවන්.

මට තාමත් හිතා ගන්න බැහැ සිද්ධ වෙන්න යන්නෙ මොකක්ද කියලා. එක පාරටම මගේ ඔලුවට කඩා වැදුනෙ කුඩා කළ දවසක පාසලේදී ගුරුවරියකගෙන් කිරි උරා බිව් සිදුවීම. එම අත්දැකීමෙහි තිබූ ගුප්තකම මේ මොහොතේ මට දැනෙනවා.

ඔහු මේ හදන්නෙ මට මේ ගෙදරින් කාමරයක් කුලියට දෙන්නද? මේ වගේ තැනක නවතින්න තියෙනවා නම් කොච්චර දෙයක්ද? කැම්පස් එකට පයින් යන දුර. ඔහු කාමරයේ දොර වහලා නැවත කොරිඩෝරය දිගේ ගමන් කළා. කොරිඩෝරය කෙළවර පඩි දෙක තුනක් උඩට නගින්නට තිබුණා. ඒ පඩි නැගුන විට වම් පසට තිබුණේ තවත් කෙටි පැසේජයක්. ආයෙත් පඩි දෙක තුනක බැස්මක්. ඊළඟට දකුණට හැරෙන විටම තිබෙන දොර ළඟ ඔහු නැවතුණා.

ඔහු මා දෙස සුහද බැල්මක් හෙළන ගමන් කාමරයේ සොයිබය කැරකුවා. පළමුව කාමරයට ඇතුළු වුණේ ඔහුමයි. කාමරය තුළින් විලවුන් සුවඳක් සමඟ මුසුවුන දුගඳක් එළියට විසිවුණා. මමත් කාමරයට පිවිසුණා. අඳුරු කාමරයේ කෙළවරක වූ ඇඳක කව්දෝ උඩුබැලිව නිදාගෙන ඉන්නවා. නිදාගෙන ඉන්නෙ මහළු ස්ත්‍රියක බව හඳුනාගන්න අපහසු නැහැ. අවුරුදු අසූවක

විතර මැහැල්ලක්. ඇඳ ලඟම උජාරු රෝද පුටුවක් ඇයව එහෙ මෙහෙ රැගෙන යාමට සූදානම්ව කල්මරනවා.

මැහැල්ල හිස හරවලා අප දෙස බැලුවා. ඇගේ මුහුණේ තිබුණේ කලකිරීමක්. ඔහේ උඩුබැලිව බලාගෙන සිටීමට සිදුවීම නිසා මෝදු වුන කෝපයකුත් එහි තැවරී තිබුණා. ඇය කුමක් හෝ කියන්න තැත් කළා. ඒත් ගොත ගැසුවා මිස තේරුම් ගත හැකි යමක් ඇගේ මුවින් පිටවුණේ නැහැ.

නිස්සංක මේ ඉන්නෙ මගේ අම්මා. තමුසෙට තියෙන්නෙ මගේ අම්මාවත් බලාගෙන මේ ගෙදර නතර වෙලා ඉන්න එකයි. කෑම බීම ගැන තමුසෙ බලා ගන්නවා. මම මාසෙකට රුපියල් තුන් දාහක් තමුසෙට ගෙවනවා. මෙතන වැටිලා ඉන්නවාට. අම්මා බලාගන්නවත් මේ ගේ දොර බලා ගන්නවත් විශ්වාස කෙනෙක් නැහැ.

මට ඒ වචන ඇහෙනකොට ඉහිලුම් නැතිව ගියා. මගේ කර පිට පැටවෙන්නේ වයස්ගත ස්ත්‍රියකගේ ජීවිතයක් නොවෙයි. මා මත කඩා පාත් වන්න යන්නේ වාසනාවක්. නවාතැනක් සහ රුපියල් තුන්දහසක්. මට රුපියල් දෙදහක්ම ගෙදරට යවන්න පිළිවන්.

සහෝදරයා!

මට කියවුණා. ඔහු මගේ අතින් අල්ලගෙන කාමරයේ කෙළවරකට ගෙන ගියා.

නිස්සංක තරහා වෙන්න එපා. මේ වහල යටදි තමුසෙ මට සහෝදරයා කියන්න එපා. එළියෙදි තමුසෙ මට සහෝදරය බැරි නම් ඕන එකක් කියනවා. මෙක

දේශපාලනයට තහනම් අඩවියක්. මගේ අක්කා ඉන්නෙ මේ කිට්ටුව. තව අක්කා කෙනෙක් ඇමෙරිකාවෙ. උන් ඔක්කොම අධිරාජ්‍යවාදියො. දේශපාලනේ කිරිමෙත් තමයි මම උන් එක්ක තියෙන වෛරය පිරිමහා ගන්නෙ. පොඩි අක්කා ඉඳහිට ඒවි අම්මාව බලන්න. තමුසෙ එයත් එක්ක වැඩිය කතාවට යන්න එපා. දේශපාලනේ නම් කතා කරන්න එපා. එයා ආව වෙලාවට මඟ හැරලා ඉන්නවා. උදේට එනවා නර්ස් කෙනෙක්. අම්මාව ශුද්ධ පවිත්‍ර කරලා බේත් ටික දීලා යයි. එයා කියයි තමුසෙට කරන්න ඕන දේවල්. තමුසෙට තියෙන්නෙ අම්මාව බලාගෙන තමුසෙගෙ ස්ටඩීසුත් කරගෙන ඉන්න එකයි. මම හිතන්නෙ නැහැ අම්මා තව වැඩි කල් ජීවත් වෙයි කියලා.

ඔහු කතාව ඉවර කළේ ගනුදෙනුවක් ගැන කතා කරගෙන අවසන් කරනවා වගේ. එතන තිබුණේ ජීවිතයක් පිළිබඳ සංවේදි කතාවක් නොවෙයි. ගනුදෙනුවක්. ඒත් නායක සහෝදරයාගෙ අර අවසන් වාක්‍යයට මගේ හිත කඩා වැටුණා. අනේ අම්මේ මැරෙන්න එපා. තව අවුරුදු දෙකයි මට තියෙන්නෙ. එතකං ඔබතුමිය මගේ ආයුෂත් අරගෙන ජීවත් වෙන්න ඕන.

මොනවාද නිස්සංක කල්පනා කළේ. කැමතිද වැඩේට?

කැමතියි.

එහෙනම් අදම එන්න පිළිවන්ද? කොහෙද නිස්සංක දැනට ඉන්නෙ?

මම රත්තනපිටියෙ යාළුවෙකුගෙ බෝඩිමක ගජයක් ගහගෙන ඉන්නෙ. මම දැන්ම ගිහින් බඩු අරගෙන එන්නම්.

මම කතාව නවත්තලා අප්පච්චි දිහා බලාගෙන හිටියා. අප්පච්චිගේ මුහුණේ සෝපාහාසය පිරි හිනාවක් ඇඳුනා.

උඹ හිතන්නෙ මොකක් හින්දද උඹේ ඔය නායක සහෝදරයා ඔය වැඩේට උඹව පංගාර්තු කළේ?

අප්පච්චි අහනවා.

ඒ සහෝදරයා මට කරුණාවයි. හරිම හිතවත්. ආදරෙයි. මාව විශ්වාසයි. ඒකයි.

නැහැ මිනිහෝ උඹ නොම්මර එකේ නෝන්ජලයෙක් හින්දා. මිනිහා එතන නවත්තන්න හෙව්වෙ නෝන්ජලයෙක්ව. ඒක උඹේ නෝන්ජල්කම ගැන ලැබුණ සහතිකයක්. උඹ ඉතින් එතන හුගාක් කල් හිටියාද?

මාස පහයි. ඒ ගෑනු මනුස්සයා මැරුණා. මට මගේ නවාතැනයි ආදායමයි දෙකම නැතිවුණා. ඒ කාලෙදි මට කරන්නට තිබුණේ අර වයසක මනුස්සයා රෝද පුටුවට ගොඩ කරලා එහෙ මෙහෙ තල්ලු කරන එකයි වෙලාවට බේත් ටික දෙන එකයි තමයි.

මියැදෙමින් සිටි මහළු ස්ත්‍රියක සමඟ විසල් නිවසක තනිව ගෙවූ එම කාලය තුළ මා ලැබුවේ හරිම අපූර්ව අත්දැකීමක්. සමහර දිනවල රාත්‍රියට ඇගේ කෙඳිරිලි හඬ මට ඇහෙනවා. මම ඇය සිටින කාමරයට ගොස්

ඇය දෙස බලා සිටිනවා. බොහෝ වෙලාවට මම ඇයට පෙනෙන ලෙස සිටින්නේ නැහැ. මා දුටුවහොත් ඇය ඇගේ කෙඬෑරි අත් දිගු කර මා ඇය වෙත කැඳවනවා. ඇය වේගයෙන් හුස්ම ගනිමින් මොනවාදෝ කියන්න උත්සාහ කරන සැටි බලා සිටින්නට බැරි තරම්. මේ යාතුකර්මයට පස්සෙ ඇය එක්වරම කෙඳිරිලි හඬක් හෝ නොනගා නිහඬ වෙනවා. මම බිය ගන්නේ ඇය මිය ගියාවත් දෝහෝයි යන සැකයෙන්. මේ නිසාම මම ඇය වෙත සමීපව ඇගේ අතක් ගෙන ඇයට පණ තිබේදැයි පරික්ෂා කර බලනවා. මට කල්පනාවට නැගෙන්නේ ඇය මිය ගියහොත් මට අහිමිවන මුදල් සහ නවාතැන ගැන. ඇගේ ශරීරය මවිසින් පරෙස්සම් කරගත යුතුව තිබූ වස්තුවක්.

සමහර දිනවල මැදියම් රැයේ මම අවදි වන්නේ මැහැල්ල යටි ගිරියෙන් කෑ මොර දෙන හඬින්. මම වහාම ඇගේ කාමරය වෙත දිව යනවා. කාමරයට ඇතුළු වන විටම නැගෙන දුර්ගන්ධයෙන් මාව හැකිලෙනවා. ඇය ඇඳිවතේම මළ පහ කරගෙන. මම ආපහු මගේ කාමරයට ගොස් රෙදි කැබැල්ලක් ගෙන නාසය වැසෙන සේ බැඳ ගන්නවා. ඊළඟට අත් මේස් දෙකක් දමාගෙන ඇය ශුද්ධ පවිත්‍ර කරනවා. හෙදිය මට කියලා තිබුණේ හැකි තරම් ඇය පැත්ත හරවා තියන ලෙසයි. එක දිගට උඩු බැලිව සිටීමෙන් ඇඳ වන හැදූන ඇගේ පිට දුර්ගන්ධ කලාපයක්. ඇය වැඩිකල් ජීවත් වේ යයි මට වුණත් සිතුණේ නැහැ.

ඇය මිය ගියේ මා එලෙස ඇයට සාත්තු කරමින් සිටි රැයක් ගෙවී උදාවුණ දවසක. ඇය මොනවාදෝ

Scanned by CamS

කියන්න හැදුවා. ඒ වෙලාවෙ ඇගේ මුහුණට ආරූඪ වුණේ මහ විකාරකාරි පෙනුමක්. ඒ මුහුණ ඊට පස්සෙත් කාලයක් යනකම් මගේ හිතේ හොල්මන් කළා.

මේ නිවසේ සිටි කාලය තුළ හරිම විකාරකාරි සිදුවීම් වුණා. මැහැල්ල සමඟ ඔට්ටු වී වෙහෙසට පත්වන මම සාලයට විත් සියළු විදුලි පහන් දල්වා සෝපාවක වාඩි වෙනවා. ඒ වෙලාවෙ මගේ හිස ඇතුලේ රැව් පිළිරැව් දෙන අර මැහැල්ලගේ කෙඳිරිය වේවැල් පුටුවෙනුත් ඇහෙන්නට පටන් ගත්තා. මට ක්‍රමයෙන් දැනෙන්න වෙන්නේ එතන තිබුණ සියළුම ගෘහ භාණ්ඩ වලට පණ තිබෙන බවයි. කොටින්ම කියනවා නම් මම හිඳගෙන සිටි සෝපාව එයාම හෙලවිලා මාව බිමට පෙරලලා දැම්මා.

මම ඒවා පාලනය කර ගැනිමෙ අදහසින් ඒවායේ නම් කියා කතා කළා. මම ඈත තිබෙන පුටුවක් අමතා පුටුව කියා කතා කළාම ඒ පුටුව මා දෙසට හැරෙනවා වගේ මට දැනුණා. මම කෙතරම් බියපත් වුණාද කියනවා නම් දුවලා ගිහින් මගේ කාමරයට වැදී දොර වසා ගත්තා. අර ස්ත්‍රිය මිය ගියේ ඔය සිදුවීමට පස්සෙ දවසෙ උදේ.

අම්මා මැරුණාට පස්සෙ සහෝදර සහෝදරියො එකතුවෙලා ඒ ගේ විකුණලා දැම්මා. දැන් එතන තියෙන්නෙ තට්ටු ගානක ලොකු හෝටලයක්. නායක සහෝදරයා පස්සේ කාලෙක දේශපාලනයෙන් සමු අරගෙන අමෙරිකාවට ගියා.

මම අප්පච්චිගෙ කාමරයෙන් පිටවුණේ කළකිරුණ සිතින්. කියන්න ගිය කතාව වෙනුවට මම අප්පච්චිට

කිව්වෙ වෙන කතාවක්. මට ඕන වුණේ කන්තෝරුවේදි අද සිදුවුණ දේවල් අප්පච්චි ඉස්සරහ අකුරක් නෑර වමාරන්න. ව්‍යාපාති වාර්තාව ලියලා ඉවර කරන්න අප්පච්චි ගැන මතකයත් මට උපකාර වුණා කියලා කියන්න. කොටින්ම ඒ වාර්තාව ලියන තුරාවට අප්පච්චිත් මගේ ළඟ වාඩි වී සිටියා වගේ දැනුණා කියලා කියන්න. මම එහෙම කිව්ව නම් අප්පච්චි කියයි විකාර කියලා.

මම ඇඳේ වැතිරී ගෙන කළ්‍යාණි ගැන කල්පනා කළා. ඇය මට හමුවුණේ අහම්බෙන්. ඒක ඉතාම රහසිගත ප්‍රේමයක්. කිසි කෙනෙකුගෙ කනකට වත් ඇසකට වත් නොගැටුණ ප්‍රේමයක්. සුමාලි කොයිතරම් මගේ ගමන් බිමන් ගැන ඇහැ ගහගෙන හිටියත් ඇයට අපේ සම්බන්ධය ඉව වැටුණේ නැහැ.

කළ්‍යාණිටයි මටයි මුණ ගැසෙන්න අවස්ථාවක් තිබුණේ නැහැ. අප අතර තිබුණේ මොබයිල් ප්‍රේමයක්. ඒ ප්‍රේමය ඇරඹෙන්නේ අහම්බෙන් පැමිණි දුරකථන ඇමතුමකින්.

හෙලෝ!

ගැහැනු කටහඬක් දුරකථනයෙන් එළියට පැන මගේ කන් බෙරය මත අඩව්වක් අල්ලනවා.

හෙලෝ - ඔය සුනිමල්ද?

ගැහැනු කටහඬ මගෙන් විමසනවා. සුනිමල් මගේ ආත්මයට ආරූඪ වුණා.

කව්ද ඔය?

හානේ මම කළ්‍යාණී. ඔයාට අඳුරගන්න බැරි වුණාද?

කළ්‍යාණීව හඳුනගන්න මට ඒ හැටි වෙලාවක් ගියේ නැහැ.

ඉතින් කළ්‍යාණී ඔයාට ඕන සුනිමල්මද? නිස්සංක වගේ නමකින් ඔයාට වැඩක් වෙන්නෙ නැද්ද?

මගේ වචන ඉවර වෙන ඇසිල්ලෙන් ඇගේ දුරකථන ඇමතුම ඡේදනය වුණා. මම කළ්‍යාණී නමින් ඒ ආගන්තුක දුරකථන අංකය මගේ ජංගමයේ තැන්පත් කර ගත්තා.

හෙලෝ!

කොහොමද?

මට පාළුයි.

ඇයි මහත්තයා?

අනේ - හ්.

අපි කොහොමද හමුවෙන්නෙ?

ඔයා කියන්න.

දැන් ඔයා කොහොමද ඉන්නෙ?

මම ඇඳේ හාන්සි වෙලා ඉන්නෙ.

ම් ම් ම්

මොකද?

අපි ඉක්මනට හමු වෙමුකො.

කෝ ඔයාගෙ නෝනා?

ඔය ඉන්නෙ.

එයා කොහෙද වැඩ කරන්නෙ?

එයා බැංකුවෙ.

නෝනා ලස්සනයිද?

ඔයා විතර ලස්සන නැහැ.

බොරු කියන්න එපා... අනික ඔයා තවම මාව දැකලා නැහැනෙ.

මම කියන්නෙ මගේ හිතේ මැවුන රූපෙ.

ඔයා මොනවගේ රූපයක්ද මවාගෙන තියෙන්නෙ?

දිග නහයක්. දිලිසෙන ඇස් දෙකක්. ලොකු පස්සක්. ආවාටයක් තරම් ගැඹුරු පෙකනියක්.

ඔය ලස්සන ඔයාගෙ නෝනාට නැද්ද?

එයාගෙ පස්ස ලොකු මදි.

මගේ පස්ස නම් ලොකුයි... ඉස්කෝලෙ ළමයි කියන්නෙ චන්ද්‍රිකාගෙ පස්ස වගේ කියලා.

ඔයාගෙ බ්‍රෙස්ට්ස් කොහොමද?

මට ලැජ්ජයි ඔයා අහන ඒවාට.

මට ආසාවෙ බැහැ ඔයා දකිනකම්.

ඔයා උසද?

ඔව් 5' 8' යි.

අපේ මහත්තයා 5' 9' ක්.

ඒක නෙවේ ඔයා මුලින්ම මගේ ෆෝන් එකට කෝල් කළේ සුනිමල් කෙනෙක් ගැන අහගෙන. කව්ද සුනිමල්?

එයා අපේ ඉස්කෝලෙ ස්ටාෆ් එකේ ටීච කෙනෙක්. ඉස්කෝලෙ වැඩකට කතා කළේ.

නැතුව වෙන වැඩකට නෙමෙයිනෙ?

අනේ - එයා හරිම උපාසකයෙක්. ඒක නොවෙයි ඔයා ඔයාගෙ නෝනාට ආදරෙයිද?

හරිම ප්‍රශ්නනෙ ඔයත් අහන්නෙ?

ඇයි ආදරේ නැද්ද?

පිරිමියෙකුට ආදරේ කරන්න හිතෙන තරම් ගතිගුණ සුමාලි ගාව තියෙනවා.

ඇති. ඇති. ඇයි එහෙනම් මගෙත් එක්ක එල්ලි එල්ලි කතාවට ආවෙ.

අපි කතා කරනවා විතරනෙ. ඔයයි මහත්තයයි නිදා ගන්නෙ එක ඇඳකද?

නැතුව!

ඊයෙත් නිදා ගත්තෙ එහෙමද?

ඔව්.

ඔයාලා ඊයේ සෙක්ස් කළාද?

....

කියන්නකො ඔයාලා ඊයේ සෙක්ස් කළාද?

මට ඕවාට උත්තර දෙන්න බැහැ. ඔයා කවි ලියන්නෙ නැද්ද?

ඔයා හරි ලස්සනට ඒ ප්‍රශ්නෙ මඟ හැරියා නේද? මම ඉස්සර කවි ලිව්වා. පත්තරවලත් පළවුණා. අපේ අප්පච්චි පරණ කවියෙක්.

හැබැයි ඔයාට විතර කවි ලියන්න බැහැ.

ඇයි ඔයා කවි ලිව්වද?

ඔව්. ඒවා ලස්සන නැහැ අනේ.

එවන්නකො මට බලන්න.

මොකක්ද ඔයාගෙ පෝස්ට් එක කිව්වෙ?

ඩිපියුටි ඩිරෙක්ටර්. දැන් ඩිරෙක්ටර් කමකට නිර්දේශ වෙලා තියෙන්නෙ.

ඔයාට නිල වාහනයක්ද තියෙන්නෙ?

නැහැ. ඩිරෙක්ටර් වුණාම ඔෆිෂියල් වෙහිකල් එකක් ලැබෙනවා. දැන් තියෙන්නෙ මගේ පුද්ගලික කාර් එක.

මොකක්ද ඔයාගෙ කාර් එක?

යාරිස් එකක්.

අයියෝ... ගන්නකො ප්‍රීමියර් එකක්.

ඩිරෙක්ටර් වුනාම හම්බ වෙන්නෙ ඊටත් වැඩිය හොඳ එකක්... ඔයා කොහොමද ඔච්චර කාර් ගැන දන්නෙ?

ඇයි අපේ මහත්තයා වැඩ කරන්නෙ ලීසිං කොම්පැනියකනෙ. එයා ගෙදරදි කාර් ගැන කතා කරනවා.

අර මං ඔයාගෙන් කලින් ඇහුව ප්‍රශ්නෙට උත්තර දුන්නෙ නැහැනෙ.

මොකක්ද ප්‍රශ්නෙ?

අර මං ඇහුවෙ ඊයේ ඔයාලා සෙක්ස් කළාද කියලා. ඔව් ද නැද්ද. එච්චරයි.

ඔව්.

ඇයි ඔයාට තිබුණානෙ බැහැ කියන්න.

එහෙම කොහොම කරන්නෙ?

ඒ මගේ මහත්තයා. අනිත් එක එයාගෙන් බේරිලා ඉන්න එක ලේසි නැහැ.

මිට පස්සෙ ඔයා වෙන කාමරේක නිදා ගන්න. එයාව මග අරින්න. අඩු තරමින් මාව හමුවෙනකම්වත්.

ඒක කරන්න අමාරුයි නිසා. මම ඔයාව තවම ඇහැටවත් දැකලා නැහැ තමයි. ඒත් මගේ හිත ඔයාට බැදිලා. එයා එක්ක හිටියාට මම හිතන්නෙ ඔයා ගැන.

අන්තිමේදි අපි හමුවෙන්න තීරණය කළා. හමුවිය යුතු තැන දිනය සහ වේලාව සියල්ලම තීන්දු වුණාට පස්සෙ තමයි අපි හමුවිය යුතු ක්‍රමය ගැන කතාව මතුවුණේ. අපේ සම්බන්ධය රහසක්. ඒක කිසිවකු දැන ගත යුතු නැති රහසක්. අප ගැන සුමාලිවත් කළ්‍යාණිගේ ස්වාමි පුරුෂයාවත් දැනගැනීම අප දෙදෙනාගෙම ජීවිත අනතුරේ හෙළීමක්.

ඒත් ප්‍රශ්නය තියෙන්නෙ මේ වගේ සම්බන්ධයක් ලෝකයෙන් වසන් කරගෙන පවත්වාගෙන යන්නේ කොහොමද? එහෙම නම් අපට කිසිවකුට නොපෙනී අදෘශ්‍යමානව හැසිරීමේ බලයක් තියෙන්නට ඕන. කිසිවකුට ඇස නොගැසී අප හමුවන්නේ කෙසේද?

කළ්‍යාණි දිගින් දිගටම අපගේ හමුවීම කල් දමනවා. එක අතකින් මේ මොබයිල් රමණය හමුවීමකට වඩා රසවත් බව මටත් දැනෙනවා. අනිත් එක මේ සම්බන්ධය එළිදරව් වුණොත් එය මගේ රැකියාවට වුනත් බලපාන්න පිළිවන්. මට ලැබීමට නියමිත උසස් වීම නොලැබී යන්නටත් පිළිවන්.

අපේ මොබයිල් ප්‍රේමයට දැන් දීර්ඝ කාලයක් ගත වෙලා. දැන් මෙය හරිම වෙහෙස කරයි. නීරසයි. හමුවීම

ගැන බල කිරීමට මට සිදුවුණා. අපි හමුවෙමු. නැත්නම් මේ කතාබහට තිත තියමු කියලා යෝජනා කරන තැනට මම පත්වුණා. අන්න එතකොට තමයි කළ්‍යාණී කලබල වුණේ. ඒත් අපි කොහොමද හමුවෙන්නෙ?

කළ්‍යාණී මේ ගැටලුවට විසඳුමක් සොයාගෙන. හමුවිය යුතු දිනයත් වේලාවත් තැනත් ඇය නියම කළා.

මම කොහොමද ඔයාව හඳුනාගන්නෙ?

බැරිම තැන මම ඇහුවා.

ඒක මම ඔයා එතෙන්ට ආපුවම කියන්නම්. ඔයා මම කිව්ව වෙලාවට එන්න.

ඔයා එන්නෙ කාර් එකේ නම් ඒ ළඟම තියෙනවා කාර් පාර්ක් එකක්. ඒකෙ කාර් එක නවත්තලා මම කියන බස් හෝල්ට් එකට එන්න. බස් හෝල්ට් එකට ආව ගමන් ඔයා මාව හඳුනාගනීවි.

හරිම ගුප්ත සැලසුමක්. මගේ හිතට සියුම් බියක්ද කාන්දු වුණා. මේක මට අනතුරක් විය හැකි වැඩ පිළිවෙලක් වෙන්නටත් බැරි නැහැ. මා කළ යුත්තේ කුමක්ද? එක්කෝ මේ සබඳතාව නවතා දමා මා එදිනට නොඑන බව දැන්විය යුතුයි. නැත්නම් කළ යුත්තේ ඕනෑම දෙයකට මුහුණ දීමේ අවදානම දරාගෙන එහි යාමයි. එහි ඇති අවදානම සහ අනතුර මා තුළ ඇතිකළේ කිසියම් ප්‍රමෝදයක්.

කළ්‍යාණී මොනවගේ ගැහැනියක්ද? ඇගේ කට හඬ තරුණයි. මිහිරියි. කතා කරන විට ලාලිත්‍යයක් තියෙනවා. සමහර අවස්ථාවල මම ඇගේ සරීර අවයව

ගැන විමසනවා. ඇඳුම තුළින් අත දමා ඇගේ සිරුර ස්පර්ශ කිරීමේ ආසාවකින් මම ආතුර වෙනවා. ඇගේ උස් නිතඹ පියයුරු වල උණුසුම මගේ අතට දැනෙනවා වගේ.

අප හමුවීම සඳහා නියම කරගෙන තිබුණේ සෙනසුරාදාවක්. බාග විට ඇය වෙස් මුහුණක් දමාගෙන එන්න පිළිවන්. ඇත්තටම නම් ඇය දැනටමත් කාටවත් හඳුනාගත නොහැකි වෙස්මුහුණක් තමයි. මම වෙස් මුහුණක් දාගෙන ගියොත් අප එකිනෙකාට හඳුනා ගැනීම පහසුයි. එතන වෙස් මුහුණු දමා ගත් දෙදෙනෙකුට සිටින්නේ අප විතරයි.

මම මෝටර් රථය ගාල් කළේ මහපාර අයිනේ. ඒක කෝකටත් හොඳයි කියලා මට හිතුනා. මම හෙමින් සීරුවේ ඇය කී බස් නැවතුම වෙත ගාටන්නට වුණා. බස් නැවතුමේ සිටියේ මැදිවියේ ගැහැණියක් සහ බුර්කාවක් හැඳගත් මුස්ලිම් කතක් පමණයි. කළ්‍යාණි කියන්නේ අර මැදිවියේ ගැහැනියද? ඇගේ වියපත් කෙස් ගස් මට මෙතෙන්ටත් පෙනෙනවා. අසුවී තිබෙන රැවටීමේ තරම හරිහැටි තක්සේරු කර ගත නොහැකිව මම අන්දමන්ද වුණා. ඇය මේ විදියේ ගැහැනියක වේ යයි මට නිකමටවත් සිතුනේ නැහැ. මගේ මනසේ ඇඳී තිබුණේ තිස් වියැති තරුණ ඉතිරියක්.

මට සිතුණේ වහාම ආපසු හැරී පලා යන්න. කළ යුතු සුදුසුම දේ එයයි. ඇය නුදුටු විලාශයෙන් ආපසු හැරී ගොස් ඇගේ ඇමතුම් කපා හලහොත් මේ ගැටළුව මෙතනින්ම ඉවරයි.

මේ වනවිටත් මම බස් නැවතුමට මඳක් සමීප වෙලා. මම වහාම නැවතී ආපහු හැරෙන විට මගේ ජංගම දුරකථනය කෑ ගසන්නට වුණා. Kalyani මට විරිත්තනවා. මම ජංගමයේ අගුල මුදා නොහැර බස් නැවතුම දෙස බැලුවා. අර මැදිවියේ ගැහැනිය වගේ වගක් නැතුව බසයක් බලාපොරොත්තුවෙන් මහ මග බලනවා. ඇය අතේ ජංගම දුරකථනයක් නැහැ. එසේ නම් මා අමතන්නේ ඇය නොවේ. කළ්‍යාණිය ඇය නොවේ.

කළ යුතු එකම දේ ඇයට පිළිතුරු දීම. මම මගේ ජංගම දුරකථනය ඇය උදෙසා විවර කළා.

නිස්සංක ඇයි බලාගෙන ඉන්නෙ. එන්න මම මෙතන ඉන්නවා.

කෝ මට පෙනෙන්නෙ නැහැනෙ. කොහේද ඔයා ඉන්නෙ?

ඇත්ත. ඔයාට මාව පේන්නෙ නැහැ තමයි. මොකද මම කළුම කළු බුර්කාවක් ඇතුලෙනෙ ඉන්නෙ. ඇස් දෙක විතරයි මගේ පේන්නෙ.

බුර්කාවක්? එතකොට ඔයා මුස්ලිම්ද?

නැහැ අනේ. මේක තමයි වෙස්වලාව. මේක මම ඉල්ල ගත්තෙ අපේ ගෙවල් ළඟ මුස්ලිම් ගැහැනු ළමයකුගෙන්.

මම ක්‍රමයෙන් බස් නැවතුම වෙත සමීප වුණා. බුර්කාව මා දෙස හැරී බැලුවා. ඇයට තිබෙන්නේ ඇස් දෙකක් පමණයි. අඟලක් පමණ තීරුවක් හරහා ඇගේ

ඇස් දිලිසුණා. ඇගේ ඇස් ලස්සනයි. ඒ ඇස්වලත් මොකක්දෝ කුතුහලයක්.

අපි ඉක්මනට මෙතනින් යමු නිස්සංක.

හරි - අර ඈත තියෙන සුදුපාට යාරිස් එක තමයි මගේ කාර් එක. ඔයා ගිහින් කාර් එකට නගින්න. අපි යමු හෝටලයකට.

ඇය ඉස්සර වුණා. මම දුර සිටම යතුර මිරිකා දොරගුළු හැරියා. ඇය වම්පසින් නැගුනාම මම රියදුරු අසුනට බර දුන්නා.

දැන්වත් ඔය කෙහෙල්මල් බුර්කාව ගලවන්න. මට ඔයාව බලන්න ඕන.

දැන්ම නොවෙයි. ඒකට තව වෙලාව තියෙනවා. ඒක මම මෙතනදි කළොත් මේ සිදුවීම අවසාන වන විදියයි අපි දෙන්නා හෝටල් කාමරයක තනිවෙලා මාව ඔයාට නිරාවරණය වුණාම සිදුවන දෙයයි අතර බරපතල වෙනසක් තියෙනවා. මේ කතාවෙ හැටියට නිස්සංක ඔයා මාව මරන්න ඕන.

මම ගල් ගැහුනා. මම මෝටර් රථයේ වේග පැඩලය මහපට ඇඟිල්ලෙන් තෙරපුවා. අපි හෝටලයට ඇතුල් වී පිළිගැනීමේ කවුන්ටරය ට සමීප වුණා. එහි සිටි තරුණිය මීට පෙර කෙදිනකවත් නොසිදුවන දෙයක් සිදුවීමට යන සැටි නරඹනවා වගේ අප දෙස බලා සිටියා.

එක්ස්කියුස් මී. අපට කාමරයක් ගන්න පිළිවන්ද?

ෂුවර්.

ඇයට මගේත් ඇගේත් නම් අවශ්‍ය වුණා. ඇය පාතිමා බිබී. මම නිස්සංක අන්වර් සදාත්. පිළිගැනීමේ කවුන්ටරයේ තරුණිය පාතිමා බිබී දෙස බැලුවේ අමනාපයෙන් වගේ.

මිස් පාතිමා මේ වගේ තැනකට එනකොටවත් බුර්කාව ගලවලා වෙන ඇඳුමක් ඇඳගෙන එන්න තිබුණානෙ.

මගේ බුර්කාව ගලවන්න ඔයා කව්ද? අපි අපේ මුහුණ පෙන්නන්නෙ මිනිහාට විතරයි.

කවුන්ටරයේ තරුණිය අසරණ වුණා.

කාමරයට ඇතුල්වෙද්දි මම හිටියේ නොඉවසිල්ලෙන්.

දැන්වත් ගලවනවා ඔය මලඉලව් ඇඳුම, මට තමුසෙව බලන්න. නැත්නම් මම ඕක කෑලි කෑලිවලට ඉරලයි ගලවන්නෙ.

මම කෝපය දරාගත නොහැකිව කෑ මොර දුන්නා.

ඔච්චර මොකට කෑ ගානවා නිස්සංක.

ඇය කට හඬට දෙමළ උච්චාරණයක් එකතු කළාම මට ඉවසුම් නැතිව ගියා.

ඒකට තව වෙලා තියෙනවා. මම බාත් රූම් එකට ගිහින් ඇඳුම් මාරු කරගෙන එන්නම්.

ඇය නාන කාමරයට වැදී දොර වසා ගත්තා. කල්පයක් ගෙවුනා. මම සපත්තුවත් නොගලවා ඇඳේ හාන්සි වුණා. මගේ ඇස් යාන්තම් පියවී ගෙන ආවා.

නිස්සංක.

කෙඳිරිලි හඬකින් ඇහැරී ඇස් හැර බලන විට මා දුටුවේ නිරුවත් ස්ත්‍රියක් මා ඉදිරියේ සිටගෙන සිටින බවයි.

නිස්සංක හොඳට මං දිහා බලන්න.

මම ඇඳෙන් බැස්සා නොවෙයි කව්දෝ මාව බිමට ඇදලා ඇම්මා වගේ.

මේ ඇයද? මා ඉදිරියේ නිරුවතින් සිටගෙන සිටියේ ඇය තමයි. මීට අවුරුදු ගනණාවකට පෙර සුමාලි සමඟ අසුන හුවමාරු කරගෙන මා ළඟින් හිඳගත් විරූපිනිය. ඇගේ මුහුණ ඒ මුහුණමයි. තොල් ඇඟුලක් පමණ පහලට එල්ලිලා. හිදැසක් සහිත දත් ඉදිරියට නෙරලා. දත් අතර කළුවන්ව මැලියම් බැදිලා. මෙහෙමත් අජූව මුහුණක්.

මට සමාවෙන්න නිස්සංක. මම මේක බොහොම සැලසුම් සහගතව කළ දෙයක්. ඔයා ගැන විස්තර මම ඔක්කොම දන්නවා. මම කළ්‍යාණී තමයි. ඔයා මගේ නමවත් දන්නෙ නැහැ. මම කසාද බැඳලා නැහැ. මේ අජූව මූණ බඳින්නෙ කව්ද? ඒත් මට කවදාවත් ඔයාව අමතක කරන්න බැරිව ගියා.

එහෙනම් අර හස්බන්ඩ් ගැන කියපුවා. එයත් එක්ක සෙක්ස් කරන හැටි. ඒවා බොරුද?

මම ඉහිලුම් නැතිව ප්‍රශ්න කළා.

ඒවා ඔක්කොම බොරු. මගේම මනස්ගාත. අනේ නිස්සංක මගේ මුහුණ දිහා බලන්නෙපා. මගේ ඇඟ දිහා බලන්න.

ඇය අත් දෙකෙන් මුහුණ වසාගෙන ඇඳ මත මුනින් තලාව පෙරලුනා. ඇයට තිබෙන්නේ මිනිසකුගේ රාගය අවුස්සන තුනු සපුවක්. ඒත් ඇය ගැන මට කිසිම හැඟීමක් ඇති වුණේ නැහැ. මට ඇති වුණේ කළකිරීමක්. එදා අඬ අඳුරේ ඒ සිදු වූ දේ මට සිහි කරන්න බැරි තරම්. සුමාලි මට තුරුලුව සිටින හැම මොහොතකම මට සිහිපත් වූයේ ඇයයි.

මම වෙලාවකට විදුලි පහන් දල්වා සුමාලිගෙ මුහුණ පිරික්සා බලනවා. ඇයට හොඳටම නින්ද ගිහින්. මේ ඇය නොවන බව තහවුරු කර ගැනීමට ඇගේ මුහුණ දෙස බලන පුරුද්දෙන් ගැලවෙන්නට මට බැරි වුණා. මට ඇගේ මුහුණින් ගැලවීමක් නැතිවුණා. සුමාලි ඉදිරියේ මම අකර්මන්‍ය වෙන්නට පටන් ගත්තෙ ඊට පස්සෙ.

ඇය ඉකි බිඳිනවා. එම ඉකි බිඳීමත් සමඟ ඇගේ සිරුර සලිත වෙනවා. වෙනත් වෙලාවකදී මා තුළ කාමෝද්දීපනය කරවන සුළු ඇගේ ඉකි බිඳින සරීරය දෙස මම කලකිරීමෙන් බලා සිටියා.

අන්න ඒ මොහොතේ තමයි මම ඇය මරන්නට තීරණය කළේ. ඇගෙන් ගැලවීමට නම් ඇය අදම මෙතනදීම මේ මොහොතේම මිය යා යුතුයි. ඇය පිළිබඳ මතකය ගෙල මිරිකා වහාම ඝාතනය කළ යුතුයි.

සුමාලි දුවත් එක්ක ආවා. ඇය ආවෙ යනකොට අරගෙන ගිය සියළු බඩු බාහිරාදිය සමඟ. ලොරියක බඩු සමඟ විත් ගෙට ගොඩ වෙනකොටම ඇය කිව්වෙ දැන් ඔයාට සනීපයිනෙ නිස්සංක කියලා. අප්පච්චි ගැන කටේ කෙළ බිඳක් හෙලන්නෙ නැහැ කියලා මම මටම සපථ කරගෙනයි තිබුණේ. ඒත් මම හැමදාම අප්පච්චි හංගලා තියාගන්නෙ කොහොමද? කොයි වෙලාවක හරි ඒ අය අප්පච්චිව දකීවි. අප්පච්චි ගැන මගේ කටින් මොනවා හරි පිටවේවි. අප්පච්චි ඉඳි කටුවක් නොවෙයි හංගලා තියාගන්න. මම කළේ අප්පච්චිගේ කාමරේ දොර වහලා යතුර මගේ අතට ගන්න එකයි.

හිල්ඩා ඇවිත් ගේ පුරාම ඇවිද්දා. මට තේරුණා ඇය හොයන්නෙ අප්පච්චිව බව. අප්පච්චි තවම මේ පියස්ස යට රැඳී සිටින බව ඇයට ඉව වැටිලා. ඇය එහෙම ඇවිදගෙන යන ගමන් එක වෙලාවක අප්පච්චිගේ කාමරේ දොරේ අගුළු අල්ලලා කැරකුවා.

සුමාලි ඇයි මේ කාමරේ මෙහෙම අගුලු දාලා වහලා.

ඇය සුමාලිගෙන් අහනකොට මගේ ඇඟ සීතල වුණා.

ඔය නිස්සංකගෙ ලට්ට ලොට්ට තියෙන කාමරයක්නෙ. ඕකේ යතුර තියෙන්නෙත් එයා ළඟ. එයා හරි කැමතියි ඔය කාමරේට වැදිලා ඉන්න.

එක අතකින් සුමාලි දන්නවා ඇති අප්පච්චි මේ කාමරේ ඉන්නවා කියලා. බාග විට ඒක අප්පච්චිගෙන් හංගන්න ඇයටත් ඕන ඇති. මට සුමාලි ගැන ආදරයක් හිතුනා. එතකොට හිල්ඩා හෙමින්ම සුමාලි ළඟට කිට්ටු වෙනවා මම බලාගෙන.

ඒ වුණාට සුමාලි නිස්සංක ට තනි වෙන්න දෙන්න එපා. හැම තිස්සෙම ඇහැ ගහගෙන ඉන්න. ඔයාට තියෙන්නෙ කාර් එකට ඩ්‍රැයිවර් කෙනෙක් හොයා ගන්න. නැත්නම් ඔයාට ම බැරිය ඩ්‍රැයිවර් ලයිෂන් ගන්න. ඕක මහ දෙයක්යැ.

අයියෝ මට නම් බයයි. කාර් එලවන්න.

ඒ සුමාලිගෙ හැටි. හැබැයි හිල්ඩා හරිම සූත්තරකාරි. අප්පච්චි ඉන්න බව දැන දැනම ඒ ගැන කතා නොකර වෙන අනම් මනම් සුමාලි සමඟ දොඩවනවා. මම උකටලීව බලාගෙන හිටියා.

එදා රෑ සුමාලි මාව බදාගෙන ඇඬුවා. මට බය හිතුණේ අල්ලපු කාමරේ ඉන්න අප්පච්චිට ඇහෙයි කියලා.

අනේ නිස්සංක... අනේ නිස්සංක ඔයාට දැන් සනීපයිනෙ නේද?

මට දැන් ඕක අහලා ඇතිවෙලා. මට ඇති අසනීපයක් නැහැ.

එහෙනම් ඔයා පහුගිය කාලයක් විකාර දෙඩෙව්වේ. කව්දෝ ගෑනියෙක් එක්ක තිබුණ සම්බන්ධයක් ගැනත් ඔයා කිව්වා. ඔයා ඒ ගෑනිත් එක්ක ගිය තැන් හොයාගෙන තියෙනවා කියලා තාත්ති එදා කිව්වෙ බොරු. එහෙම දෙයක් නැති බව මම තාත්තිට ඒත්තු ගැන්නුවේ කොච්චර අමාරුවෙන්ද? තාත්ති කැමති වුණේම නැහැ මම ආපහු එනවාට. ඒත් හිල්ඩයි ඔයාගෙ කන්තෝරුවෙ නිර්මලයි දෙන්නාම කිව්ව ඔයා දැන් හරිම නෝමල් කියලා.

අප්පච්චි ගැන සුමාලිට කියන්න පොටක් පාදා ගන්න වෙලාව ඇවිත්.

නැහැ සුමාලි එහෙම කෙනෙක් හිටියා. ඒ කව්ද කියලා ඔයාට කියන්න බැහැ මට. ඔයා මට හමුවුණ දවසෙ ඉඳලාම කරුමයක් වගේ ඒ ගෑනි මගේ පස්සෙන් පැන්නුවා. අන්තිමේදි ඒක මම විසඳුවා ඒ ගෑනි මරලා.

සුමාලි මාව තුරුල් කර ගත්තා.

ඔය ඔක්කොම ඔයාගෙ විකාර නිස්සංක. ඔයාට පුළුවන්ද ගෑනියෙක්ව මරන්න. ගෑනියෙක් තියා ඔයාට කැරපොත්තෙක්වත් මරන්න පුළුවන්ද? ගෙදරදි ඒක කරන්නෙත් මම. ඔයා ජීවිතේ කියලා හිතාගෙන ඉන්නෙ ඔයාම හිතින් මවා ගත්ත කතාන්දර ගොඩකට. ඔය බහුබූත හිතෙන් අස්කර ගන්න මං ඔයාට උදව් වෙන්නම්.

පව් අහිංසක සුමාලි. එයා මේ කිසි දෙයක් දන්නෙ නැහැ. ලෝකෙ ඒ වගේ දේවල්

වෙනවා කියලා එයාට හිතෙන්නෙ නැහැ. ජංගම දුරකථනයට එන වැරදි ඇමතුමක් මිනී මැරුමකින් කෙළවර වෙන්න බැරිද?

සුමාලි මගේ ජීවිතේ ම පිරිලා තියෙන්නෙ රහස් වලින්. අප්පච්චි තවම ගෙදර ඉන්නවා. අල්ලපු කාමරේ තවම ඉන්නවා. අප්පච්චි ඉන්නවා කියලා හිල්ඩාවත් දන්නෙ නැහැ.

මේ ටික කියා ගත්තාම මගේ හිත හැල්ලු වුණා. සුමාලි මාව අතහැරලා මුහුණ ඇතෙහි ඔබාගෙන ඉකි බිඳින්න පටන් ගත්තා.

අනේ නිස්සංක මම හිතුවේ ඔයාට සනීපයි කියලා. ඔයා තාම ඉන්නෙ විකාර ලෝකෙක.

කඳුළු අතරින්ම සුමාලි ඉකිගහමින් කියෝනවා.

ඔයාගෙ අප්පච්චි මැරිලා දැන් කොච්චර කල්ද? අප්පච්චිගෙ මළ ගෙදර ස්තුති කතාව කළෙත් ඔයා. මතකද අපේ තාත්තිත් කතාවක් කළා. ඉතින් කොහොමද අප්පච්චි ඉන්නවයි කියන්නෙ?

අප්පච්චි ආයෙම මේ ගෙදරට ඇවිත් ඉන්නවා. එයා ඉන්නෙ අල්ලපු කාමරේ. මම ඔයාට අප්පච්චි පෙන්නුවොත් ඔයා පිළිගන්නවාද?

මම සුමාලිගෙ අතකින් අල්ලගෙන ඇඳෙන් බිමට බැස්සා. සුමාලි සුසුමක් හෙලුවෙ සිත නිදහස් කරගන්නවා වගේ.

යමු මමත් කැමතියි අප්පච්චිට ටිකක් කතා කරන්න.

අපි කාමරයෙන් පිටවෙලා අප්පච්චිගෙ කාමරය ඉස්සරහ හිට ගත්තා. මම අප්පච්චි අප්පච්චි කියලා දොරට තට්ටු කළා. අප්පච්චිගෙ සද්දයක් නැහැ. අප්පච්චිට පිටවෙලා යන්න විදිහක් තිබුණේ නැහැ. මම දොරවහලා අගුලු දමලා තිබුණේ. යතුර තියෙන්නෙ මගේ ළඟ. මම යතුර අරගෙන දොර ඇරියා. අප්පච්චිගෙ කාමරේ අඳුරුයි. මම බිත්තිය අතගාලා විදුලිපහනක් දැල්වුවා.

අප්පච්චි බොහොම සාර සුබාවට ඇඳමත එරමිණිය ගොතාගෙන ඉන්නවා.

අර ඉන්නෙ අප්පච්චි.

මම අත දික් කරලා සුමාලිට අප්පච්චිව පෙන්නුවා. සුමාලි අප්පච්චි දිහා හිස් බැල්මෙන් බලාගෙන ඉන්නවා. අප්පච්චි මෙතන ඉන්න බව සුමාලිට ප්‍රතික්ෂේප කරන්න බැහැ. සුමාලි එහෙම අප්පච්චිව ප්‍රතික්ෂේප කරන බවක් මට පෙනුණේ නැහැ.

අප්පච්චිට කතා කරන්න සුමාලි.

මම සුමාලිගෙ අතකින් අල්ලා ගත්තා. සුමාලිගෙ අත සීතලයි. අපි අප්පච්චි ළඟට කෙමෙන් සමීප වුණා.

අප්පච්චි මෙන්න සුමාලි ඇවිත්.

මම ටිකක් හයියෙන් කිව්වෙ අප්පච්චි නිසොල්මන්ව ඉන්න නිසයි. අප්පච්චි ඇයි කතා කරන්නෙ නැත්තෙ. සුමාලි මගේ අත මිරිකා ගන්නවා මට දැනුණා.

අප්පච්චිට නිදහසේ ඉන්න දෙන්න නිස්සංක. අපි යමු.

ඇය මාව ඇදගෙන වගේ කාමරයෙන් එළියට ආවා. සුමාලි අප්පච්චි එක්ක වචනයක්වත් කතා නොකරපු එක ගැන මගේ හිතට හරි මදි. අප්පච්චි සුමාලි ගැන මොනවා හිතුවාද දන්නෙ නැහැ.

සුමාලි ඇයි ඔයා අප්පච්චි එක්ක කතා කළේ නැත්තෙ? අප්පච්චි හිතන්න ඇති ඔයා මහ දුෂ්ට ගෑනියක් කියලා.

ඇගේ ඇස් තිබුණේ ඇර දමා තිබූ ජනේලයෙන් පිටත. ඒත් එළියේ ඝනකන අන්ධකාරය මිසක් සුමාලිට දකින්න ජනේලයෙන් පිටත ලෝකයක් නැහැ. මම කෝපයෙන් දැවෙමින් ඇඳේ වාඩි වුණා. සුමාලි මගේ ළඟින් වාඩිවෙලා මගේ අතක් අල්ලා ගත්තා.

හරි නිස්සංක ඔයාගෙ අප්පච්චි ඇවිත් ඉන්නවා කියලා මම පිළිගන්නම්.

සුමාලිගෙ ඒ කතාව මට රුස්සන්නෙ නැහැ. ඒක හරියට අප්පච්චි මේ ගෙදර නැති වුනත් ඉන්නවා කියනවා වගේ දෙයක්.

ඇයි සුමාලි එහෙම කියන්නෙ. මම ඉල්ලන්නෙ අප්පච්චි ඉන්නවා කියලා විශ්වාස කරන්න කියලා නොවේ. අප්පච්චි අපි අතර ඉන්නවා. අර කාමරේ අප්පච්චි ඉන්නවා ඔයා දැක්කානෙ.

සුමාලි හුස්මක් හෙලා මගේ අත අත හැරියා.

ඔව් නිස්සංක අප්පච්චි ඉන්නවා. අපි අප්පච්චිටත් මේ ගෙදර ඉන්න දෙමු. හැබැයි අප්පච්චිව ඒ කාමරෙන් එළියට යවන්න එපා. අල්ලපු ගෙදර හිල්ඩාට විතරක්

නොවෙයි දුවටවත් අඟවන්න එපා අප්පච්චි ඉන්න බව. ඔයා ඒ කාමරේට ගිහින් අප්පච්චිට කතා කරන්න.

මට සුමාලි ගැන ඇතිවුණේ පුදුම ආදරයක්. මම සුමාලිව කිටි කිටියේ බදා ගත්තා.

ඇය බැලලියක් වගේ මගේ පපුවට තුරුළු වෙනවා.

ඔයා දැන් කටු කැලේ ව්‍යාපෘති වාර්තාව ලියලා ඉවර කළානෙ. ඒ වගේ කන්තෝරුවෙ අත හැරිච්ච අනිත් වැඩ ටිකත් කරන්න. ඔය වාර්තාව ගිය ගමන් ඔයාට ප්‍රෝමෝෂන් එක ලැබෙයි. කිසි කෙනෙක් එක්ක අප්පච්චි ගැන කියන්න එපා.

මට ඉවසුම් නැතිව ගියා. මම සුමාලිව ඇඳේ පෙරලා ගත්තා. මට බය හිතුණේ ඇගේ කෙඳිරිලි හඬ අල්ලපු කාමරේ ඉන්න අප්පච්චිටත් ඇහෙයි කියලා විතරයි.

තත්ත්වයන් ඒ විදියට සමනය වෙලා ජීවිතය සාමාන්‍ය ඒකාකාරි ප්‍රවාහයක් බවට පත්වුණා. මම වෙනදා වගේම සුමාලිව එයාගෙ බැංකුව ළඟින් බස්සලා දුව ඉස්කෝලෙට දාගෙන කන්තෝරුවට යනවා. හවසට දුවගෙ ටියුෂන් පන්ති. දුව පන්තිවලින් අරගෙන ගෙදර එනකොට සුමාලි ඇවිත්.

අපි අතර අප්පච්චි ගැන කතා බහක් ඇතිවුණේම නැහැ. මම හවසට ගෙදර ආපුවම අප්පච්චිගෙ කාමරේට වැදිලා පැයක් හමාරක් ගත කරනවා. උදේටත් කන්තෝරු යන්න කලින් ඒ කාමරේට ගිහින් අප්පච්චිට වැඳලා සමු ගන්නවා. සුමාලි මේ සිරිත ඉවසගෙන සිටියා. ඒත් මට සැක හිතුනෙ මම නැති වෙලාවට සුමාලිත් අප්පච්චිගෙ කාමරේට වැදිලා කතා කරනවා ඇති කියලයි. මම කෙලින්ම ඒ ගැන සුමාලිගෙන් ඇහුවා.

සුමාලි ඔයා මම නැති වෙලාවට අප්පච්චි එක්ක කතා කරනවාද? මොනවාද අප්පච්චි කියන්නෙ? අප්පච්චි ඔයාට ආදරෙයි.

සුමාලි තැතිගෙන වගේ මා දිහා බැලුවා.

ඔය අප්පච්චි ගැන කතාව නවත්තන්න. ඔන්න දුව එනවා.

රූපවාහිනියේ හඬ නැවතීම දුව එන බවට ඉඟියක්. දුව කාමරයට ඇතුල් වුණා.

මොනවා ද දෙන්නා කටු කුටු ගාන්නෙ? මට පේන්නෙ දැන් අම්මාටත් තාත්තිගෙ විකාර ලෙඩේ බෝ වෙලා වගේ.

සුමාලි කිසිවක් කිව්වේ නැහැ. දුව දිහා හිස් බැල්මෙන් බලාගෙන හිටියා. මට ඕන වුණා මේ කතාව වෙන පැත්තකට හරවන්න.

ඔය ගොල්ලො දැක්කෙ නැහැනෙ මගේ ප්‍රොජෙක්ට් රිපෝට් එක.

සුමාලි තිගැස්සිලා වගේ මා දිහා බැලුවා.

ඔයා තාම ඒක බාර දුන්නෙ නැද්ද? ඒක ලියලා ඉවර කරපු එකේ ඉක්මනට බාර දෙන්න ඔයාගෙ ප්‍රෝමෝෂන් එක තියෙන්නෙ ඔය රිපෝට් එක උඩනෙ.

දුව මේ කතා බහ මැද්දෙ අපේ ඇඳමතට පැන නිදි.

මට හිතෙන්නෙ නැහැ ඕක සමරදිවාකරගේ ඇහැ ගැහෙන්න දෙන්න. ඉරිසියාවෙ පැළෙයි. මුල ඉඳලාම මිනිහා ඔය වැඩේට විරුද්ධවනෙ හිටියෙ.

ඒ වුණාට ඔයාට ඔය වාර්තාව ඉදිරිපත් කරන්න වෙන්නෙ සමරදිවාකර හරහාම නෙ. කවද්ද එයා රිටයර් වෙන්නෙ?

ලබන මාසෙ.

එතකොට ඔයාව වැඩ බලන ඩිරෙක්ටර් හැටියට පත් කරයි.

ඔය වාර්තාව මම ලියලා ඉවරයි කියලා හැමෝම දැන් දන්නවා. මාතුපාල හැමතැනම පතුරවලා. නිර්මලාත් මගෙන් ඒ ගැන ඇහුවා.

ඔයා ඒක ගෙනිහින් බාර දෙන්න නිස්සංක.

ඒත් පහුවදාවත් ඊට පස්සෙවත් මම වාර්තාව කන්තෝරුවට ගෙනිච්චෙ නැහැ. මම ඒක කල් දැම්මෙ අප්පච්චිත් එක්ක ඒ ගැන කතා කරනකම්. ඒ අතරවාරෙ හරි අපූරු දෙයක් සිදුවුණා.

එදා සෙනසුරාදාවක්. සුමුදුට පංති. මම දුව පන්තියට අරගෙන ගියා. සුමාලි ගෙදර. වෙනදාට මම කරන්නෙ දුවගෙ පන්තිය ඉවර වෙනතුරු ඒ පැය තුන මෝටර් රථය තුළ ගෙවලා දුවත් එක්කම එන එක. ඒත් අද මම දුව පන්තියට බස්සපු ගමන් ගෙදර එන්න පිටත් වුණා. පන්තිය ඇරෙන්න පැය කාලක් තියලා ගියාම ඇති. එතකං මට අප්පච්චිත් එක්ක කයිවාරු කදයක පැටලෙන්න පිළිවන්. හුඟ දවසකින් අප්පච්චිගෙන් නාට්‍ය කෙරුවාව ගැන කතාවක් ඇහුවේ නැහැ. මගේ ව්‍යාපෘති වාර්තාවත් අද මම අප්පච්චිට ඇහෙන්න කියවනවා.

අතරමගදි මට හදිසියේ කල්පනා වුණේ කාර් එක සර්විස් එකට දාලා හෝදව ගත්තා නම් හොඳයි කියලා. වාහනය එතන ඉන්න නිමල්ට බාර දීලා මම පයින්ම ගැටුවා. විනාඩි පහෙන් මම ගෙදර.

දොර වහලා තිබුණත් අගුල්දාලා තිබුණේ නැති නිසා මම සුමාලිට කතා නොකරම ගෙට ඇතුල්වුණා.

දොර සෙමෙන් වසා තබා මම සාලය ඔස්සේ ඇතුල් ගේ දෙසට ගියා. අපේ කාමරය දෙසට ලං වන විට මට කාමරය තුළින් යමෙකු කෙඳිරිලි හඬින් කතා කරන ශබ්දයක් එළියට විසිවුණා. ඒ කට හඬ සුමාලිගෙ. ඇය කොඳුරන හඬින් යමක් කාට ද කියනවා. ඒත් එක්කම මට දැනුණා ඒ ශබ්දය නැගෙන්නේ අපේ කාමරය දෙසින් නොව අප්පච්චිගෙ කාමරයෙන් බව. මම එම කාමරය ඉදිරිපිට දොර ළඟ සිට ගත්තා.

සුමාලි අප්පච්චිගෙ කාමරයට ගිහින්. ඇය කතා කරන්නෙ කෙඳිරිලි හඬකින්. මේ නිසා ඇය කියන දේ පැහැදිලිව ඇහෙන්නෙ නැහැ. මම කනක් දොරට තද කළා. සුමාලිගේ කෙඳිරිලි හඬ දැන් මට යන්තමින් ඇහෙනවා. මම ඇගේ වචන අල්ලගන්න දැඩි උත්සාහයක යෙදුණා. එක පාරටම ඇගේ කෙඳිරිලි හඬ වේගවත් වුණා. දැන් ඇය උස් හඬින් වේගවත්ව කතා කරනවා.

අප්පච්චිගෙ මේ විකාර හින්දා අපේ ජීවිත අවුල් වෙලා. නිස්සංක කොයි තරම් හොඳට වැඩ කරගෙන හිටියාද? ඔය ව්‍යාපෘති වාර්තාව ලියලා ඉවර කරන්න එයාට ඔච්චර කාලයක් ගියේ අප්පච්චි හින්දා. තාමත් එයා ඒක බාර නොදෙන්නෙ අප්පච්චිට පෙන්නන්න ඕන හින්දා. අප්පච්චි නිසා අපේ ජීවිත අවුල් වෙලා කියලා අප්පච්චිට පෙනෙන්නෙ නැද්ද?

අන්තිම වාක්‍ය වේගයෙන් කියද්දි ඇගේ කටහඬ වෙව්ලුවා. ඊළඟට ඇය සිහින් හඬින් වැලපෙන්න පටන් ගත්තා. අප්පච්චි ඇගේ කතාවට ප්‍රතිචාර ලෙස කියූ දේවල් මට ඇහුණේ නැහැ. ඒත් අප්පච්චි දත් මිටි කන සද්දෙ මට ඇහුණා. එහෙම දත් මිටි කන්නෙ අප්පච්චිට

තරහා ගියාම. සුමාලි අප්පච්චිව තරහා ගන්වනවා. මොන එකකට ඔය දේවල් ඇය අප්පච්චිත් එක්ක කතා කරන්න යනවාද?

එකපාරටම දොර ඇරගෙන කාමරයට කඩා වැදිලා සුමාලිවයි අප්පච්චිවයි තැති ගන්වන්න මා තුළ ඇතිවුණ පෙළඹීම මා මැඩ ගත්තේ අමාරුවෙන්. ඒ ප්‍රශ්නය ඒ දෙන්නටම විසඳගන්න දෙන එක තමයි හොඳම දේ. ඒත් සුමාලිට පස්සෙ අවවාදයක් කරන එක හොඳයි අප්පච්චිත් එක්ක ඔහොම අනවශ්‍ය දේවල් කතා කරන්න එපා කියලා.

මම කිසිම කතාවක් බහක් නැතුව ආපහු හැරුණා. ගෙට ඇතුළු වුණා වගේම ගෙයින් පිටවෙලා බොහොම සීරුමාරුවට දොර වැහුවා.

සුමාලි මම නැති වෙලාවට අප්පච්චි සමඟ කතා කරන බව දැන් මම දන්නවා. මම දන්න බව සුමාලි දන්නෙ නැහැ. මගේ රහස් වෙන අය නොදන්නකම හරහා ලබන තරම්ම ආශ්වාදයක් මට එයින් ලැබුණා. සුමාලි සහ අප්පච්චි අතර සම්බන්ධය මම නොදන්න ගානට හැසිරෙන්න මම හැමවිටම පරෙස්සම් වුණා.

පුදුමෙ කියන්නෙ අප්පච්චි කොයි වෙලාවකවත් සුමාලි තමා සමඟ කතා කළ බවක් හෝ තමාට දොස් කී බවක් ඇඟෙව්වේ නැහැ. ව්‍යාපෘති වාර්තාව ලියා තිබෙන බව තමා දන්න බවවත් අප්පච්චි නොවෙයි ඇඟෙව්වෙ. මම වික්ෂිප්ත වුණා තමයි. හැබැයි ඒක හරිම ආශ්වාදජනකයි.

මම ව්‍යාපෘති වාර්තාව කන්තෝරුවට ගෙන ගියේ නැහැ. සමරදිවාකර මාව එයා ළඟට කැඳවලාම මේ ගැන විපරම් කළා.

නිස්සංක අර කටු කැලේ ප්‍රොජෙක්ට් රිපෝර්ට් එක ලියලා ඉවරයි නේද?

සමරදිවාකරගෙ ඇස්වල ලියවිලා තියෙන දේ කියවන්න මම වෑයම් කළා. මිනිහත් හරි කපටි විදියට මගේ ඇස් කියවනවා.

සමරෙ කොහොමද දන්නෙ මම ඒක ලියලා ඉවරයි කියලා.

ඔය හැමෝම කියන්නෙ. තමුසෙ දවසක් පැය ගානක් තිස්සෙ හවස් වෙනකම්ම ඕක ලිව්වාලුනෙ. මාතුපාල කිව්වෙ ඒක ටයිප් කරන්න දෙන්න සමුද්‍රාව හොයාගෙන ගෙදරටත් ගියා කියලා. මොනවා වුනත් තමුසෙ පිළිවෙලකට වැඩ කරගෙන යන එකට නම් මට සතුටුයි. මොකද තමුසෙට තව වැඩි දවසක් නැහැ මේ පුටුවට එන්න.

දැන් මට එකක් පැහැදිලියි. මේ හැමෝම මම දිහා ඇහැ ගහගෙන ඉන්නෙ. තැන තැන කතාවෙන්නෙ මම ගැන. මාතුපාලයා තමයි චර පුරුෂ සේවයට යොදාගෙන තියෙන්නෙ. සමහරු මම ළඟට එනකොට කතාව නවත්තනවා. ගේට්ටුවෙ මුරට ඉන්න ආරක්ෂක භටයාගෙ වුනත් හිනාව වෙනස් කියලා මට දැනෙනවා. බාග වෙලාවට මම පාරෙදි දකිනවා සමහරු මා දිහා බලමින් මොනවාදෝ කියනවා.

මම උදේ ගිහින් මේසෙට ඉඳ ගත්තා විතරයි මාතුපාල පත්තරේ ගෙනත් මේසෙ උඩින් තිබ්බා. මම පත්තරේ පෙරළන ගමන්ම තේ එකක් ගෙන ඒමට මාතුපාලට අණ කළා.

පත්තරේ මුල් පිටුවෙම ප්‍රධාන සිරස්තලයට දකුණතින් පළ වී තිබුණ ප්‍රවෘත්තියෙන් මම තිගැස්සුණා.

ව්‍යාපෘති වාර්තාව පමා වීමෙන් නෝර්විජියානු ආධාර වතුරේ!

මගේ ඇඟ දැවෙන්නට පටන් ගෙන. මම පත්තරෙත් අතින් ගෙන හුන් තැනින් නැගිට කෑ මොර දෙන්නට වුණා.

මොන පාහරයද මේක පත්තරේට දුන්නෙ...?

හැමෝම මම ඉන්න ඉසව්වට ගාටනවා. මාතුපාල ඇවිත් මගේ මේසෙ උඩ තිබුණ පත්තරය අරගෙන කාටදෝ දෙනවා මම බලාගෙන. හැමෝම වට වෙලා පත්තරේ එහාට මෙහාට පෙරලමින් බලනවා.

කෝ - මොකක්ද මේකෙ තියෙන්නෙ. අපේ දෙපාර්තමේන්තුව ගැන මොකුත් නැහැ.

මුන් හැමෝම හැමදේම හංගනවා. පත්තරේ පොල්ගෙඩි අකුරෙන් පළවෙලා තිබුණ දේත් නැහැ කියනවා. සමරදිවාකරත් ඇවිත් කිව්වෙ එහෙම කලබල වෙන්න තරම් දෙයක් අපි ගැන පත්තරේ පළ වෙලා නැහැ කියලා. හරි මම හෙටම ව්‍යාපෘති වාර්තාව අරගෙන එනවා. එතකොට මේකලාගේ කටවල් පුට්ටුවෙයි.

මම ගෙදර යන ගමන් කොටුවට ගිහින් දිග දුනු පිහියක් ගත්තා. ඒක හරි අපූරු පිහියක්. බොත්තමක් තද කළ ගමන් අඟල් 8ක් විතර දිග පිහි තලයක් ඉස්සරහට පනිනවා. මට මුන් එකෙක්වත් විශ්වාස නැහැ. තමන්ගෙ ආරක්ෂාව තමන්ම සලසා ගන්න ඕන. තානාපති කාර්යාලය වුනත් මේකට මැදිහත් වෙලා ඇති. පිස්තෝලයක් වගේ ආයුධයක් හොයාගන්න තියෙනවා නම් තවත් හොඳයි. මහ මගදි බල්ලෙක් වගේ මැරුම් කන්න මම සූදානම් නැහැ. හැබැයි මේ පිහිය සුමාලිටවත් සුමුදුටවත් ඇහැ නොගැහෙන විදියට තියා ගන්න ඕන.

Scanned by CamS

මම මෝටර් රථය ගරාජයට ගාල් කරලා ගෙට ගොඩ වුණා. අද දවස මට හරි මදි. කන්තෝරුවෙදි අද සිදුවුණ දේවල්වලින් මගේ හිත පැරිලයි තිබුණේ. මගේ ඇහින්ම දැක්ක පත්තර වාර්තාව උන් නැහැයි කියපු හැටි. සමහර පත්තර වාර්තාවක ඔය ව්‍යාපෘති වාර්තා පමාව ගැන ව්‍යාංගයෙන් සඳහන් කළ අවස්ථා මම අනන්තවත් දැකලා තිබුණා. දවසක් වාර්තාවක තිබුණා කටු කැලේ ප්‍රදේශයට ජලය බෙදා හැරීම සීමා කෙරේ කියලා ප්‍රවෘත්තියක්. ඒ වාර්තාව යටින් කියවෙන්නේ මගේ ව්‍යාපෘති වාර්තාව ගැන. මගේ කාරණය ට කිසිම අදාළ කමක් නැති වාර්තාවක් විදියට පෙනී ගිය සමහර ප්‍රවෘත්තියක හැඟවිලා තිබුණේ මම ගැන. ඒවා හුඟාක් වෙලාවට ලියවිලා තිබුණේ මට වදින විදියට.

අවුල් වුණ මනසකින් ගෙට ගොඩ වෙන කෙනෙකු තමන්ගේ පවුලේ අය එක්ක වුනත් ආරවුල් ඇති කර ගන්න පිළිවන්. ඒත් මම එහෙම කෙනෙක් නොවෙයි. මම බොහොම පරෙස්සමෙන් කාමරයට අඩිය තිබ්බා. අද නම් මම එළිවෙනකම් හරි මේ ප්‍රශ්නය ගැන අප්පච්චි එක්ක කතා කරනවා.

සුමාලි මගේ මුහුණෙ තිබුණ අමුත්ත කියවලා.

ඇයි නිස්සංක ඔයා අද අමුතුයි.

ඇය මම ගලවපු කමිසය අරගෙන තුවා රාක්කය උඩින් දමනවා.

මට දැන් ඇතිවෙලා මුන්ගෙ කෙනෙහිලිකම්. වාර්තාව ප්‍රමාද වීම ගැන අද පත්තරෙත් තිබුණා.

ඉතින් තිස්සංක ඔයාගෙනේ වැරැද්ද. දැන් ඒක ලියලත් ඉවරනම් ගෙනිහින් දාන්නාම ඉවරනෙ.

හෙට ගෙනියනවා... හෙට ගෙනියනවා.

සුමුදු අපේ ඇඳේ හිඳගෙන ඉන්නවා මම දැක්කෙ එතකොටමයි. ඇය හිනාවක් තද කරගෙන ඉඳලා ඒක හිකිස් ගාලා පුපුරලා ගියා. ඇය තවමත් හිනාවෙනවා.

ඇයි මොකද සුමුදු.

සුමාලි අහනවා.

අම්මී දැක්කාද තාත්තිගෙ ඔය වාර්තාව.

ඇය ඇඳ උඩ වාඩි වුණා.

නැහැ ඔයා කොහොමද දැක්කෙ?

අර තාත්තිගෙ පොත් කාමරේ මේසෙ උඩ තියෙන්නෙ. ෆයිල් එකේ පොල් ගෙඩි අකුරින් ලියලා තියෙනවා කටුකැලේ යෝජනා ක්‍රමයේ ව්‍යාපෘති වාර්තාව කියලා. මම හවස ගියා ඒ කාමරේට පොතක් හොයා ගන්න. එතකොට තමයි දැක්කෙ.

සුමුදු නැවතත් අතින් කට වසාගෙන හිකිස් ගා සිනාවක් පිට කළා.

ඇයි මොකද?

අම්මී බලන්නකො. මාර වාර්තාවක් ඒක... ඉන්නකො මම ගේන්න.

සුමුදු ඊයක් වගේ කාමරයෙන් එළියට දිව්වා. සුමාලි ප්‍රශ්නාර්ථයක් සහිත බැල්මක් මගේ මුහුණ මත

සැනෙකින් සුමුදු වාර්තාව සහිත ලිපි ගොනුව අරගෙන කාමරයට ඇතුල් වුණා. ඇය එය සුමාලි අතට දෙන්නෙ මෙහෙම කියාගෙන.

මේ බලන්නකො අම්මි තාත්ති ලියලා තියෙන දේ.

සුමාලි ලිපි ගොනුව අතට අරගෙන දිග හැරියා. එය කියවාගෙන යන ඇගේ ඇස් දොඹ ගෙඩි දෙකක් වගේ විසාල වුණා.

මේ මොකක්ද ඔයා මේ ලියලා තියෙන්නෙ?

ඇය ලිපි ගොනුව බිම අත හැරියා. එහි වූ කඩදාසි සී සී කඩ විසිරුණා. මම පැය 3ක් තිස්සේ ලියූ වාර්තාව.

ඔයා පිටු එකසිය ගානක් පුරාම ලියලා තියෙන්නෙ එකම වචනයයිනෙ. අප්පච්චි කියලා විතරයි. අප්පච්චි අප්පච්චි අප්පච්චි අප්පච්චි අප්පච්චි...

මම ගිනි පිටවෙන ඇසින් සුමුදු දෙස බලාගෙන හිටියා. සුමාලි මුහුණ දෙඅත්ල අතර හිර කරගෙන ඉකි ගහනවා. සුමුදු තැති ගත්තෙ සුමාලිගෙ කඳුළුවලටද මගේ ඇස් දෙකට ද කියලා නිනව්වක් නැහැ. ඇය මහ හඬින් හඬාගෙන කාමරයෙන් පිටතට දිව ගියා.

සුමුදු කාමරයෙන් පිට වී මද ඇසිල්ලකින් අප්පච්චි කාමරයට ඇතුළු වුණා. ඔහු කාමරයේ බිම සී සි කඩ විසිරී තිබෙන කඩදාසි කන්දරාව දිහා බලාගෙන හිටියා. සුමාලි තවමත් ඉකි බිඳිනවා. මට එතන කළ හැකිව තිබූ එකම දේ කාමරයෙන් පිටව යාම පමණයි. එක වචනයක් වත් මුවින් පිට කරන්න මට හිත් දුන්නෙ නැහැ. බාගවිට මම තවත් එතන හිටියා නම් මගේ ඉවසීම එහි සීමාව බිඳගෙන යන්න පිළිවන්.

මම ගරාජයට ගිහින් මෝටර් රථය එළියට ගත්තා. ඊළඟට මම ම ගේට්ටුව ඇරගෙන මෝටර් රථය බොහොම සාර සුබාවට පාරට ගත්තා. ගේට්ටුව වසා දැමිය යුතු යයි මට කල්පනා වුණේ නැහැ. මට ඕන වුණේ හැකි තරම් ඉක්මනින් හැකි තරම් දුරකට මේ ස්ථානයෙන් පලා යන්න. මම මෝටර් රථය මහ පාර දිගේ ඔහේ පදවගෙන ගියා. මම හිතන්නෙ පැය ගණනාවක් ඇතුළත මම ගෙදර සිට කිලෝ මීටර් සියයකටත් වඩා දුර ඇවිත්. මා සිටින්නේ කොහේදැයි දැන ගැනීමට මම වීදුරුව පාත් කර මග දෙපස සංඥා පුවරු කියවන්න වුණා.

එතකොට ම මම දුටුවා පාරේ ඈත පොලිස් බැරියරයක්. එම පොලිස් බැරියරය මඟ හැර යන්න මඟක් මට තිබුණේ නැහැ. පොලිස් ජීප් රියක් පාර හරහා නවත්වා තිබෙන බවක් මම දුටුවා. ක්‍රමයෙන් මා එතනට ළංවන විට පොලිස් නිලධාරියකු මට නවතින ලෙස සංඥා කළා.

කළ්‍යාණි මරා දැමීම සඳහා මා අත් අඩංගුවට පත් වීමට නියමිතයි. ඔවුන් මා මෝටර් රථයෙන් පිටතට ගෙන පරීක්ෂාවට ලක් කළා. මගේ කලිසමේ දකුණු සාක්කුවේ තිබුණ මා මිලදී ගත් දුනු පිහිය ඔවුන් අතට පත්වුණා.

ඔවුන් මාව අත් අඩංගුවට ගත්තා තමයි. හැබැයි ඔවුන් කියන්නෙ හරි පුදුම කතාවක්. මම මගේ බිරිඳයි දුවයි මරා දමා පැන යමින් සිටිනවලු. සුමාලි සහ සුමුදු මරා දමා තිබෙන බව මා දැන ගත්තෙත් පොලිසියෙන්.

මම මගේ බිරිඳ සහ දුව මරා දැමුවේ නැහැ.

විත්තිකරුගේ නීතිඥවරයාගේ දේශනය

ගරු විනිශ්චයකාරතුමනි, ජූරිසභික මහත්වරුනි,
නෝනාවරුනි,

ඔබ මෙතෙක් අසාගෙන සිටියේ මගේ සේවාදායකයා රක්ෂිත බන්ධනාගාර ගතව සිටි අවුරුදු 1 1/2 කාලය තුළ ලියන ලද ඔහුගේ කතාවයි. එය මේ නඩුවට විත්තිය වෙනුවෙන් වි1 ලෙස ඉදිරිපත් කර තිබෙනවා. මම මුලින්ම කිව යුතු දේ තමයි මම නීති වෘත්තියට පිවිසිලා තවම මාස 6යි. මේ තමයි මිනීමැරුම් චෝදනාවකට අදාළ නඩුවකට මා මුල් වරට පෙනී සිටින අවස්ථාව.

මේ සේවාදායකයා මගේ සේවය සොයාගෙන ආපු කෙනෙක් නෙවෙයි. ඔහු මට සොයා දුන් කෙනෙක්. නඩු නැති නවක නීතිඥවරයකු ලෙස නීතිඥ මේසයේ කොනක වාඩි වී මේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතුන්ගේ කට දිහා බලාගෙන ඇනුම් අරිමින් සිටියදි ගරු විනිසුරුතුමා තමයි මේ නඩුවට පෙනී සිටීමට මා පත් කළේ. ඒ කියන්නේ නීතිඥවරයකුගේ සහායක් නොලැබෙන විත්තිකරුවෙකු වෙනුවෙන් රජයෙන් පත් කරන ලද නීතිඥයා මමයි. දැන් නිසැකවම ඔහු මගේ සේවා දායකයා. ඒ ගැන ඔබතුමාට

Scanned by CamS

ස්තුති වන්ත වෙන ගමන් ගරු විනිසුරුතුමනි මා කියන්නෙ මම මගේ උපරිමයෙන් ඔහුගේ නඩුව වෙනුවෙන් කටයුතු කළ බවයි. අනෙක් අතට මම ඔහුගෙන් බොහෝ දේ ඉගෙන ගත්තා. ඔහු විසින් ලියන ලද මේ කතාව ලේඛනයක් ලෙස ලකුණු කර ගරු ජූරි සභාවට ඇසෙන සේ අධිකරණයේ නිලධාරියකු ලවා විවෘත අධිකරණයේ දී කියවීමට අවසර දීම ගැනත් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙය ඒ විදියට ඉදිරිපත් කිරීම ගැන උගත් රජයේ නීතිඥවරයා ඉදිරිපත් කළ විරෝධතාව ඔබතුමා පිළිගත්තේ නැහැ. ඒ නිසා මේ විත්තිකරුගේ සිතුම් පැතුම් සහ ඔහුගේ චාර්යාවන් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඔහු විසින්ම අපට සපයා දීලා තිබෙනවා.

මේ විත්තිකරුට එරෙහිව තිබෙන චෝදනාව බරපතල එකක්. ඔහු තමන්ගේ බිරිඳත් එකම දියණියත් ගෙල කපා මරා දැමූ හයානක අපරාධකරුවෙකු ලෙස පෙන්වා සිටීමටයි පැමිණිල්ල පසුගිය සති 3ක කාලයක් තිස්සේම සාක්කි කැඳවමින් උත්සාහ කළේ. ඔහු මනාව සැලසුම් සහගතව මේ මිනීමැරුම කළ බව කියමින් මේ විත්තිකරු කොටුවේ වෙළඳ සැලකින් දුනු පිහියක් මිලදී ගත් බව පෙන්වා සිටීමට සාක්කි කැඳෙව්වා. ඔව් ඔහු දුනු පිහියක් මිලදී ගත්තා තමයි. මිනීමැරුම සිදුවෙලා පැය ගානකට පස්සෙ ඒ අපරාධය සිදු වූ තැන ඉඳලා කිලෝ මීටර් 100ක් විතර දුර බැහැර තැනකදි ඔහු අත් අඩංගුවට ගත්තා විටත් ඒ දුනු පිහිය ඔහුගේ සාක්කුවේ තිබුණා. මිනීමැරුම කළේ ඒ පිහිය හාවිත කළ බව පැමිණිල්ල ඔප්පු කර නැහැ. ඒ පිහියෙ ලේ සළකුණු තිබුණ බවට රස පරීක්ෂක වාර්තාවක් නැහැ.

Scanned by CamS

මේ මිනීමැරුම් කළේ තමා බව වත් තමා නොවන බව වත් ඔහු ප්‍රකාශ කර නැහැ. පැමිණිල්ල මුල සිටම නගන ලද ප්‍රශ්නය තමයි ඔහු නොවේ නම් එය කළේ කව්ද කියන එක.

ඔවුන් මරා දමා තිබුණේ නිදි යහනේ සිටියදී නොවේ. ඔවුන්ගේ සිරුරු තිබුණේ කාමරයේ බිම වැතිරිලා. ඉතා සුක්ෂම ලෙස මේ මිනීමැරුම් සිදුවී තිබෙන බව ඇත්ත. ඔවුන් උත්සාහ කළා ඔහු සහ බිරිඳ අතර විරසක බවක් තිබුණ බව පෙන්වා සිටීමට. බිරිඳත් දියණියත් ඔහු සමඟ අමනාප වී නිවසින් ගොස් තිබුණ බවට සාක්කි ඉදිරිපත් වුණා. මම එක් වැදගත් කරුණක් කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්නම්. මරණකාරියන් දෙදෙනා මරා දමා තිබෙන බව මුලින්ම දැක තිබෙන්නෙ යාබද නිවසේ පදිංචි හිල්ඩා නමැති කාන්තාවක්. ඇය මේ නඩුවේ සාක්කි දුන්නා. ඇය හදිසියේ විත්තිකරුගේ බිරිඳ මුණ ගැසීමට මේ නිවසට එනවා. දොර හායි ගාලා ඇර දමලයි තිබුණේ. ඇය නිවස තුළ ඇවිදගෙන යද්දි ඔවුන්ගේ නිදන කාමරයේ ලේ විලක් මැදවැටී සිටින අයුරු ඇය දකිනවා. ඉන් පසුව දියණියගේ සිරුර ඇගේ නිදන කාමරයේ බිම වැටී සිටියදී ඇයට හමුවෙනවා. ජූරි සභිකයිනි ඇය ඉතා පැහැදිලිව කියා තිබෙනවා තමාට කිසිම මරලතෝනියක් හෝ වෙනත් ශබ්දයක් මේ නිවසින් නොඇසුණ බව. මා නැවත නැවතත් කියන්නෙ මේ අපරාධය කළේ විත්තිකරු නොවන බවයි.

එහෙනම් කව්ද? මේ අපරාධ කළේ කව්ද? පැමිණිල්ල කියන්නේ විත්තිකරුට හැර මෙය සිදු කිරීමට වෙන කිසිවකුට අවකාශයක් නැති බවයි. අවකාශය

නැත්නම් අවස්ථාව ලැබීම කියන දේ නඩුවක අනුකූල කරුණක් විය හැකියි. හැබැයි මිනීමැරුම කළේ විත්තිකරු බව ඒ මතම තීරණය කරන්න බැහැ. මම කියන්නේ මේ නිවසේ සිව්වැන්නකුද සිටි බවයි. ඒ ගැන මේ මොහොතේ මා කිසිවක් කියන්නේ නැහැ. ඒ සිව්වැන්නා කවරෙක්ද කියන එකත් ඔහු මේ මිනිමැරුම් කළේ කෙසේද යන්නත් මා පසුව පැහැදිලි කරන්නම්.

මේ වෙලාවේ මට පෙනෙනවා මගේ උගත් මිත්‍රයාගේ මුහුණේ සාවඥ සිනාවක් නැගෙනවා. මම දන්නවා ඇයි ඔහු සාවඥ ලෙස හිනාවෙන්නෙ කියලා.

ඒ ගැන මේ මොහොතේ මා කිසිවක් කියන්නේ නැහැ. හැබැයි මා විශේෂ කාරණාවක් මේ අවස්ථාවේදි සඳහන් කළ යුතුයි. ඒ තමයි මේ නඩුවේ විසඳාගත යුතු කාරණය තමයි මේ විත්තිකරු උමතු බවින් පෙළෙන්නෙක්ද කියන දෙය.

ඉතාම ඛේදජනක ලෙස පැමිණිල්ල කැඳවූ සාක්කි වලින් කියවුණේ ඔහු උන්මත්තකයකු නොවන බවයි. ඔහු උමතු පුද්ගලයකු නම් ඔහු මේ චෝදනාවට වරදකරුද නිවැරදකරුද කියන ප්‍රශ්නය මතුවන්නේ නැහැ. එවිට ඔහුට එම චෝදනාවට පිළිතුරු දෙන්නට බැහැ.

හැබැයි පැමිණිල්ල දිගින් දිගටම උත්සාහ කළේ විත්තිකරු ඉතා හොඳ සිහිකල්පනාව ඇති පුද්ගලයකු බව පෙන්වා සිටීමට. ඔහු පළමු පෙළේ කීර්තිමත් පරිපාලන නිලධාරියෙක්. විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලැබූ උපාධිධරයෙක්. ඔහුට පශ්චාත් උපාධියක් ද තිබෙනවා. ඒ විතරක් නොවේ ඔහු කටු කැලේ ව්‍යාපෘතිය නම් වූ ජල

Scanned by CamS

යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මුල් වී කටයුතු කළ කෙනෙක්. අනෙක් අතට මනෝ වෛද්‍යවරයෙකු සාක්කි දෙමින් අධිකරණයේ පැවසුවේ ඔහුට කිසිම මානසික ආබාධයක් නැති බවත් ඉතාම තාර්කිකව ගැටළු දෙස බලන නිර්මාණශීලි පුද්ගලයකු බවයි. වරක් ඔහු තම බිරිඳ සමඟ තම සායනයට පැමිණි බවත් ඔහු සාක්කි දුන්නා. එම අවස්ථාවේ ඔහු තුළ කිසිම මානසික රෝගයක් නොමැති බව තමාට ඒත්තු ගිය ආකාරය පැහැදිලි කරමින් එම මනෝ වෛද්‍යවරයා සාක්කි දුන්නා. එම සාක්කිකරු මගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටියේ විත්තිකරු තමා නොමඟ යැවීමට වෑයම් කළ බවක් තමාට නොවැටහුණ බවයි. ජූරි සභික මහතුනි එය තමයි මෙහි ඛේදවාචකය.

මෙම මිනිමැරුම සිදුවීමෙන් පසුවත් එම වෛද්‍යවරයා මේ විත්තිකරු පරීක්ෂාවට ලක් කර තිබෙනවා. එම පරීක්ෂණ වාර්තාව අනුවත් ඔහු මානසික රෝගයකින් පෙළෙන බවක් එළිදරව් වන්නේ නැහැ. තමාට එරෙහිව නගා ඇති චෝනාවලට පිළිතුරු දීමට තරම් සුදුසු මානසික තත්ත්වයක ඔහු සිටින බව තමයි ඉන් කියවුණේ. මා කියන්නේ ඔහු චෝදනාවලට පිළිතුරු දීමට තරම් සුදුසු මානසික තත්ත්වය නොසිටි මානසික රෝගියෙකු බවයි. මට අවශ්‍ය ඔහු මේ චෝදනාවලට නිවැරදිකරු බව කියවා ගැනීම නොවේ. මට අවශ්‍ය ඔහු බරපතල මානසික රෝගයකින් පෙළෙන බවත් ඒ නිසා චෝදනා වටහා ගැනීමට තරම් සුදුසු මානසික තත්ත්වයක් ඔහුට නැති බවටත් තීන්දුවක් ලබා ගැනීමයි.

විනිසුරුතුමනි, ජූරි සභිකයිනි මේ අවස්ථාවේදී මට හැම ආගන්තුක අඩවියක් වෙත කැඳවාගෙන යාමට මා අදහස් කරනවා. කිව යුතු දේ තමයි මේ රටේ මනෝ වෛද්‍යවරුන් පිළිබඳ කිසිම විශ්වාසයක් මා තුළ නැති බව. පැමිණිල්ල කැඳවපු මනෝ වෛද්‍යවරයාගේ මතයට එරෙහිව වෙනස් මතයක් ඉදිරිපත් කිරීම සඳහා මනෝ වෛද්‍යවරයෙකු නොකැඳවීමට මා තීරණය කළේ හිතාමතාමයි. මනෝ විශ්ලේෂණය පිළිබඳ විදෙස් රටකින් විශේෂඥයකු ගෙන්වීමට අපට වත්කමක් නැහැ. ඒ වෙනුවට පසුගිය කාලය පුරාම මා කළේ මේ විෂයට අදාළ පොතපත කියවීමයි. ඇත්ත. මම මනෝ විශ්ලේෂකයකුවත් මනෝ චිකිත්සකයකුවත් එහෙම නැත්නම් මානසික රෝග සඳහා ප්‍රතිකාර කරන්නෙකු වත් නොවෙයි. එහෙත් මේ විෂය පිළිබඳ මවිසින් කරන ලද අධ්‍යයනයන් විත්තිකරු විසින් ලියන ලද මේ පොත මගින් තහවුරු වුණා. එම පොත වි1 ලෙස මා ඉදිරිපත් කළේ ඒ නිසයි.

විත්තිකරු තමන්ගේ ආඛ්‍යානය තුළ පෙන්වා සිටින්නේ තමාගේ පියා නිවසට පැමිණ සිටි බවයි. ඔහුගේ පියා ඔහු සමඟ කතාබහ කරනවා. ඔහු සමඟ ගමන් බිමන් යනවා. නමුත් ඔහුගේ පියා මියගොස් තිබෙන්නේ මීට අවුරුදු ගණනාවකට පෙරදී.

ස්වාමිනී, විත්තිකරු මට කී දේවල් මට ලැබුණ උපදෙස්. ඒ උපදෙස් මඟින් ඔහු කීවේ ලියා තිබෙන කරුණු වැඩි හරියක් තමා ඇත්තටම ලැබූ අත්දැකීම් නොවන බවයි.

විනිසුරු : එහෙනම් මොකටද මේ වි1 ලේඛනය ඉදිරිපත් කළේ. ඒකෙ තිබෙන්නේ බොරු නම් එහි කිසිම සාක්ෂිමය වටිනාකමක් නැහැ නොවේද?

විත්තියේ නීතිඥ : නැහැ ඒක එහෙම නොවෙයි. මට අවශ්‍ය ඔහු කවර විදියේ නිර්මාණකරුවකුද යන බව පෙන්වා සිටිමටයි. ඔහු තමාගේ ජීවිතය තමාම නිර්මාණය කර ගත්තෙක්. මට අවශ්‍ය යථාර්ථයේ තිබෙන ප්‍රබන්ධ මානය පැහැදිලි කිරීමට.

විනිසුරු : ඔබ පවසන දේ මට පැහැදිලි මදි. යථාර්ථයේ ප්‍රබන්ධ මානය. ඒ කියන්නේ Fictional aspect of the reality කියන එකද? ඒ වගේ ප්‍රවාදයක් කොහොමද මේ නඩුවට සම්බන්ධ වන්නේ?

විත්තියේ නිතිඥ : ස්වාමිනී මට අවශ්‍ය මගේ සේවාදායකයා උමතු අයකු බව පෙන්වා සිටීමට. නමුත් ඔහුට තිබෙන්නේ සුවිශේෂ උමතුවක්. එක්තරා විදියකින් සමාජයේ වැඩි දෙනෙක් මෙබඳු උමතුවකින් පෙළෙනවා. අපි යථාර්ථය කියන්නේ

අපම නිර්මාණය කර ගන්නා දෙයක්. කෙටියෙන් කිවහොත් ෆැන්ටසියක්. අපට උමතු නොවී සිටීමට ඒ ෆැන්ටසිය අවශ්‍යයි. අප යථාර්ථය නම් වූ ෆැන්ටසි ගොඩනැගීම තුළ තමයි උමතු බවේ අගාධයට නොවැටී සිටින්නේ.

විනිසුරු : ඔබ පවසන දේවල් වල කිසියම් අපූර්වත්වයක් තිබෙනවා. මා ඔබට බාධා කරන්නේ නැහැ.

විත්තියේ නීතිඥ : ඉතාමත්ම ස්තුතියි ස්වාමිනි. උමතු බව කියන්නේ අප විසින් යටපත් කළ යුතු අඳුරු සිතිවිලි අවරෝධනය කරන එක් ක්‍රමයක්. වෙනත් විදියකින් කියන්නේ නම් ආරක්ෂක වැඩ පිළිවෙලක්.

විත්තිකරු ලියා තිබෙන මේ පොත ගත්තොත් ඔහු කරන්නේ තමාගේ පියා නිර්මාණය කිරීමක්. මෙතන සිටින්නේ ඔහුගේ සැබෑ පියා නොවෙයි. ඔහුගේම පරිකල්පිත පියා. මෙය පැහැදිලිව තේරුම් ගන්නට නම් පියා නැත්නම් Father

පිළිබඳව මනෝ විශ්ලේෂණ ප්‍රවාද වල සඳහන් වන දේ ගැන අප පැහැදිලි කර ගත යුතුයි.

පියා (Father) කියන සංකල්පය අප හිතන තරම් සරල නැහැ. එය ඉතා සංකීර්ණයි. පියා යන යෙදුමෙන් සැබැවින් අර්ථ ගන්වන්නේ කුමක්ද? මනෝ විශ්ලේෂණයේ පියා ලෙස ගැනෙන සිග්මන් ෆ්‍රොයිඩ් නමැති පඬිවරයා ගැන ඔබ අසා ඇති බව නිසැකයි. ෆ්‍රොයිඩ්ගේ සමස්ත කෘති වල කේන්ද්‍රිය තේමාව වන්නේ පියා කියන සංකල්පය.

මනෝ විශ්ලේෂකයකු වූ ජාක් ලැකාන් මනාව පැහැදිලි කළ දේ තමයි දරුවකු සමාජ පැවැත්ම තුළට හඳුන්වා දෙන්නේ පියා විසින් බව. මව සහ දරුවා අතර තිබෙන සම්බන්ධය මනෝ විශ්ලේෂණ න්‍යායේ හදවත ලෙස සමහර මනෝ විශ්ලේෂකයින් හඳුන්වනවා. එහෙත් ජාක් ලැකාන් එයට පටහැනිව

පැවසුවේ මව දරුවා අතර සම්බන්ධතාවයට මැදිහත් වී දරුවා සයිකෝසියාවට ගොදුරු වීමෙන් වලකා සමාජ පැවැත්ම තුළට ඇතුල් කරන්නේ පියා විසින් බවයි. පියා කියන්නේ මවගේ ආදරය තමාට පමණක් විය යුතු යයි හඬා වැටෙන දරුවාගේ තරඟකරුවකු පමණක් වන්නේ නැහැ. ඔහු සමාජ පැවැත්ම නියෝජනය කරන්නෙක්. ඊඩිපස් සංකීර්ණය තුළ පියා සමඟ අනන්‍ය වීමෙන් පමණයි දරුවාට මේ සමාජ පැවැත්ම තුළට ඇතුළු වෙන්න පිළිවන් වන්නේ.

විනිසුරු : මම හිතන්නේ ඔබ ඔය සඳහන් කරන දේවල් මේ පුරි සභාවටත් මටත් පැහැදිලි කර දෙනවා නම් හොඳයි. අපි කැමතියි ඔබෙන් මේ දේවල් ගැන ඉගෙන ගන්න. කුමක්ද මේ ඊඩිපස් සංකීර්ණය?

විත්තිකරුගේ නීතිඥ : එහෙමයි ස්වාමිනි ඊඩිපස් සංකීර්ණය ලෙස ෆ්‍රොයිඩ් නිර්වචනය කළේ කෙනෙකු

(අපි ඒ කෙනාව හඳුන්වන්නේ ආත්මය (Subject) කියලයි.) තමාගේ මව්පියන්ට අදාළ ව අත් විඳින ප්‍රේමනීය සහ වෛරී වූ අවිඥානික ආශාවක් විදියට. ඒ කියන්නේ ඔහුගේ - මව්පියන්ගෙන් එක් අයකුට ආශා කිරීමෙන් අනෙකා තමාගේ විරුද්ධවාදියා බවට පත් කර ගන්නවා. ඊඩිපස් සංකර්ණයේ එලදායි ස්වරූපය අනුව හැමවිටම එසේ ආශා කරන මව හෝ පියා වන්නේ තමාගේ විරුද්ධ ලිංගික මව හෝ පියාවයි. එවිට තමාගේම ලිංගයේ මව හෝ පියා තමයි විරුද්ධවාදියා වන්නේ. ඊඩිපස් සංකීර්ණය මතුවන්නේ අවුරුදු 3දි. අවුරුදු 5 වැද්දි ඉවර වෙනවා. එවිට ඔහු තමා ආශා කරන මව්පියන්ගෙන් විරුද්ධවාදියා සමඟ අනන්‍ය වෙනවා. කෙනෙක් ඊඩිපස් අවදිය පසු කරනවා කියන්නේ එයටයි.

මගේ සේවාදායකයා වී1 ලේඛනය තුළ ගොඩනගන්නේ

පරිකල්පනීය පියෙක්. එය පියාගේ නාමකරණය අභිමි වීමට එරෙහිව ඔහු දෙන පිළිතුරයි.

විනිසුරු : මට නම් එය වැටහෙන්නේ නැහැ. කුමක්ද මේ පියාගේ නාමකරණය කියන්නේ.

විත්තියේ නීතිඥ : පියාගේ නාමකරණය එහෙම නැත්නම් Name of the Father කියන්නේ ආත්මයට (Subject) එහෙම නැත්නම් විෂයයාට අනන්‍යතාව පිරිනමන හැඟවුම්කාරයක්. ඒ කියන්නේ ඒ මතින් තමයි ඔහුව නම් කරන්නෙත් සංකේතිය විශ්වය තුළ යම් තැනක ඔහු රඳවන්නෙත්. එසේම ඊඩිපස් තහනම නැත්නම් ව්‍යාභිචාරි තහනම පනවන්නෙත් ඒ මඟින්. මේ පියාගේ නාමකරණය නැත්නම් පියාගේ (no of the father) තහනම සංකේතිය පැවැත්ම තුළ සිදු නොවුනහොත් එහි ප්‍රතිලය වන්නේ ඔහු සයිකෝසියාවට නැත්නම් උමතු බවට ගොදුරු වීමයි.

විනිසුරු : ඒ කියන්නේ මේ විත්තිකරු උන්මත්තකයකු බවට පත්වන්නේ පියාගේ නාමකරණය සිදු නොවුන නිසා බවද?

විත්තියේ නීතිඥ : ස්වාමීනි එයට මට ඔව් හෝ නැහැ යනුවෙන් සරල පිළිතුරක් දෙන්න බැහැ. හැබැයි ඔහුට මායාභ්‍රාන්තික ලෙස තමාගේ පියා හමුවීමත් ඔහු තමාගේ පියා මෙසේ විය යුතු යයි නිර්මාණය කිරීමත් තුළ අපට පෙනෙන්නේ පියාගේ නාමකරණය සිදුනොවුන බවයි. එක් අතෙකින් ඔහු තමාගේ පියා බේබද්දකු සහ සල්ලාලයකු ලෙස විස්තර කරන අතර වීරයකු ලෙසද හඳුන්වා දෙනවා. කිව යුතු දේ තමයි ඔහු ප්‍රතික්ෂේප කරන පියා වෙනත් වේෂයකින් ආපසු පැමිණීම. එය භීතිය දනවන දෙයක්.

සිග්මන් ෆ්‍රොයිඩ් පූර්වජ ගෝත්‍රික සමාජ තුළ සිටි පියකු ගැන විස්තර කරනවා. අප ඔහු පූර්වජ පියා නැත්නම් primodial father යනුවෙන් හඳුන්වනවා. මේ පියා තම පුතුන් විෂයෙහි ව්‍යභිචාරි තහනම (incest taboo) පනවනවා. සියළුම ස්ත්‍රීන් ඒ අනුව පියා සතුයි. පුත්තු කරන්නේ පියා මරා දැමීම. එහෙත් පියා මරා දැමීමෙන් ඔවුන්ගේ ගැටලුව අවසන් වන්නේ නැහැ. ඔවුන්ට දැනෙනවා පියා අවශ්‍ය බව. ඔවුන් පියා ආපසු කැඳවනවා සංකේතයක් ලෙස. එම ගෝත්‍රයේ තහනමක් පැනවෙනවා යම් සතකු මරා දැමීම හෝ යම් ගසක් කපා දැමීම. එම සතා හෝ ගස මගින් සංකේතවත් වන්නේ පියා. ඒ විදියට තමන් මරා දැමූ පියා වෙනත් වේශයකින් ආපසු පැමිණ ඔවුන් විෂයෙහි නීති පනවනවා. මගේ සේවාදායකයාගේ පියා ආපසු වෙනස් වේශයකින් පැමිණ කරන්නේ ඔහු මත නීති පැනවීමයි. ඔහුගේ කටයුතු පාලනය කිරීමයි.

මම තව උදාහරණයක් ඉදිරිපත් කරන්න කැමතියි මයිකල්

Scanned by CamS

ජැක්සන්ගෙන්. මයිකල් ජැක්සන්ට සිදුවන්නේ කුමක්ද? ඔහු තමාගේ මුහුණේ පෙනුම - වෙනස් කර ගන්නවා. එය වෙස් මුහුණක් බඳු මුහුණක්. තමාගේ සමේ පැහැය පවා ඔහු වෙනස්කර ගන්නවා. ඔහු එහෙම කරන්නේ ඇයි? මයිකල් ජැක්සන් කුඩා කළ තමාගේ සහෝදරයින් සමඟ කාමරයක නිදා සිටින විට ඔහුගේ පියා කරන්නේ වෙස් මුහුණක් දමා ගෙන ජනේලයකින් පැන ඔවුන් බිය වැද්දීමයි. නිදා ගැනීමට යනවිට එම ජනේලය වසා දැමීම පියාගේ නීතියයි. ජනේලයෙන් කාමරයට වැද බියපත් කිරීම එම නීතිය කඩ කිරීම ගැන පියා දුන් දඬුවමයි. සොරෙකුට වුවත් ඒ විදියට ඇතුල් වීමට පිළිවන්.

මයිකල් ජැක්සන් මිය යන තෙක්ම ළමයකු වූ (පීටර් පැන් සංකීර්ණය) මයිකල් ජැක්සන්ට අවශ්‍ය වූයේ තමාගේ පියාගෙන් ගැලවීමට නොව ඔහු කියා දුන් සංකේතික විශ්වය හඳුනා

ගැනීමට. ජැක්සන් තම මුහුණ වෙස් මුහුණක් බවට පත් කර ගන්නේ එම පියාගේ භීතියට අවනත වෙමින්. හම සුදු පැහැ ගැන්වීමෙන් ද ඔහු අපේක්ෂා කළේ බාහිර ලෝකයේ සතුරන්ගෙන් ආරක්ෂා වීමයි. ඔහුගේ ක්‍රියාවෙ අවිඥානික ආශාව එයයි.

පියාගේ වෙස් මුහුණු බිය ගැන්වීමෙන් පසු කිසිවකු තමා පැහැරගෙන යනු ඇතැයි මයිකල් බියෙන් පසු වුණ බව කියවෙනවා. ඔහු තමාගේ මුහුණ වෙස් මුහුණක් බවට පරිවර්තනය කර ගන්නේ මෙම බිය ඔහුගේ මුළු ජීවිතයම වෙලාගෙන තිබුණ බැවින්. මෙයින් මා පෙන්වා සිටින්නට උත්සාහ කරන්නේ කෙනෙකුට තම පියාගේ බලපෑමෙන් ගැලවීමට නොහැකි බවයි. පියා ජීවිතයේ කේන්ද්‍රිය කාරණය වෙනවා කියන්නේ පියා ආපසු පැමිණෙන බවයි. හැබැයි එලෙස ආපසු පැමිණෙන්නේ ආත්මයාට

අවශ්‍ය ඔහු ආරක්ෂා කරන වර්ගයේ පියෙක්.

මේ කාරණය පැහැදිලි කරන්නට මා ඊළඟට හැරෙන්නේ ෆ්‍රාන්ස් කෆ්කා දෙසට.

විනිසුරු : ෆ්‍රාන්ස් කෆ්කා?

විත්තිකරුගේ නීතිඥ : එහෙමයි ස්වාමිනි. ඔබතුමා කෆ්කා ගැන අසා ඇති.

විනිසුරු : ඔව් මම කෆ්කාව කියවා තිබෙනවා. ඔහුගේ The Trial, Castle වගේ නවකතා මා කියවා තිබෙනවා. එතකොට අර Metamophosis කියන අරුම පුදුම කෙටිකතාව. මම වඩාත්ම කැමති ඔහුගේ දෘෂ්ටාන්ත වලට. ඔය The Trial නවකතාවේම එන The Door of the Law කියන දෘෂ්ටාන්තය. ඒ කතාවේ හැටියට එම නීතියේ ද්වාරයෙන් ඇතුළු වීමට පැමිණෙන ගැමියා අවුරුදු ගණනාවක් බලා සිටියත් ඒ දොර ඇරෙන්නෙ නැහැ. ඒත් දොර ඇර ඉන් ඇතුළු වීමට යන විට ඔහු මැරි වැටෙනවා. හරියට අපේ උසාවි වල අවුරුදු ගානක් ගිහිනුත් නඩුවක් ඉවර

මෙන කොට පාර්ශවකරුවන් මිය ගොස් තිබෙනවා වගේ.

විත්තියේ නීතිඥ : ස්වාමිනි ඔහු දැන නොසිටි කාරණය තමයි එම දොර තිබුණේ ඔහු වෙනුවෙන්ම බව.

විනිසුරු : හරියට හරි. මම හිතන්නෙ අපි දෙන්නා මෙහෙම කෆ්කාව තනිව රස විඳින එක මේ ජූරි සභාවේ වැදගත් මහත්වරුන්ට කරණ අසාධාරණයක්. එහෙත් මට තේරුම් ගන්න බැරි ඔබ කෆ්කාව මෙම නඩුවේ ඉසව් ගත කරුණ සමඟ සම්බන්ධ කරන්නේ කොහොමද කියන එකයි.

විත්තියේ නීතිඥ : ස්වාමිනි ගරු ජූරි සභික මහත්වරුනි අපගේ උගත් විනිසුරුතුමන් පෙන්වා දුන් විදියට ෆ්‍රාන්ස් කෆ්කා කියන්නේ ඉතාම විශිෂ්ට ජර්මානු ලේඛකයෙක්. මෙහිදී මම ඔබේ අවධානයට ලක් කරන්නේ කෆ්කා තමාගේ පියාට ලියූ ලිපියක්. මෙම ලිපියෙන් පියාගේ අධිකාරිත්වයේ තිබෙන සංකීර්ණ ස්වභාවය මතු කර

පෙන්වනවා. ස්ලැවෝජ් ජිජැක් පෙන්වා දෙන විදියට.

විනිසුරු : කව්ද මේ ස්ලැවෝජි ජිජැක්?

විත්තියේ නීතිඥ : ස්වාමිනි ඔහු ෆ්‍රොයිඩියානු සහ ලැකානියානු මනෝ විශ්ලේෂණය ඇසුරු කොට ගනිමින් මිනිස් ගැටලු විග්‍රහ කරන පඬිවරයෙක්. ෆ්‍රොයිඩ් අවිඥානය යනු කුමක්දැයි පැහැදිලි කළේ හිස්ටීරියාව හරහා. ලැකාන් එය කරන්නේ සයිකෝයිකාව නැත්නම් උමතු බව විශ්ලේෂණය කිරීමෙන් ජිපැක් අවිඥානයට යන රජ මාවත ලෙස තෝරා ගත්තේ විපරිත බව. ඉංග්‍රීසියෙන් Perversion කියන දේ. ඒ අනුව ඔහුට විෂය වන්නේ සමකාලීන සමාජයේ විපරිත ස්වරූපය. විශේෂයෙන්ම ජනප්‍රිය සංස්කෘතිය.

විනිසුරු : හරි මට තේරුණා.

විත්තියේ නීතිඥ : ඉතින් ජිජැක් ලියනවා පොතක් In Defese of Lost Causes කියලා.

විනිසුරු : ටිකක් ඉන්න මම ඒ පොතේ නම ලියා ගන්නකන්.

විත්තියේ නිතිඥ : In Defense of Lost Causes. ඒ පොතේ ජිජැක් පෙන්වා දෙනවා කෆ්කාගේ ලිපිය කියවන කෙනෙකුට එහි යම් දෙයක් මග හැරී තිබෙන බව. ඒ තමයි අර නීතියේ ද්වාරය කියන දෘෂ්ටාන්තයේ අවසානයට කියවෙන දේ. එනම් "මේ දොර තිබෙන්නේ ඔබ සඳහා පමණයි." කියන ද්වාර පාලකයාගේ ප්‍රකාශය. ඒ විදියටම කෆ්කා තම පියාට ලියන ලිපියේ ඔහුට මග හැරෙන දේ තමයි පියා ප්‍රදර්ශනය කළ තර්ජනය සහ කෝපය ඔහු සඳහා පමණක් බව. තමාගේ පියා බියජනක පුද්ගලයෙකු බවට කෆ්කා පරිකල්පනය කළත් හර්මන් කෆ්කා කියන්නේ තමන්ගේ පුතාගේ පරිකල්පනයන්ගෙන් විශ්මයට පත්වන ඉතා කරුණාවන්ත මහත්මයකු බව කෙනෙකුට සිතා ගන්න පුළුවන්.

ජීපැක් කියන විදියට කෆ්කාට තිබෙන ප්‍රශ්නය තමයි තමන්ගෙ පියාගේ ජවය. ඔහු ජීවයෙන් පිරැණු ඉතාම ආශිලාචාර ලෙස ආක්‍රමණශිලි කෙනෙක්. කෆ්කා ඔහුගේ පියාට මෙහෙම ලියනවා. “අශිලාචාර ප්‍රකාශ කිරීමට ඔබ තුළ තිබෙන ආශාව ගැනයි මේ. ඔබ එවැනි ප්‍රකාශ මහ හඬින් සිනා වගුරවමින් කරන්නේ හරියට ඉතා යහපත් වැදගත් දෙයක් කියනවා වගේ. හැබැයි ඒවා තුට්ටු දෙකේ අශීලාචාර ප්‍රකාශ. මේවා මට අනුව ඔබගේ ජීවන ශක්තිය නින්දා සහගත ලෙස ප්‍රකාශයට පත් කිරීමක්.”

යමෙකු මෙහි සිහි තබා ගත යුතු දේ තමයි පියාගේ අධිකතර ජීවන ශක්තිය නැත්නම් ජවය විසින් ඔහුගේ සංකේතික අධිකාරිත්වය හෑල්ලුවට ලක් නොකරන බව. තමන්ගේ පියාගේ ජවය ගැන කෆ්කා තැවෙන්නේ පියා තමාගේ සංකේතීය අධිකාරිත්වය පෙන්වා නොසිටි නිසා බවයි.

පියාගේ නාමකරණය යනුවෙන් අප කලින් සඳහන් කළ දෙයෙහි සාරය කුමක්ද? ඉන් හරියටම කෙරෙන්නේ පියාව සංකේතිකව මරා දැමීමට ආත්මයට ඉඩ දීමයි. එමඟින් ඔහු තම පියා අත්හැර දමා නිදහස් ලෝකය තුළ තමන්ගේ මාවත සොයා ගන්නවා. තම පියාගෙන් කැඩී වෙන්වීමට නොහැකි වීම මගින් පෙන්නුම් කරන්නේ ඔහු පියාගේ නාමකරණය බාර ගැනීමට මැලිවීමයි. කෆ්කාගේ ලියුම , සදාකාලිකවම තම පියාගේ සෙවණැල්ලෙන් මිදීමට නොහැකි වූ බවට කදිම සාක්කියක්.

වී1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර තිබෙන විත්තිකරුගේ දීර්ඝ ලියවිල්ල මගින් පෙන්නුම් කරන්නෙත් එයමයි. ඔහුට තම පියාගේ සෙවනැල්ලෙන් මිදීමට නොහැකි වූ බවයි. කෆ්කා වගේම ඔහු තමාගේ පියා තමාට අවශ්‍ය පරිදි මෙහි නිර්මාණය කරනවා.

මෙහි සිටින්නේ ඔහු විසින් පරිකල්පනය කරන පියා මිසක් ඔහුගේ සැබෑ පියා නොවේ.

ස්වාමිනි ජූරි සභික මහතුනි චිත්තකරු මේ ලියා තිබෙන ලියවිල්ල තුළ බැලූ බැල්මට පෙනෙන්නේ ඔහු බොහෝ දේවල් එළිදරව් කර තිබෙන බවයි. එහෙත් ඇත්ත නම් ඊට වඩා වූ දේවල් ඔහු අවරෝධනය කරනවා. එහෙම නැත්නම් යටපත් කරනවා. ඔහු යටපත් කරන දේ තමයි ඔහුගේ බෙලහීන චරිතය. ඔහු තමාගේ බිරිඳ නිතර සැක කළ කෙනෙක්. ඔවුන් හොඳ පවුල් ජීවිතයක් ගත කළේ නැහැ. ඒ අඩදබර වල් ප්‍රතිලයන් විදියට තමයි ඇය තමන්ගේ දරුවාත් සමඟ නිවසින් යන්නේ. ඔහු මේ කතාව මඟින් තමන්ගේ අවුල් සහගත ජීවිතයට එරෙහිව ෆැන්ටසිමය ජීවිතයක් නිර්මාණය කරනවා.

විනිසුරු : ඔහු එහෙම තමන්ගේ ජීවිත කතාව විදියට තමාම ගොතපු කතාවක් ඉදිරිපත් කරනවා

නම් ඔහුට මානසික රෝගයක් තිබෙන්න බැහැනෙ.

විත්තිකරුගේ නීතිඥ : ඒක තමයි - මෙහි තිබෙන සංකීර්ණ ස්වභාවය. සමාජයේ සිටින බොහෝ අයට සයිකෝසික තත්ත්වයක් නැහැයි කියලා අපට කියන්න බැරි තරම්. හැමෝගෙම ජීවිත කියන්නේ අපම නිර්මාණය කරගත් ප්‍රබන්ධ. මේ කිසිම කෙනෙකු උමතු බවින් පෙළෙන බවට බාහිර කිසිම සාක්කියක් නැහැ. ඩේරියන් ලීඩර් මෙය හඳුන්වන්නේ සන්සුන් උමතු බව නැත්නම් Quiet Madness කියලා.

විනිසුරු : කව්ද මේ ඩේරියන් ලීඩර්.

විත්තියේ නීතිඥ : ඔහු මනෝ විශ්ලේෂකයෙක්. ඔහු ලියූ What is Madness කියන ග්‍රන්ථයේ ඔහු මීට අදාළ කාරණා ගණනාවක් පැහැදිලි කරනවා.

විනිසුරු : මොකක්ද ඒ පොතේ නම. නැවත කියන්න.

විත්තියේ නීතිඥ : What is madness. ඔහු ලියා තිබෙනවා තව හරි අපූරු

පොතක් Why Women Write More Lettes Than they Post කියලා.

විනිසුරු : හා... හා... (මහ හඬින් සිනාසේ)

විත්තියේ නීතිඥ : මේ ග්‍රන්ථයේ ඔහු කියන වැදගත් කාරණයක් තමයි උමතු බව කියන්නේ කිසියම් රෝග ලක්ෂණ විද්‍යාවකට අනුව තේරුම් ගත යුතු දෙයක් වුනත් උමතු බවේ කිසිම සලකුණක් නොපෙන්වා කිසියම් තීරණාත්මක අවස්ථාවක සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියාවකින් එය නිරාවරණය වෙන්න පිළිවන් කියන එක.

කෙනෙක් තමන්ගේ රැකියාව, එදිනෙදා කටයුතු පවුල් ජීවිතය බොහොම සන්සුන්ව ගත කරනවා වෙන්න පිළිවන්. ඔහුගේ හැසිරීමේ කිසිම අසාමාන්‍ය ලක්ෂණයක් නැහැ. බැලූ බැල්මට ඔහු ආදර්ශමත් කෙනෙක්. හැබැයි කිසියම් අවස්ථාවක ඔහු සඟවා ගෙන තිබෙන

පිස්තෝලයක් ඇදල ප්‍රසිද්ධ කෙනෙකුට වෙඩි තිබ්බොත් අන්න එතකොට තමයි ඔහුගේ උමතු බව එළිදරව් වෙන්නෙ. ඒ - අවස්ථාව තෙක්ම ඔහු හැසිරිලා තිබෙන්නේ උමතුවෙන්.

ලීඩර් ප්‍රශ්න කරන විදියට එහෙම දෙයක් නොවුනා නම් ඔහු සන්සුන්ව ජීවිතය ගෙවා දමන්න තිබුණා. ඒ කියන්නේ එම ක්‍රියාවට පෙරත් ඔහු උමතුබව තිබියදී සන්සුන්ව සිටියා නම් කාටවත් හිරිහැරයක් වුණේ නැත්නම් ඔහු උන්මත්තකයෙක් කියලා කාටවත් දැන ගන්න ලැබෙන්නෙ නැහැ. කෙනෙක් තමන්ගේ විවේක කාලය නොයෙක් විදියේ විනෝදාංශ සඳහා කැප කරනවා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් තමාගේ රැකියාවට අදාළ දෙයක් පිළිබඳව අසාමාන්‍ය උනන්දුවක් දක්වන්න පුළුවන්. හරියට අපේ කතා නායකයා අර කවු කැමේ ව්‍යාපෘතිය

Scanned by CamS

ගැන උනන්දු වුණා වගේ. එහෙම ක්‍රියාවක සෙවණැලි උමතුවක් (Shadow Madness) තිබුණේ නැහැ කියලා කියන්න පිළිවන්ද? ඉන් ප්‍රකාශයට පත් වන්නේ ඔහුගේ අභ්‍යන්තරයේ කැකෑරෙන උමතු රෝග ලක්ෂණයක්. අපේ කතා නායකයා සම්බන්ධයෙන් ගතහොත් ඔහුගේ කෘතහස්ත බව පියාගේ නාමකරණය මගහැරීමෙන් ලබන විපාකයක්.

විනිසුරු : ඔබ කියන දේ මට නම් පිළිගන්න අමාරුයි. හිතන්න මම මේ අධිකරණයේ නඩුවක් විභාග කර නීති වාර්තා නීති පාඨ ග්‍රන්ථ ආදිය පරිශීලනය කර හොඳ නඩු තීන්දුවක් ලියනවා. මම එහෙම කරන්නේ පිස්සුවෙන්ද? එහෙම නැත්නම් මම උදේ සිට හවස් වන තෙක්ම විනිශ්චයාසනයේ සිටිමින් හැකිතරම නඩු ඉවරකරනවා මම එහෙම කරන්නේ පිස්සුවෙන්ද?

විත්තියේ නීතිඥ : සමාවෙන්න ස්වාමිනි, උගත් - රජයේ නීතිඥ මහතා කට

Scanned by CamS

කොනිත් සාවඥ සිතාවක් පළ කරන බව මට පෙනෙනවා. මම එය ගානකට ගන්නේ නැහැ. ඔබතුමා කී විදියට කෙනෙකු තමා කරන වෘත්තියට කැපවීමෙන් කටයුතු කිරීම හෙලා දැකීමට මම අදහස් කළේ නැහැ. ඔබතුමාගේ කැපවීම අප හැම විටම අගය කරනවා. හැබැයි එහෙම අවස්ථාවක් වුනත් උමතු බවේ ප්‍රකාශනයක් වන අවස්ථා තිබෙනවා.

ජර්මනියේ සිටියා ඉහළ අධිකරණයක විනිසුරුවරයෙක් ඩැනියල් පෝල් ෂ්රැබර් නමින්. තමාට මානසික රෝගයක් තිබෙන බවට ඔහුටම වැටහීමක් තිබුණා. තමාගේ ස්නායු රෝගාබාධය ගැන 1903 දී ඔහු Memoirs of My nervous illness යනුවෙන් පොතක් පවා ලියනවා. මේ සටහන් ගැන ෆ්‍රොයිඩ් පවා ලියා තිබෙනවා. අපේ කතානායකයා ලියා තිබෙන මේ වි1 වගේ ලේඛනයක්

තමයි ඔහු ලියා තිබුණේ. තමා නව ජාතියක් උපදවන්නකු බවට පත් වෙමින් සිටිනවා යයි තමා තුළ පැවති විශ්වාසය එම පොත මඟින් ඔහු එළිදරව් කරනවා. ඒ වගේම ඔහු සිතුවේ තමා දිව්‍යමය කිරණ සහ කෙඳි දිවෙන අරුම පුදුම විශ්වයක් තුළ වාසය කරන බවයි. එබඳු මනෝ විකාර ඔහු තුළ තිබියදීත් ඔහු උසාවියේ දී තියුණු නීති තර්ක ගෙනහැර පෑමේ නිපුන බවක් පළ කළා. නීති තර්ක වගේම තම කතාව මගින් තමා රඳවා සිටි උන්මත්තකාගාරයෙන් මුදවා ස්වකීය කටයුතු කරගෙන යාම සඳහා මුදා හැරීමට තරම් යෝග්‍ය යයි උසාවියට ඒත්තු ගන්වන්ටත් සමත් වුණා. පසුව ඔහුගේ උමතුව උත්සන්න වන්නේ ඉහළ අධිකරණයේ විනිසුරුවරයකු ලෙස උසස් වීමක් ලැබීම නිසයි.

විනිසුරු : ඔබ අපව බිය ගන්වනවා.

විත්තියේ නීතිඥ : ඇත්තටම නම් අප බිය විය යුතුයි තමයි. කවද උමතු

කවිද [illegible] කියන. වඳ කෙනෙකුට ලැබෙද්දී කිරීමට අමාරුයි. මනෝ විශ්ලේෂිකාවක වූ ජීයෙන ඔලෙන්ගීර් තමාගේ රෝගියෙකු පිළිබඳ කළ විස්තරයක් ලියාව ඔහුගේ පොතේ එළිදරව් කරනවා. ඔලෙන්ගීර් ට හමුවන විට මේ නැංග්‍රාන්තිය සමාජයේ සාමාන්‍ය කෙනෙකු විදියට විවාහ වෙලා දරුවකුත් ලැබී කඩයක් අගෙන හිටි කෙනෙක්. හැබැයි ඒක අවසකින් ඔලෙන්ගීර්ට එළිදරව් වෙන්නේ දරුවන් බිහි කිරීම පිළිබඳ ඇය තමාටම සුවිශේෂ වූ මතයක එල්බ සිටි බවයි. ඇයට අනුව පුරුෂයාගේ ශුක්‍රාණු වලින් වෙන දෙයක් නැහැ. එය කරන්නේ ස්ත්‍රියකගේ ප්‍රජනන ඉන්ද්‍රිය උත්තේජනය කිරීම පමණයි. පුරුෂ අංගජාතය එක් උපකරණ තුළට ඇතුළු කරවා ගැනීමට ස්ත්‍රියට පෙළඹවීමක් ඇති වෙනවා. පුරුෂයන් තරුණ වියේදී මිය යන්නේත් ඔවුන්ගේ කෙස් වැටෙන්නේත් ඒ නිසා බව

ඇය විශ්වාස කළා. ඇය මෙබඳු මතයක සිටි බව කිසිවකු දැන සිටියේ නැහැ.

ලීඩර් පැහැදිලි කරන විදියට මේ වර්ගයේ සයිකෝටික ආත්මයන් හැසිරෙන්නේ විශේෂඥයින් වගේ. තමන්ටම ආවේණික පූර්වජ මති භ්‍රමයකට අනුව තමයි ඔවුන් ලෝකය දකින්නේ. හැබැයි ඔවුන්ගේ දෛනික පැවැත්ම ඉතාම සාමාන්‍යයි. දුර සිට බලන කිසිවකු ඔවුන් අසාමාන්‍ය යයි සැක කරන්නේ නැහැ. ඔලග්නීර්ගේ රෝගිකත ඇය වෙත පැමිණෙන්නේ තමා තුළ ඇති වුණ කිසියම් භීතිකාවක් නිසයි. ඒ විදියට ඇය නොපැමිණියානම් අර විකාර කල්පනාවන් කවදාවත් එළියට එන්නේ නැහැ. ඇය ඇගේ අර විකාර විශ්වාසය නඩත්තු කරන ගමන්ම තමන්ගේ ජීවිතය සාමාන්‍ය විදියට ගෙවා දමන්නට තිබුණා.

ඇත්තටම හැම අද අපට පැහැදිලි රෝග ලක්ෂණයක් විද්‍යාමාන නොවන මානසික රෝගීන් පිරිසක් මැද කල් ගෙවීමට සිදු වී තිබෙනවා. කොටින්ම කාටද පිස්සු කාටද පිස්සු නැත්තෙ කියා කීම දුෂ්කරයි. සමකාලීන මනෝ චිකිත්සකයින් (Psychiatrists) උමතු බව විශ්ලේෂණය කරන විට තම අවධානය යොමු කරන්නේ පැහැදිලිව පෙනෙන රෝග ලක්ෂණ ගැන විතරයි. යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් මති භ්‍රමයක්, භ්‍රාන්තියක් හෝ අනුකරණයක් ජීවිතය කළඹනවාද කියන එක තමයි ඔවුන් හොයන්නෙ. අන්න ඒ නිසා තමයි මනෝ වෛද්‍යවරුන්ට මගේ සේවා දායකයා මානසික රෝගියකු බව හඳුනා ගැනීමට අපහසු වෙන්නෙ. ඔහු කරන්නේ (අර මේ කාලෙ ජනප්‍රිය කියමනකින් කියනවා නම්) මේ වෛද්‍යවරුන් ඇන්දවීම. තමා ඉතා යහපත් කල්පනාවෙන් සිටින සාමාන්‍ය කෙනෙකු

බව ඒත්තු ගන්වන්නට තරම් ඔහු දක්ෂයි. තමා මනෝ භ්‍රාන්තියක සිටින බව, කට හඬවල් ඇහෙන බව, වෙන අය නොදකින පුද්ගලයින් සමඟ කතා බහ කරන බව ඔහු මනෝ වෛද්‍යවරුන් ඉදිරියේ හංගනවා. ඔහු මේ ආඛ්‍යානය මගින් ඍජුව ඉදිරිපත් කරන්නේ අන්න ඒ හංගපු දේවල්. ඒකයි මෙහි තිබෙන විශේෂත්වය.

විනිසුරු : ඒ කියන්නේ ඔහු ලියලා තිබෙන්නේ ඇත්තටම සිදුවුන දේවල් නොවෙයිද? නිදර්ශනයක් හැටියට කිව්වොත් ඔහු තමන්ගෙ අප්පච්චි සමඟ කන්තෝරුවට යනවා. බස් රථයක නැගී යනවා. දෙදෙනා එකතු වී ක්‍රීඩා කරනවා වෙනත් අය දකිනවා වගේ දේවල්. ඒවා සිදු නොවුන දේවල්ද?

විත්තියේ නීතිඥ : ඒවා සිදුවන්නේ මෙහි ලියා තිබෙන ආකාරයට නොවේ. ඔහු තමාගේ පියා සමඟ කන්තෝරුවට යනවා. පියා ඔහුගේ මේසයේ අනෙක් පස

පුටුවේ වාඩි වී සිටිනවා. නමුත් ඔහු පියා පැමිණි බව අනෙක් අයට හඟවන්නේ නැහැ. එය අනෙක් අයගෙන් සඟවන්නේ ඔවුන් එය නොපිළිගන්නා බව ඔහු දන්න නිසයි. යම් ලෙසකින් තමා පියා සමඟ පැමිණි බව පැවසුවා නම් සිදුවිය හැකි දේ තමයි ඔහු මෙහි ලියන්නෙ. තමා මනෝ භ්‍රාන්තින්ගෙන් පෙළෙන බව දැනගැනීමට ඉඩ නොදී සිටීමටයි ඔහු උත්සාහ කලේ නිදර්ශනයක් විදියට ඔහු තම පියාව නිර්මලාට හඳුන්වා දුන්විට සිදුවන ඇගේ වෙනස ඔහුගේ නිර්මාණයක් වුනත් එය සිදුවීමට නියමිත ඒ විදියට තමයි. තමා මනෝ භ්‍රාන්තිකයෙක් බව අන් අයට දැන ගැනීමට ඉඩ නොදී සිටීමටයි ඔහු උත්සාහ කලේ.

විනිසුරු : එතකොට අර ව්‍යාපෘති වාර්තාව ඒකෙ තිබුණේ අප්පච්චි කියන වචනය යළි යළිත් ලියා තිබීම විතරයි කියලා මේ කතාවේ තිබෙනවා. මේ නඩුවේ කිසිම සාක්කියකින් එහෙම දෙයක්

ඉදිරිපත් වුණේ නැහැ. ඒක ඇත්තක්ද?

විත්තියේ නීතිඥ : ඒක ඇත්තක් ස්වාමිනි. ඔහු පැය 3ක් තිස්සේ පිටු 150 ක් පුරා ලියලා තිබුණේ ඒක විතරයි. ඒක විකාරයක් කියලා ඔහු දැන සිටියා. නමුත් ඔහු එසේ ලිව්වේ තමන්ගේ මනෝ භ්‍රාන්තිය වූ අප්පච්චිගෙ බලපෑම නිසයි. කොටින්ම අර අපේ ගමේ ගොඩේ භාෂාවෙන් කියනවා නම් ඔහුට අප්පච්චි වැහිලා හිටියා. He is Posessed by his father ඒ කියන්නෙ ඔහු කළ දේවල්වල වගකීම යන්නෙ අප්පච්චිට. ඔහු හැමදේම කළේ අප්පච්චිගේ උපදෙස් මත. ඒක තමයි මෙහි ඛේද වාචකය.

වාර්තාවේ ලියලා තිබුණේ අප්පච්චි කියන වචනය විතරයි කියන කරුණ එළිදරව් වෙනවාට ඔහු කැමති වුණේ නැහැ. සුමුදු වාර්තාව ගෙනවිත් තමන්ගේ මවට පෙන්වන විට ඔහු වික්ෂිප්ත වුනේ ඒකයි.

විනිසුරු : එහෙම එය එළිදරව් වීම නිසා ඇතිවුණ වික්ෂිප්තය උඩ ඔහු

තමාගේ බිරිඳ, සහ දරුවා මරා දැමුවා කියලා ද, ඔබ කියන්නේ.

විත්තියේ නීතිඥ : ඒ වගේ නිගමනයකට එන්න ඒ තරම් හදිසි නොවන ලෙස මම ඔබතුමාගෙන් ගරු ජූරි සභාවෙනුත් ඉල්ලා සිටිනවා. මා යෝජනා කරන්නේ දෘශ්‍යමානයක් ලෙස අප දකින මිනිසාට වඩා සපුරාම වෙනස් කෙනෙකු ඔහුගේ අභ්‍යන්තරයේ සිටි බව පෙන්වා සිටිමට. අප යථාර්ථය ලෙස දුටුවේ ඔහු මවා පෙන්වන දේ. නමුත් ඔහු ජීවත් වුණේ වෙනස්ම වූ ෆැන්ටසිමය ප්‍රබන්ධයක. මා සිතන්නේ එය අපි හැමෝටමත් පොදුයි. අප හැමෝම ජීවත් වන්නේ අපම නිර්මාණය කරගත් ෆැන්ටසි ප්‍රබන්ධයක. අප යථාර්ථය යයි කියන්නේ එයටයි.

විනිසුරු : ඔබ කියන දේ මට නම් ඒ තරම් පැහැදිලි නැහැ. මේ ජූරි සභාවේ සිටින්නේ සාමාන්‍ය බුද්ධියකින් යුතු පිරිසක්. ඔවුන්ගෙන් අප කිසිම දෙයක් සැඟ

Scanned by Ca

විශේෂඥ දැනුමක් බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබ කියන දේ ඔවුන් වටහා ගන්නවා ඇත්තේ කෙසේද?

විත්තියේ නීතිඥ : ගරු ජූරි සභික මහතුනි කෙනෙකු උමතු ද කියා නිගමනය කිරීමට බාහිර ලක්ෂණ මත යැපිය යුතු නැහැ කියන එකයි මා කියමින් සිටින්නේ. මා එය මෙහෙම කියන්නම්. සමකාලීන සමාජයේ යම් සමාජ මෙහෙවරක (Mission) නියැලී සිටින්නත් සිටිනවා. ඇත්තටම නම් මේ මෙහෙවර කියන ප්‍රපංචය බොහෝ විට සයිකෝසියාව නැතහොත් උමතු බව අඟවන ලකුණක්. පීඩනෝන්මාදය (Paranoia) සහ භින්නොන්මාදය (Schizophrenia) යන සයිකෝසියාවේ රෝග ලක්ෂණ පිළිබඳව වටහා ගැනීම මෙහිදී වැදගත්. ඇත්ත වශයෙන්ම ඒ රෝග දෙකෙන් කොයි එක තිබුණත් ඔහු සයිකෝටිකයෙක් තමයි.

පීඩනෝන්මාදයෙන් පෙළෙන්නා බොහෝ විට කරන්නේ අනෙකාගේ ආශාව සලකුණු කිරීම. නිදසුනක් විදියට ඔය CIA කුමන්ත්‍රණ දෙමළ ඩයස්පෝරාව වගේ යෙදුම් එන්නෙ පිඩනෝන්මාදියාගෙන්. හිත්තෝන්මාදිය. කරන්නේ අනෙකාගේ ආශාවේ අර්ථය කුමක්දැයි සෙවීමයි. ඒ කියන්නේ පිඩනෝන්මාදියා අනෙකාගේ එහෙම නැත්නම් සමාජයේ ආශාව ලෙස සලකන්නේ යම් කුමන්ත්‍රණයකින් ගැලවීම ලෙස ගත්තාම එම කුමන්ත්‍රණය ඔහු නම් කරනවා ඒ විදියට පිඩනෝනාමාදියා අනෙකාගේ ආශාව (desire of the other) නිර්වචනය කරන විට හිත්තෝන්මාදියා එය විවෘතව තබනවා. මගේ සේවාදායකයා එම අර්ථයෙන් හිත්තෝන්මාදියෙක්. හැබැයි මේ දෙවර්ගයම හිතන්නේ තමාට යම් සමාජ මෙහෙවරක් පැවරී ඇති බවයි.

මෙය පැහැදිලි කර ගත හැකි සිනමා පටයක් තිබෙනවා

Scanned by CamS

Beautiful Mind කියලා. එහි කියවෙන්නේ විශ්ව විද්‍යාලයක - මහාචාර්යවරයෙක් ගැන. නමුත් ඔහු තුළ විදෙස් (සෝවියට්) කුමන්ත්‍රණයක් ගැන මතිභ්‍රමයක් තිබෙනවා. අනෙක් අය නොදකින ඔහු පමණක් දකින පුද්ගලයින් ඔහුට හමු වෙනවා. ඔහුට පැවරී තිබෙන මෙහෙවර තමයි මේ ව්‍යසනයන්ගෙන් ලෝකය ගලවා ගැනීම. හැබැයි මෙහි තිබෙන බියජනක ඇත්ත තමයි තම රෝගි බව සාමාන්‍ය මහජනතාවටද බෝ කිරීම. ඒ නිසා ඔවුන් කරන්නේ පීඩනෝන්මාදයෙන් සහ භින්නෝන්මාදයෙන් පෙළෙන ජනතාවක් නිර්මාණය කිරීමයි. අනෙකාගේ ආශාව තමා විනාශ කිරීම යයි ඔහු සිතනවා. පීඩනෝන්මාදි ආත්මය බොහෝ විට පෙළඹෙන්නේ ලෝකය ආගම හෝ විද්‍යාව ආදිය පිළිබඳ පණිවිඩ නිකුත් කිරීමට බව යයි ලීඩර් පවසනවා. ඔවුන්ගේ

පණිවුඩ වලින් කියවෙන්නේ ප්‍රවේශම් වන ලෙසයි. එහෙත් භින්නෝන්මාදියාට අවශ්‍ය මේ වන විටත් වෙනස් වීම සිදු වී අවසන් බව ප්‍රකාශ කිරීමටයි. ඔවුන්ට අවශ්‍ය වෙන දෙයක් නොවේ. මේ වෙනස නියෝජනය කිරීමට. තහවුරු කිරීමට. මා ඉල්ලා සිටින්නේ එළියේ දේශපාලනික සමාජයට මේ න්‍යායන් ආයෝජනය කර බලන ලෙසයි. එවිට අප සමාජ ශෝධකයින් ලෙස දකින බොහෝ අය පීඩනෝන්මාදයෙන් හෝ භින්නෝන්මාදයෙන් පෙළෙන අය බව ඔබට වැටහේවි.

විනිසුරු : ඒක ඉතාම බරපතල ප්‍රකාශයක්.

විත්තියේ නිතිඥ : ස්වාමිනි එහි වගකීම මා බාර ගන්නවා. පුදුම විය යුතු දේ තමයි කිසිවකු ඔවුනට පිස්සන් බව නොකියන එක. මගේ සේවා දායකයාටත් එහෙම පිටතට පෙනෙන උමතු බවක රෝග ලක්ෂණ දකින්නට නොලැබුණේ මේ නිසයි.

ස්වාමිනි මනෝ ව්‍යාධි ගැන කතා කරන විට යෙදෙන වචනයක් තමයි ඩිමෙන්ෂියාව කියන්නෙ. ඒක අපට සිංහලෙන් ඔල්මාදය කියලා කියන්න පිළිවන්. ඔල්මාදය සයිකෝසියාවේ ලක්ෂණයක්. හැබැයි ඔල්මාදකාරයින්ව කව්රුත් වැඩිය ගණන් ගන්නේ නැහැ. ඉස්සර තිබුණ ජනප්‍රිය විශ්වාසය වුණේ රෝගියා හොඳින් ඉන්නවා නම් එය සයිකෝසියාව විය නොහැකි බවයි. ලිඩර් ඔහුගේ ග්‍රන්ථයේ මේ පිළිබඳ අපූරු තොරතුරක් එළිදරව් කරනවා. ඒ අනුව එක්තරා මනෝ චිකිත්සකයකු තමා ප්‍රතික්ෂේප කළ භින්නෝන්මාදයෙන් (Schizophrenical) පෙළෙන්නේ යයි විශ්වාස කර තිබූ රෝගියකු ගැන ඇමෙරිකානු මානව විද්‍යාඥවරියක වූ ටන්‍යා ලූමාන් මෙසේ කියා තිබෙනවා.

"ඇයට සහකරුවෙක් සිටිනවා. ඇත්තටම ඇයට ඕනෑ වුණේ

Scanned by Cam

මේ හාදයාව කසාද බැඳ ගැනීමට. බැලූ බැල්මට ඔහු ගැළපෙන කෙනෙක්. ඇය සියල්ල තනිවම කර ගැන්මට තරම් සාමාන්‍යයයි. ඇයට සයිකෝටික ලේබලය ඇලවීම අර්ථයක් ඇති දෙයකැයි මා හිතන්නේ නැහැ."

බලන්න මේ මානව විද්‍යාඥවරියට අනුව ඇය සයිකෝටිකයකු නොවන්නේ බලාපොරොත්තු වුන පරිදි ඇගේ ජීවිතය කඩා නොහිරුණ බැවින්. මේ විදියට රෝග විනිශ්චයක පූර්වානුමිතින් ඒ කියන්නේ භින්නෝන්මාදයෙන් පෙලෙන්නියක නම් බැලූ බැල්මට ඇයට ව්‍යාකූල පෙනුමක් තිබිය යුතුයි. ඇයට පිරිමියෙකුගේ බැල්ම දිනාගත නොහැකියි වගේ දේවල් හරිම අන්තගාමියි. මගේ සේවා දායකයාට හරහට හිටියෙත් ඒකමයි. ඔහුට පිස්සකුගේ පෙනුමක් නැහැ. බලන්න ඔහු දැනටත් අර විත්තිකූඩුවේ සිටින්නේ හොඳට ඇඳ

පැළඳගෙන ටයි පටියක් පවා පැළඳගෙනයි.

මේ විදියේම ෆ්‍රොයිඩ්ගෙන් පවා ප්‍රතිකාර ලබා ගත් රෝගියෙක් වෘක මිනිහා නමින් ප්‍රසිද්ධව සිටියා. ඔහු සර්ජි පැන්කජිත් නම් රුසියානුවෙක්. ඔහුට වෘක මිනිසා (Wolf Man) යයි කිව්වෙ වෘකයින් රැලක් බියජනක ලෙස තමා දෙස බලා සිටින බව නිතර සිහිනෙන් දැකීම නිසයි. මේ රෝගියා පීඩනෝන්මාදයෙන් (Paranoia) පෙළෙන්නකු බව රෝග විනිශ්චය වී තිබුණා. ඒ සඳහා ඇති තරම් - සාක්කි තිබුණා. එහෙත් පැන්කජිත්ව පුද්ගලිකව දැන සිටි මියුරියල් ගාඩිනර් කියන විශ්ලේෂිකාව (analyst) කිව්වෙ කුමක්ද? ඔහු පීඩනෝන්මාදියකු ලෙස කර ඇති විනිශ්චය ඇය අභියෝගයට ලක් කළේ මෙසේ කියමින්.

"ඔහු ඉතාම ප්‍රියමනාප කෙනෙක්. නිතරම පිළිවෙලට පිරිසිදුව ඇඳුම් අඳිනවා. හරිම

ආහාර ගෙනෙන්නයි, අනෙක් අයට කරුණාවන්තයි,"

මින් කියන්නේ හයිපොකොන්ඩ්‍රියාකයකු නම් ඔහු කලබල සහිත හයිපොකොන්ඩ්‍රියා පෙනුමකින් හැසිරිය යුතු බවයි. ඔහුට සාර්ථක ජීවිතයක් ගෙවීමට තමා පිළිබඳව ඇදීමටවත් නුපුලුවන් විය යුතුයි. මන්ත ඔය වගේ අගතිගාමී නිගමන නිසා තමයි අපේ රටේ මනෝ වෛද්‍යවරුත් මගේ සේවාදායකයා උමතු රෝගියකු ලෙස නම් නොකළේ. නමුත් ස්වාමිනි ජුරි සභිකයිනි මේ චිත්තිකරු හිත්තෝමාදයෙන් පෙලුන උමතු රෝගියෙක්. ඔහුව මෙහෙයවූයේ ඔහු මනා උගත් අයකු ලෙස හිතින් මවාගෙන සිටි ඔහුගේ පියා විසින්. ඔහු කළා යයි කී දේවල් ඔහු කළ දේවල් නොවේ. ඔහුගේ පියාගේ මෙහෙයවීම පිට කළ දේවල්. ඒ නිසයි මම කිව්වේ එතන සිව්වැන්නකු ද සිටි බව. ඒ සිව්වැන්නා ඔහුගේ පියා. [illegible] [illegible]

පිළිබඳ කාරණය එළිදරව් වුනාම කෝපයට පත් වන්නේ ඔහු නොවේ ඔහුගේ අභ්‍යන්තරයේ සිටි ඔහුගේ අප්පච්චි.

විනිසුරු : එතකොට මේ පෙතේ ඔහු කළ්‍යාණි නමින් ස්ත්‍රියක මරා දමා සිටි බව කියනවා. ඒක කුමක්ද? ඇත්තටම එහෙම දෙයක් වෙලා තියෙනවාද?

විත්තියේ නීතිඥ : එය ඔහුගේම මතිභ්‍රමයක් පමණයි. එය ඔහුගේ ජීවිතයට බලපෑ එක්තරා අම්හිරි සිදුවීමක් පිළිබඳ මතකයකින් එන පිඩනයෙන් මිදීමට ඔහුම නිර්මාණය කරන ප්‍රබන්ධයක්. කළ්‍යාණි මරා දැමීම සංකේතාත්මක සිදුවිමක්. ඔහු තම පියා තරම්ම නිර්මාණශිලි පුද්ගලයෙක්. ඔහු එතනදි අපූර්ව කතාන්දරයක් නිර්මාණය කරනවා. එය ඔහුට පමණක් ආවේණික වූ රහසක්. ඔහුට අවශ්‍ය ඉන් මිදෙන්නට. මේ ප්‍රබන්ධය තුළ ඔහු මරා දමන්නේ දීර්ඝ කාලයක් තිස්සේ තමාව පීඩාවට පත්

කළ ඒ අම්හිරි මතකයන්. විත්තිකරු ඒ ගැන මා සමග පැවසුවා. එහෙත් ඒ ගැන කීමට මා ඔහුව සාක්කි කූඩුවට නංවන්නේ නැහැ.

ස්වාමීනි මා පෙනී සිටින්නේ උමතු රෝගියෙකුට. ඔහු සාක්කි කූඩුවට නැංවීමෙන් අපට කිසිම ප්‍රතිලයක් අත් වන්නේ නැහැ. මානසික රෝගියෙකුට සවිඥානික තර්කයක් නැහැ. ඔහුගේ තර්කනය ප්‍රබලයි. හැබැයි එය පවතින්නේ ඔහුගේ ලෝකය ආරක්ෂා කර ගැනීමට පමණයි. මා මෙහි පෙන්වා සිටීමට වෑයම් කළේ මානසික රෝගියකුගේ ස්ථාවරයක් මිසක් සවිඥානික බුද්ධියෙන් යුතු විත්තිකරුවකුගේ ආස්ථානයක් නොවේ.

ඒ කතාව මතිභ්‍රමයක්. හැබැයි ඔහු මරා දමන්නේ ගැහැණියක් නොවේ. තමාගේ බෙලහීන බව පිළිබඳ හීනමානය. මෙහි මරා දැමීම යනු එය යටපත් කිරීමක්. ඔය කතාව තමාගේ පියා සමග කියා ගන්නාට

ඔහුට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

විනිසුරු : ඔහු මානසික රෝගියෙක්. එහෙම ඇත්ත පියෙක් එතන හිටියේ නැහැ. ඒක ඔහුගේ හිතලුවක්.

විත්තියේ නීතිඥ : නැහැ ස්වාමිනි. උමතුවුවකු ප්‍රබන්ධ කරන ලෝකය ඔහුට යථාර්ථයක්. එය අප යථාර්ථය සේ ගන්නා දේට වෙනස් නැහැ. නිදර්ශනයක් හැටියට කිව්වොත් ඔහු පියා ලෙස විස්තර කරන්නේ ඔහු ෆැන්ටසි කරනය කරන පියෙක්. ඔහු පියාගෙන් බලාපොරොත්තු වන දේ ඒ පරිකල්පන පියා තුළ තිබෙනවා.

අප කිසියම් කෙනෙක් නායකයෙක් ලෙස පිළිගන්නේ අපගේ ෆැන්ටසි. නායකයාට ගැලපෙන කෙනෙක් නම් තමයි. ඔහු හොඳ නායකයෙක් නොවේ යයි කියන්නේ ඔහු මගේ ෆැන්ටසිය තුළ සිටින නායකයාට තුළ්‍ය නොවන නිසයි. මේ නිසා උමතු බව කියන්නේ අපට ජීවිතය

> ගැන බොහෝ පාඩම් කියලා දෙන තැනක්. මා කියන්නේ මේ මිනීමැරුම් කළේ ඔහු නොවෙයි. ඔහුගේ පියා තමයි මේ අපරාධය කළේ. උන්මත්තකයකුට මිනි මරන්න බැහැ.

මම මගේ දේශනය මෙතෙනින් අවසන් කරනවා. මා මේ ජූරි සභාවෙන් ඉල්ලා සිටින්නේ ඔහු මේ මිනීමැරුම් දෙකට වැරදි කරුවකු නොවන බව තීරණය කරන ලෙස නොවේ. ඔහු උමතු රෝගියකු බව තීරණය කරන ලෙසයි. ස්තුතියි.

අප්පච්චි ඇවිත්

Name - of - the - Father

සමන් වික්‍රමාරච්චි

ලංකාවේ වාමාංශික පක්ෂවල ශික්ෂිත කේඩරය සමන්විත වන්නේ තමන්ගේ සංයුක්ත පවුලෙන් විගාමික වූ පිරිසකගෙනි. ඒ අර්ථයෙන් ගත් විට ලාංකික වාමාංශික චින්තනය යනු පවුල් දෙකක් අතර සංක්‍රමණීක අවස්ථාවකි. එක පවුලකින් බිඳෙන පුද්ගලයකු අලුත් පවුලක් සාදන තුරු කාලය නාස්ති කිරීම මේ රටේ වමේ දේශපාලන විලාසිතාවයි.

ෆ්‍රාන්ස් කෆ්කා යනු බටහිර සාහිත්‍යයේ අපූර්ව ශානරයක් ඉදිරිපත් කළ සාහිත්‍යකරුවෙකි. ලංකාවේ බහුතර සාහිත්‍ය කෘති යනු එක්කෝ උන්නතිකාමය පිළිබඳ ආත්ම ප්‍රකාශනයකි. නැතහොත් ස්ත්‍රී ලිංගිකත්වය පිළිබඳ වංකගිරියකි.

කෆ්කා තමන්ගේම අනන්‍යතාවට සිනාහ වූ පුද්ගලයෙකි. සමහරු ඔහුගේ කෘති ධනේශ්වර පරාරෝපණය සමග ගලපති. තවත් සමහරු ඔහුගේ කෘති ආගමික පරමාදර්ශ බිඳ වැටීම සමග තුල්‍ය කරති. නමුත් වඩා වැදගත් වන්නේ මිනිස් පැවැත්මේ සමකාලීන ස්වභාවයයි. ඒ තුළ වඩා අන්තර්ගත වී ඇත්තේ හාස්‍යයයි.

id
2017 ඔක්තෝබර් 01

http://www.sarasavi.lk
Rs 375.00
ISBN 978-955-31-0915-6
SARASAVI 2017
Novel

සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ. දුරකථන/ෆැක්ස් 011 2769446 e-mail: publishing@sarasavi.lk
[illegible]

Scanned by CamS